79 වන කාණ්ඩය
3 වන කලාපය

බ්‍රහස්පතින්දා
1968 ජූලි 18

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලත් සන්දේශ [තී. 261]

නිවේදන [තී. 263] :

- ගෘහ්‍ය කාරක සභාව
- ස්ථාවර නියෝග කාරක සභාව
- ආණ්ඩුවේ ගිණුම් පරීක්ෂක කාරක සභාව
- මහජන පෙත්සම් කාරක සභාව

තේරීම් කාරක සභාවේ වාර්තාව [තී. 265]

ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභා [තී. 266]

අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව [තී. 267] :

ස්තුති යෝජනාව පිළිබඳ විවාදය [තුන්වන දිනය]

විවාදය කල් තබන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 79
இல. 3

வியாழக்கிழமை
18 ஜூலை 1968

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

மகா தேசாதிபதியிடமிருந்து வந்த செய்தி [ப. 261]

அறிவிப்புக்கள் [ப. 263] :

சபைக்குழு
நிலையற் கட்டளைக் குழு
அரசாங்கக்கணக்குக் குழு
பொது மனுக் குழு

தெரிவுக்குழு : அறிக்கை [ப. 265]
சட்டவாக்க நிலையற் குழுக்கள் [ப. 266]
மகாதேசாதிபதியினது பேச்சு : [ப. 267] :

உரைமீதான விவாதம் [மூன்றும் நாள்]
விவாதம் ஒத்திவைக்கப்பெற்றது

---

Volume 79
No. 3

Thursday
18th July 1968

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

MESSAGE FROM THE GOVERNOR-GENERAL [Col. 261]

ANNOUNCEMENTS [Col. 263] :

House Committee
Standing Orders Committee
Public Accounts Committee
Public Petitions Committee

COMMITTEE OF SELECTION : REPORT [Col. 265]
LEGISLATIVE STANDING COMMITTEES [Col. 266]
GOVERNOR-GENERAL'S SPEECH [Col. 267] :

Debate on the Address [Third Day]
Debate adjourned

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## House of Representatives

### 1968 ජූලි 18 වන බ්‍රහස්පතින්දා

வியாழக்கிழமை, 18 ஜூலை 1968

*Thursday, 18th July 1968*

---

අ. භා. 2ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායක තුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.

சபை, பி. ப. 2 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at* 2 P.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලත් සන්දේශය

## மகா தேசாதிபதியிடமிருந்து வந்த செய்தி

## MESSAGE FROM THE GOVERNOR-GENERAL

**කථානායකතුමා**
*சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I have received the following Message from His Excellency the Governor-General.

" අග්‍රාණ්ඩුකාර කාර්යාලය

රජ වාසල,
කොළඹ,
ශ්‍රී ලංකාව.
1968 ජූලි 17,

ගරු කථානායක,

1959 අංක 8 දරන පනතින් සංශෝධනය කරනු ලැබූ (40 වෙනි අධිකාරය වන) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වෙනි වගන්තිය යටතේ 1968 ක් වූ ජූලි 17 වැනි දාතමින් නිකුත් කරනු ලැබූ ප්‍රකාශනය මගින් ඉහත කී ආඥාපනතේ 2 වෙනි කොටසේ විධිවිධාන 1968 ජූලි 18 වැනි දින ක්‍රියාත්මක විය යුතු බව මවිසින් ප්‍රකාශ කරන ලදී.

ප්‍රකාශනය නිකුත් කිරීමට හේතුව මහාජන සාමය ආරක්ෂා කිරීම හා ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය වූ සැපයීම් හා සේවාවන් පවත්වාගෙන යාම සඳහා වූ බව නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත මම මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාරවරයා.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ගරු කථානායක තුමා. "

" மகா தேசாதிபதியின் கந்தோர்,

இராணி மாளிகை,
கொழும்பு,
இலங்கை.
1968 யூலை 17

கௌரவ சபாநாயகர் அவர்களே,

1959 ஆம் ஆண்டின் 8 ஆம் இலக்கச் சட்டத்தினால் திருத்தப்பட்டபடியான (40 ஆம் அத்தியாயமான) பொதுசனப் பாதுகாப்புக் கட்டளைச் சட்டத்தின் 2 ஆம் பிரிவின் கீழ், வெளியிடப்பட்ட 1968 யூலை 17 ஆம் திகதிப் பிரசித்தத்தின் மூலம், மேற்கூறப்பட்ட கட்டளைச் சட்டத்தின் II ஆம் பிரிவில் சொல்லப்பட்ட ஏற்பாடுகள் 1968 யூலை 18 ஆம் திகதி அமுலுக்கு வருமென்று நான் பிரகடனப்படுத்தியிருக்கிறேன்.

இப் பிரசித்தத்தை வெளியிட்டதற்கு நியாயம், பொதுசன ஒழுங்கை நிலைநாட்டுவதற்கும் சமுதாயத்தின் சீவியத்திற்கு அத்தியாவசியமான வழங்குதல்களையும் சேவைகளையும் பாதுகாப்பதற்கு மென்பதை இத்தால் பிரதிநிதிகள் சபைக்கு வெளிப்படுத்துகிறேன்.

டபிள்யூ. கொபல்லவ,
மகாதேசாதிபதி,

கௌரவ பிரதிநிதிகள் சபை சபாநாயகர் அவர்கட்கு. "

" Governor-General's Office

Queen's House, Colombo, Ceylon.
17th July 1968

MR. SPEAKER,

BY PROCLAMATION dated 17th July 1968 and issued under Section 2 of the Public Security Ordinance (Cap. 40), as amended by Act No. 8 of 1959, I have declared that the provisions of Part II of the aforesaid ordinance shall come into operation on 18th July 1968.

I do hereby communicate to the House of Representatives that the reason for issuing the Proclamation is for the preservation of public order and for the maintenance of supplies and services essential to the life of the community.

W. GOPALLAWA,
GOVERNOR-GENERAL

The Honourable the Speaker of the House of Representatives. "

2——එච් 15333—794 (68/7)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නිවේදන

## அறிவிப்புக்கள்

## ANNOUNCEMENTS

I

### ගෘහ්‍ය කාරක සභාව

சபைக்குழு

HOUSE COMMITTEE

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

123 වන ස්ථාවර නියෝගය අනුව තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් වන මන්ත්‍රීන් කථානායකතුමාගේ සභාපතිත්වය ඇතිව ගෘහ්‍ය කාරක සභාවේ සභිකයන් හැටියට නම් කරන ලදී:

ජේ. පී. ඔබේසේකර මිය.
කේ. තුරෙයිරත්නම් මයා.
ජී. ජේ. පැරිස් පෙරේරා මයා.
ඩී. පී. ආර්. වීරසේකර මයා.
එස්. හෙට්ටිගේ මයා.

In terms of Standing Order No. 123, the following Members have been nominated by the Committee of Selection to form the House Committee with Mr. Speaker as Chairman :

Mrs. J. P. Obeyesekere
Mr. K. Thurairatnam
Mr. G. J. Paris Perera
Mr. D. P. R. Weerasekera
Mr. S. Hettige.

II

### ස්ථාවර නියෝග කාරක සභාව

நிலையியற்கட்டளைக்குழு

STANDING ORDERS COMMITTEE

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

124 වන ස්ථාවර නියෝගය අනුව තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් වන මන්ත්‍රීන් කථානායකතුමාගේ සභාපතිත්වය ඇතිව නියෝජ්‍ය කථානායකතුමාත්, කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමත් සමග ස්ථාවර නියෝග කාරක සභාවේ සභිකයන් හැටියට නම් කරන ලදී:

ගරු ජේ. ආර්. ජයවර්ධන
ඒ. අමිර්තලිංගම් මයා.
ප්‍රින්ස් ගුණසේකර මයා.
ආචාර්ය එන්. එම්. පෙරේරා

In terms of Standing Order No. 124, the following Members have been nominated by the Committee of Selection to form the Standing Orders Committee in addition to Mr. Speaker as Chairman, the Deputy Speaker, and the Deputy Chairman of Committees :

The Hon. J. R. Jayewardene
Mr. A. Amirthalingam
Mr. Prins Gunasekera
Dr. N. M. Perera.

III

### රජයේ ගිණුම් කාරක සභාව

அரசாங்க கணக்குக்குழு

PUBLIC ACCOUNTS COMMITTEE

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

125 වන ස්ථාවර නියෝගය අනුව තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් වන මන්ත්‍රීන් රජයේ ගිණුම් කාරක සභාවේ සභිකයින් හැටියට නම් කරන ලදී:

එම්. ෆලීල් අබ්දුල් කෆූර් මයා., එම්.බී.ඊ.
එම්. එස්. අමරසිරි මයා.
පී. ජී. බී. කෙනමන් මයා.
ලක්ෂ්මන් ජයකොඩි මයා.
එස්. තොන්ඩමන් මයා.
වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාතන්
බර්නාඩ් සොයිසා මයා.

In terms of Standing Order No. 125, the following Members have been nominated by the Committee of Selection to form the Public Accounts Committee :

Mr. M. Falil Abdul Caffoor, M.B.E.
Mr. M. S. Amarasiri
Mr. P. G. B. Keuneman
Mr. Lakshman Jayakody
Mr. S. Thondaman
Dr. E. M. V. Naganathan
Mr. Bernard Soysa.

IV

### මහජන පෙත්සම් කාරක සභාව

பொது மனுக் குழு

PUBLIC PETITIONS COMMITTEE

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

126 වන ස්ථාවර නියෝගය අනුව තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් වන මන්ත්‍රීන් කථානායකතුමාගේ සභා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පතිත්වය ඇතිව මහාජන පෙත්සම් කාරක සභාවේ සභිකයින් හැටියට නම් කරන ලදී:

එම්. අබ්දුල් බකීර් මාකර් මයා.
කේ. ඩබ්ලිව්. දේවනායගම් මයා.
මංගල මූණසිංහ මයා.
කේ. බී. රත්නායක මයා.
පී. බී. ඒ. වීරකෝන් මයා.

In terms of Standing Order No. 126, the following Members have been nominated by the Committee of Selection to form the Public Petitions Committee with Mr. Speaker as Chairman:

Mr. M. Abdul Bakeer Markar
Mr. K. W. Devanayagam
Mr. Mangala Moonesinghe
Mr. K. B. Ratnayake
Mr. P. B. A. Weerakoon.

## තේරීම් කාරක සභා වාර්තාව

*தெரிவுக்குழு அறிக்கை*

## COMMITTEE OF SELECTION : REPORT

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

තේරීම් කාරක සභාවේ මතු පළවන වාර්තාව මම ඉදිරිපත් කරමි:

"122 වන ස්ථාවර නියෝගය ප්‍රකාර ඔබතුමන්ගේ කාරක සභාව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවන්ගේ ගණන, ඒවායේ කාර්ය භාරය සහ (ගණපූරණය ඇතුළුව) ඒවා සංයුක්ත විය යුතු අන්දම ගැන සලකා බලා ඒ පිළිබඳ ස්වකීය මතය මන්ත්‍රී මණ්ඩලයට මතු සඳහන් වන අන්දමට වාර්තා කරති:—

(අ) "ඒ" ස්ථාවර කාරක සභාව යනුවෙන් ද, "බී" ස්ථාවර කාරක සභාව යනුවෙන් ද හැඳින්විය යුතු ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභා දෙකක් පත් කළ යුතුය:

(ආ) එම කාරක සභාවල කාර්ය භාරය, 57 වන ස්ථාවර නියෝගය යටතේ කථානායකතුමා විසින් ඊට පවරනු ලබන කෙටුම්පත් පනත් සලකා බැලීම විය යුතුය:

(ඇ) කාරක සභා දෙකෙහිම, එකක මන්ත්‍රීන් විසි දෙනෙකු බැගින් සිටිය යුතුය; යම් කිසි විශේෂ කෙටුම්පත් පනතක් සලකා බැලීම පිණිස අතිරේක වශයෙන් මන්ත්‍රීන් පහළොවකට නොවැඩි ගණනක් එක කාරක සභාවකට පත් කිරීමට කථානායකතුමාට බලය තිබිය යුතුය:

(ඈ) මෙම කාරක සභාවක ගණපූරණය මන්ත්‍රීන් හත් දෙනෙකුගෙන් සමන්විත විය යුතුය."

I present the following Report of the Committee of Selection:

"Your Committee have, in accordance with Standing Order No. 122, considered the number, functions and constitution (including quorum) of Legislative Standing Committees and report to the House their opinions thereon as follows:

(*a*) that there shall be two Legislative Standing Committees designated Standing Committee 'A' and Standing Committee 'B'.

(*b*) that the functions of the Committee shall be to consider Bills allocated to them by Mr. Speaker under Standing Order No. 57;

(*c*) that each Committee shall consist of twenty Members and that Mr. Speaker be empowered to add not more than fifteen additional Members to serve on the Committee during the consideration of any particular Bill; and

(*d*) that seven Members shall form a quorum."

**එම වාර්තාව සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*குறித்த அறிக்கை சபாபீடத்திலிருக்கக் கட்டளையிடப்பட்டது.*

*Ordered that the said Report do lie upon the table.*

## ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභා

*சட்டவாக்க நிலையற் குழு*

## LEGISLATIVE STANDING COMMITTEES

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

*(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

I move,

"That two Legislative Standing Committees be appointed to be designated Standing Committee 'A' and Standing Committee 'B' respectively;

That each Committee do consist of twenty Members and that Mr. Speaker be empowered to add not more than

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

fifteen additional Members to serve on the Committee during the consideration of any particular Bill ;

That seven Members be the quorum of each Committee."

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම

### *சபை அமர்வு*

### SITTING OF THE HOUSE

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சீ. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

I move,

"That this House at its rising this day do adjourn until 2 P.M. on Friday, 19th July 1968."

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

***Question put, and agreed to.***

## අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව : ස්තුති යෝජනාව පිළිබඳ විවාදය [තුන්වන දිනය]

### *மகாதேசாதிபதியினது பேச்சு : உரைமீதான விவாதம் [மூன்றும் நாள்]*

### GOVERNOR GENERAL'S SPEECH DEBATE ON THE ADDRESS [THIRD DAY]

**සංශෝධන [ජූලි 15] පිළිබඳ කල් තබන ලද විවාදය තව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [ජූලි 7]**

*ஜூலை 7 ஆம் தேதிய வினாவுக்கான திருத்தங்கள் [ஜூலை 15] மீதான ஒத்திவைக்கப்பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

***Order read for resuming Adjourned Debate on Amendments [15th July] to Question—[7th July].***

"අතිගරු අග්‍රාණ්ඩුකාරතුමන් විසින් පවත්වන ලද කථාවට පිළිතුරු වශයෙන් මෙම මන්ත්‍රී මණ්ඩලය පහත දැක්වෙන ස්තුති යෝජනාව ඉදිරිපත් කළ යුතුය :

'අතිගරු උතුමාණනි,

පාර්ලිමේන්තුව විවෘත කිරීමේදී ඔබතුමාණන් විසින් පවත්වන්නට යෙදුණු කථාව වෙනුවෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයෝ වන අපි ඔබතුමාණන්ට ස්තුති කරමු. අප වෙත ඉදිරිපත් කරන ලද සියලුම කරුණුවලට අපගේ අවධානය යොමු කරන බව අපි ඔබතුමාට ස්ථිර ලෙස ප්‍රකාශ කරමු.' "—[විජේසිරි මයා.]

*"மேன்மை தங்கிய மகா தேசாதிபதி அவர்களால் நிகழ்த்தப்பட்ட பேச்சுக்கு மறுமொழியாக இச்சபை பின்வரும் நன்றியுரையைச் சமர்ப்பிப்பதாக :*

*'மேன்மை தங்கிய உத்தம,*

*பாராளுமன்றத் திறப்பின்போது மேன்மைதங்கிய தங்களால் நிகழ்த்தப்பட்ட பேச்சுக்கு, பிரதிநிதிகள் சபை அங்கத்தினராம் நாம் எங்களது நன்றியை தெரிவிக்கின்றோம். மேன்மை தங்கிய தங்களால் எம்முன் சமர்ப்பிக்கப்பட்ட எல்லா விடயங்கள் மீதும் எம் கவனத்தைச் செலுத்துவோம் என உறுதி பகர்கிறோம்' ".—[திரு. விஜேசிறி]*

"That this House do present the following Address to His Excellency the Governor-General in reply to his Speech:

'May it please Your Excellency.

We, the Members of the House of Representatives, thank Your Excellency for the Speech with which you have been pleased to open Parliament. We assure Your Excellency that we shall give our attention to all matters placed before us.' "—[*Mr. Wijesiri*].

**යෝජිත සංශෝධන, ප්‍රශ්නයේ අගට එකතු කිරීමට :**

*பிரேரிக்கப்பட்ட திருத்தங்கள், வினாவின் இறுதியில் சேர்க்கப்படுவதற்கு :*

***Which Amendments were, at the end of the Question, to add :***

"එතෙකුදුවුවත්, උතුමාණන් වහන්සේගේ රජයේ ප්‍රතිපත්ති කෙරෙහි මහජන විරෝධය බුරබුරා නැග එන අතර රජයේ පරමාර්ථයන් කෙරෙහි පවත්නා මහජන අවිශ්වාසය පාර්ලිමේන්තු අතුරු මැතිවරණ ප්‍රතිඵල සහ පළාත් පාලන ඡන්ද ප්‍රතිඵල ඇතුළුව විවිධාකාරයට මනාව පැහැදිලි වන හෙයින් ද, රජය බලයට පැමිණි අවස්ථාවේ පටන් දිගටම ගෙන යන ප්‍රජාතන්ත්‍ර විරෝධි ප්‍රතිගාමි ප්‍රතිපත්ති කිසියම් අන්දමකට හෝ වෙනස් කිරීමට උනන්දුවක් නැති බව පෙනෙන හෙයින් ද, එහි ප්‍රතිඵලයක් වශයෙන් ලක්වැසි බහු ජනතාවගේ අයිතිවාසිකම් විදේශීය අධිරාජ්‍ය වාදීන්ටත්, ඔවුන්ගේ දේශීය ඒජන්තවරුන්ටත්, ආධාරකරුවන්ටත් පාවාදී ඇති හෙයින් ද ;

නැගී එන ආර්ථික අර්බුද සහ ජනතා ප්‍රශ්න ක්‍රියාශීලීවූද අංග සම්පූර්ණවූද ප්‍රතිපත්ති සහිත ක්‍රියා මාර්ගයකින් විසඳීමට රජය මුළුමනින්ම අසමත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිසා එම අදක්ෂතාවය විවිධ පරිපාලන විස්තර රූසකින් වසන් කිරීමට දරන ප්‍රයත්නය උතුමාණන් වහන්සේගේ කථාවෙන් පැහැදිලිව පෙනෙන හෙයින් ද;

රජය දුන් පොරොන්දු ඉටු නොකිරීමෙන් හා අවස්ථාවාදී උපක්‍රම සහ ප්‍රතිගාමී ප්‍රතිපත්ති හේතු කොටගෙන රජය වෙත එල්ල වෙන විපාක මග හරින්ට උත්සාහ කරමින් දිගින් දිගටම හැකි තාක් කල් බලයේ එල්ලී සිටීමට උත්සාහ දැරීම උතුමාණන් වහන්සේගේ ආණ්ඩුවේ ප්‍රධාන අරමුණ බව පෙනෙන අතර, වැදගත් ජාතික ප්‍රශ්න බොහොමයක්ම මග හරිමින් ප්‍රකාශවන දේශපාලන දෙබිඩි කථා වලින් උතුමාණන් වහන්සේගේ කථාව පිරී ඇති බැවින් ද,

උතුමාණන් වහන්සේගේ කථාවෙහි විශේෂ වශයෙන් :—

(අ) එදිනෙදා ජීවිතයට උවමනා කරන අවශ්‍ය භාණ්ඩවල මිළ ඉහළ නැගීම හා හිඟකම නිසා ජනතාවට මුහුණ පාන්නට සිදුවී තිබෙන කරදර දුක් ගැහැට මග හැරවීම පිණිස කිසිම පියවරක් යෝජනා කරනු තබා බඩුවල අධික මිළ හා බඩු හිඟය පිළිබඳව වචන මාත්‍රයක්වත් සඳහන් නොකර ඇති හෙයින් ද;

(ආ) වැඩිවී යන රක්ෂා හිඟය නිසා අනාථව බලාපොරොත්තු සුන්ව හා කළකිරීමෙන් යුතුව සිටින ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමත් වූවන් හා විශ්ව විද්‍යාලීය අධ්‍යාපනය ලබා ගත් දස දහස් දෙනා ඇතුළු ලක්ෂ සංඛ්‍යාත තරුණ තරුණියන්ගේ රැකීරක්ෂා ප්‍රශ්නය ගැන සඳහනක්වත් නැති හෙයින් ද;

(ඉ) දේශපාලන හා පෞද්ගලික විරුද්ධවාදීන්ගෙන් විවිධ ලෙස පළිගැනීම පිණිස පාවිච්චි කරමින් මේ රජයේ කාලසීමාව තුළ අවුරුදු දෙකහමාරකටත් වැඩි කාලයක් මුළුල්ලේ අයුක්ති සහගතව පවත්වාගෙන යන හදිසි තත්ත්වය අහෝසි කිරීම ගැන අදහසක්වත් සඳහන් නොකිරීමෙන් ද;

(ඊ) ලංකාවේ සමගිතාවය හා අඛණ්ඩභාවයට තර්ජනයක් වූ, රාජ්‍ය භාෂාවේ තත්ත්වය අඩපණ කරන්නාවූ උතුරු නැගෙනහිර පළාත් හැර ලංකාවේ අනික් පළාත්වල වාසය කරන, දෙමළ නොවන, රටවැසියන්ට එම පළාත් දෙක තුළ රජය විසින් දෙනු ලබන ඉඩම් ගැනීමට ඇති අයිතිවාසිකම තහනම් කරන්නාවූ, කොන්දේසි ඇතුළත් කරමින්, එක්සත් ජාතික පක්ෂයේ හා ලංකා ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයේ නායකයන් විසින් 1965 මාර්තුවේදී රහසේ ඇතිකරගත් අධම ගිවිසුම ක්‍රියාත්මක කිරීම පිණිස ගන්නා ලද අලුත්ම පියවර වූ දිස්ත්‍රික් සභා පිහිටුවීමට විරුද්ධව පැන නැගුණ මහජන උද්ඝෝෂණ නොතකා එම රහස් ගිවිසුම ක්‍රියාත්මක කිරීමට දරන ප්‍රයත්නය අත්හැරීමට ආණ්ඩුව අදහස් නොකරන බව පෙනියන හෙයින් ද;

(උ) නොයෙකුත් පරිපාලන සංශෝධන මගින් නිදහස් අධ්‍යාපනය සීමා කිරීම හා අඩපණ කිරීම නිසා මේ ආණ්ඩුව විශ්ව විද්‍යාලයේ සිට පහළට අධ්‍යාපන ක්‍රමය අවුල් කිරීම අත්හැර දමන අදහසක් එළි නොකරන හෙයින් ද;

(ඌ) විදේශ කටයුතුවලදී මධ්‍යස්ථ ප්‍රතිපත්තියෙන් බැහැරව නිතර නිතර ගුප්ත ක්‍රියා කිරීම නැවැත්වීමට රජය අදහස් කරන බවක් නොදක්වන හෙයින් ද;

(එ) රාජ්‍ය භාෂාව උසාවි භාෂාව කිරීමට පටන් ගැනීමටවත් යෝජනාවක් අඩංගු නොවන හෙයින් ද.

(ඒ) තමන් අයිති කුලය නිසා සමාජයේ සමානාත්මතාව නොලැබෙන අයගේ අයිතිවාසිකම් තහවුරු කිරීමටත්, විශේෂයෙන්ම සුළු ද්‍රවිඩ ජනතා නැමැති අයට ඔවුන්ගේ වර්තමාන උද්ඝෝෂණය පරිදි දැනට විඳින්ට වී ඇති විෂමතා හා අවමාන අස් කිරීම පිණිසත්, 1957 සමාජ දුබලතා වැළැක්වීමේ පනත ප්‍රාණවත් කිරීමට අවශ්‍ය සංශෝධන යෝජනා කර නොමැති හෙයින් ද;

(ඔ) රජයේ වෘත්තීය සංගම් විරෝධී ප්‍රතිපත්තියට අනුකූලවන පරිදි, ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ වැඩි කොටස හෙළා දකින, ජයවර්ධන කාරක සභාවේ පක්ෂ ග්‍රාහී හා ප්‍රතිගාමී වාර්තාව අනුව වෘත්තීය සංගම් ආඥාපනත සංශෝධනය කිරීමට අදහස් කරන හෙයින් ද;

(ඕ) මෙරට නිපදවන ආහාර ද්‍රව්‍ය පාරිභෝගිකයාට සැපයීමේ දෘෂ්‍යමාන වැඩිවීමක් හෝ එහි මිළ අඩුවීමක් හෝ පෙනෙන්නට නැති බැවින් ඊනියා ආහාර වගාවේ සාර්ථකත්වය සත්‍ය වශයෙන්ම පුහු ඝෝෂාවක් බව පිළිගෙන නැති හෙයින් ද;

(ක) ඔබගේ රජයේ කැපී පෙනෙන නිර්ලජ්ජා අංගයන් වන දේශපාලන හිතවත්කම උඩ වැඩි සැළකීම, දූෂණවලට ඉඩ තැබීම, දේශපාලනමය සහ පෞද්ගලික විරුද්ධ වාදීන් පෙළීමට රාජ්‍ය තන්ත්‍රය යෙදීම යනාදී දේ අත්හැර දැමීමට උත්සාහ දරන බව පෙනෙන්නට නැති හෙයින් ද;

උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව කෙරෙහි අපගේ විශ්වාසයක් නොමැත."—[ඉලංගරත්න මයා.]

" எனினும், பாராளுமன்ற உப தேர்தல் முடிவுகள், உள்ளூராட்சிச் சபைத் தேர்தல் முடிவுகள் உட்படப் பல்வேறு வழிகளில் அரசாங்கத்தின் நோக்கங்கள் மீது அவநம்பிக்கையையும், அதன் கொள்கைகள் மீது என்றும் வளர்ந்துவரும் எதிர்ப்பையும், பொது மக்கள் வெளிக்காட்டியிருந்துங்கூட மேன்மைதங்கிய

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தங்கள் அரசாங்கம் பதவியேற்ற காலம் தொடக்கம் பின்பற்றி வந்துள்ளதும், அந்நிய ஏகாதிபத்தியத் துக்கும், அதன் உள்ளூர் ஆதரவாளர்களுக்கும், முகவர்களுக்கும் இலங்கை மக்களின் சீவாதார உரிமை களைத் தியாகம் செய்யும் விளைவை யேற்படுத்திவிட்டது மான ஜனநாயக விரோதமானதும் பிற்போக்கானது மான அடிப்படைக் கொள்கைகளை மாற்றும் நோக்கம் எதற்குமான அறிகுறிகளைத் தெரிவிக்காதபடியாலும்,

வளர்ந்துவரும் பொருளாதாரப் பிரச்சினைகளையும் மக்களின் ஏனைய பிரச்சினைகளையும் கையாள்வதற்குத் திட்டவட்டமான, விசாலமான கொள்கையை வகுத் துக் கொள்வதில் அடிப்படையிலான இயலாமையை நானாவித நிர்வாக விபரங்களின் பின்னால் அர சாங்கம் மறைக்க முயலுவதாக சிம்மாசனப் பிரசங்கம் எடுத்துக்காட்டுவதாலும்,

மேலும், அவசர தேசிய முக்கியத்துவமான பிரச்சினைகளில் தங்கள் பிரசங்கம் இரட்டைப் பேச்சுக் களும் அரசியல் நேர்ப்பதிலின்மைகளும் மலிந்ததா யிருப்பதுடன், பிற்போக்குக் கொள்கைகள், சந்தர்ப் பவாத சூழ்ச்சிகள் நிறைவேற்றாத வாக்குறுதி கள் ஆகியவற்றின் தவிர்க்க முடியாத விளைவுகளிலிரு ந்து, ஒரு புறத்தில், தப்பிவிட முயல்வதுடன் மறு புறத்தில் இயன்றளவு காலம் பதவியில் ஒட்டிப் பிடித்துக் கொண்டிருப்பதற்கான வழிவகைகளைக் காண்பதே தங்கள் அரசாங்கத்தின் பிரதான தூண்டுதலாக இருக்கின்றதாக தங்கள் பிரசங்கம் எடுத்துக்காட்டுவதாலும்,

மேலும் குறிப்பாகத் தங்கள் பிரசங்கம்—

(அ) மக்களுக்குக் கஷ்டங்களையும் தொந்தரவுகளையும் ஏற்படுத்திவிட்ட நிலைமைக்குப் பரிகாரம் தேடும் நடவடிக்கைகளுக்கான உத்தேசங்களைத் தெரி விப்பது ஒருபுறமிருக்க, நாளாந்த வாழ்க்கை யின் அத்தாவசியப் பொருட்களில் இவ்வாறான உயர்ந்த வாசிகள், பற்றாக் குறைகள் என்ற நிலைமை பற்றிக் குறிப்பிடத்தானுமில்லை என்பதாலும்,

(ஆ) பல்லாயிரக்கணக்கான சிரேட்ட தராதரப் பத்திரம் பெற்றவர்கள் பல்கலைக்கழகப் பட்டதாரிகள் உட் பட பல இலட்ச மக்களுக்கு மனச்சோர்வும் மனச் சலிப்பும் ஏற்படுத்திச் சோம்பல் நிறைந்த வாழ்க்கைக்கு அவர்களைத் தீர்த்திருக்கும் வளர்ந்துவரும் வேலையின்மைப் பிரச்சினை பற் றித் தொடு கூற்று ஒன்றுதானும் கூறத் தவறிவிட்டபடியாலும்,

(இ) பல்வேறு வழிகளில் தனிப்பட்ட எதிரிகள் மீதும் அரசியல் எதிரிகள் மீதும் பழி வாங்குவதற்குப் பயன்படுத்தப்பட்டு வருவதும் இந்த அரசாங்கத் தின் பதவிக்காலத்தின் இரண்டரை வருடங் களுக்கும் மேலாக நீடித்திருப்பதும் நியாய மற்றதுமான அவசரகால நிலையை அகற்றுவ தற்கான நோக்க மெதையும் அரசாங்கம் கொண்டிருக்கவில்லை என்பதை எடுத்துக் காட்டு வதாலும்.

(ஈ) ஐக்கிய தேசியக் கட்சியினதும் இலங்கைத் தமிழ் அரசுக் கட்சியினதும் தலைவர்களிடையே 1965, மார்ச் மாதம் இரகசியமாக ஏற்பட்ட ஒப்பந்தத் தின் நிபந்தனைகளை நிறைவேற்றுவதைக் கைவி டும் உத்தேசம் அரசாங்கத்திற்கு இல்லையென் றும் இத்தகைய நடவடிக்கைகளில் மிகப்பிந்திய தான மாவட்ட சபைகள் நிறுவும் முயற்சிக்குப் பொது மக்கள் பரந்த அளவில் எதிர்ப்பு காட்டி யுங்கூட மேலும் இத்தகைய துரோகமான ஒப்பந் தத்தை நிறைவேற்றுவது இலங்கையின் ஒற்று மையையும் தேசிய ஒருமைப்பாட்டையும் பயமு றுத்தியும் அரசகரும மொழியின் நிலையைப் பல வீனப் படுத்தியும், வடக்கு, கிழக்கு மாகாணங்க ளுக்கு வெளியேயுள்ள தமிழரல்லாத குடி மக் கள் இம்மாகாணங்களில் அரசாங்கம் வழங்கும், காணிகள் பெறும் உரிமையை மறுத்து வருவ தாயிருந்துங்கூட இம்முயற்சியைக் கைவிடும் நோக்கமில்லையென்றுங் காட்டுவதாலும்,

(உ) பல்வேறு நிருவாகப் புனரமைப்புக்கள் மூலம் பல்கலைக்கழகம் தொட்டு கீழ்ப்படிகள் வரையி லான கல்வித் திட்டத்தில் குழப்ப நிலையை ஏற்படுத்துவதன் மூலம் இலவச கல்வித்திட்டத் தைக் கட்டுப்படுத்திப் பலவீனப் படுத்தும் முயற் சியைக் கைவிடும் நோக்கத்தை வெளிப்படுத் தாததாலும்,

(ஊ) வெளிநாட்டு விவகாரங்களில் கட்சி சேராக்கொள் கையிலிருந்து அடிக்கடி கள்ளத்தனமாக விலகி நடப்பதை நிறுத்திக்கொள்ளும் நோக்கம் அர சாங்கத்துக்கு உண்டென்பதைக் காட்டாததாலும்,

(எ) நீதி மன்றங்களில் அரசகரும மொழியைப் புகுத்து வதை ஆரம்பிப்பதற்கான எந்தவொரு உத்தே சத்தைத் தானும் கொண்டிருக்காதபடியாலும்,

(ஏ) தமக்கு இழைக்கப்படும் பல்வேறு விதமான பாரபட்சமும் அவமரியாதையும் நிறுத்தப்பட்ட வேண்டுமென்று கோரிக்கொண்டிருக்கும் சிறு பான்மைத் தமிழரைக் குறிப்பாக உள்ளடக்கி, சாதியின் அடிப்படையில் சமூக சமத்துவம் மறுக்கப்பட்டிருப்பவர்களைப் பாதுகாப்பதற்கு வலு மிகுந்ததும் கூடியபயன்பயப்பதுமான வகையில் 1957 ஆம் ஆண்டின் சமூகக் குறைபாட்டுச் தடுப்புச் சட்டத்தை திருத்தும் உத்தேசம் கொண்டிருக்காதபடியாலும்,

(ஐ) இலங்கையின் தொழிற் சங்க இயக்கத்தின் மிக பரவலான பகுதியினரால் கண்டிக்கப்பட்ட ஜய வர்த்தனக் குழுவின் பிற்போக்கானதும், பக்கச் சார்ந்ததுமான அறிக்கையின் அடிப்படையில், அரசாங்கம் தனது பொதுவான தொழிற் சங்கக் கட்டளைச் சட்டத்துக்குத் திருத்தங்கள் கொண்டுவர உத்தேசித்திருப்பதாகக் காட்டுவ தாலும்,

(ஒ) உணவு உற்பத்தி இயக்கத்தில் அரசாங்கம் பெரிது படுத்திக் காட்டும் தனது வெற்றிகளை நுகர் வாளர்க்குக் கிடைக்கும் உள்ளூரில் விளைந்த உணவுப் பொருட்களின் தொகை அதிகரிப்பின்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

மூலமோ அவற்றின் விலைகளில் குறிப்பிடக் கூடிய இறக்கத்தின் மூலமோ காணக்கூடியதா யில்லை என்ற உண்மையை கணக்கிற்கொள்ளத் தவறுவதாலும்,

(ஓ) இந்த அரசாங்கத்தின் குறிப்பான, அபகீர்த்தி நிறைந்த அம்சமாயிருக்கும் அரசியற் பாரபட்சம், ஊழலைச் சகித்தல், அரசியல் எதிரிகளையும் தனிப்பட்ட எதிரிகளையும் உத்தியோக தோரணையில் துன்புறுத்தல் ஆகியவற்றைக் கைவிடும் நோக்கமுண்டென்று காட்டாதிருப்பதாலும்,

மேன்மைதங்கிய தங்கள் அரசாங்கத்தில் எமக்கு நம்பிக்கையில்லை." [திரு. இலங்கரத்ன]

"but inasmuch as Your Excellency's Government, despite the ever-growing public opposition to its policies and distrust of its intentions that have been manifested in various ways including in the results of parliamentary by-elections and local government elections, has given no indication that it intends to change in any way the basic anti-democratic and reactionary policy that it has followed since it assumed office and which has resulted in the sacrifice of the vital interests of the people of Ceylon to those of foreign imperialism and its local agents and supporters,

and as the Address shows that the Government seeks to hide behind a collection of miscellaneous administrative details its fundamental inability to evolve a positive and comprehensive policy to deal with the growing economic crisis and other problems of the people,

and moreover as the Address is full of political evasions and double-talk on most matters of urgent national importance and indicates that the main consideration that animates Your Excellency's Government is to find ways and means to cling on to office for as long as possible, while seeking to escape from the inevitable consequences of its own broken promises, opportunistic manoeuvres and reactionary policies, and in particular as the Address—

(*a*) does not even mention the high prices and scarcities of essential goods in everyday use, let alone propose any steps to remedy this situation which has brought about great difficulties and hardships for the people;

(*b*) fails to make even a passing reference to the ever-growing problem of unemployment, which condemns several lakhs of persons including tens of thousands of S. S. C. qualified and university-educated young people, to a life of idleness, frustration and despair;

(*c*) reveals no intention on the part of the Government to end the unjustified state of emergency which has existed for over two and a half years of this Government's term of office and has also been used by the Government to inflict vengeance on political and personal opponents in various ways;

(*d*) shows that the Government does not intend to abandon its efforts to implement the terms of the agreement drawn up in secret in March 1965 between the leaders of the United National Party and the Ilankai Thamil Arasu Kadchi, despite the overwhelming public opposition to the latest of these efforts, namely the attempt to establish District Councils, and also despite the fact that the implementation of this nefarious agreement threatens the unity and state integrity of Ceylon, undermines the position of the Official Language, and denies non-Tamil citizens resident outside the Northern and Eastern Provinces any right to obtain land distributed by the State in these provinces;

(*e*) does not disclose any intention by the Government to abandon its efforts to restrict and undermine the free education scheme by various administrative re-arrangements, thereby creating a chaotic situation in the educational system from the universities downwards;

(*f*) does not show that the Government intends to put a stop to its repeated furtive attempts to depart in practice from the policy of non-alignment in external affairs;

(*g*) does not contain any proposal even to begin the introduction of the official language into the courts;

(*h*) does not propose to amend the Prevention of Social Disabilities Act of 1957 in order to make it a stronger and more effective instrument to protect those who are denied social equality on the grounds of the caste to which they belong, and, in particular, the so-called Minority Tamils who are at the moment demanding that the various discriminations and indignities to which they are subject should be ended;

(*i*) indicates that the Government in line with its general anti-trade union policy intends to base its proposals to effect amendments

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

to the Trade Unions Ordinance on the biassed and reactionary report of the Jayawardene Committee which has been condemned by the widest sections of the trade union movement in Ceylon ;

(*j*) fails to take account of the fact that the tall claims made by the Government about the success of its so-called food drive are not reflected in any reduction in the prices or any noticeable increase in the supply to the consumer of locally-grown foodstuffs ; and

(*k*) does not show that the Government intends to give up the political favouritism, tolerance of corruption, and official persecution of political and personal opponents which are a marked and scandalous feature of its regime ;

we have no confidence in Your Excellency's Government "—[*Mr. Ilangaratne.*]

II

" එතෙකුදුවුවත්, දිස්ත්‍රික් සභා පිහිටුවීම පිණිස ව්‍යවස්ථා ඉදිරිපත් නොකරන ලෙස අපි උතුමාණන් වහන්සේගේ රජයෙන් ඉල්ලා සිටිමු. "—[ඉලංගරත්න මයා.]

" எனினும், மாவட்ட சபைகள் அமைப்பதற்குச் சட்டம் கொண்டு வரவேண்டாமென மேன்மை தங்கிய தங்கள் அரசாங்கத்தைக் கேட்டுக்கொள்கிறோம். " [திரு. இலங்கரத்ன]

" but we request Your Excellency's Government not to present legislation to establish District Councils ".—[*Mr. Ilangaratne.*]

III

" එතෙකුදුවුවත්, දැනට ප්‍රංශයෙහි වියට්නාම් යුද්ධය සමතය කිරීමට පවත්වන සාම සාකච්ඡාවල සතුටුදායක ප්‍රතිඵල ලැබිය හැක්කේ පළමුකොට අමෙරිකානු එක්සත් ජනපදය වියට්නාම් ප්‍රජාතන්ත්‍රවාදී ජන රජයට බෝම්බ දැමීම ආදී ආක්‍රමණික ක්‍රියා වහාම නවතා දකුණු වියට්නාමයෙන් තම සන්නාහ සන්නද්ධ හමුදා අස්කර ගැනීමට සතුට ප්‍රකාශ කළහොත් පමණක් බව අපගේ හැඟීමයි. "—[ඉලංගරත්න මයා.]

" ஆனால், ஐக்கிய அமெரிக்க இராச்சிய அரசாங்கம் வியட்நாம் ஜனநாயகக் குடியரசுக்கு எதிராகக் குண்டு வீசுவதையும், ஏனைய பகைமை நடவடிக்கைகள் மேற்கொள்வதையும் முதலில் நிறுத்தி, தென் வியட்நாமிலிருந்து ஆயுதப் படைகளை வாபஸ் பெறுவதற்கு அது ஆயத்தமாக இருக்கிறதென்பதையும் தெரிவிக்குமேயானல் வியட்நாம் யுத்தம் பற்றி இப்பொழுது பிரான்சில் நடைபெறுகின்ற பேச்சுவார்த்தைகளில் மிக திருப்திகரமான முன்னேற்றம் காணமுடியுமென்பது எமது அபிப்பிராயமாகும். " [திரு. இலங்கரத்ன]

" but it is our view that the talks now taking place in France in regard to the war in Vietnam can make most satisfactory progress if in the first instance the Government of the United States of America stops its bombing and other hostile acts against the Democratic Republic of Vietnam and also expresses its readiness to withdraw its armed forces from South Vietnam ".—[*Mr. Ilangaratne.*]

IV

" එසේ වූවද, හය වෙනි පාර්ලිමේන්තුවේ හතර වැනි සැසි වාරය විවෘත කරමින් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් කරන ලද කථාව පිළිබඳව පහත දැක්වෙන කරුණු නිසා මගේ කණගාටුව පළ කරමි :—

(අ) ඊනියා නිදහස ලැබී විසි වසරක් ගත වීත් අපේ ආර්ථිකය මත අද මේ වනතුරුත් විදේශික අධිරාජ්‍යවාදයේ ඇති ග්‍රහණය පිළිබඳවත්, මෙම ආණ්ඩුව විසින් අපේ ආර්ථිකය විදේශික අධිරාජ්‍යවාදයේ ග්‍රහණයට වඩා තදින් බැඳීමට දිගින් දිගටම ගත් පියවරවල් ගැනවත්, කිසිවක් සඳහන් නොවීම ;

(ආ) පසුගිය අවුරුද්දේ හාල් සලාකයෙන් අඩක් කපා දැමීමටද, දෙවරෙක රුපියලේ අගය අඩු කිරීමටද, හේතුවූ, දැනට පවත්නා මහ ආර්ථික අර්බුදය එනම් 1929-31 අර්බුදයෙන් පසුව ඇතිවූ බරපතලම අර්බුදය ගැන හා ඉහත කී පියවරවල් ගැන්ම නිසා ජීවන වියදම අහස උසට නැගීම හා ඇතිවූ පාරිභෝගික භාණ්ඩ හිඟය ගැන නිවැරදි විග්‍රහයක් එහි නොමැතිවීම ;

(ඇ) ජීවන වියදම පහළ බස්වා ජන සමූහයන්ට සහනය සැලසීමට හෝ බරපතල ප්‍රමාණයන්ට වැඩී ඇති උග්‍රවන රැකියා ප්‍රශ්නය විසඳීමට හෝ කිසිදු යෝජනාවක් එහි නොවීම ;

(ඈ) දරිය නොහැකි අන්දමින් ජීවන වියදම ඉහළ යැමත්, ඒ හේතුවෙන් ජීවන තත්ත්වයන් පහළ වැටීම නිසා අසීරු තත්ත්වයකට මුහුණ පා සිටින කම්කරුවන්ට, ගොවීන්ට හා මැද පංතීන්ට සහනය සැලසීම සඳහා කිසිදු යෝජනාවක් අඩංගු නොවීම ;

(ඉ) 1967 හා 1968 වාර්තා බිඳ හෙළන අස්වැන්න ලැබුවායයි කයිවාරු කීවද, ආහාර වගාව දියුණු කිරීම සඳහා වන ආණ්ඩුවේ ව්‍යාපාරය සාර්ථක බව කියා පෑවද, කැපූ හාල් සලාකය නැවත ලබාදීමට කිසිදු යෝජනාවක් අඩංගු නොවීම ;

(ඊ) මෙම ආණ්ඩුව බලයේ සිටි මාස 39කින්, මාස 30ක් තිස්සේම පවත්වා ගෙන යන හදිසි අවස්ථාව ඉවත් කිරීමට හා ජනතාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් නැවත ලබාදීමට කිසිදු යෝජනාවක් අඩංගු නොවීම ;

(උ) අප නිර්යාත වැවිලි එකක් දෙකක් මත සම්පූර්ණයෙන්ම යැපීමෙන් මුදාගනු වස්, අපේ ආර්ථිකය විවිධාකාර කිරීම උදෙසා මේ රටේ වේගවත් කර්මාන්තමය කිරීමකට භාජනය කිරීම සඳහා කිසිදු ක්‍රමානුකූල සැලැස්මක් ඒ තුළ නොවීම ;

(ඌ) ලංකාව ආහාර අතින් ස්වයංපෝෂිත වීමේ ප්‍රගති මාර්ගයට එකම විශාලතම බාධකය වී ඇති කෘෂිකර්මය සඳහා වාරිමාර්ග පහසුකම් හීනවීමේ ප්‍රශ්නය විසඳාලීම උදෙසා විදේශීන් සතු තේ වතු පවරාගෙන, කඳු මුදුන් නැවත වනගත කිරීමෙන් පස සෝදා යෑමේ ප්‍රශ්නය විසඳාලීමටද, තැනිතලා බිම්වල ගොවිතැන් කරන්නන්ගේ ප්‍රයෝජනය සඳහා, නාස්තියකින් තොරව වැහි ජලය ගෙන යෑම පිණිස අපේ ගංගා හාරා ගැඹුරු කිරීමටද, කිසිදු යෝජනාවක් එහි අඩංගු නොවීම ;

(එ) සමාජ අවහිර වැළැක්වීමේ පනත ක්‍රියාවේ යෙදවීමට හෝ උතුරු ලංකාවේ පවත්නා ස්පර්ශ නොකිරීමේ නින්දිත තත්වය හා කුල පීඩනය මුලිනුපුටා දැමීමට ආණ්ඩුව ඕනෑකමක් දක්වන බවක්වත් එයින් ප්‍රකාශ නොවීම ;

(ඒ) මේ රටේ අධ්‍යාපනය හා සමාජ ක්‍රමයේ මූලික වෙනසක් ඇති කිරීමට ශිෂ්‍යයින්ගේ සිත් යොමු කර ඇති, ඔවුන් තුළ ඇති කළ කිරීමට හේතු භූත වූ ප්‍රශ්නයන් වන, දේශන ශාලා නැතිකම, ප්‍රමාණවත් ආචාර්ය මණ්ඩලයක් නොවීම, ප්‍රමාණවත් පුස්තකාල පහසුකම් හා දුප්පත් සිසුන්ට අවශ්‍ය ශිෂ්‍ය ආධාර නොගෙවීම, විභාග ගාස්තු වැඩි කිරීම, විශ්ව විද්‍යාලවල උපකුලපතිවරුන් ලෙස ශාස්ත්‍රීය අංශයෙන් සුදුසුකම් නැති පරිපාලකයින් පත් කිරීම ආදී ප්‍රශ්නවලට කිසිදු සහනයක් එහි අඩංගු නොවීම ;

(ඔ) මෙම ආණ්ඩුව විසින් ඇති කළේය කියන බොරු ජාතික සමගිය—එනම් ඇත්ත වශයෙන්ම දෙමළ සිංහල දෙජාතීන්ගේ ජන සමූහයන් අතර නොව, ඔවුන් අතර ප්‍රතිගාමී බල වේගයන්ගේ සමගියක් පමණක් වන සමගිය හෙළිදරව් කළාවූ, ආණ්ඩුව ප්‍රතිගාමී ෆෙඩරල් පක්ෂය සමග ඇති කර ගත් රහස් ගිවිසුම, ගරු කිරීමට යාමෙන් රටේ ඇති වූ අසමගිය ගැන සඳහනක්වත් එහි නොවීම ;

(ක) පසුගිය අවුරුදු 37 තිස්සේම පැවතියද, අදත් මේ රට මත ඇති අධිරාජ්‍යවාදී—ධනවාදී සූරාකෑමේ ක්‍රමය මදකුදු වෙනස් නොකළාවූද, කපටි බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් අප මත බලහත්කාරයෙන් පටවන ලද්දා වූද, ධනේශ්වර පාර්ලිමේන්තු ක්‍රමයේ බංකොලොත් භාවය පෙන්නුම් කර දීම නොසලකා හැරීම ;

(ඛ) එක්සත් ජනපද අධිරාජ්‍යවාදය, වියට්නාම ජනතාවට එරෙහිව කරන ආක්‍රමණය ගැන මේ රටේ ජනතාව දරන මතය වන, එක්සත් ජනපද හා ඔවුන්ගේ පරිවාර හමුදා සම්පූර්ණයෙන්ම වියට්නාමයෙන් ඉවත් විය යුතුය ; ඔවුන්ගේ සියලු කඳවුරු දකුණු වියට්නාමයෙන් ඉවත් කළ යුතුය ; ප්‍රජාතන්ත්‍රවාදී උතුරු වියට්නාම් ජනතාවට එරෙහිව කරන බෝම්බ දැමීම සම්පූර්ණයෙන් අත් හිටුවිය යුතුය ; තම අනාගතය තීරණය කිරීමට වියට්නාම ජනතාවටම බාර දිය යුතුය ; යන ඉල්ලීම් එයින් කිසිදු අයුරකින් ප්‍රකාශ නොවීම ;

(ග) අමෙරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ඔත්තු සේවාවේ (සී.අයි.ඒ.) අංශයක් ලෙස එළිදරව් වී ඇති දුර්ජන සාම හමුදාවට මේ රටට නැවත පැමිණෙන්නට අවසර දීමෙනුත්, අපගේ ජනතාවට එරෙහිව යටිකුට්ටු වැඩවල යෙදීම සඳහා අමෙරිකන් අධිරාජ්‍යවාදීන්ගේ "හෝප් නැවට" කොළඹ වරායේ නැංගුරම් දමාගෙන සිටීමට අවසර දීමෙනුත් පෙන්වා දෙන පරිදි, එම ආණ්ඩුව එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ අණ පරිදි ක්‍රියා කරන්නේය යන සත්‍ය තත්වය පැහැදිලි කිරීමට අපොහොසත් වීම ආදිය නිසාය.

එම නිසා මෙම සභාව ඔබේ ආණ්ඩුව කෙරෙහි කිසිදු විශ්වාසයක් නැති බව ප්‍රකාශ කර සිටින්නිය."— [එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

"எனினும், ஆறுவது பாராளுமன்றத்தின் நான்காவது கூட்டத் தொடரின் ஆரம்பத்தின்போது மேன்மை தங்கிய தாங்கள் நிகழ்த்திய உரையில்—

(1) இருபது வருடங்களாகச் சுதந்திரம் அடைந்திருக்கின்றோம் என்று கூறப்பட்ட போதிலும், எமது பொருளாதாரத்தில் அந்நிய ஏகாதிபத்தியம் தொடர்ச்சியாக வகித்துவரும் இறுக்கமான பிடிப்பைப் பற்றியோ அந்நிய ஏகாதிபத்தியத்தின் தேர்ச்சில்லில் எமது நாட்டுப் பொருளாதாரத்தை விலக முடியாதபடி இறுக்கமாக இணைப்பதற்கு இவ்வரசாங்கத்தால் அடுத்தடுத்து எடுக்கப்பட்ட நடவடிக்கைகள் பற்றியோ குறிப்பிடாததையிட்டும்,

(2) எமது பாங்கீட்டரிசியைப் பாதியாக குறைத்துள்ளதற்கும், சென்ற ஆண்டு இரு முறைகள் ரூபாவின் மதிப்பைக் குறைந்துள்ளதற்கும் அதன் காரணமாக வாழ்க்கைச் செலவு வானளாவ உயர்ந்துள்ளதற்கும், அத்தியாவசியப் பொருட்களுக்குத் தட்டுப்பாடு ஏற்பட்டுள்ளதற்கும் காரணமான, குறிப்பாக, 1929–31 ஆம் ஆண்டு முதல் எமது நாட்டை எதிர்நோக்கியுள்ள

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

மிகவும் மோசமான பொருளாதார நெருக்கடி பற்றித் தெளிவான ஆராய்வு இடம் பெருததையிட்டும்,

(3) வாழ்க்கைச் செலவைக் குறைத்து அதன் மூலம் மக்களின் துயரைத் தீர்ப்பதற்கும் மிகவும் உச்சக்கட்டத்தை அடைந்துள்ள வேலையில்லாத் திண்டாட்டத்தைத் தீர்ப்பதற்கும் எத்தகைய ஆலோசனைகளும் இடம் பெருததையிட்டும்,

(4) விலைவாசியின் தாங்கமுடியாத உயர்வு காரணமாக வாழ்க்கைத் தரம் பாதிக்கப்பட்டுள்ள தொழிலாளர்கள், விவசாயிகள், நடுத்தர வர்க்கத்தினர் ஆகியோருக்கு நிவாரணமளிப்பதற்குமான எத்தகைய ஆலோசனைகளையும் குறிப்பிடாததையிட்டும்,

(5) 1967, 1968 ஆம் ஆண்டுகளில் அதிக விளைச்சல் எனத் தம்பட்டமடித்த போதிலும் உணவு உற்பத்திப் பெருக்கத்துக்கான அரசாங்கத்தின் நடவடிக்கைகள் பூரணமாக வெற்றியளித்துள்ளது என்று பெருமையடித்துக் கொள்ளும் அதே நிலையிலும் வெட்டிய அரிசியை மீண்டும் மக்களுக்குக் கொடுப்பது சம்பந்தமாக எதுவும் குறிப்பிடாததையிட்டும்,

(6) இந்த அரசாங்கம் பதவியிலிருந்து முப்பத்து ஒன்பது மாதங்களில், முப்பது மாதங்களாக இருந்துவருகின்ற அவசரகால நிலைமையை அகற்றி மக்களுடைய ஜனநாயக உரிமைகளை மீண்டும் பெறச் செய்வதற்கான எத்தகைய திட்டத்தையும் குறிப்பிடாததையிட்டும்,

(7) இரண்டொரு ஏற்றுமதிப் பொருட்களில் மாத்திரம் தங்கியிருக்கும் எமது பொருளாதாரத்தைப் பலவகைப்பட்ட பொருளாதாரமாக மாற்றுவதற்கேதுவாகத் துரிதமான கைத்தொழில் வளர்ச்சியை ஏற்படுத்துவதற்கான சரியான திட்டமிடப்பட்ட பொருளாதாரத்தை நிறைவேற்றுவதற்கான பிரேரணை எதையும் குறிப்பிடாததையிட்டும்,

(8) எமது நாட்டுச் சமதரைகளில் வாழ்கின்ற விவசாயிகளுக்குப் பயன்தரத்தக்கதாக விலைமதிப்பற்ற மழை நீரைக் கொண்டு செல்லக்கூடிய விதத்தில் எமது ஆறுகளை அவற்றிலுள்ள சேறுகளை அகற்றி ஆழமாக்கி, அந்நியர்களுக்குச் சொந்தமான தேயிலைத் தோட்டங்களைத் தேசியமயமாக்கி, மலை உச்சிகளில் காடு வளர்த்து மண் அரிவைத் தடுத்து, எமது நாட்டு உணவுத் தேவையைப் பூர்த்திசெய்வதற்கான வளர்ச்சிக்கு பெருந் தடையாயிருக்கக்கூடிய நீர்ப்பாசன வசதியின்மையை இல்லாமல் செய்து எமது விவசாயப் பிரச்சினையைத் தீர்ப்பதற்கான எத்தகைய திட்டத்தையும் குறிப்பிடாததையிட்டும்,

(9) சமூகக் குறைபாட்டுத் தடுப்புச் சட்டத்தை அமுல் செய்வதற்கோ, வட இலங்கையில் நிலவி வருகின்ற இழிவான தீண்டாமைக் குறையை ஒழிப்பதற்கோ அரசாங்கம் சற்றேனும் உறுதிகொண்டிருப்பதாக எடுத்துக்காட்டத் தவறியதையிட்டும்,

(10) விரிவுரை அறைகள் போதாமை, போதிய ஆசிரியர்கள் இல்லாமை, போதிய நூல்நிலைய வசதிகள் இல்லாமை, உதவிப்பணம் தேவையான மாணவர்களுக்கு அது போதியளவு இல்லாமை, பரீட்சைக் கட்டணத்தை உயர்த்தியமை, பல்கலைக் கழகத் துறையில் அனுபவமில்லாத நிருவாகிகளைப் பல்கலைக் கழகங்களில் துணை வேந்தர்களாக நியமித்தமை, ஆகிய காரணங்களினால் பெரிதும் ஏமாற்றமடைந்து இந்நாட்டின் கல்வித்துறையிலும் சமூக அமைப்பிலும் பூரணமான, தீவிரமான ஒரு மாற்றத்தை ஏற்படுத்த வேண்டுமென்ற எண்ணத்தைக் கொண்டுள்ள மாணவர்களை எதிர்நோக்கியுள்ள பிரச்சினைகளுக்கு எவ்வித தீர்வையும் காட்டத் தவறியதையிட்டும்,

(11) இந்நாட்டின் சிங்கள, தமிழ் மக்களிடையே ஐக்கியத்தை ஏற்படுத்தாது சிங்களவர் தமிழர் மத்தியிலுள்ள பிற்போக்குச் சக்திகளிடையே மாத்திரம் ஐக்கியத்தை ஏற்படுத்தி இவ்வரசாங்கம் தம்பட்டமடிக்கின்ற போலித் தேசிய ஐக்கியத்தை அம்பலப்படுத்துகின்ற விதத்தில் பிற்போக்குத் தமிழரசுக் கட்சிக்கு அரசாங்கத்தாலளிக்கப்பட்ட இரகசிய வாக்குறுதிகளை நிறைவேற்றும் முயற்சியில் இந்நாட்டில் ஏற்படுத்திய ஐக்கியமின்மையைப் பற்றிக் குறிப்பிடாததையிட்டும்,

(12) தந்திரசாலியான பிரித்தானிய ஏகாதிபத்தியம் எம்மீது திணித்துள்ள திறனற்ற முதலாளித்துவ பாராளுமன்ற ஜனநாயகம் கடந்த முப்பத்தேழு வருடகாலமாக இருந்துங்கூட எமது நாட்டில் இன்றுவரை சிறுதும் குறையாது தொடர்ந்து இருந்துவரும் ஏகாதிபத்திய முதலாளித்துவ சுரண்டல் முறையைப் பற்றி எதுவும் குறிப்பிடாததையிட்டும்,

(13) வியட்நாம் மக்கள் தமது எதிர்காலத்தை தாமே தீர்மானித்துக்கொள்வதற்கு அனுமதிப்பது, அமெரிக்க ஏகாதிபத்தியம் வியட்நாம் மக்கள்மீது தேவையற்ற ஆக்கிரமிப்பு நடத்துவது, அமெரிக்காவின் கூலிப்படைகளை வாபஸ் வாங்குவது, தென் வியட்நாமிலிருந்துஅவர்களின்தளங்களை அகற்றுவது வட வியட்நாம் ஜனநாயகக் குடியரசுமீது நடத்தும் குண்டுவீச்சைப் பூரணமாக நிறுத்துவது ஆகிய பிரச்சினைகள் சம்பந்தமாக எமது நாட்டு மக்களின் விருப்பத்தைப் பிரதிபலிக்கத் தவறியதை யிட்டும்,

(14) அமெரிக்காவின் மத்திய உளவு ஸ்தாபனத்தின் ஓர் அங்கமாக அம்பலப்படுத்தப்பட்ட பிரசித்தி பெற்ற அமெரிக்க சமாதானப் படையை மீண்டும் எமது நாட்டுக்கு வருவதற்கு அனுமதியளித்ததாலும், எமது நாட்டு மக்களுக்கு எதிராக நாசகார வேலையில் ஈடுபடுவதற்கு அமெரிக்க ஏகாதிபத்தியத்தின் "ஹோப்" கப்பலைக் கொழும்புத் துறைமுகத்துக்குவர அனுமதியளித்ததாலும் அமெரிக்க ஏகாதிபத்திய உத்தரவுகளுக்கு இந்த அரசாங்கம் அடிமைப்பட்டிருக்கின்றதென்றும் உண்மையைக் குறிப்பிடத்தவறியதையிட்டும் வருந்துகிறோம்.

எனவே இச்சபைக்கு தங்கள் அரசாங்கத்தில் நம்பிக்கையில்லை." —(திரு. எஸ். டி. பண்டாரநாயக்க)

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

"but regret that Your Excellency's Address at the opening of the Fourth Session of the Sixth Parliament—

(*a*) does not contain any reference to the continued stranglehold exercised on our economy by foreign imperialism despite twenty years of socalled independence ; nor to the successive steps taken by this Government to chain our economy ever more securely to the chariot wheels of foreign imperialism ;

(*b*) does not contain a correct analysis of the economic crisis—the most serious since 1929-31—that has overtaken our country and that has led to halving of the rice ration and the devaluation of the rupee on two occasions during the last year and to the consequent fantastic rise in the cost of living and the non-availability of many essential consumer goods ;

(*c*) does not contain any proposals to bring down the cost of living and afford relief to the masses or to solve the mounting problem of unemployment which has assumed serious proportions ;

(*d*) does not contain any proposals to afford relief to the workers and peasants and to the middle classes who have been badly affected by the unbearable rise in the cost of living and whose standards of living have been lowered as a consequence ;

(*e*) does not contain any proposal for the restoration of the rice-cut despite the boast of repeated record harvests for 1967 and 1968 and alleged successes of the Government's campaign to increase food production ;

(*f*) does not contain any proposal to lift the State of Emergency, which has now lasted for thirty months out of the thirty-nine months during which this Government has been in power, and to restore the democratic rights of the people ;

(*g*) does not contain any systematic plan for the rapid industrialization of our country, with a view to diversifying our economy and free us from complete dependence on one or two export crops ;

(*h*) does not contain any proposals for solving the problem of lack of irrigation facilities for agriculture, which is the single biggest stumbling block in the path of Ceylon's progress to self-sufficiency in food, by nationalizing the foreign owned tea estates, re-foresting the hill-tops and solving the problem of soil erosion, dredging and deepening our rivers and enabling our rivers to carry the precious rain water, without waste, to the cultivators in the plains ;

(*i*) does not reflect any determination on the part of the Government to enforce the Prevention of Social Disabilities Act or to help in the eradication of the obnoxious system of untouchability and caste oppression that prevails in North Ceylon ;

(*j*) does not contain any relief to the problems facing the students, such as lack of lecture rooms, inadequate tutorial staff, insufficient library facilities, inadequate bursaries for needy students, the imposition of higher examination fees, appointment of non-academic administrators as vice-chancellors of universities, all of which have combined to create a sense of frustration among the students who have expressed a desire for a complete and radical change in the educational and social structure of this country ;

(*k*) does not refer to the disunity caused in the country by the attempt of the Government to honour its secret pledges to the reactionary Federal Party and which exposed the sham national unity that this Government claimed to have built—which unity was in fact only a unity between the reactionary forces among the Sinhalese and Tamils and not between the masses of both peoples ;

(*l*) neglects to point out the bankruptcy of bourgeois parliamentary democracy which was imposed on us by the cunning British imperialists and which, during the past 37 years, has brought no change in the system of imperialist-capitalist exploitation which continues unabated to this day ;

(*m*) does not reflect the wishes of the people of this country on the question of the unwarranted aggression of U. S. imperialism against the people of Vietnam by demanding the immediate withdrawal of U. S. and satellite troops and the disbandment and removal of their bases from South Vietnam, the complete cessation of all bombings of the Democratic Republic of Vietnam

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

and allowing the Vietnamese people to decide their future by themselves;

(*n*) does not reflect the truth of the subjection of this Government to the dictates of U. S. imperialism which was demonstrated by the permission given to the notorious U. S. Peace Corps, which has been exposed as an arm of the Central Intelligence Agency of the U.S.A., to return to Ceylon and the permission granted to the U.S. imperialist ship 'Hope' to dock in Colombo harbour and engage in subversive activities against our people;

and therefore this House has no confidence in your Government ".—[*Mr. S. D. Bandaranayake.*]

V

"එතකුදු වුවත්, රට සභා පිළිබඳ විෂයෙහි,—

(අ) ද්‍රවිඩ මුන්නේත්‍ර කඝගම් (අපි දෙමළු) පක්ෂය වැනි දේශද්‍රෝහී දේශපාලන සංවිධානවල ශාඛා පිහිටුවීම සහ එම සංවිධානයේ බලය වැඩි දියුණු කරවීමට හා සංවිධානාත්මක ක්‍රියා මාර්ග ඉදිරියට ගෙන ඒමත් සහ ප්‍රචාරක කටයුතු දියුණු වීමට ඉඩ ප්‍රස්තාව දීමෙන් ද ඉහත කී සංවිධාන තහනම් නොකිරීමෙන් ද මේ රටේ ස්වෛරීතාවට තර්ජනයක් බවට පරිවර්තනය වී තිබියදීත්,

(ආ) ෆෙඩරල් පක්ෂයේ (දෙමළ රාජ්‍යයේ) එකම පරමාර්ථය වෙනම දෙමළ රාජ්‍යයක් පිහිටුවීමය යනුවෙන් ප්‍රසිද්ධ ප්‍රකාශන මැතිසබයේ දී පවා කියා තිබියදීත් අද වනතෙක් එම ප්‍රතිපත්තිය අනුගමනය කිරීමෙන් සිංහලයාටද මේ රටේ ඒකීයතාවයට මේ තාක් කල් නොපැවතුන භයානක තර්ජනයක් ෆෙඩරල් පක්ෂයෙන් එල්ල වී තිබියදීත්,

(ඇ) කාරතිව් සිට කිරින්ද දක්වා උතුරු නැගෙනහිර වෙරළේ මසුන් මැරීමේ යෙදී සිටින සිංහල ධීවර කාර්මිකයින් හට වෙරළින් 2/3 ප්‍රමාණයක් වාරකන් කාලයේ දී අහිමි වී යෑමේ තර්ජනයක් පවතින නමුදු ද්‍රවිඩ ධීවරයන් හට වාරකන් කාලයේ දී මෙන්ම අනික් කාලයේත් මසුන් මැරීමෙන් ජීවත් වීමට දෙපැත්තකින් ඇති ඉඩකඩ ගැන සලකා සිංහල ධීවරයන්ගේ යහපත තකා ක්‍රියා මාර්ගයක් නොගැනීමෙන් ද,

(ඈ) සිංහල භාෂාවට හිමි විය යුතුව ඇති ප්‍රමුඛත්වය දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලට දීමෙන් 1956 අංක 33 දරණ රාජ්‍යභාෂා පනතට පටහැණිව උතුරු නැගෙනහිර දෙපළාතේ පාලන කටයුතුවලින් රාජ්‍ය භාෂාව තල්ලු කොට දමා ඇති හෙයින් ද,

(ඉ) උතුරු නැගෙනහිර ප්‍රදේශවල ඇති වගාවට සුදුසු ඉඩම් වගා කිරීම පිණිස ජනපද පිහිටුවීමට ෆෙඩරල් පක්ෂය විසින් පළ කළ විරෝධය මේ රජය පිළිගෙන තිබීමෙන් ද,

(ඊ) නාගදීප සේරුවාවිල වැනි උතුරේත් නැගෙනහිරේත් ඇති ඓතිහාසික බෞද්ධ සිද්ධස්ථානවල ආරක්ෂාවට තර්ජන එල්ල විය හැකි හෙයින් ද,

(උ) රටසභා ඇති කිරීමෙන් හෝ රටසභා ඇති කිරීමේ ප්‍රතිපත්තිය පිළිගෙන ක්‍රියාත්මක කිරීමෙන් හෝ මේතාක් කල් ජීවිත පරිත්‍යාගයෙන් ආරක්ෂා කළාවූත් සදාකල්හිම ආරක්ෂා කළ යුතුව ඇත්තා වූත් රටේ ඒකීය භාවය අහෝසි වී රට දෙකඩ වන බැවින් ද,

කිනම් අයුරකින් හෝ කිනම් නමකින් හෝ මින් ඉදිරියට රටසභා ඇති නොකරන බව උතුමාණන් වහන්සේගේ රජය අවංකව පළ කර නොතිබීම ගැන බලවත් කණගාටුව පළ කරන් නෙමු."—[ආර්. ජී. සේනානායක මයා.]

"எனினும், மாவட்ட சபைகள் சம்பந்தப்பட்ட விடயத்தில்,

(அ) திராவிட முன்னேற்றக் கழக (நாம் தமிழர்) கட்சியைப் போன்ற தேசத்துரோகமான அரசியல் தாபனங்களின் கிளைகளை நிறுவவும், அத்தாபனத்தின் சக்தியை வலுப்படுத்தவும், தாபன ரீதியான நடவடிக்கைகளை எடுக்கவும், பிரச்சார வேலைகள் அபிவிருத்தி செய்யவும் சந்தர்ப்பம் அளித்ததனாலும், மேற்கூறிய தாபனத்தைத் தடைப்படுத்தாததனாலும், இந்நாட்டின் இறைமைக்கு ஆபத்துச் சூழும் தன்மை உருவாகியிருக்கின்ற பொழுதும்,

(ஆ) தமிழரசுக் கட்சியின் (தமிழ் இராச்சியத்தின்) ஒரே இலட்சியம், தனிப்பட்டதான தொரு தமிழ் அரசைத் தாபிப்பதாகும் எனப்பகிரங்கமாக பிரதிநிதிகள் சபையிலும் கூறியிருப்பதோடு, இது நாள் வரை அக்கொள்கையைக் கடைப்பிடிப்பதன் மூலம், சிங்கள மக்களுக்கும், இந்நாட்டின் ஒற்றையாட்சித் தன்மைக்கும், இது காலம் வரை ஏற்படாத பயங்கரமான ஆபத்து தமிழரசுக் கட்சியினால் உருவாக்கப்பட்டிருக்கின்ற பொழுதும்,

(இ) காரைதீவிலிருந்து கிரிந்தை வரை வடக்கு, கிழக்குக் கரையிலே மீன்பிடித் தொழிலில் ஈடுபட்டுள்ள சிங்களக் கடற்றொழிலாளருக்கு, கடற்கரையின் 2/3 பகுதியில், பருவ மழைக் காலத்திலே உரிமையில்லாமற்போகும் நிலையேற்படும் ஆபத்து இருக்கின்ற நேரத்திலேயே, தமிழ்க் கடற்றொழிலாளர்களுக்கு, பருவ மழைக் காலத்திலும், மற்றக்காலத்திலும், மீன்பிடித்துவாழ இருபக்கத்திலும் அமைந்துள்ள வசதிகளைக் கவனத்திற் கொண்டு சிங்களக் கடற்றொழிலாளர்களின் நன்மையைக் கருதி நடவடிக்கை எடுக்காமலிருப்பதனாலும்,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ஈ) சிங்கள மொழிக்கு உரித்தான முதலிடத்தைத் தமிழுக்கும், ஆங்கிலத்திற்கும் அளிப்பதன் மூலம், 1956 ஆம் ஆண்டு 33 ஆம் இலக்க அரசகருமமொழிச் சட்டத்திற்கு முரணுக வடக்கு, கிழக்கு மாகாணங்களில் நிர்வாகத்திலிருந்து அரசகரும மொழியை ஒதுக்கியிருப்பதனுலும்,

(உ) வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள விவசாயத்திற்குத் தகுதியான காணிகளே, விவசாயத்திற்குட்படுத்துவதற்காக குடியேற்றத் திட்டங்களை நிறுவும் விடயத்தில் தமிழரசுக் கட்சியின் எதிர்ப்பை இவ்வரசாங்கம் ஏற்றுக் கொண்டிருப்பதனுலும்,

(ஊ) நயினுதீவு, சேருவாவிலே போன்ற வடக்கிலும் கிழக்கிலுமுள்ள சரித்திரப் பிரசித்தி பெற்ற பௌத்த புனிதத் தலங்ககளின் பாதுகாப்புக்கு ஆபத்து ஏற்படலாமென்பதனுலும்,

(எ) மாவட்ட சபைகளை நிறுவுவதன் மூலமோ, மாவட்ட சபைகளைத் தாபிக்கும் கொள்கையை ஏற்று நடவடிக்கை எடுப்பதன் மூலமோ, இது நாள் வரை உயிர் கொடுத்துக்காக்கப்பட்டு வந்ததும் எக்காலத்தும் பாதுகாக்கப்படவேண்டியதுமான நாட்டின் ஒற்றையாட்சித் தன்மை மறைந்து, நாடு இரண்டு துண்டாகப் பிரியுமாகையினுலும்,

எவ்விதத்திலாவது, எப்பெயரிலாவது, எதிர்காலத்தில் மாவட்ட சபைகளை உருவாக்க மாட்டோமென மேன்மை தங்கிய தங்களது அரசாங்கம் உளத்தூய்மையுடன் வெளியிடாமலிருப்பது குறித்து ஆழ்ந்த கவலையைத் தெரிவிக்கின்ருேம். "—[திரு. ஆர் .ஜி. சேஞநாயக்க].

" but, in the matter of District Councils—

(a) whereas the fact that the setting up of branch institutions of anti-national political organizations such as the (We Tamil) Dravida Munethra Kazagam and the opportunities afforded to them to pursue their activities in this country on an organized scale, and the fact that these institutions have not been proscribed, continue to constitute a threat to the sovereignty of this country ;

(b) whereas the Federal (Tamil State) Party which has publicly stated even in Parliament that its sole objective is the setting up of a separate Tamil State in this country, continues to follow that policy and thus this party constitutes a hitherto non-existent and dangerous threat to the Sinhalese people and also to the unitary character of the country.

(c) whereas steps have not been taken in furtherance of the interests of the Sinhalese fishermen who are engaged in fishing in the Northern and Eastern coasts from



Karativu to Kirinda and who are in danger of losing their right to fish during the monsoon season in two-thirds the coast of Ceylon, while the Tamil fishermen continue to enjoy the right to earn a living both in the North and East as well as elsewhere in Ceylon ;

(d) whereas the official language has been pushed out of the work of administration in the Northern and Eastern Provinces, with the Tamil and English languages being given the primacy due to the Sinhalese language contrary to the provisions of the Official Language Act No. 33 of 1956 ;

(e) whereas the Government has given in to the opposition expressed by the Federal Party over the establishment of colonization schemes for the purpose of bringing arable land in the North and East under cultivation ;

(f) whereas the security of the historic Buddhist places of worship in the North and the East, such as Nagadipa and Seruvavila, can be endangered ;

(g) whereas the establishment of District Councils or the acceptance and implementation of the policy of establishing District Councils, while destroying the unitary character of the country which to this day has been defended with the very lives of the people and which has to be defended for ever, will also divide the country ;

this House regrets that Your Excellency's Government has failed to state unequivocally that it will not establish District Councils in any form or name whatsoever. "—[*Mr. R. G. Senanayake.*]

VI

" එතකුදු වුවත්, ජීවන වියදම පිළිබඳ විෂයෙහි,—

(අ) දිනෙන් දින ඉහළ නගිමින් පවත්නා ජීවන වියදම නියත වශයෙන් පහත හෙළීමට ඇති එක් පියවරක් හැටියට පිළිගෙන, නිදහස් වූ ආර්ථික සංවර්ධන ක්‍රමයක් මෙරටෙහි ඇති කර ගනු පිණිසත්,

(ආ) විදේශික ජාවාරම්කාරයින් අතර පවත්නා වෙළඳ උපක්‍රම මැඩලීමෙන් සිංහල ජනතාවගේ නියම අයිතිවාසිකම් රැක දෙනු පිණිසත්,

(ඇ) මෙම දේශද්‍රෝහී ජාවාරම්කාරයන් හට ඔවුන්ගේ ඕනෑ එපාකම් අනුව අවශ්‍ය වූ අවස්ථාවලදී ජීවන අංකය ඉහළ පහළ යැවීමට බැරි වන පිණිසත්,

(ඈ) භයානක ලෙස පිට රටට ඇදෙන ජාතික ධනය මෙහිම රඳවාගනු පිණිසත්,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ඉ) ඉන්දියානුවන් ප්‍රධාන අනිකුත් විදේශික ධන කුවේරයන් විසින් උදුරා ගෙන තිබෙන අපගේ වෙළඳ බලය යළිත් ආපසු ලබා ගැනීම පිණිසත්,

වෙළඳාම ලාංකික කිරීමට උතුමාණන් වහන්සේගේ රජය ක්‍රියා කොට නොතිබීම ගැන බලවත් ලෙස කණගාටුව පළ කරන්නෙමු."—[ආර්. ජී. සේනානායක මයා.]

" எனினும், வாழ்க்கைச் செலவுபற்றிய விஷயத்தில்

(அ) நாள்தோறும் ஏறிக்கொண்டேபோகும் வாழ்க்கைச் செலவை நிரந்தரமாகக் குறைப்பதை ஒரு நடவடிக்கையாக ஏற்றுக் கொண்டு சுதந்திரமான பொருளாதார அபிவிருத்தித் திட்டமொன்றை இந்நாட்டில் ஏற்படுத்துவதற்காகவும்,

(ஆ) வெளிநாட்டு வியாபாரிகளிடையே உள்ள வியாபாரச் சூழ்ச்சிகளை முறியடிப்பதன் மூலம் சிங்கள மக்களின் சரியான உரிமையைப் பாதுகாத்துக்கொடுக்கவும்,

(இ) இத்தேசத்துரோசி வியாபாரிகளுக்கு அவர்களின் விருப்பு வெறுப்பின்படி அவசியமான சந்தர்ப்பங்களில் வாழ்க்கைப் புள்ளியை மேலும் கீழுமாக்க இயலாமற் செய்யவும்,

(ஈ) பயங்கரமாக வெளியேறும் தேசிய செல்வத்தை இங்கேயே தங்கச் செய்யவும்,

(உ) பிரதானமாக இந்தியர் உட்பட, ஏனைய அந்நிய செல்வந்தர்களினல் பறிக்கப்பட்டுள்ள எங்களுடைய வர்த்தக அதிகாரத்தை மீண்டும் பெற்றுக் கொள்ளவும்,

வர்த்தகத்தை இலங்கையர் மயமாக்க மேன்மை தங்கிய தங்கள் அரசாங்கம் நடவடிக்கையெடுக்காததையிட்டு எமது மிகுந்த வருத்தத்தைத் தெரிவிக்கின்றேம்."—[திரு. ஆர். ஜி. சேனநாயக்க].

"but regret that in the matter of the cost of living Your Excellency's Government has not taken measures to Ceylonize trade with a view to—

(*a*) recognizing an unfettered system of economic development as one of the steps which will definitely bring down the steadily rising cost of living and ensuring the setting up of such an economic system in this country ;

(*b*) protecting the legitimate rights of the Sinhala people by eradicating the corrupt practices resorted to by the foreign businessmen ;

(*c*) preventing the fluctuations in the cost of living as a result of the manipulation of prices at the will and pleasure of these anti-national businessmen ;

(*d*) arresting the outflow of our national wealth, which has assumed dangerous proportions ;

(*e*) restoring the dominance in trade which has been wrested from us by foreign capitalists, principally the Indians."—[*Mr. R. G. Senanayake.*]

VII

" එතකුදු වුවත්, ඉන්දියානු ප්‍රශ්නය පිළිබඳ විෂයෙහි,—

(අ) සිංහලයාගේ රැකිරක්ෂා ප්‍රශ්නය දැඩි ලෙස උග්‍ර වී තිබෙන මෙම වකවානුවේ පුරවැසිකම් නොලත් ඉන්දියානුවන්ට හා තාවකාලික බල පත්‍ර යටතේ පදිංචිව සිටින අයට රැකිරක්ෂා සැපයීමට ඉඩකඩ යෙදීම සහ ඔවුනට නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සේවය, හාල් සලාකය වැනි වරප්‍රසාදත්, වෘත්තීය හා දේශපාලන අයිතිවාසිකම් දී තිබීමත් අසාධාරණයක් හැටියට අද වන තුරුත් නොසලකා මේ රටේ ජනතාවගේ අයිතීන් වෙනුවෙන් විධිමත් පියවරක් නොගැනීමෙන් ද,

(ආ) ඉන්දියානුවන් ඉන්දියාවට යැවීම සඳහා අවංක ක්‍රියා මාර්ගයක් අද වන තෙක් නොගැනීමෙන් ද,

(ඇ) කන්ද උඩරට සිංහලයාගේ ඡන්ද උරුමයන් රැකෙන පරිදි පුරවැසිකම් ලබා තිබෙන ඉන්දියානුවන් වෙනම ඡන්ද ලේඛනයකට ඇතුළත් නොකිරීමෙන් ද,

(ඈ) මෙරට ජනතාවට ජීවත් වීමට පවා සෑහෙන බිම් ප්‍රමාණයක් නොමැතිව තිබියදී මිළයට ගැනීමෙන් මෙරට චංචල නිශ්චල දේපල සතු කර ගැනීමට විදේශිකයින්ට ඉඩ සැලසීමෙන් ද, කර්මාන්ත, ගොවි කර්මාන්ත හා වෙනත් මුදල් උපයන ව්‍යාපාර පවත්වාගෙන යෑමට විශාල වශයෙන් ඉඩකඩ සැලසීමෙන් ද,

උතුමාණන් වහන්සේගේ රජය ඉන්දියානු ප්‍රශ්නය දිනෙන් දින උග්‍ර වීමට ඉඩ ප්‍රස්තාව යෙදීම ගැන කණගාටුව පළ කරන්නෙමු."—[ආර්. ජී. සේනානායක මයා.]

" எனினும், இந்தியர் பற்றிய விடயத்தில்,

(அ) சிங்களவர்களின் வேலையில்லாப் பிரச்சினை மிகவும் உக்கிரமடைந்திருக்கும் இச்சந்தர்ப்பத்தில் பிரஜா உரிமை பெறத இந்தியர்களுக்கும் தற்காலிகமாக அனுமதிபெற்றுக் குடியிருக்கும் நாடற்றவர்களுக்கும் தொழில் வசதி அளித்தல், இலவசக் கல்வி, இலவச வைத்திய சேவை, பங்கீட்டரிசி போன்ற சலுகை, தொழில், அரசியலுரிமை கொடுத்திருப்பது அநீதியானதென்று இதுவரை கவனியாது இந்நாட்டு மக்களின் உரிமைகள் சார்பாகப் பல நடவடிக்கைகளை எடுக்காமையாலும்,

(ஆ) இந்தியர்களை இந்தியாவிற்கு அனுப்புவதற்கான நேர்மையான செயல் வழி வகைகளை இன்று வரை கைக்கொள்ளாமையாலும்,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(இ) மலை நாட்டு சிங்கள மக்களின் பிறப்புரிமைகள் பாதுகாக்கப்பட கூடிய வகையில் பிரஜா உரிமை பெற்றுள்ள இந்தியர்களை வேறு தேர்தல் இடாப்பில் சேர்க்காமையாலும்,

(ஈ) இந்நாட்டு மக்கள் வாழ்வதற்குத்தானும் போதிய நிலமில்லாதிருக்கையில் நாடற்றவர் பணப்பலத்தினால் இந்நாட்டில் அசைவுள்ள, அசைவற்ற சொத்துக்களை உரிமையாக்கிக் கொள்ள இடமளித்தமையாலும், தொழில், விவசாயம், வேறு பணம் சம்பாதிக்கக்கூடிய வற்றைச் செய்வதற்கு இடமளித்தமையா லும்,

மேன்மை தங்கிய தங்களுடைய அரசாங்கம் இந்தியப் பிரச்சினையை நாளுக்கு நாள் உக்கிரமடையைச் செய் வதையிட்டு நாம் கவலையைத் தெரிவிக்கிறோம். "—[திரு. ஆர். ஜி. சேனநாயக்க].

"but regret that as far as the Indian problem is concerned Your Excellency's Government has allowed it to become acute from day to day by—

(*a*) affording opportunities of employment to Indians, who have not obtained citizenship, and Temporary Resident Permit Holders at a time when the problem of unemployment is very acute among the Sinhalese ; and by not taking proper steps with regard to the rights of the people of this country as a result of not considering up to date, the grant of privileges such as free education, free health service and rice ration, and trade union and political rights to the said Indians and T.R.P. holders to be an injustice ;

(*b*) not taking an honest step up to date to repatriate Indians to India ;

(*c*) not taking steps to safeguard the birthrights of the Kandyan Sinhalese by including in a separate electoral register the names of the Indians who have obtained citizenship ;

(*d*) affording opportunities on a large scale to foreigners to purchase and thereby gain ownership of movable and immovable properties at a time when sufficient land is not available even for the people of this country ; and by allowing them to engage in industries and agricultural activities and other money making concerns. "—[*Mr. R. G. Senanayake.*]

VIII

"එතකුදු වුවත්, භාෂාව පිළිබඳ විෂයෙහි,—

වැදගත් වෘත්තීය අයිතිවාසිකමක් වන භාෂාවේ අයිතිවාසිකම රැක ගැනීම සඳහා ඉදිරිපත්ව, 1966 ජනවාරි 8 වෙනිදා සිද්ධියේ දී දඬුවම් ලැබූ භාෂාප්‍රේමී රජයේ හා සංස්ථාවල සේවකයන් හට එම දඬුවම ඉවත් කොට සහනයක් සැලසීමට උතුමාණන් වහන්සේගේ රජය ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් බලවත් කණගාටුව පළ කරන්නෙමු."—[ආර්. ජී. සේනානායක මයා.]

" எனினும், மொழி சம்பந்தமான விடயத்தில்,

முக்கியமான தொழிற்சங்க உரிமையாகிய மொழி யுரிமையைப் பாதுகாக்கும் நோக்கத்துடன் முன்வந்து, ஜனவரி 8 ஆம் திகதி நிகழ்ச்சியின் காரணமாகத் தண்டனை பெற்ற அரசாங்கத் திணைக்களங்கள், கூட்டுத் தாபனங்கள் ஆகியவற்றைச் சேர்ந்த மொழிப்பற்றுள்ள ஊழியர்களின் தண்டனைகளை அகற்றி சலுகை வழங்கு வதற்கு, மேன்மை தங்கிய தங்கள் அரசாங்கம் நடவடிக்கை எடுக்காதது குறித்து ஆழ்ந்த கவலையைத் தெரிவிக்கின்றோம். "—[திரு. ஆர். ஜி. சேனநாயக்க.]

"but regret that as far as the language is concerned, Your Excellency's Government has not taken action to remove the punishments imposed on the language loving public servants and employees of corporations who by coming forward to safeguard the right of language which is an important professional right were concerned in the incident of 8th January 1966 ; and to grant them redress. "—[*Mr. R. G. Senanayake.*]

"එම වචන එතැනට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදි.

" அச்சொற்கள் அங்கு சேர்க்கப்படுமாக " எனும் வினா மீண்டும் எடுத்தியம்பப் பெற்றது.

*Question again proposed, "That those words be there added."*

අ. භා. 2.6

**එම්. එම්. මුස්තfපා මයා. (සමාජසේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(ஜனாப் எம். எம். முஸ்தபா—சமூக சேவை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. M. M. Mustapha—Parliamentary Secretary to the Minister of Social Services)

Mr. Speaker, the National Government has completed three years of its term of office and it is, therefore, a very convenient and appropriate stage at which a proper evaluation of the work so far done by the Government can be made.

His Excellency the Governor-General, in opening the Fourth Session of the present Parliament, made a rather comprehensive Speech setting out the policies and programmes of the Government during the current Session of Parliament and,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මුස්තපා මයා.]

in doing so, he gave in detail what the Government had done during the past year.

The Debate on that Speech provides hon. Members of this House a splendid opportunity to assess and value the work of the Government, but unfortunately His Excellency's Speech seems to have come as a rude shock to most Members of the Opposition.

You know that it is a fact that a certain degree of development is taking place in the country. It is a fact that even the good work that the Government had done appeared to have been temporarily obliterated from the minds of the people. This was a situation which hon. Members of the Opposition had good reason to feel jubilant about. The clouds were gathering so fast that hon. Members of the Opposition even thought that the Government would disappear with this mirage. In fact the Opposition Members expected the Throne Speech to give rise to thunder and lightning. They thought that the Government would be no more, so much so that they came poised for another dramatic demonstration in the House. We heard from the papers that they were prepared to stage a walk-out, but alas, His Excellency the Governor-General, after keeping them listening to almost the end of the Speech, delivered one sentence which completely benumbed them. It benumbed them so much that they forgot to stage the walk-out. Therefore it is not surprising that a sense of disappointment, a sense of despondency, has overtaken hon. Members of the Opposition after the Throne Speech was delivered.

In fact, we on this side must be grateful to His Excellency the Governor-General for having cleared the air of a good deal of tension and misunderstanding, and today when hon. Members of the Opposition find the Maha Sangha praising the Hon. Prime Minister as a true democrat, exhorting the people to co-operate with the Hon. Prime Minister in his national effort, one can understand the feeling of frustration that has overtaken them.

When in 1964 many of the parties that sit today on this side of the House, came together to defeat the last Government, they not only sought to defeat that Government but also strenuously fought for the preservation of democracy in this country. In fact, among those who helped to defeat that Government were noble men like the Hon. Leader of the House who wanted to live a free man among free men. It is on account of the efforts of such men that today we have preserved for this country, for the present and future generations, the right to select a government of their own. During the last three years, this Government has demonstrated not only by word but also by deed that it is committed to democracy. It has proved by incontrovertible evidence that every citizen of this country has the right to express his views and the right to choose a government after his heart. That is why today even the bitterest enemy of the Government is praising the Hon. Prime Minister as a domocract, born and bred. He has chosen to listen to public opinion in the country before introducing legislation on a subject of national importance. I shall come to that aspect of it later.

In 1965 when the National Government took office it was not to continue the work that the previous Government had done. A new Government with a new programme and new policies was installed in office by the people and, therefore, rather than continuing the work of the previous Government, its task was to re-set the course that its predecessor had followed for over a period of nine years. And this, as you will appreciate, is a thing that takes time and even involves a certain amount of delay. That is precisely why in 1965 not much headway could be made. The year 1965 was really a period of transition from one government to another.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

When this Government took office in 1965 the situation that it was confronted with was certainly not an enviable one. The Government was faced with an acute foreign exchange shortage. It had to feed 11 million people, but the food that was produced locally was not sufficient to feed even half that number and, with no foreign exchange available to import the balance food that was required, the danger of starvation was lurking in every corner of this country. I feel sure that even hon. Members of the Opposition will not dare to oppose me on that point. That was the actual state of the economy when this Government took office. That is why I say that the Government was not faced with a situation in which it had reason to be happy. It was in that miserable state of the economy that the previous Government went out of office.

Mr. Speaker, what is it that we need in this country to become self-sufficient in food ? It is a pity that we should have depended for so long on foreign countries to produce the food that we eat. Is it that we have no land in this country ? Is it that we have no water ? No. We have in this country conditions most propitious for rice production. All that is required for the production of rice is found in plenty in this country. The nature in its mercy has lavished all its splendours on our country. What we needed was the united effort of the people towards a national goal. That was what was lacking, and that was what the two previous Governments from 1956 had failed to produce in this country. I venture to say that that was the primary reason why we found ourselves in that position of economic bankruptcy in 1965. That was also one of the primary reasons why the people of this country were fed up with the last Government.

So, Mr. Speaker, in 1965 the Government had to make a decision, a determined effort to put an end to this trend. It was time, the Government felt, that the food we require in this country should be locally produced, so much so that the Government, under the leadreship of the Hon. Prime Minister himself, launched on a massive food production campaign. From school-children to the oldest peasants in the village, everybody has been made aware of the urgency and the importance of this problem. They have been told that they have a part to play in the economic development of this country. In fact, as a result of this campaign, in 1966-67 there was a phenomenal increase in the production of rice in this country. Although the Government had set a target of 75 per cent self-sufficiency in the matter of rice, indeed, it is a happy augury that by the end of July 1967 itself we had more than half fulfilled that target.

Sir, more than 60 per cent of the people of this country are youths under the age of 25 and more than 48 per cent of the people are young people under 18 years of age, and therefore the Government sought to mobilize the youths, the students, the young people of this country in this national effort.

In November or December 1967 a World Bank team under the chairmanship of Mr. Blobell visited this country to evaluate the performance of our economy with aid from foreign countries. It is a matter for happiness and pride that in the course of their evaluation they had observed that there was a general improvement in the economy of this country and that in the sphere of agricultural development the progress was spectacular. That is the word used in their report.

So, the Government realizes that in order to achieve this goal of self-sufficiency in food it is very necessary that there must be a transformation in the attitude of the people, and we have no doubt that with the work experience that the school children engaged in this work have, with the Land Army functioning in various parts of the country, and with the new scheme that the Government has

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මුස්තfපා මයා.]

in mind, the Voluntary National Service Scheme, that transformation is in sight.

Today, the farmer, the peasant in the village, is no longer content with the loin-cloth, that he was used to for generations, it is no longer necessary for him to live in a wattle and daub hut. Today, the *goviya* is a factor to be reckoned with. Today, all over the country, in the rural areas and in the town areas, competitions in the matter of food production are conducted to decide who has produced the largest amount of paddy from an acre of land. *Govi rajas* are selected in these competitions, and they come to Colombo to receive their prizes from the Hon. Prime Minister himself. When they go back to their villages with these prizes they are received like a Minister or Prime Minister. They are received like heroes who have come back to the village after victory in a battle. Today, the people are proud to call themselves farmers.—[*Interruption*]. Sir, people of the Communist Party talked of the peasants and the farmers. What is the use of pouring forth torrents of words if there is no action ? What is it that they have done for the last thirty years to improve the miserable lot of the farmers ?

The Government has afforded a place to the farmers and to the peasants of this country because they provide the food that you and I eat. Today, the farmer is a factor to be reckoned with a personality better recognized than a C. A. S. officer.

The other day, at a public meeting at Polonnaruwa, the Hon. Prime Minister stated in unmistakable terms that he was even prepared to give the place of a king to the farmer. He is prepared to make the farmer a king in this country. These were not empty words. The Hon. Prime Minister himself is heading the food drive. He is doing this not because the Hon. Minister of Land, Irrigation and Power is not capable of doing it. He is doing it to show that he is giving first priority to the production of food.

We have all this time been producing food by pouring out empty words, by pouring them out in torrents in this House. Today, self-sufficiency is in sight.—[*Interruption.*] I will prove it to my Friend.

කථානායකතුමා
(*சபாநாயகர் அவர்கள்*)
(Mr. Speaker)

The hon. Member for Balapitiya is speaking next. He can reply to him then.

මුස්තfපා මයා.
(*ஜனாப் முஸ்தபா*)
(Mr. Mustapha)

Hon. Members who have read about some outdated theories on some sort of ism, such as socialism, capitalism, and Marxism, in books, only know to heckle and laugh at everything that is said.

What is the use of their talking about the peasants and the farmers if in real life they are not afforded better living conditions ? Unless they can have better houses to live in and better clothes to wear, unless they are able to move about in dignity and honour and to feel that to call themselves farmers is no disgrace, what is the use of saying that they are engaged in the most noble task that one can think of ?

My hon. Friend was laughing just now—a vacant laugh as much as to say, " What is the impact of the food production campaign that your Government has launched on ? I shall therefore read to him, for his edification, certain statistics to show how the food drive has affected the economy of this country in real terms.

We had been importing practically every item of food from various countries. We had been importing red onions to the value of Rs. 1.6 million in 1966. In 1967 the value of red onion imports dropped to Rs. 0.755. In 1968,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

it has been estimated that the import of red onions would be only to the value of about Rs. 0.548 million. You see, Mr. Speaker, how the value of our imports of red onions has been coming down. It has come down by about one-third.

එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා. (මිනුවන්ගොඩ)

*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட)*

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda)

That is why there are no onions.

මුස්තාෆා මයා.

*(ஜனுப் முஸ்தபா)*

(Mr. Mustapha)

It is not that there are no onions. You do not know where to buy them.

Then let us come to the import of chillies. In 1966 the Government imported chillies to the value of Rs. 42.5 million. One cannot believe that Ceylon was importing chillies to the value of Rs. 42.5 million. In 1967 it dropped to Rs. 29.3 million. In 1968, the estimated cost on chillies is Rs. 17 million. So you will see that we have reduced the import of chillies from Rs. 42 million to Rs. 17 million.

Then let us come to potatoes. In 1966 we imported potatoes to the value of Rs. 24.1 million. In 1967 we imported Rs. 6.64 million worth of potatoes from January to May. We completely banned the import of potatoes thereafter.

Then what is the position in regard to the domestic production of rice in terms of indices ? Sir, our production of rice rose from 100 in 1966 to 116 in 1967, and in 1968 it is expected to rise to 133.

Potato production rose from 100 in 1966 to 296 in 1967, and in 1968 it is expected to rise to as much as 326.

With regard to chillies the index rose from 100 to 224.67 in 1966, and it is expected to rise to 271 in 1968. In the case of red onions it rose from 100 in 1966 to 114 in 1967 and to 149 in 1968.

I read these figures merely to tell my hon. Friend the Member for Balapitiya (Mr. L. C. de Silva) and the hon. Member for Matara (Mr. Tudawe) that it is useless just to laugh but that they must go into statistics. Hy hon. Friends must read the reports issued by the Planning Ministry and the Department of Agriculture to see how a large amount of foreign exchange which got frittered away year in and year out on the importation of food is now getting reduced. This has been made possible because of the production of these essential commodities in this country itself. In 1967, under the G. P. S. the Ceylon Government bought 8.6 million bushels of paddy. In June 1968 the figure rose up to 11.2 million bushels of paddy purchased under this scheme. The importation of rice from other countries has dropped considerably and we now save quite a large amount of money in foreign exchange.

එල්. සී. ද සිල්වා මයා. (බලපිටිය)

*(திரு. எல். சீ. டி சில்வா—பலப்பிட்டி)*

(Mr. L. C. de Silva—Balapitiya)

You have halved the rice ration.

කථානායකතුමා

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

I think I will have to halve the time of the hon. Member for Balapitiya.

මුස්තාෆා මයා.

*(ஜனுப் முஸ்தபா)*

(Mr. Mustapha)

Mr. Speaker, all this has been made possible not by merely making platform speeches, not by merely exhorting the people to produce food, but by giving them real material benefit and encouragement by way of increased loans. For instance, the previous Government gave loans up to only Rs. 175 an acre. But today the amount has been increased to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මුස්තෆා මයා.]

Rs. 220 an acre and they are able to get loans up to 10 acres. They have been enthused to use more fertilizer and agro-chemicals.

It is by adopting these various methods that today the local farmer is able to increase the production of food in this country. Today, as I said earlier, it is a matter for pride that the atmosphere of crisis is largely overcome. It is largely overcome because we are able to produce in this country much of what we have been importing all this time, and what was merely a holding operation has today become a growth effort on the part of our people. And this no doubt, has been made possible by the united effort of all sections of the people of this country.

In fact, it looked for a moment in 1958 that the entire social fabric of this country would get ruined, that there would be no point at which we could all meet and work together for the benefit of this country. But happily today we are all together. This no doubt is one of the reasons for the frustration of the Opposition in that the defection that they expected on the part of the Federal Party from this Government did not take place. In fact those gentlemen are today almost benumbed to see the Federal Party is sitting where it was. And this statement in the Throne Speech has not given place to any form of alarm on the part of our goods Friends, the Members of the Federal Party.

The next important item that was——

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

May I remind the hon. Member that he has only five minutes more?

මුස්තෆා මයා.
(ஜனாப் முஸ்தபா)
(Mr. Mustapha)

No, Sir. I was given forty minutes.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I am very sorry. The hon. Member is right.

මුස්තෆා මයා.
(ஜனாப் முஸ்தபா)
(Mr. Mustapha)

Sir, the next important item that is in the Throne Speech is the burning question of the day—the District Councils. It was very unfortunate that during the Debate on the White Paper on District Councils, I had no time to speak because most of the time was spent on mudslinging between two parties on our side.

The impression has been sought to be created in this country that the Federal Party are the architects or originators of the idea of district councils. Nothing can be further from the truth.

On the other hand, whenever a government conceived the idea of district councils the Federal Party have played the role of abortionist. Whenever a bill to establish district councils was conceived by a government, the Federal Party were shown up as an excuse to abort the whole thing, as was done a few weeks back.

If ever there was in this country a statesman who sincerely believed in district councils as being the solution to the present ills of the kachcheri system he was none other than the late Mr. S. W. R. D. Bandaranaike, the former Prime Minister of this country. He was not moved by political considerations in regard to that matter. He sincerely believed that the establishment of district councils would remove the ills of the kachcheri system, so much so that as Minister of Local Government in the first D. S. Senanayake Cabinet he drafted a bill for the establishment of district councils. It was ready to be introduced in Parliament in January 1950, but unfortunately the late Mr. S. W. R. D. Bandaranaike had to leave that Government

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

and cross over to the Opposition. That put an end to the establishment of district councils at that time.

Then, again, when Mr. S. W. R. D. Bandaranaike became Prime Minister of this country, on his own, without any intervention on the part of the Federal Party, he drafted a District Councils Bill and he wanted it introduced in Parliament. But what happened ? Our friends of the Federal Party went to him and engaged themselves in certain negotiations which culminated in the notorious B-C Pact, and district councils never saw the light of day. Were it not for the fact that Mr. S. W. R. D. Bandaranaike tried to accommodate some of the demands of the Federal Party by signing that pact, Mr. Bandaranaike, on his own, without any pressure or demand from anybody, would have introduced district councils.

If today the Federal Party have achieved anything at all, they have only succeeded in creating suspicion and mistruct in the minds of the Sinhala people, nothing more, nothing less. If the Federal Party have succeeded in anything, they have succeeded in postponing the establishment of district councils for over a decade, even if the law is introduced at this stage.

So, it is nothing but a canard to say that the Federal Party are responsible for the idea of district councils. That is a wrong impression that must be removed from the minds of the people.

Everybody here knows, the people of this country know, that the proposal to set up district councils is one with a long and chequered history. In fact it was the Donoughmore Commission which first referred to the desirability of decentralization of the administration in this country. Thereafter every government up to now has been considering this idea of establishing district councils, because any person with any idea of provincial administration will concede the fact that if today we are unable to accelerate the pace of economic development in the districts it is because of the outmoded kachcheri system.

We have seen how the kachcheri system functions. Certain matters just cannot be pushed through because of the kachcheri system. That is the bottle-neck. We know that there are district co-ordinating committees which hold their meetings where very valuable suggestions are made. But what is the use ? Those committees function today in an advisory capacity. The reports or the resolutions passed at these meetings are sent to the Ministries in Colombo but I regret to say that these decisions, reached after very careful consideration by people who know the subject at the district level, never reach the Minister's table in Colombo. What is the sanctity in a Minister's signature on anything that we can conveniently do at district levels ? Unfortunately it has become a political issue.

Sometimes I am inclined to agree with the hon. Member for Gampaha, (Mr. S. D. Bandaranayake), when he says that parliamentary democracy failed in this country, because we find persons like the hon. Member for Yatiyantota (Dr. N. M. Perera), a very responsible and very experienced politician in this country, saying one day that he is 100 per cent for district councils and on another day that he is opposed to them only because the Federal Party is interested in them. Can any man in his senses say that ? The important thing is the administrative set-up in Ceylon.

Then again there is the Deputy Leader of the L.S.S.P., Dr. Colvin R. de Silva who made the announcement that he is opposed to district councils in any form. These are the things which make one feel with regret that the leaders of the L.S.S.P., a long-standing political party of this country, has long ceased to be leaders. I hope they will at least be good followers of the party they have accepted, and its leaders.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මුස්තාෆා මයා.]

Then, last but not least, I as a Muslim coming from the Batticaloa District, or rather the Amparai District, would fail in my duty if I do not express my views on the question of district councils without fear or favour. The comic episode is that my good friend the leader of the Islamic Socialist Front, Mr. Badiuddin Mahmud, is going about the country saying that Muslim Members of Parliament are keeping mum when a major catastrophe is going to affect the Muslims of this country. My good friend must realize that our rights and our duty to speak for the community spring from the people themselves and not from any individual, be that individual male or female. Our rights spring from the people themselves and it is our sacred duty to safeguard the interests of the community to which we belong.

I have a forum to fight from. I have several other places where I can espouse the cause of the Muslims from their point of view on this subject, and that we have done to the best of our ability not only in the Government Group, not only in the Working Committee, but in several other meetings with the Hon. Prime Minister. The Muslims can rest assured and Mr. Badiuddin Mahmud can rest assured that even if the district councils ever see the light of day they will never function to the detriment of the Muslims of this country. We have seen to it that certain provisions that might prove detrimental have been removed and we have the assurance of the Hon. Prime Minister that they will never find a place in the Bill that will ultimately be introduced in this House. So Mr. Badiuddin Mahmud must not go about the country saying that barring himself no other politician on earth does anything worthwhile for the Muslims.

Yesterday I had occasion to be present as an observer at one of these "front" meetings. There is another front led by Mr. Badiuddin Mahmud. I do not believe in these 'fronts.' I believe Muslims must become members of national political parties—[*Interruption.*]

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ (අකුරැස්ස)

*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குறஸ்ஸ)*

(Dr. S. A. Wickremasinghe—Akuressa)

All parties ?

මුස්තාෆා මයා.

*(ஜனாப் முஸ்தபா)*

(Mr. Mustapha)

Why not ? Of course, excluding perhaps your party, because Muslims and Communists are poles apart. No Muslim in his senses will join your party. Barring your party, of course, I feel Muslims have a place in all other national political parties in this country.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ

*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*

(Dr. S. A. Wickremasinghe)

The Muslim people will not listen to you.

මුස්තාෆා මයා.

*(ஜனாப் முஸ்தபா)*

(Mr. Mustapha)

In the same way the Sinhalese people have ceased to look up to you. The Sinhalese people have never looked up to you.

I should like to ask this gentleman, my good friend, who is now charging us with not taking any steps with regard to the District Councils Bill, what his attitude was in the last Parliament when he was a Minister holding rather an important portfolio ? No doubt before 1956 my good friend, Mr. Badiuddin Mahmud, was not known except perhaps as a teacher, but after 1956 this gentleman was known as a close associate of the late Prime Minister, Mr. S. W. R. D. Bandaranaike. Except for the regularity of his trips to the U. N., what

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

is it that he has done for the Muslim community for which he can be remembered? Except for these trips nobody remembers him for any signal service that he has done to the community.

Then in 1960 and thereafter he held an important portfolio in the Sirimavo Bandaranaike Cabinet. During that period from 1960, in no less than three Throne Speeches this promise of district councils found a very important place in their policy statements. When Mr. S. W. R. D. Bandaranaike and the Federal Party signed the B-C Pact which promised to give this country a district council of a much more powerful nature, which might well have ruined the Muslim interests in the Eastern and Northern Provinces, Mr. Badiuddin Mahmud did not utter a word, did not lift a finger. There again even after he became a Minister and during the period of that Government, when the S.L.F.P. sought to give this country district councils, we have the right to assume that they had the district council of Mr. S. W. R. D. Bandaranaike in view. And Mr. Badiuddin Mahmud did not raise one little voice then. Am I not entitled to ask that it was due to his love of the portfolio and not due to the love of the community that he did not raise a single argument then.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
He supported it.

මුස්තාපා මයා.
(ஜனாப் முஸ்தபா)
(Mr. Mustapha)
He, in fact, supported it.

It is easy now when he is somewhere in the political wilderness to shout at all and sundry and say that the Muslim Members of Parliament are not doing their duty. He can rest assured that we have been in this House because the people of our country, the people of our side, have confidence in us, not once but many times. We need not have to depend on the tender mercies of any individual to find a place in this House. We shall either come to this place through the people or not at all. So this is the real position with regard to district councils.

But I have to say one word to the Federal Party who, I have a feeling, know only of the Jaffna Peninsula. They must realize that the other Tamil-speaking districts in this country are not in the same position as the Jaffna District. I would tell my Friend—he is laughing—this is a matter which they are well advised to consider.

In the Jaffna Peninsula, whether they like it or not, there is no space for anybody to go in and settle down. It is a fully developed district. But it is not so in the case of the other districts.

Let me talk of the Amparai District. The precise difference between the district council of Mr. Bandaranaike and the district council that is envisaged in the present Bill is that the present Bill has absolutely no control whatsoever over colonization, land settlement and river valley development. In fact, it is to this aspect of the district council that the Hon. Prime Minister has right along been opposed to. He opposed the B-C Pact and the district council of Mr. Bandaranaike because that district council enjoyed the power over colonization.

Sometimes the Hon. Minister of Local Government concedes to me the doubtful privilege of being the first chairman of the district council for Amparai. I used to ask him, "For how long?" My Hon. Friend perhaps is not aware that there is a Heda-Oya Scheme. If this scheme is taken up tomorrow for implementation, I feel sure that the Federal Party cannot give me the assurance that they can prevail upon any future Government to drop it. If the Heda-Oya Scheme

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මුස්තපා මයා.]

is started, it will be like another Gal Oya, and I will not be surprised if at a future time, when that is done, the Sinhalese find themselves in a majority even there.

So, all these benefits we are hoping to get from district councils as envisaged in the Bill may not be to the advantage of the Tamils and the Muslims. Now that we have had the benefit of the Bill and we have read and understood it, the benefits might very well be against the Tamils and the Muslims in the Amparai District.

I want to say this, if not for anything else, at least for the record: the time may come when the Tamils and the Muslims will have to fight for the removal of district councils in the event of their being formed. I am speaking with the full knowledge of the Bill, with the full knowledge of its implications and what it is going to mean to a district like Amparai.

I do not blame the Federal Party because I am sure they do not know the peculiar circumstances in which we find ourselves in a place like the Amparai District. So if the Hon. Prime Minister introduces the Bill, it will of course be our duty to support it, but these are views that the Hon. Prime Minister and the Federal Party will have to consider because they owe a duty to the people they represent.

So, I honestly feel that the Hon. Prime Minister in giving vent to his feeling that he will not introduce legislation on the subject of district councils without careful consideration of all the points of view placed for and against such a Bill, has proved that he is one gentleman in whom every community in this country can have real faith. He is one who is prepared to give every man an opportunity to express his views and I have no doubt that by 1970 when the people of this country go to the polls to elect a government, they will not forget that this right has been preserved for them by the United National Party and by the National Government of which we are all members. That is something too precious for the people of this country to forget, and I know that the vast masses of this country will not forget today or in the future that if they enjoy the right to choose a government or to reject a government, they owe it all to the National Government.

අ. භා. 2.48

**එල්. සී. ද සිල්වා මයා.**

*(திரு. எல். சீ. டி சில்வா)*

(Mr. L. C. de Silva)

ගරු කථානායකතුමනි, සමාජ සේවා උප ඇමතිතුමාගේ කථාවට ඇහුම්කන් දී ගෙන සිටි මට කල්පනා වන්නේ, එතුමාට තිබෙන ආත්ම ශක්තිය ගැන එතුමාට ප්‍රශංසා කරන්න වටින බවයි. මේ රජය විසින් මෙතෙක් ගෙන ගිය ක්‍රියා මාර්ගය ගැන සතුටට පත් වූයේ යයි කියන්නට එතුමාට හැකියාවක් ඇති වීම ගැන මා ඇත්ත වශයෙන්ම එතුමාට ප්‍රශංසා කරනවා. ඒ තරම්ම ආත්ම ශක්තියක් එතුමාට තිබුණත්, මට හිතෙන හැටියට තම පක්ෂයත් තම රජයත් ආරක්ෂා කිරීම පිණිස එවැනි ප්‍රකාශයක් කරන්නට අනිකුත් බොහෝ ගරු මන්ත්‍රීවරුන්ට බැරි තත්ත්වයක් උදා වී තිබෙනවා.

ගරු සමාජ සේවා උප ඇමතිතුමා අද මෙහිදී කළ ඒ කථාව මේ රටේ ජනතාව කියවා බැලුවොත් ඔවුන්ට සැකයක් පහළ වෙන්න පුළුවන්, එතුමා කථා කර තිබෙන්නේ මේ රට ගැනද එසේ නැත්නම් වෙනත් රටක් ගැනද කියා. ආහාර ද්‍රව්‍ය සඳහා වියදම්වන මුදලෙන් විශාල ප්‍රමාණයක් අඩුකර ගැනීමට මේ රජයට පුළුවන් වී තිබෙන බව අප පිළිගන්නවා. එසේ අඩු කර ඇත්තේ අඩු කළ ප්‍රමාණයට සරි ලන ආහාර ප්‍රමාණයක් මේ රටේ වගා කර ජනතාවට සපයා දීමෙන් නොවෙයි; නමුත් ජනතාවගේ හාල් සලාකය අඩු කිරීමෙන් මෙතෙක් ගෙන්වූ ප්‍රමාණය අඩු කිරීමෙනුයි.

අද තමුන්නාන්සේ මේ කොළඹ නගරයේම හෝ නගරයෙන් ඈත ගම්බද පෙදෙසක හෝ හැතැප්ම දෙක තුනක් ඇවිද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බැලුවොත්, ආහාර ද්‍රව්‍ය ගැනීම සඳහා කොපමණ පෝලිම් ගණනාවක් තිබෙන වාද කියා තමුන්නාන්සේට දකින්න ලැබෙනවා ඇති. රතු ලූනු රට ලූනු වගා වන් ගැන සමාජ සේවා උප ඇමතිතුමා සංඛ්‍යාලේඛන ඉදිරිපත් කළා. මගේ අද හසේ හැටියට නම්, මේ රටේ ජනතාව දැන් මාස ගණනක සිට රට ලූනු දැකලාවත් නැහැ. තමුන්නාන්සේලා ඇත්ත වශයෙන්ම ආහාර ද්‍රව්‍ය ගෙන්වන ප්‍රමාණය අඩු කළා පමණක් නොව, තමුන්නාන්සේලා අනුගමනය කරන වෙළඳ ප්‍රතිපත්තිය නිසා—බඩු බෙදා හැරීමේ ප්‍රතිපත්තිය නිසා—සාමාන්‍යයෙන් තිබෙනවාටත් වඩා වැඩි ආහාර හිඟයක් මවා පාන්නට වෙළන්දන්ට පුළුවන් වී තිබෙනවා.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා. (මීගමුව)**
*(திரு. என். டென்சில் பெர்னாண்டோ—நீர்கொழும்பு)*
(Mr. N. Denzil Fernando—Negombo)

ඒ තමුන්නාන්සෙ පාලනය කරන ඒවායේ.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

මීගමුවෙ ගරු මන්ත්‍රීතුමා මා පාලනය කරන සමුපකාර සමිති සංගමය ගැන සඳහන් කළා. මා පත්‍ර මාර්ගයෙන් දැක්කා ආණ්ඩු පක්ෂයේ රැස්වීමේදී අම්බලන්ගොඩ ගරු මන්ත්‍රීතුමාත් ඒ ගැන සඳහන් කර තිබෙන බව. ගරු කථානායකතුමනි, මගේ සංගමයට ලැබිය යුතු බඩු ප්‍රමාණයෙන් අවුන්සයක්වත් අඩුවෙන් මගේ සංගමය ගෙන ගොස් තිබෙනවා නම්, ඒ වාගේම සමුපකාර සමිතිවලට අප සංගමය විසින් බෙදා හැරිය යුතු බඩුවලින් අවුන්සයක්වත් අඩුවෙන් බෙදා හැර තිබෙනවා නම්, ඒ බව ඔප්පු කරන්නය කියා ගරු ආහාර ඇමතිතුමාට හෝ වෙළඳ ඇමතිතුමාට මා මේ අවස්ථාවේදී අභියෝග කරනවා. "තමුන්නාන්සේලා ඔය දුර්වල තත්ත්වයට පත් වී ඇත්තේ තමුන්නාන්සේලාගේ සංගමය විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙකු විසින් පාලනය කරන නිසාය" කියා ජනතාවට පෙන්වන්න සූදානම් වුණාට ඒ ජනතාව එවැනි කියමනක් භාරගන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, සමාජ සේවා උප ඇමතිතුමා වැනි ගරු මන්ත්‍රීවරුන් ආහාර වගාව ගැන ලජ්ජා නැතිව මෙවැනි ප්‍රකාශ කරනවා. ගොවියා රජෙකු හා සමානව සැළකීමට අගමැතිතුමා සූදානම්ය කියා ගරු අගමැතිතුමා ප්‍රකාශ කරන නමුත්, ගොවියා කවදත් රජෙක් බව අපට නම් රහසක් නොවෙයි. තමුන්නාන්සේලා ඔය විධියට ඔටුනු පළන්දා ගොවියා රජා යයි නොකීවාට ගොවියා ඇත්ත වශයෙන්ම කවදත් රටක රජෙක් බව අප පිළිගෙන තිබෙන සත්‍යයක්.

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුව ගොවීන්ට ණය දීම ගැන ආඩම්බරයෙන් කථා කරනවා. දැන් රුපියල් 225 ක් දෙනවාය, පසුගිය ආණ්ඩුවෙන් දුන්නේ 175 ය කියනවා. ඔව්, වෙනසක් තියෙනවා. පසුගිය ආණ්ඩුව මේ ණය දීමේ ක්‍රමය ආරම්භ කළ අවස්ථාවේ 175 ක් දුන්නේ ක්‍රමයෙන් ඒ ගණන වැඩි කරන බලාපොරොත්තුව ඇතුවයි. පසුගිය ආණ්ඩුව ඒ ණය දුන්නේ සියයට තුනේ පොළියටයි. අද තමුන්නාන්සේලා ගොවියාගේ පමණක් නොව ගොවියාගේ පවුලේ සියළු දෙනාගේම හාල් පොත් උගසට තබාගෙන ණය දෙන්නේ සියයට දොළහේ පොළියටයි. ඒ බව මා ගරු සමාජ සේවා උප ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි. මේ පිළිබඳ සංඛ්‍යාලේඛන මා අය වැය විවාදයේදී ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. මහජන බැංකුවෙන් පසුගිය මාස් කන්නයට ගත් ණය ආපසු නොගෙවූ උදවියට යල කන්නයට ණය දුන්නේ නැහැ. ඒ නිසා ගොවීන් ගණනාවක් අමාරුවේ වැටී ඉන්නවා. මාස් කන්නයට ණය ගෙන ගොවිතැන් කළ විට අස්වැන්න පාළු වුණා. මාස් කන්නයේදී ගත් ණය නො ගෙවීම නිසා යල කන්නයේදී ණය දුන්නේ නැහැ. දැන් හාල් පොත් ගැනීමට චක්‍ර ලේඛයක් සමුපකාර සමිතිවලට යවා තිබෙනවා. සමහර තැන්වල හාල් පොත් අරගෙන තියෙනවා. තමුන්නාන්සේලා ලොකු ධනවත් ගොවීන් ඇති කරලා, ඔවුන්ට රජයේ ඉඩම් අක්කර දහස් ගණනින් දීලා, එසේම ඔවුන්ට අවශ්‍ය ජීප්, මිනිමොක්, ට්‍රැක්ටර් ආදිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. සී. ද සිල්වා මයා.]

ගෙන්වා ගැනීමට ඕනෑ තරම් විදේශ විනිමය දීලා, අවුරුදු ගණනාවකට ආදායම් බදු සහන දීලා හොඳින් සැලකුවා. ඔවුන්ට එසේ සැලකූ තමුන්නාන්සේලා අසරණ ගොවියා ගත් ණය වෙනුවට ඔවුන්ගේ හාල් පොතුත් ආපසු අරගෙන තිබෙනවා. එවැනි ලජ්ජා නැති ආණ්ඩුවක් ගැනයි, තමුන්නාන්සේලා මේ ගරු සභාවේදී වර්ණනා කරන්නේ.

ගරු කථානායකතුමනි, අද මේ සමාජ සේවා උප ඇමතිතුමා සඳහන් කළ ආහාර වගාව ගැන, අපේ ගුවන් විදුලිය භාර ගරු උප ඇමතිතුමාගේ ගුවන් විදුලි සංස්ථාවෙන් නම් උදේ සිට සවස් වන තුරුත්, සවස සිට එළි වන තුරුත් තොර තෝංචියක් නැතිව ඇහෙනවා. එපමණයි, වැවෙන්නෙ. ගුවන් විදුලියෙ නම් වැවෙනවා. නව පැරකුම් යුගයක් උදා වෙනවාය කියා මේ ආණ්ඩුව කියනවා. නව පැරකුම් යුගයේ පරාක්‍රම කව්ද කියා අප දැන ගන්නට සතුටුයි. පැරකුම් අගමැතිතුමාද ? එසේ නැත්නම් ඉඩම් ඇමතිතුමාද ? ඉඩම් ඇමතිතුමා පැරකුම් යයි සමහරුන් කියනවා. තවත් සමහරුන් අගමැතිතුමා පැරකුම් යයි කියනවා. කෙසේ වුණත්, මේ යුගය අවසාන වුණ දවසක ප්‍රතිමාව ඉදි කරන්නේ අපයි. ඉඩම් ඇමතිතුමා පැරකුම් නම් අප එදාට අර පුස්කොළ පොත වෙනුවට එතුමාගේ ප්‍රතිමාවේ අතෙහි පිහියක් තබනවා. අගමැතිතුමා පැරකුම් නම් කැමරාවක් වත් අතෙහි තබනවා. ඇත්තෙන්ම ගුවන් විදුලියෙන් නම් තොරතෝංචියක් නැතිව පැරකුම් යුගයක් උදා කරනවා. අක්කරයෙන් වී බුසල් 80 ක් ලැබෙනවා යයි කියනවා. එහෙම නම් මේ රටේ ජනතාව අසන ප්‍රශ්නය මෙයයි. "මේ තරම් වගා කරනවා නම්, මේ තරම් අස්වැන්න ලබනවා නම් ඇයි දෙවියනේ තවමත් හාල් සේරුව රුපියල් 1.20 ට නැත්නම් 1.40 දෙන්නේ ?"

සහතික මිල යෝජනා ක්‍රමය යටතේ ගන්නා ලද වී ප්‍රමාණය ගැන සමාජ සේවා කටයුතු පිළිබඳ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා විසින් සඳහන් කරන්නට යෙදුණා. සහතික මිල යෝජනා ක්‍රමය යටතේ ගන්නා ලද වී ප්‍රමාණය ගැන සඳහන් කිරීමෙන් එතුමා බලාපොරොත්තු වන්නේ අස්වැන්න වැඩි වී තිබෙන බව ඔප්පු කරන්නටයි. එහෙත් කාටද ඔය සහතික මිල යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු ගැන විශ්වාසය තබන්නට පුළුවන් ? ඔක සම්පූර්ණයෙන්ම ,හොර ජාවාරමක්. සහතික මිල යෝජනා ක්‍රමය යටතේ එකම වී තොගය දහ වතාවක් ගණන් ගන්නා විත්තිය, ඒ සඳහා දහ වතාවක් මුදල් ගෙවන විත්තිය රහසක් නොවෙයි. කුමන ආණ්ඩුව යටතේ වුවත් තත්ත්වය ඒකයි. සඳහන් කර ඇති ගණන් හිලව් අනුව මුදල් ගෙවා ඇති බවට නම් සැකයක් නැහැ. එහෙත් වී ප්‍රමාණය නම් ඒ ගණන් හිලව් වලසඳහන් කර තිබෙන ප්‍රමාණයෙන් අඩක්වත් නැතිව ඇති.

වී වගාව සාර්ථකලු. බලාපොරොත්තු වූ සියයට 75 සංවර්ධනය ඇනටම සිදු වී තිබෙනවාලු. එහෙම නම් ඇයි දෙවියනේ කැපූ හාල් සලාකය තවමත් ආපසු නොදෙන්නේ ? මැතිවරණයට සුමාන තුනක් විතර තියා එය දෙන්නට බලාපොරොත්තු වෙනවාද ? [බාධාකිරීමක්] ඔව්, නැවත හාල් සලාකය දෙන කාලය ගැන තමුන්නාන්සේලා හොඳින් දන්නවා ඇති නොවැ ? අපත් ඒ ගැන දන්නවා. මුළු රටමත් ඒ ගැන දන්නවා.

ගරු කථානායකතුමනි, මේ රජයත් පසු ගිය රජය අනුගමනය කරගෙන ගිය වෙළඳ ප්‍රතිපත්තිය අනුගමනය කළා නම් ආහාර හිඟය මේ තරම් උග්‍ර වන්නේ නැහැ. මේ ආණ්ඩුව ආහාර ද්‍රව්‍ය අපනයනය කිරීමේ වරප්‍රසාදය යළිත් වරක් පෞද්ගලික අංශයට පැවරුවා. අද රට ලූනු ආදිය ගෙන්වන්නේ පෞද්ගලික අංශයයි. සතොස එයින් සියයට 30 ක් ලබාගෙන මහජනයාට බෙදනවා. අනෙක් සියයට 70 ම බෙදන්නේ පෞද්ගලික අංශයයි. පෞද්ගලික අංශයට පොත් දී තිබෙනවා. පෞද්ගලික වෙළඳුන් ලියාපදිංචි කර තිබෙනවා. පොත් ගෙන්වා ඔවුන්ගේ ප්‍රමාණය ගෙන යන්නට ඉඩ හරිනවා. ඊට පසු ඒවා කොහේ වික්කාද, කාට වික්කා දැයි දන්නේ නැහැ. බඩු වැඩි වශයෙන් කලුකඩයකට යන්නේ ඔන්න ඔය නිසයි.

අප කෑ කෝ ගසා සමහර ද්‍රව්‍ය සඳහා සලාක ක්‍රමයක් ඇති කෙරෙව්වා. ඒ නිසා දුන් ඒ සලාක ක්‍රමය අනුව දෙන බඩු අවුන්ස ගණනින් හෝ හැම කෙනකුටම ලැබෙනවා. ඇත්තෙන්ම ආහාර ද්‍රව්‍ය ගෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වීමේ සම්පූර්ණ කටයුත්ත සතොස ආයතනයට පවරන්නට තමුන්නාන්සේලාට තිබෙන අපහසුව මොකක්ද? තමුන්නාන්සේලාට වුවමනා වී තිබෙන්නේ ඒ ආහාර ද්‍රව්‍ය පාවිච්චි කරන ජනතාව සෑනසීම නොවී පසුගිය මහා මැතිවරණයේදී තමුන්නාන්සේලාට ආධාර දුන්, ඊළඟ මැතිවරණයේදී ආධාර දෙන්නට බලාපොරොත්තු වී සිටින, වෙළඳුන් තර කර ගැනීමයි. වෙළඳුන් සතුටු කිරීම සඳහායි, බඩු ගෙන්වීමත් බඩු බෙදා හැරීමත් පෞද්ගලික අංශයට භාර දුන්නේ. බඩු ගෙන්වීම සම්පූර්ණයෙන්ම පෞද්ගලික අංශයට භාර දෙන්නට වෙළඳ ඇමතිතුමා මහන්සි ගන්නා බවක් පෙනෙනවා. එහෙත් ඇත්ත වශයෙන්ම අප මේ රජයට කියා සිටින්නේ, තරමක් දුරටවත් ආහාර හිඟය මඟහරවා ගන්නට වුවමනා නම් ආහාර ද්‍රව්‍ය ගෙන්වීමේ වගකීම ආහාර අමාත්‍යාංශය යටතේ පාලනය වන සමුපකාර ව්‍යාපාරයට භාර දෙන ලෙස හා සලාක ක්‍රමය අනුව බඩු බෙදා හරින ලෙසයි. එහෙම කළොත් සතියකට එක වරක්වත් රට ලූනු සම්බෝලයක් කන්නට ජනතාවට අවස්ථාව සැලසේවි. එහෙත් අද මේ විධියට තමුන්නාන්සේලා අනුගමනය කරන ප්‍රතිපත්තිය නිසා සාමාන්‍ය ජනතාවට ජීවත් වන්නට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේලාට මේවා නොපෙනෙනවා ද යි මා දන්නෙ නැහැ. සමාජ සේවා කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා කෙලින්ම අම්පාරෙන් ගුවන් යානයට නැංගාම කොළඹට ඇවිත් බසින නිසා මේව නොපෙනෙනව ඇති. එසේ නැත්නම් අද සාමාන්‍ය ගැමි ජනතාව ගත කරන දුඃඛිත ජීවිතය එතුමාට පෙනී යන්න ඕනෑ. මේ රටේ ආහාර හිඟයක් නැත කියා සමාජ සේවා කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා කළ කථාව පුළුවන් නම් අපේ කොට්ඨාශයේ වේදිකාවකට ගිහින් කරන්න කියා මම එතුමාට අභියෝග කරනවා. ගරු කථානායකතුමනි, අපේ පළාත්වල තත්වය ඒකයි. අද ආහාර වගාව ගැන ගුවන් විදුලියෙන් ප්‍රචාරය වන විටත් මිනිසුන් ගුවන් විදුලි යන්ත්‍ර වසා දමනව.

**මුස්තාෆා මයා.**
*(ஜனாப் முஸ்தபா)*
(Mr. Mustapha)

That is due to your false propaganda.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

ළඟදී එනව.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

කරුණාකරල ඉක්මණින් එන්න. ජනතාව එනතුරු බලා සිටිනව.

ගරු කථානායකතුමනි, මේ රජය අනුගමනය කරන වෙළඳ ප්‍රතිපත්තිය නිසා සාමාන්‍ය රෙදිපිළිවල මිළත් වැඩි වී තිබෙනව. ජම්පිං fපිෂ් නමැති බොහොම ජනප්‍රිය, ඉතා ලාබ, රෙදි වර්ගයක් තිබුණ. මේ ආණ්ඩුව බලයට පත්වීමෙන් පසු ක්‍රමයෙන් ඒ රෙදිවල මිළ ගණන් උස්සල අද ඒ රෙදි යාරයේ මිළ රු. 2.12 දක්වා නැග තිබෙනව. රෙදිපිළි ගෙන්වීම සම්පූර්ණයෙන්ම සළුසලට භාර දුන්න. සළුසලත් පෞද්ගලික ආයතනයක් වගෙයි. රජයට තිබෙන්නෙ එහි අයිතිවාසිකම්වලින් දෙකෙන් පංගුවක් පමණයි. සළුසලෙන් ගෙන්වන රෙදිවලින් විශාල ප්‍රමාණයක් බෙදා හරින්නෙ පෞද්ගලික ආයතන මාර්ගයෙනුයි. සළුසල ගෙන්වන රෙදිවලින් සියයට 40 ක් සමුපකාර තොග වෙළඳ සංස්ථාවට දෙනව. සියයට 15 ක් ස. තො. ස. ආයතනවලට දෙනව. අනෙක් සියයට 45 පෞද්ගලික ආයතන මගින් බෙදා හරිනව. මේ වගේ වැඩ නිසා තමයි ජනතාවට දරන්නට බැරි තරමට අද ජීවන වියදම නැග තිබෙන්නෙ. අද රක්ෂාවක් ඇති මිනිහටත් ජීවත්වන්නට අමාරුයි. කියක් පඩි ගත්තත් කෑමට මදි කියා මිනිසුන් අඬනව.

ගරු කථානායකතුමනි, මම හිතන හැටියට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගරු අගමැතිතුමාත් රජයත් විශාල රැවටිල්ලකට භාජන කර තිබෙනව. එසේ නැත්නම් අගමැතිතුමාත් රජයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත් එකතුවෙලා මුළු රටම රැවටීමට සූදානම් වී සිටිනව. කෘෂිකර්ම දෙපාර්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. සී. ද සිල්වා මයා.]
මේන්තුව රජයට වාර්තා කර තිබෙනව, බීජ අල අවුරුදුපතාම පිටරටින් ගෙන්වන්නට ඕනෑය, එසේ නැත්නම් අල වගා කරන්ට පුළුවන්කමක් නැත කියා. ගරු කථානායකතුමනි, මේක ස්වභාවධර්මයටත් විරුද්ධ දෙයක්. කිසිම පර්යේෂණයක් නොමැතිව ස්වභාව ධර්මය අනුව කියන්ට පුළුවන් යම් දෙයක් වැවෙනව නම් ඒ වැවෙන දෙයින් නැවත බෝකරන්ට පුළුවන් බව. එහෙත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කියන්නෙ මෙහෙ වැවෙන අල වලින් බීජ අල ලබා ගන්න බැරි බවයි. ඒ උදවිය නිර්දේශ කරන්නෙ මේ නිසා අල වගාව නැවැත්විය යුතුයි කියායි. එහෙත් කඩබක්කිවල අල නරක් වී පැලවුණාම ඒවා වෙළඳුන් ඉවත දැමූ පසු සමහර උදඋදවිය ඒවා අරගෙන ගිහින් කෑලි කපා සිටුවා ඒවායින් හොඳ අස්වැන්න ලබා ගත් අවස්ථා ගැන අපි දන්නව. තත්ත්වය එහෙම තිබෙද්දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඔවුන්ගේ පර්යේෂණ අනුව කියනව, අවුරුදුපතාම බීජ අල පිටරටින් නොගෙන්නුවොත් අල වගාව සාර්ථක වෙන්නෙ නැහැ කියා. බීජ අල සඳහා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අවශ්‍ය නිසා අල වෙනුවට අළුකෙසෙල් වවමු යයි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තවදුරටත් නිර්දේශ කර නැද්ද කියා මා අහනව.

ගරු කථානායකතුමනි, ආහාර වගාව ගැන මෙතරම් පුරසාරම් දොඩන ආණ්ඩුව ගොවි ණය ක්‍රමය ලිහිල් කිරීමට මෙතෙක් කිසිම පියවරක් නොගැනීම ගැන අප ඉතාමත් කනගාටු වෙනව. අද ගොවියාට ගොවිතැන් කරන්නට බැරි තත්ත්වයක් තිබෙනවා. සියේට දොළහේ පොළියටයි ගොවියාට ආණ්ඩුවෙන් මුදල් ණයට ලැබෙන්නේ. අත්පිට මුදල් දී පොහොර ලබා ගන්නා කෙනකුට අද සියේට පණහක සහනයක් ලැබෙනවා. ණයට ගන්නවා නම් ලැබෙන්නේ සියේට තිස්තුනක සහනයක් පමණයි. බැංකුවෙන් පොළියට මුදල් අරන් පොහොර ගත්තත් ගණන් ගන්නේ ණයට ලබාගත් හැටියටයි. එතකොට මේක පොළියෙන් පොළිය ගැනීමක් වාගේ දෙයක් වෙනවා. සාමාන්‍යයෙන් ලැබෙන සහනයෙනුත් එක්තරා ප්‍රමාණයක් අත් හරින්නටයි සිදු වන්නේ. සියේට පණහක සහනයක් ලැබිය යුතු ගොවියාට ලැබෙන්නේ මේ ක්‍රමයට තිස්තුනක සහනයක් පමණයි. මේ ගැන ආහාර කටයුතු භාර ගරු ඇමතිතුමාගෙන් එක්තරා අවස්ථාවක මා ප්‍රශ්න කළාම එතුමා කියා සිටියේ ණය මුදල් හරියාකාර ගෙව්වොත් සියේට පණහේ සහනය සම්පූර්ණයෙන්ම ලැබෙන්නට සලස්සනවාය කියන එකයි. ඒ කොයි හැටි වෙතත්, ණය මුදල් සම්පූර්ණයෙන්ම ගෙවූ අයටවත්, අද වනතුරු එම සහනය ලැබී නැහැ. නිසි අවස්ථාවේදී ඒ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

ආහාර වගාව ගැන මේ තරම් හයියෙන් කෑකෝ ගහන මේ ආණ්ඩුව ඒ ඉතාමත් භාරදූර කර්තව්‍යය භාර දී තිබෙන්නේ කාටද ? ආහාර වගාව කෙසේ වෙතත්, මේ රටේ ජාතික වස්තුවක්ව තිබුණු විශාල දව ප්‍රමාණයක් ඉවත් කර ගැනීමට ධනපති කොම්පැනිකාරයින්ටත්, ධනපති ව්‍යාපාරිකයින්ටත් මේ ආණ්ඩුව අවස්ථාවක් දුන් බව නම් අපි දන්නවා. ආණ්ඩුව කර තිබෙන දේ වැරදි බව ආණ්ඩුවම මේ ගරු සභාවේදී පිළිගෙන තිබෙනවා. ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරන ලද අවස්ථාවේදී සමහර උදවියට දෙන ලද ඇතැම් ඉඩම් කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන්ම හෝ ආපසු ගැනීමෙන් ආණ්ඩුව තමන් කළ වරද පිළිගත් බව පෙනී ගියා. විශ්වාස භංග යෝජනාවේ අඩංගු කරුණු සත්‍ය බව ඒ ක්‍රියාවෙන් ආණ්ඩුව පිළිගත්තා.

ප්‍රජාතන්ත්‍රවාදය ගැන මේ ආණ්ඩුවේ තමුන්නාන්සේලා මහා හයියෙන් උදන් අනනවා. ලෝකයේම ඉන්න හොඳම ප්‍රජාතන්ත්‍රවාදියා ලංකාවේ වර්තමාන අගමැතිතුමායයි තමුන්නාන්සේලා කියනවා. එහෙම නම් දැන් තමුන්නාන්සේලාට ඉල්ලා අස් වන්නට හොඳටම අවස්ථාව පැමිණ තිබෙනවා. මේ රටේ ජනතාව දැන් තමුන්නාන්සේලා ප්‍රතික්ෂේප කර තිබෙනවා. අක්මීමන ගරු මන්ත්‍රීතුමා (සුගතදාස අරඹවල මයා.) මගේ කියමන අසාහිනා වන බව මට පෙනෙනවා. එහෙත්, එතුමා හෘදය සාක්ෂියට එකඟව නම්, මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආණ්ඩුවට විරුද්ධව විශාල අප්‍රසාදයක්, විශාල මහජන මතයක් අද මේ රටේ ඇති වී තිබෙන බව පිළිගන්නවා ඇති.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන (විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමති)**

(கௌரவ எம். டீ. எச். ஜயவர்தன—விஞ்ஞான ஆய்வு, வீடமைப்பு அமைச்சர்)

(The Hon. M. D. H. Jayawardena—Minister of Scientific Research and Housing)

තමුවෙන් පැරදිලත් යන්නේ නැහැ.

**එල්. සී. ද සිල්වා මයා.**

(திரு. எல். சீ. டி சில்வா)

(Mr. L. C. de Silva)

ඇත්ත වශයෙන්ම පසුගිය දවස්වල ඇති වූ පළාත් පාලන මැතිවරණ ප්‍රතිඵල වලින් ආණ්ඩුවේ තමුන්නාන්සේලාට හොඳාකාර පැහැදිලි වන්නට ඇති, මේ ආණ්ඩුව කෙරෙහි ජනතාව තුළ කිසිම විශ්වාසයක් නැති බව. අද අපේ පළාත් වල ඇත්ත වශයෙන් පළාත් පාලන මැතිවරණ සඳහා එක්සත් ජාතික පක්ෂයෙන් ඉදිරිපත් වන්නට පවා කෙනකු සොයා ගන්නට බැරි තත්ත්වයක් තිබෙනවා.

**සී. ආර්. බෙලිගම්මන මයා. (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

(திரு. சீ. ஆர். பெலிகம்மன—உள்நாட்டு விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. C. R. Beligammana—Parliamentary Secretary to the Minister of Home Affairs)

නිතරගයෙන් එන්න පුළුවනි.

**එල්. සී. ද සිල්වා මයා.**

(திரு. எல். சீ. டி சில்வா)

(Mr. L. C. de Silva)

තරගයෙන් නම් දිනාගෙන එන්නට බැහැ. ඒ නිසා නිතරගයෙන් තමයි එන්නට බලාපොරොත්තුව තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුවේ ආහාර වගා ප්‍රතිපත්තිය වගා ප්‍රෝඩාව—මේ රටේ ජනතාවගේ ඇස්වලට වැලි ගැහීමක්ය කියන්නට පුළුවනි. ආහාර වගා කිරී මේ වගකීම ඒ ආහාර පාවිච්චියට ගන්න උදවියටම භාර දිය යුතු බව අපි හැමදාම කියනවා. ඒවා පාවිච්චි නොකරන පිට දේශක්කාරයින්ට—පිට ජාතිකයින්ට—නැත්නම් ලියාපදිංචිවූ ලාංකිකයින්ට භාර දීමෙන් කවදාවත් මේ ප්‍රශ්නය විසඳන්නට බැහැ. මේ රටේ ගොවියා රජකු හැටියට සලකන්නට ලෑස්ති නම් ගොවියාට නියම වගකීම භාර දෙන්න. ජීප් රථ, මිනිමොක් ආදිය ගොවිතැනට අවශ්‍ය නැහැ. ගොවියාට අවශ්‍ය වන්නේ තමන්ගේ ගොවිතැන කරගැනීමට මුදල් ටිකකුත්, පොහොර ටිකකුත්, ඉඩම් ටිකකුත් පමණයි. තමුන්නාන්සේලා මේ තරම් ආහාර වගාව ගැන කෑ කෝ ගහනවා. ගරු ඉඩම් ඇමතිතුමා විසින් සංශෝධන කිහිපයක් ද ඉදිරිපත් කරන්න යෙදුනා. බද්දට දී තිබෙන ඉඩම් සින්නක්කර ඉඩම් බවට පත් කරනවාය කියා සංශෝධනයක් ද ඉදිරිපත් කළා. නමුත් අහිංසක පවුල් 180 ක් පමණ පදිංචි වී සිටින අම්බලන් ගොඩ කොට්ඨාශයේ පොල්උන්නෑවේ රක්ෂිත කැලේ අක්කර 250 ක් පමණ වන ප්‍රදේශයේ පදිංචි ගොවියන්ට එම ඉඩම් ලබා දීම සඳහා මෙතෙක් කිසිම පියවරක් ගෙන නැහැ. ඒ නිසා මා කියන්න කැමතියි, මේ වගේ බොරු ප්‍රෝඩාවල් මගින් ජනතාව රවටන්න පුළුවන් වන්නේ නැති බව.

අවසාන වශයෙන් ගරු කථානායකතුමනි, මා තවත් කරුණක් කිව යුතුව තිබෙනවා. මට ලැබී තිබෙන්නේ සීමා සහිත කාලයක් නිසා දීර්ඝ කථාවක් කරන්න පුළුවන්කමක් නැහැ. මෙම රාජාසන කථාවේ හැම අමාත්‍යාංශයක් ගැනම සඳහන් වෙතත් වැදගත්ම අමාත්‍යාංශයක් වන අධිකරණ අමාත්‍යාංශය ගැන වචනයක් වත් සඳහන් කර නැහැ. මා හිතන්නේ අධිකරණ ඇමතිතුමා—

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**

(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)

(The Hon. M. D. H. Jayawardena)

මේ තිබෙන්නෙ.

**එල්. සී. ද සිල්වා මයා.**

(திரு. எல். சீ. டி சில்வா)

(Mr. L. C. de Silva)

කොතනද?

3445

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

කියවන්නද ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

සාම මණ්ඩල.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

ගරු කථානායකතුමනි, මේ සාම මණ්ඩල නිසා තමයි මම කියන්නෙ අධිකරණ ඇමතිතුමා අද පඹ ගාලක පැටලී සිටින වාය කියා. තමුන්නාන්සේලා මේ සාම මණ්ඩලවලට පත් කරන්නේ තමුන්නාන්සේලාගේ පක්ෂයට හිතවත්කම් දක්වන අය පමණක් නිසා අද නොයෙකුත් පළාත්වල මේ සාම මණ්ඩල ගැන කිසිම තැකීමක් නොකරන තත්ත්වයක් ඇති වී තිබෙනවා. මේ මගින් නොයෙකුත් හිරිහැර ජනතාවට සිදු කෙරෙනවා. තමුන්නාන්සේට මතක ඇති මැද කොළඹ ගරු මන්ත්‍රීතුමා විසින් දොඩන්දූවේ සාම මණ්ඩලයේ සභාපතිතුමා ගැන ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කළා. අයි. ආර්. සී. වලට පොඩ්ඩයි වෙනස් "reconvicted" නැහැ. නිකම් "convicted" පමණයි. සාම මණ්ඩලවලට අනිසි, නුසුදුසු, අය පත් කරන්නා වගේ ශ්‍රේෂ්ඨ අධිකරණයටත් පන්දම් කාරයන් පත් කරන්ට හදන බව ආරංචියි. මේ ගරු සභාවේ විවේචනය වුණ, විවේචනයට නැවත භාජන වන, අය පත් කිරීම වැරදියි.

අද ඇත්ත වශයෙන්ම අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින අධිකරණය ගැනත් මිනිසුන් සැක පහළ කරන තත්ත්වයක් ඇති වී තිබෙනවා. පසුගිය දවස්වල අල්ලස් කොමසාරිස්තුමාට විරුද්ධව ගෙනෙන ලද විශ්වාස භංග යෝජනාව ගැන නැවතත් කල් දී තිබෙනවා. එය තවමත් සාකච්ඡාවට භාජන වුණේ නැහැ. ඒ අවස්ථාවට ඒ ගැන තව විස්තර දැන ගන්න පුළුවන් වේවි.

අද තමුන්නාන්සේලා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන බවක් පෙන්වීමට මහන්සි ගන්නවා. දැන් අලුත්කඩේ ප්‍රශ්න කරන වා "General Council of Advocates" කියන සංවිධානයේ අයිතිවාසිකම්—ඡන්දය දීමට තිබෙන අයිතිවාසිකම්—ඒ ගිනිකන අද්වකාත් මහත්වරුන්ගෙන් පිටතට නොදෙන්න. දිස්ත්‍රික් නඩුකාරයින්, මහේස්ත්‍රාත්වරුන්, අධිකරණ දෙපාර්තමේන්තුවේ නීතිඥයින් ආදී හැම දෙනෙක්ම අයින් කර Hulftsdorp වල වෘත්තියේ යෙදී සිටින අද්වකාත් මහත්වරුන්ට පමණක් එම අයිතිය සීමා කරන්න බලාපොරොත්තු වෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The hon. Member has taken ten minutes more than his time and is going outside the subject matter ; he is referring to the General Council of Advocates. What has that got to do with this Debate ?

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

ගරු කථානායකතුමනි, පාසැල් ශිෂ්‍යයන් ගොවිතැනට යෙදවීම ගැනත් වචනයක් කියන්න මට ඉඩ දෙන්න. මේ සම්බන්ධයෙන් සමාජ සේවා උප ඇමතිතුමාත් සඳහන් කළා. අද පාසැල් ශිෂ්‍යයන් පඩි වගා ව්‍යාපාරයට සහභාගි වී තිබෙනවාලු. මා ඉදිරිපිටදීම අක්මීමන ගරු මන්ත්‍රීතුමා විසින් මේ ළමයින් ගොවිතැනට යෙදවීම ගැන ගාල්ලේ අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට මතක් කරන්න යෙදුනා. ළමයින් මේ විධියට ගොවිතැනේ යෙදවීමෙන්, පෝලිම්වල ගෙනයාමෙන් අපට සිදුවන්නේ පාරේ බැස යන්නවත් බැරි තත්ත්වයක් බව අක්මීමන ගරු මන්ත්‍රීතුමා කියන්න යෙදුනා. දෙමව්පියන් බණින්නේ ආණ්ඩුවටයි. ළමයින් වැසිවලට තෙමී නොයෙකුත් ලෙඩ රෝග සාදා ගත් විට මිනිසුන් බණින්නේ කාටද ? වගා ව්‍යාපාරයට එනවාය, පැළ සිටුවීමට එනවාය, කියා ළමයින් ඇවිත් අධ්‍යාපන ඇමතිතුමාගේ කැරොල් කරත්තය අර ගෙන යනවා. ඇමතිතුමා පැමිණෙන දවස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වලට, කොපමණ වර්ෂාව ඇති වුණත් ඇමතිතුමා පිළිගන්න ළමයින් පේලි සෑදී ඉන්න ඕනෑ. ළමයින්ගේ වුවමනාකම් උඩ නොවෙයි, ගුරුවරුන්ගේ බලකිරීම නිසා වැස්සට තෙමි තෙමි හෝ අව්වට වේලි වේලී ඇමතිතුමා පිළිගන්න නොයෙක් තැන්වල ඉන්නවා. මෙය සම්පූර්ණයෙන්ම වැරදි ක්‍රියාවක්. පැළ සිටුවීමේ ව්‍යාපාරයෙහි ළමයින් යෙදවුවත්, ළමයින් ගොවිපලවලට ආවාම පැළ සිටුවීම කෙසේ වෙතත් පැළ උගුල්ලා දමනවා යයි ගොවීහු කියනවා. එම නිසා ළමයින් මෙම ක්‍රියාවෙහි යෙදවීම හොඳ පියවරක් නොවෙයි. එම නිසා මේ කාරණය ගැන අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් සඳහන් කළ යුතු කරුණක් තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ තරම් ජීවන වියදම උග්‍ර වී තිබෙන අවස්ථාවකදී, මේ රටේ සාමාන්‍ය ජනතාවට ජීවත් වන්න බැරිව තිබෙන අවස්ථාවකදී එම ප්‍රශ්නය විසඳීමට මේ රජය කිසිම වැදගත් පියවරක් නොගැනීම ගැන, ගැනීමට සූදානම් නැති වීම ගැන, අපේ බලවත් අප්‍රසාදය පළ කරන බව මතක් කරනවා.

අ. භා. 3.18

**වී. ධර්මලිංගම් මයා.** (උඩුවිල්)

*(திரு. வி. தர்மலிங்கம்—உடுவில்)*

(Mr. V. Dharmalingam—Uduvil)

சபாநாயகர் அவர்களே, எனக்குத் தாங்கள் தந்திருக்கும் நேரத்தில் நான் எத்தனையோ விடயங்களைப் பற்றிப் பேசவேண்டுமென்று எண்ணி இருந்தேன். ஆனால் எனக்குக் கொடுக்கப்பட்டுள்ள நேரத்தில் அவைகள் எல்லாவற்றைப் பற்றியும் பேச முடியாதென்று கருதி இரண்டொரு விடயங்களைப் பற்றி மட்டும் பேச விரும்புகிறேன்.

சிம்மாசனப் பிரசங்கத்திற்குக் கொண்டுவரப்பட்டுள்ள திருத்தப் பிரேரணைகளிலே முதலாவதாக, இன்றைக்கு மக்கள் நாளாந்தம் உபயோகிக்கின்ற பொருட்களுடைய விலை அதிகரிப்பைப்பற்றிக் குறிப்பிடப்பட்டுள்ளது இன்று மக்கள் தாங்கள் ஒவ்வொரு நாளும் பாவிக்க வேண்டிய பொருட்களுக்குக் கொடுக்கின்ற விலை அதிகரித்து இருக்கின்றது என்பதை நாம் ஏற்கிறோம். ஆனால் இன்றைய விலைகளைக் கவனிக்கும் பொழுது ஸ்ரீலங்கா சுதந்திரக் கட்சி ஆட்சியில் மக்கள் என்ன விலை கொடுத்து அந்தப் பொருட்களை வாங்கினார்கள் என்பதை நாங்கள் அவதானிக்க வேண்டும். இன்றைக்கு உலகச் சந்தையில் பொருட்களின் விலைகள் அதிகரித்து இருக்கின்றன. உலகச் சந்தை விலைகளிலும் பார்க்கக் கூடிய விலைகளை இங்கு நாங்கள் கொடுக்கவில்லை என்பதை அனைவரும் அறிந்து கொள்ள வேண்டும். 1963 ஆம் ஆண்டு சிம்மாசனப் பிரசங்க விவாதத்தில் கௌரவ யட்டியாந்தோட்டைப் பிரதிநிதி (கலாநிதி என். எம். பெரேரா) மிகச் சிறந்த ஒரு பேச்சை நிகழ்த்தினார். அவர் எப்பொழுதும் நன்கு படித்து ஆராய்ந்து கவனத்தோடு பேசுகின்றவர். அவர், சில பிரதிநிதிகளைப்போல வாயில் வந்ததையெல்லாம் கண்டபடி பேசுபவர் அல்ல. அப்படிப்பட்ட அவர் 1963 ஆம் ஆண்டில் பேசும்பொழுது, மக்கள் நாளாந்தம் பாவிக்கும் பொருட்களுக்கு என்ன என்ன விலைகளைக் கொடுக்கிறார்கள் என்று எடுத்துக் காட்டினார். அவர் அன்று எடுத்துக் காட்டிய 29 பொருட்களுடைய விலைகளுடன் அவற்றின் இன்றைய விலைகளை நாம் ஒப்பிட்டுப் பார்க்கும்பொழுது இன்றைக்கு மக்கள் எந்தவிதமான கஷ்டத்திலும் இல்லை என்றே கூற வேண்டும். ஸ்ரீலங்கா சுதந்திரக் கட்சியின் கீழ் இருந்ததிலும் பார்க்க இன்று மக்கள் நன்றாகவே வாழ்கின்றார்கள் என்பது நல்லாகத் தெரிகிறது. கௌரவ யட்டியாந்தோட்டைப் பிரதிநிதி அவர்களுடைய பேச்சு ஹன்சாட் அறிக்கை 52 ஆம் தொகுதியில் 1062, 1063, 1064 ஆம் பத்திகளில் இருக்கின்றது. அவர் தமது பேச்சில் 29 பொருட்களுடைய விலைகளைத் தந்திருக்கிறார். அவர் அந்த விலைகளைத் தருவதற்கு முன் கூறினார், "இந்தப் பொருட்களின் அதிகரித்த விலையினால்தான் மக்கள் மிகவும் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். உணவுப் பொருட்களிலும் பார்க்க இந்தப் பொருட்கள்தான் மக்களுக்கு மிகவும் அத்தியாவசியமானவை. இந்தப் பொருட்கள்தான் மலிவாக இருக்க வேண்டும். அப்பொழுதுதான் மக்கள் தங்களுடைய வாழ்க்கையைச் சிறப்பாக நடத்த முடியும். எனவே உணவுப்பொருட்களிலும் பார்க்க

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ධර්මලිංගම් මයා.]

இந்தப் பொருட்களுடைய விலைகள்தான் குறைக்கப்படவேண்டும்" என்று. அன்று அவர் குறிப்பிட்ட விலைகளை நான் இங்கு தர விரும்புகிறேன் :

One cup of plain tea 7 cents.
One cup of milk tea 15 „
One cup of plain coffee 15 „
One cup of milk coffee 15 „

இதே விலைகள்தான் இன்றைக்கும் எந்தக் கடையிலும் இருக்கின்றன என்பதை எவரும் மறுக்க முடியாது. சவர அலகுகள் இருபது சதம் என்று அவர் அன்று குறிப்பிட்டார். இன்றைக்குச் சவர அலகுகள் பதினைந்து சதத்திற்கு வாங்கக் கூடியதாக இருக்கின்றது. அலடின் விளக்கு மன்ரில்கள் ரூ. 9.50 ஆக விற்கப்படுகின்றன என்றும் சில இடங்களில் ரூ. 12.50 க்குக்கூட விற்கப்படுகின்றன என்றும் அவர் தமது பேச்சில் குறிப்பிட்டு இருக்கிறார். 1963 ஆம் ஆண்டில் mantle for Petromax lamp ரூ. 1.50 ஆக விற்கப்பட்டது. இன்று அதன் விலை ரூ. 125 ஆக இருக்கின்றது. இதை இதே விலைக்கு எங்கும் தாராளமாக வாங்கக்கூடியதாக இருக்கின்றது. Chimney for No. 15 lamp இரண்டு ரூபா என்று 1963 இல் அவர் கூறினர். இன்றைக்கு ரூ. 1.50 ஆக அதன்விலை இருக்கின்றது. Osco lamp chimney ரூ. 4.50 என்று அவர் கூறினர். இன்றைக்கு அதை நாங்கள் ரூ. 1.75 க்கு எங்கும் வாங்கக்கூடியதாக இருக்கின்றது. நெருப்புப் பெட்டியின் விலை எட்டுச் சதம் தொடக்கம் 10 சதம் வரை இருக்கிறதென்று கூறினர். ஆனல் இன்று நெருப்புப்பெட்டிகளை ஐந்து சதத்துக்குத் தாராளமாக வாங்கக்கூடியதாக இருக்கிறது. அன்று லக்ஷபான பற்றறியின் விலை 60 சதம். இன்று அதனை 60 அல்லது 70 சதத்துக்கு வாங்கக் கூடியதாக விருக்கிறது. அன்று பல்பின் விலை ரூ. 1.25 என்று கூறினர். இன்று அதனை ரூ. 1.10 க்கு வாங்கக் கூடியதாக இருக்கிறது. பைசிக்கிள் ரயரின் விலை ரூ. 8.75 என்று டாக்டர் என். எம். பெரேரா கூறினர். ஆனல் அதனை இன்று ரூ. 8.50 க்கு வாங்கக் கூடியதாக இருக்கிறது. அந்த பைசிக்கிள் ரயர்களை ஒரு மாதத்துக்குக் கூடப் பாவிக்க முடியாது என்றும் அப்படியான ரயர்களை ஏழை மக்களால் எப்படி வாங்கி உபயோகிக்க முடியும் என்றும் அவர் கேட்டார். இன்று உற்பத்தி செய்யப்படும் ரயர்கள் மிகவும் சிறந்த தரத்தில் உள்ளன என்பதை எவராலும் மறுக்க முடியாது. வெளிநாடுகளிலிருந்து இறக்குமதி செய்யப்பட்ட ரயர்களுக்கு எந்த விதத்திலும் தரம் குறைந்ததாக இவை இல்லை என்பதை இந்தச் சந்தர்ப்பத்தில் தெரிவித்துக் கொள்கிறேன். பைசிக்கிள் ரியூப்களின் விலை 1963 ஆம் ஆண்டில் நாலு ரூபா என்று கூறினர். இன்று அவற்றை மூன்று ரூபாவுக்கு அல்லது ரூ. 2.75 க்கு வாங்கக் கூடியதாக இருக்கின்றது. "அமுட" ரூ. 1.25 அல்லது 1.50 என்று கூறினர். ஆனல் இன்று அவற்றை 75 சதம் அல்லது 50 சதத்துக்கு வாங்கக் கூடியதாக இருக்கிறது. பப்பிளினின் விலை ரூ. 1.75 என்று கூறினர். இன்று அதனை ரூ. 1.75 க்கு அல்லது இரண்டு ரூபாவுக்கு வாங்கக் கூடியதாக இருக்கிறது. அன்று சாரங்களின் விலை ரூ. 7.50. இன்று ரூ. 6.50 க்கு வாங்கக் கூடியதாக இருக்கிறது. பிளாரிக்னம் பவுண்டின் பேனுக்கள் அன்று ரூ. 9.25. இன்று ரூ. 10.50 க்கு வாங்கக் கூடியதாக இருக்கிறது. மண்வெட்டிகள், ஒரு ரகம் ரூ. 5.50 ; அடுத்த ரகம் ரூ. 10. இன்றும் அதே விலைக்கு வாங்கக் கூடியதாக இருக்கிறது. சாதாரண ஸ்பிராட்ஸ் அன்று இரண்டு ரூபா. நான் அதனைச் சாப்பிடும் வழக்கமுடையவன் அல்லன். ஆதலால் அதனுடைய இன்றைய விலை எனக்குத் தெரியாது. சீமெந்தின் விலை ரூ. 12 என்று கூறினர். இன்று ரூ. 10 க்கு வாங்கக் கூடியதாக இருக்கிறது. இவை தவிர இன்னும் சில பொருட்களுக்கு விலை தரப்பட்டிருக்கிறது. இந்த இருபத்தொன்பது பொருட்களையும் இன்று அவர் கூறிய விலையிலும் பார்க்க குறைந்த விலைக்கு வாங்கக்கூடியதாக இருக்கிறது.

சபாநாயகரவர்களே, 1963 ஆம் ஆண்டு மக்களுடைய வருவாய் என்ன, இன்று என்ன என்பதையும் நாங்கள் சிந்தித்துப் பார்க்க வேண்டும். 1963 ஆம் ஆண்டு நடுத்தர அரசாங்க ஊழியர்களும் கீழ்தர அரசாங்க ஊழியர்களும் எடுத்த சம்பளத்திலும் பார்க்க இன்று 35 ரூபா கூடுதலாகப் பெறுகிருர்கள். நெல் உற்பத்தி செய்பவர்கள், தங்களது நெல்லை அரசாங்கத்துக்கு விற்ருல் புசல் ஒன்றுக்கு முன்னைய விலையிலும் பார்க்க இரண்டு ரூபா கூடுதலாகப் பெறலாம். உப உணவுப் பொருட்களை உற்பத்தி செய்பவர்களுக்கும்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

வருவாய் கிடைக்கிறது. அப்படியிருந்த போதிலும் கௌரவ யட்டியாந்தோட்டைப் பிரதிநிதி 1963 ஆம் ஆண்டு குறிப்பிட்டதைப் போல, அன்று பொருட்களை என்ன விலைக்கு மக்கள் வாங்கினார்களோ அதே விலைக்கு இன்றும் வாங்கக்கூடியதாக இருக்கிறது. இப்படியான நிலையிலே, தேசிய அரசாங்கத்தின் கீழ் மக்கள் கஷ்டப்படுகிறார்கள்—ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியின் அரசாங்கத்தின் கீழ் கஷ்டப்பட்டதிலும் பார்க்கக் கூடுதலாகக் கஷ்டப்படுகிறார்கள் என்று கூறினால் அது வேடிக்கையாக இருக்குமே தவிர, நம்பக் கூடியதாக இருக்காது என்று கூற விரும்புகிறேன்.

உணவு உற்பத்தியைப் பற்றிப் பலர் பேசினார்கள். உணவு உற்பத்தியில் எங்கள் அரசாங்கம் கண்ட வெற்றியை எவராலும் மறுக்க முடியாது. எனக்கு முன் பேசிய கௌரவ சமூகசேவை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி (ஜனாப் எம். எம். முஸ்தபா) அவர்கள் புள்ளி விபரங்களுடன் அரசாங்கம் ஈட்டிய வெற்றியை எடுத்துக் கூறியிருக்கிறார். எனவே, நான் அவற்றைப் பற்றி மீண்டும் கூற வேண்டிய அவசியம் இல்லை எனக் கருதுகிறேன். 1965 ஆம் ஆண்டு 641,000 தொன் அரிசி இலங்கைக்கு இறக்குமதியாயிற்று. 1966 ஆம் ஆண்டு 484,000 தொன் அரிசியையே அரசாங்கம் இறக்குமதி செய்தது. 1967 ஆம் ஆண்டு 370,000 தொன் அரிசி இறக்குமதி செய்யப்பட்டது. 1968 ஆம் ஆண்டு 270,000 தொன் அரிசி மாத்திரமே இறக்குமதி செய்யப்பட்டது என்று கணக்கு வைத்திருக்கிறார்கள். இந்த ஒரு விபரமே நெல் உற்பத்தியில் அரசாங்கம் எவ்வளவு தூரத்திற்கு முன்னேற்றமடைந்திருக்கிறதென்பதை உங்களுக்கு எடுத்துக்காட்டுகிறது.

உப உணவுப் பொருட்களின் உற்பத்தியிலே கூட நாங்கள் சிறந்த வெற்றியை அடைந்திருக்கிறோம். 1965-66 ஆம் ஆண்டில் மிளகாய் உற்பத்தியைப் பொறுத்தவரையிலே 9,600 அந்தர் மிளகாய் உற்பத்தியாகியிருக்கின்றது. 1966-67 ஆம் ஆண்டிலே 27,027 அந்தர் மிளகாய் உற்பத்தி செய்திருக்கிறோம். 1967-68 ஆம் ஆண்டிலே 38,856 அந்தர் மிளகாய் உற்பத்தியாக்கப்படுமென்று கணக்கு வைத்திருக்கிறார்கள். அதுபோல வெண்காயம், உருளைக்கிழங்கு போன்றவைகளெல்லாம் தீவிரமாக உற்பத்தி செய்யப்பட்டு வருவது உங்களுக்கு நன்கு தெரியும். ஆகையினால் அரசாங்கம் விவசாய உற்பத்தியிலே அக்கறைகொண்டுள்ளதென்று கூறினால் அது மிகையாகாது. வீணான கட்டுக்கதையாக அது இருக்க முடியாது.

அரசாங்கம் விவசாய உற்பத்தியிலே எவ்வளவு அக்கறை காட்டுகின்றதோ அதைப் போலக் கைத்தொழில் அபிவிருத்தியிலும் அக்கறை காட்டுவதையிட்டு நாம் மகிழ்ச்சி அடைகிறோம். கூடிய விரைவிலே 116 இயந்திரக் கைத்தொழிற் சாலைகளை ஆரம்பிப்பதற்கு வேண்டிய நடவடிக்கைகள் எடுக்கப்படுமென்று சிம்மாசனப் பிரசங்கத்திலே கூறப்பட்டிருக்கிறது. அதற்கு வேண்டிய உத்தரவுகள் வழங்கப்பட்டிருப்பதாகவும் கூறப்பட்டுள்ளது. அதையிட்டு நாம் மிக மகிழ்ச்சியடைகிறோம். ஒரு நாட்டுக்கு விவசாய உற்பத்தி எவ்வளவு அவசியமோ அதேபோலக் கைத்தொழில் அபிவிருத்தியும் மிக அவசியமாகும். கைத்தொழில் உற்பத்தியின் மூலம்தான் ஒரு சில வகுப்பினருக்கு உத்தியோகம் கொடுக்க முடியும், ஒரு நாட்டின் எல்லாப் பகுதிகளிலும் உற்பத்தியைக் காண முடியுமென்பதை நாம் மறுக்க முடியாது. ஆனால், இந்த நேரத்திலே அரசாங்கத்துக்கு ஒரு புத்திமதியைக் கூறிவைக்க ஆசைப்படுகின்றேன். ஸ்ரீலங்கா சுதந்திரக் கட்சி அரசாங்கம் தமது கைத்தொழில் அபிவிருத்தியைப் பற்றித் தம்பட்டமடித்துக் கொண்டு திரிவது வழக்கமாகிவிட்டது. 400 கைத்தொழிற் சாலைகளை நாம் ஆரம்பித்தோம் என்று அவர்கள் தம்பட்டமடிக்கின்றார்கள். அந்தக் கைத்தொழிற் சாலைகள் எவ்வளவு தூரம் இந்நாட்டுக்குப் பலனளித்திருக்கின்றதென்று பார்க்குமிடத்து அது எங்களுக்குப் பெரும் ஏமாற்றமாகத்தான் இருக்கிறது. கைத்தொழிற் சாலைகள் மூலம் வேண்டிய பலனையடைந்திருக்கிறோம் என்று தேசிய அரசாங்கம் சொன்னால் நீங்கள் ஏற்றுக்கொள்ள மாட்டீர்கள். ஆனால், கௌரவ யட்டியாந்தோட்டைப் பிரதிநிதி, கௌரவ அகலவத்தைப் பிரதிநிதி (கலாநிதி கொல்வின் ஆர். டி சில்வா) போன்றவர்கள் கூறினால் நீங்கள் ஏற்றுக்கொள்ளுவீர்கள் என்று நான் நம்புகிறேன்.

ஸ்ரீலங்கா சுதந்திரக் கட்சி ஆட்சியின் போது தொழிற்சாலைகள் வளர்ந்ததைப் போலத் தேசிய அரசாங்கத்தின் தொழிற்சாலைகள் வளரக்கூடாது. அந்த விதத்திலே செல்லவிடக்கூடாதென்று நான் அரசாங்கத்திற்குக் கூறிவைக்க விரும்புகிறேன். 1963 ஆம் ஆண்டு நிகழ்ந்த சிம்மாசனப் பிரசங்க விவா


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தத்திலே அச்சமயத்தில் கௌரவ தெஹிவளை-கல்கிசைப் பாராளுமன்ற அங்கத்தவராக விருந்த தற்போதைய அகலவத்தைப் பிரதிநிதி அவர்கள், ஸ்ரீலங்கா சுதந்திரக் கட்சியினரின் ஆட்சியிலே இருந்த கைத்தொழில் வளர்ச்சியைப் பற்றிக் கூறியவை நான் இங்கே வாசித்துக்காட்ட விரும்புகிறேன். இதை நான் இங்கே ஏன் ஞாபகப்படுத்த விரும்புகிறேனென்றால் அந்த விதத்திலே தேசிய அரசாங்கத்தின் கைத்தொழில்கள் வளரவிடாது தடுத்துவிட வேண்டு மென்பதற்காகத்தான். அவர் கூறியதாவது :

"The Minister of Industries talked of an ever-extending list of new industries which he says are being started in this country......Four hundred odd industries are being started or are about to be started in this country. And by whom ? If there are 410 of them, 400 and probably 5 of them are to be started by so-called private enterprise. And on what terms ? One, a five-year tax holiday ; two, freedom to enter into partnership with foreign capital ; three, freedom in that partnership for the foreign capitalist to take away his profits and also to take away his capital when he wants. No provision even for the foreign capitalists to be compelled to an agreement that over a period of years the ownership of the enterprise is to pass over to the local partner. Nothing like that !.....

My hon. Friend even boasts that they would be exporting Manhattan shirts ; they want to export to Africa ! But who are Manhattan shirts ? The local enterprise of the American producer of Manhattan shirts ! We know that. That gentleman periodicaly comes to Ceylon to inspect the enterprise. So what you are really doing is in that case to provide American capital with a base in Ceylon for operations in East Africa instead of direct operations. What I am seeking to say is this. You are in the name of industrial development strengthening the stranglehold of foreign capital on the economy of our country. That is the fact. —[OFFICIAL REPORT, 30th July 1963 ; Vol. 52, c. 1086-8.]

தற்போதைய கௌரவ அலகவத்தைப் பாராளுமன்ற அங்கத்தவர் பாராளுமன்றத்தில் அன்று பேசும்போது இப்படிக் கூறினார். 1965 ஆம் ஆண்டு தேர்தல் பிரசாரத்தின் போது எனது தொகுதியிலே, இந்த நாணய கைத்தொழில்கள் பற்றி அவர் பேசியதை நீங்கள் கேட்டால் அதனை உங்களால் நம்ப முடியாமல் இருந்திருக்கும். "அவற்றால் இந்த நாட்டுக்குப் பெரிய விமோசனம் ஏற்பட இருக்கின்றது. அந்த விமோசனத்தில் தமிழ் மக்களும் கலந்துகொள்ள வேண்டும். கலந்து கொள்ளாவிட்டால் கேடு வரும்" என்று அவர் பேசினார். ஆனால், பாராளுமன்றத்திற் பேசும் பொழுது, "strengthening the stranglehold of foreign capital on the economy of our country" என்று கூறினார். அதே போல கௌரவ யட்டியாந்தோட்டைப் பாராளுமன்ற அங்கத்தவர் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியின் கைத்தொழில்களைப் பற்றிப் பேசியதை நான் இங்கு வாசித்துக்காட்ட விரும்புகின்றேன். அதிக தூரத்தில் அல்ல. 1963 ஆம் ஆண்டிலே அவர் கூறிய கூற்றை வாசித்துக் காட்ட விரும்புகிறேன் :

Dr. N. M. Perera made the following accusations against the industrial policy of the S.L.F.P. Government. He said :

"Under the guise of industrial development you have given monopolies to individual firms without looking into the quality of the goods and their prices. All that you are successfully doing is giving enormous profits to these firms. While you have imposed a wage freeze on employees, you have given an amount of tax relief to the firms and encouraged them to make profits at the expense of the consumer both as regards price and quality of the article......

You set up an industrial estate at Ekala. Who are the major owners of the so-called industries ? The majority of them are non-Ceylonese. Not only that--all the industries started here are really backed by foreigners and foreign capital ; the local people have only given their names. That is what you are doing under the guise of industrial development.

THE HON. C. P. DE SILVA : They (U.N.P.) made them Ceylonese.

DR. N. M. PERERA : I am not denying that the U.N.P. are guilty. They made them honourable citizens, distinguished citizens, and so on.

MR. JAYASINGHE : The Government is making them millionaires."—[OFFICIAL REPORT, 30th July 1963 ; Vol. 52, cs. 1061-2.]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

அடுத்ததாக, யாழ்ப்பாணத்திலே நிலவுகின்ற சாதிப் பிரச்சினையைப் பற்றி எதிர்க் கட்சி நண்பர்கள் முதலைக்கண்ணீர் வடிப்பதைப் பார்க்கும்பொழுது ஆச்சரியமாக இருக்கின்றது. கௌரவ தம்பதெனியாப் பாராளுமன்ற அங்கத்தவர் (திரு. ஆர். ஜீ. சேனுநாயக்க) முதலைக் கண்ணீர் வடிக்கிறுர். மற்றைய எதிர்க்கட்சி நண்பர்களும் முதலைக்கண்ணீர் வடிக்கிறுர்கள்.

சில மாதங்களுக்கு முன் இதே கௌரவ சபையிலே கௌரவ உள்ளூர் ஆட்சி அமைச்சர் பற்றி விவாதம் நடந்த நேரத்தில் கௌரவ யட்டியாந்தோட்டைப் பாராளுமன்ற அங்கத்தவர் நன்கொடைப் பணங்கள் எல்லாம் யாழ்ப்பாணத்துக்குத்தான் கொண்டு போகப் படுகின்றதென்று குறிப்பிட்டார். என்ன என்ன நன்கொடைப் பணம் யாழ்ப்பாணத்திற்குப் போனதோ எனக்குத் தெரியவில்லை. குறிப்பாக அவர் கூறினுர், வீடமைப்புத் திட்டங்கள் எல்லாம் யாழ்ப்பாணத்திற்குத்தான் கொண்டு போகப்படுகின்றன என்று. அவர் எந்த வீடமைப்புத் திட்டத்தைப் பற்றிக் கூறினுரோ எனக்குத் தெரிவில்லை. ஆனுல் கௌரவ உள்ளூராட்சி அமைச்சர் ஒரே ஒரு வீடமைப்புத் திட்டத்தைத்தான் யாழ்ப்பாணத்தில் உருவாக்கி இருக்கிறுர். சமீபத்திலே அச்சுவேலியிலே சிறுபான்மைத் தமிழ் மக்களுக்காக அந்த வீடமைப்புத் திட்டம் திறந்து வைக்கப்பட்டது. இப்படியான திட்டங்களைக் கண்டிப்பவர்கள் சிறுபான்மை மக்களுக்காக முதலைக் கண்ணீர் வடிப்பது ஆச்சரியமாக இருக்கின்றது.

தமிழ் அரசுக் கட்சி, சிறுபான்மைத் தமிழ் மக்களுக்காக என்ன என்ன செய்திருக்கின்றது என்று நான் கூறத் தேவையில்லை. கௌரவ உள்ளூராட்சி அமைச்சர், சிறுபான்மைத் தமிழ் மக்கள் உள்ளூராட்சி மன்றங்களில் போதிய பிரதிநிதித்துவம் வகிக்க வேண்டுமென்பதற்காக பல உள்ளூராட்சி மன்றங்களில் வட்டாரங்களைப் பிரித்துப் புதிய வட்டாரங்களை அமைத்து அவர்களுக்கு பிரதிநிதித்துவம் எடுத்துக் கொடுத்ததை எல்லோரும் அறிவர். அதுமட்டுமல்ல; வேறு எத்தனையோ விடயங்களில் செய்யக்கூடியதை எல்லாம் நாங்கள் செய்திருக்கிறேும். சிறுப்பான்மைத் தமிழ் மக்களுக்கு நன்மை அளிக்கும் வகையில் 1957 ஆம் வருடத்திய Social Disabilities Act சட்டத்தைத் திருத்த வேண்டுமென்று இன்றைக்கு எதிர்க் கட்சி நண்பர்கள் கூறுகிறுர்கள். அந்தச் சட்டம் இங்கே காலஞ்சென்ற திரு. எஸ். டபிள்யூ. ஆர். டீ. பண்டாரநாயக்க அவர்களால் கொண்டுவரப்பட்டது தமிழ் அரசுக் கட்சியின் வேண்டுகோளுக்கிணங்கவே என்பதைத் தெரியாமல் இவர்கள் கதைக்கிறுர்கள். 1956 ஆம் ஆண்டிலே அப்போதைய கோப்பாய், திருகோணமலைப் பிரதிநிதிகள் கொண்டுவந்த ஒரு பிரேரணையைப் பூர்த்தி செய்யும் முகமாகத்தான் அந்தச் சட்டம் கொண்டு வரப்பட்டது. இன்றைக்கு இந்தச் சட்டத்தை அமுல் நடத்தும் நேரத்திலே அதாவது இந்தச் சட்டத்தின்கீழ் வழக்குகள் தாக்கலாகுகின்ற நேரத்திலே யாழ்ப்பாணத்தில் இருக்கின்ற எதிர்க் கட்சி நண்பர்களுடைய வழக்கறிஞர்களில் ஒருவராவது சிறுபான்மைத் தமிழ் மக்களுக்காக வழக்குப் பேச முன்வரவில்லை. இன்று தமிழ் அரசுக் கட்சிதான் பணம்வாங்காமல் சிறுபான்மைத் தமிழ் மக்களுக்காக வழக்குகளைப் பேசுகின்றதென்பதை நான் இங்கு சொல்லி வைக்க விரும்புகிறேன். ஆனுல், இன்றைக்கு இந்தச் சாதிப்பிரச்சினையை யாழ்ப்பாணத்தில் வளர்க்கப் பார்க்கின்றவர்கள் எதிர்க் கட்சி நண்பர்களை ஆதரித்தவர்கள்தான் என்பதையும் கூறிவைக்க விரும்புகிறேன்.

கௌரவ தம்பதெனியாப் பிரதிநிதி பேசும் பொழுது ஒரு சாதியினரைக் குறிப்பிட்டுப் பேசினுர். இந்தப் பிரச்சினையில் அவர் குறிப்பிட்டுப் பேசிய சாதியினர் எவ்விதம் நடந்து கொள்கிறுர்கள் என்பதை கௌரவ தம்பதெனியாப் பிரதிநிதி யாழ்ப்பாணம் வந்து பார்த்தால் தெரியும். யாழ்ப்பாணத்திற்கு எப்பொழுதாவது அவர் விஜயம் செய்திருக்கிருரா என்பது எனக்குத் தெரியாது. கௌரவ தம்பதெனியப் பிரதிநிதி சில வேளை யாழ்ப்பாணம் தென்னிந்தியாவில் இருக்கின்றது என்றுகூட நினைத்துக் கொண்டிருக்கின்ருரோ என்றும் எனக்குத் தெரியாது. யாழ்ப்பாணத்தில் யாருக்காக யார் உழைக்கிறுர்கள் என்பதை அவர் அங்கு ஒரு முறை வந்து பார்க்க வேண்டும். அப்படி வந்து பார்க்காமல் விஷமம் செய்வதில் பயன் இல்லை.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. ජී. සේනානායක මයා.** (දඹදෙනිය)
(திரு. ஆர். ஜீ. சேனநாயக்க—தம்பதெனிய)
(Mr. R. G. Senanayake—Dambadeniya)
තව ටික කාලයකින්—[බාධා කිරීමක්]

**ධර්මලිංගම් මයා.**
(திரு. தர்மலிங்கம்)
(Mr. Dharmalingam)

பிரிட்டிஷ் ஏகாதிபத்தியம் தமது ஆட்சியைக் காலனிகளில் நிலைநாட்ட ஒரு காலத்தில் இரண்டுவிதமான தந்திரங்களைக் கையாண்டது. ஒன்று அந்தந்த நாடுகளிலே வாழ்கின்ற மக்களைப் பிரித்து வைத்து தமது ஆட்சியைப் பலப்படுத்தினார்கள். அடுத்து, மத போதகர்களை அனுப்பி ஏழை மக்களை மதம் மாற்றி தங்களுடைய நோக்கை எய்த வேண்டிய முயற்சிகளை எடுத்தார்கள். இன்று கௌரவ தம்பதெனியப் பிரதிநிதியுடைய கட்சிக்கும் ஸ்ரீலங்கா சுதந்திரக் கட்சிக்கும் இடையில் ஏதாவது வித்தியாசம் இருப்பதாக எனக்குத் தெரியவில்லை. அவர் துணிச்சலாக வெளியே சொல்வதை ஸ்ரீலங்கா சுதந்திரக் கட்சியினர் இரகசியமாகச் செய்து வருகின்றார்கள் என்பது எமக்குத் தெரியும். இரண்டு பேர்களுக்கும் ஒரே நோக்கம். இந்த நாட்டில் வாழும் தமிழ் பேசும் மக்களை ஒழித்துக் கட்ட வேண்டும், இந்த நாடு தனிச் சிங்கள நாடாக இருக்க வேண்டும், தனிப் பௌத்த நாடாக இருக்க வேண்டும் என்ற ஒரே நோக்கத்துடன் தான் அவர்கள் உழைக்கிறார்கள். இதனை ஸ்ரீலங்கா சுதந்திரக் கட்சி மறைமுகமாகச் செய்து வருகிறது; கௌரவ தம்பதெனியப் பிரதிநிதி உடைய கட்சி வெளிப்படையாகச் செய்து வருகிறது. தங்களுடைய சக்தியைப் பலப்படுத்துவதற்காக இன்று தமிழினத்தைப் பிரிக்கும் ஒரு சூழ்ச்சிதான் அவர்களுடைய பிரசாரம் என்று கூற விரும்புகிறேன்.

சபாநாயகரவர்களே, இன்று மாவட்ட சபைகள் பிரச்சினையை, மாவட்ட சபைப் பிரச்சினையாக அல்லாமல் தமிழரசுக் கட்சியினுடைய பிரச்சினையாக, தமிழரசுக் கட்சியினுடைய கொள்கையை இலட்சியத்தைப் பற்றிய பிரச்சினையாக வைத்து, இன்று நாட்டிலும் இந்தக் கௌரவ மன்றத்திலும் பிரசாரம் நடந்து வருகிறது. தமிழரசுக் கட்சி இதற்கு முன் எத்தனையோ நடவடிக்கைகளை எடுத்திருக்கிறது. அவற்றை இன்றும் சரியானவை என்றுதான் நாங்கள் கருதுகிறோம். அந்த நடவடிக்கைகளிலே எந்தவிதமான பிழையும் இருப்பதாக எனக்குத் தெரியவில்லை. எங்களுடைய இலட்சியத்திலோ கொள்கையிலோ பிழை இருப்பதாகத் தெரியவில்லை. தமிழரசுக் கட்சியினர் கலவரத்தை உண்டாக்குகிறார்கள், சமாதானத்துக்குப் பங்கத்தை உண்டாக்கிறார்கள் என்று கூறுகிறார்கள். இந்த நேரத்தில் காலஞ்சென்ற மாட்டின் லூதர் கிங் அவர்கள் அமெரிக்க மக்களுக்குக் கூறிய ஒன்றை எடுத்துக் கூற விரும்புகிறேன். மாட்டின் லூதர் கிங் அவர்கள் சுடப்பட்டு இறந்த நேரத்திலே எதிர்க் கட்சி நண்பர்கள்தாம் முன்னின்று அஞ்சலி செலுத்தினார்கள். மாட்டின் லூதர் கிங் அவர்கள் ஆங்கிலத்திலே கூறினார்கள் : "Peace is not the absence of war but the presence of justice."——

சபாநாயகரவர்களே, இந்த நாட்டில் சமாதானம் நிலவ வேண்டும் என்றால், இந்த நாட்டில் அமைதி ஏற்படவேண்டும் என்றால் இந்த நாட்டில் வாழும் எல்லா மக்களுக்கும் நீதியும் நியாயமும் வழங்கப்பட வேண்டும் என்று கூறி எனது பேச்சை முடிக்கிறேன்.

**වී. නවරත්නම් මයා.** (කයිට්ස්)
(திரு. வீ. நவரத்னம்—ஊர்காவற்றுறை)
(Mr. V. Navaratnam—Kayts)
නැඟී සිටියේ ය—

எழுந்தார்—

rose—

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

The hon. Member for Bulathsinhala. I will call the hon. Member for Kayts later.

අ. භා. 3.46

**මංගල මූණසිංහ මයා.** (බුලත්සිංහල)
(திரு. மங்கள முனசிங்க—புலத்சிங்கள)
(Mr. Mangala Moonesinghe—Bulathsinhala)

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මා නම් බලාපොරොත්තුව සිටියේ තව ප්‍රමාද වී කථා කරන්නයි. එහෙත් තමුන්නාන්සේගේ අණ පරිදි—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I wish to inform hon. Members that I have been given a list of names of speakers, and very often I find when a Member has finished his speech the Member whose name appears next on the list is not in the Chamber. I am therefore not able to control the Debate when Members leave the Chamber before their names are called. I would request hon. Members to follow the list given by the Whip and also the time given by the Whip.

**මංගල මූණසිංහ මයා.**
*(திரு. மங்கள முனசிங்க)*
(Mr. Mangala Moonesinghe)

My name appears last on the list.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I find the other Members whose names are on the list have left the Chamber.

**මංගල මූණසිංහ මයා.**
*(திரு. மங்கள முனசிங்க)*
(Mr. Mangala Moonesinghe)

It does not matter, Sir. I am prepared to speak now.

**එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. M. P. de Zoysa Siriwardena)

ගරු කථානායකතුමනි, එක කරුණක් කියන්න ඕනෑ—[බාධාකිරීමක්]

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I do not think I can be a party to any arrangement where you place one name against another.—[*Interruption.*] I shall call upon the Members who are not here now to speak in due course.

**මංගල මූණසිංහ මයා.**
*(திரு. மங்கள முனசிங்க)*
(Mr. Mangala Moonesinghe)

ගරු කථානායකතුමනි, මෙම රාජාසන කථා ස්තුති යෝජනාව පිළිබඳ විවාදයේදී වචන ස්වල්පයක් කථා කිරීමට ඉඩ දීම ගැන මා තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. ඇත්ත වශයෙන්ම ගරු උඩුවිල් මන්ත්‍රීතුමා (වී. ධර්මලිංගම් මයා.) කථා කළ අන්දමට මේ විවාදයේදී පෞද්ගලික ප්‍රශ්න මතුකරගෙන ගරු යටියන්තොට මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) 1963 දී මෙන්න මේ දේ කීවාය, අද මෙන්න මෙහෙම කියනවාය යනාදී වශයෙන් තර්ක කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. ගරු උඩුවිල් මන්ත්‍රීතුමා එක්සත් ජාතික පක්‍ෂයට විරුද්ධව සිටින කාලයේදී මේ ගරු සභාවේදීම එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව කථා කරන්නට ඇතැයි කියා එතුමාට මා මතක් කර දෙන්නට ඕනෑ. ප්‍රශ්නය ඒක නොවෙයි. මා තමුන්නාන්සේට කියන්න යන්නේ මෙයයි: අප නිදහස ලැබූ කාලයේ සිටම අවුරුදු ගණනාවක්ම රාජාසන කථා අසා තිබෙනවා. එමෙන්ම සෑම අවුරුද්දක් පාසාම මේ ගරු සභාවේ රාජාසන කථා විවාද කරලත් තිබෙනවා. ඒ අනුව බලන විට ටිකක් ගැඹුරු අන්දමට අපි සිතා බැලුවොත් මේ රාජාසන කථාවල අර්ථයක් තිබෙනවාද, නැත්නම් ඒවායේ අර්ථය කුමක්ද, එහෙමත් නැත්නම් මේ රාජාසන කථාවලින් වැඩක් වෙනවාද කියා බලමු. අපි අවුරුදු පතාම රාජාසන කථා අසා ඒවා විවාද කර ගෙදර යනවා. ඒ මගින් මහජන මුදල් නාස්ති කරනවා. ඒ හැර එයින් සිදුවන කාර්යය කුමක්ද? අප විසින් සාකච්ඡා කර යුත්තේ අන්න ඒ විධියේ ප්‍රශ්නයි.

මෙය ප්‍රශ්න දෙකක් හැටියට ගන්නට මා ලැහැස්තියි. එකක් නම් මේ රාජාසන කථා පවත්වන දිනයේ පවත්වනු ලබන උත්සවයයි. ඒ උත්සවය දෙස බලන විට මට පෙනී ගියේ ඇත්ත වශයෙන්ම එම උත්සවය පරණ යුගයක නැත්නම් අධිරාජ්‍යවාධී යුගයක පැවැත්වූ උත්සවයක් හැටියටයි. එහි පරිසරය ඒ විධියයි. එයින් ඇතිවන හැඟීමත් ඒ විධියයි. ගරු අග්‍රාණ්ඩුකාරතුමා සමග පැමිණෙන නිල ධාරී මහත්වරුන් දෙස බලන විට ඒ විධි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මංගල මුණසිංහ මයා.]

යේ හැඟීමක් තමයි ඇති වන්නේ. ඔවුන් සුදු ඇඳුම් ඇඳගෙන, සුදු තොප්පි දමා ගෙන, ඔළුව උඩ රතු පිහාටු අලවා ගෙනයි මේ ස්ථානයට පැමිණෙන්නෙ. එමෙන්ම හමුදාවල නිලධාරි මහත්වරුන් පැය ගණනාවක්ම ඉටි රූප වගේ හිටගෙන සිටිනවා. එවැනි පරිසරයකයි මේ රාජාසන කථාව කියෙව්වේ. ඒකයි රාජාසන කථාවේ ස්වරූපය. මේ ආණ්ඩුවෙන් මේ අවුරුද්ද වෙනුවෙන් ඉදිරිපත් කර ඇති රාජාසන කථාව දෙස බැලුවාම මෙය අවුලක් හැටියටයි අපට පෙනී යන්නෙ. වාක්‍ය කීපයක් කිසිම පැහැදිලි කමක් නැතුව ඉදිරිපත් කර තිබෙනවා. අවුරුදු තුනක් ගියාට පස්සෙත් මහජනතාවට කියන්න යන්නෙ මේවායි. ගරු කථානායකතුමනි, රාජාසන කථාවෙන් ඉදිරිපත් කර ඇති අදහස් කීපයක් මම දැන් කියවන්නම් :

"මාගේ ආණ්ඩුව වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාවක් ළඟදී පත් කරනු ඇත."

තවත් තැනෙක :

"වසංගත රෝගයක් ලෙස පැතිර ගොස් ඇති මැලේරියාව මුලිනුපුටා දැමීමට මාගේ ආණ්ඩුව සකල ශක්තියම යොදවා ක්‍රියා කරගෙන යයි."

තවත් තැනෙක :

"වෙළඳ නැව් කණ්ඩායමක් පිහිටුවාලීම සඳහා කටයුතු කරනු ඇත."

ඒ වාගේම:

"නව මාර්ග සැලැස්මක් සැලකිල්ලට භාජනව පවතී."

මෙන්න මේ වාගේ වාක්‍ය කීපයක් එකතු කර සකස් කර ගත් රාජාසන කථාවකුයි මෙවරත් ඉදිරිපත් කර තිබෙන්නෙ. ගරු කථානායකතුමනි, මෙවැනි දේවල් ගැනද අප මෙතැනදී සාකච්ඡා කරන්න යන්නෙ ? සෑම අවුරුද්දකදීම මේ වාගේ වාක්‍ය කීපයක් එකතු කර ඉදිරිපත් කරනවා. ගිය අවුරුද්දේ දුන් පොරොන්දු මේ අවුරුද්දෙ ඉදිරිපත් කරන්නෙ නැහැ. ඊට පෙර අවුරුද්දෙ දුන් පොරොන්දු සම්පූර්ණයෙන්ම අමතක කර දමා, ඊළඟ අවුරුද්දෙ අළුතෙන් පොරොන්දු දෙනවා. ඔය අන්දමට රාජාසන කථාව සකස් කරමින් නොයෙකුත් පොරොන්දු දෙමින් මහජනතාව රවටන්න මේ රජය උත්සාහ කරනවා. ඇත්ත වශයෙන්ම, 1965 මේ ආණ්ඩුව පිහිටුවීමේදී දුන් පොරොන්දු එකක් වත් මතක නැහැ. ඒවා සම්පූර්ණයෙන්ම අමතක කර දමා අලුත් ස්වරූපයකින් මෙවර රාජාසන කථාවක් ඉදිරිපත් කර තිබෙනවා. මා අහන්නෙ මේක විහිළුවක් නොවේද කියායි.

එම නිසා මෙබඳු රැවටිල්ලක් කරන්නෙ නැතුව, අන්ධයන් මෙන් මෙයට සහභාගි කරවා ගන්නෙ නැතුව, යම්කිසි පක්ෂයක් ආණ්ඩුවක් පිහිටුවා ගන්නවා නම්, මහා මැතිවරණයේදී ඒ ආණ්ඩුව ප්‍රකාශන ඉදිරිපත් කරනවා නම්, ඒ ප්‍රකාශන අනුව, ඉදිරිපත් කරන ප්‍රතිපත්ති අනුව, යම්කිසි සැලැස්මක් අනුව සකස් කරන ලද රාජාසන කථාවකුයි ඉදිරිපත් කළ යුතු වන්නෙ. අවුරුදු පහක කාල පරිච්ඡේදය තුළ කරන්න බලාපොරොත්තු වන දේවල් පිළිබඳ සැලැස්මක් සම්පාදනය කර රාජාසන කථාව මගින් එය ඉදිරිපත් කිරීමයි කළ යුතුව තිබෙන්නෙ. අවුරුදු පහේ සැලැස්මේ පළමුවන අවුරුද්දේ ඉලක්ක මෙන්න මේවායි කියා රාජාසන කථාව මගින් මහජනතාවට හෙළි කරනවා. දෙවැනි අවුරුද්දේ කරන්න බලාපොරොත්තු වන්නේ මෙන්න මේවායි හෙළි කරනවා. ඒ අන්ද මට සැලැස්ම හෙළිදරව් කළොත්, තමුන්නාන්සේලා ගිය අවුරුද්දෙ මෙන්න මේ දේවල් රාජාසන කථාව මගින් කරන්න පොරොන්දු වුණා, නමුත් මේවා ඉටු කර නැතැයි කියා ඊළඟ රාජාසන කථා විවාදයේදී අපට කියන්න පුළුවනි.

ගරු කථානායකතුමනි, මෙම රාජාසන කථාවෙහි සඳහන් කර ඇති දේවල් ඉටු කරන්න කොයි ආණ්ඩුවකටවත් නව අවුරුදු පණහකින්වත් බැහැ. රටේ කරන්න තිබෙන සෑම දෙයක්ම මෙම කථාවට ඇතුළත් කර මහජනතාව රවටා තිබෙනවා. සෑමදාම කරන්නෙත් මේ දේමයි. එහෙම නැතුව, එක්තරා සැලැස්මක් අනුව අවුරුද්ද තුළ කරන්න පුළුවන් කාරණා දෙක තුනක් හෝ ඇතුළත් කර මෙය ඉදිරිපත් කළා නම් මේ දේවල් හරියාකාර කළේ නැත්තෙ මන්ද කියා අපට ප්‍රශ්න කරන්න පුළුවනි. එහෙම කළොත් වගකීමක් ඇතුව රාජාසන කථාව ඉදිරිපත් කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇති බව අපට කල්පනා කරන්න පුළුවනි. නමුත් අද වගකීමෙන් සම්පූර්ණයෙන්ම තොරව, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන දේවල් තමයි රාජාසන කථාව මගින් ඉදිරිපත් කර තිබෙන්නෙ. නමුත් මා කලින් සඳහන් කළ අන්දමට, එක්තරා සැලැස්මක් අනුව, වර්ෂය තුළ කිරීමට අදහස් කරන දේවල් පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කරනවා නම්, ආණ්ඩුවෙ මැති ඇමතිවරු එක්තරා වගකීමක් ඇතුවයි මේ මන්දිරයට එන්නෙ. එවිට නිලධාරීන් පවා, පොරොන්දු වූ වැඩ කටයුතු කිරීමට උනන්දු වෙනවත් හැර ඉදිරිපත් කරන පොරොන්දු හරියාකාර ඉටු කිරීමට ලොකු බැඳීමකින්, වගකීමකින් යුක්තව කටයුතු කරන බවත් තමුන්නාන්සේට මතක් කරන්න කැමතියි. කථානායකතුමනි, මා කියන්නේ මේ විහිළුම දැන්වත් නවත්වන්නට ඕනෑ බවයි. ඇත්ත වශයෙන්ම මෙය, කාලය නාස්ති කරන, මහජන මුදල් නාස්ති කරන වැඩක්.

උදාහරණ පෙන්වා දෙමින් මගේ ප්‍රකාශය තහවුරු කරන්න මම සූදානම්. මේ ආණ්ඩුවේ පළමු වැනි රාජාසන කථාවට—1965 රාජාසන කථාවට—නොයෙක් දේවල් අඩංගු වුණා. "මහා මැතිවරණයේදී දුන් පෙරොන්දු ඉටු කරනවා, ඒ අනුව ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ක්‍රමයට අපි ක්‍රියා කරගෙන යනවා" කියා ඒ රාජාසන කථාවේ සඳහන් කළා. එසේ 1965 රාජාසන කථාවෙන් මේ ආණ්ඩුව පොරොන්දු කීහිපයක්ම දුන්නා. එහෙත් ඒවායින් එකක්වත් ඉෂ්ට නොවූ බවත්, ඒ පොරොන්දුවලට මොනවා වුණාදැයි නොදන්නා බවත් කියන්නේ කණගාටුවෙන්. එදා ඒ රාජාසන කථාවලට ඇතුළත් වූ ඒ දේවල් එකක්වත් මේ රාජාසන කථාවේ නැහැ. මම එයින් එකක් පමණක් කියන්නම්. 1965 රාජාසන කථාවෙන් මේ ආණ්ඩුව මෙවැනි පොරොන්දුවක් දුන්නා :

"……පරිපාලනයේ හා ලාභ ලැබීමේ අවස්ථාවන් සේවක පක්ෂයටද ලබා දීමෙන් සේව්‍ය සේවක දෙපක්ෂයේ සම්බන්ධතාව තහවුරු කරනු ලැබේ.—"

ඒ විධියට මහ ලොකුවට පුරසාරම් කියමින්, ඒ සම්බන්ධයෙන් කම්ටුවකුත් පත් කර තිබෙන බව මේ ගරු සභාවේදී කීවා. එහෙත් ඒ යෝජනාවට මොකක් වුණාද, කම්කරු ජනතාවට ඒ විධියට ලාභ බෙදා දුන්නාද නැද්ද කියාවත් මේ රාජාසන කථාවේ සඳහන් වී නැහැ. මේ ආණ්ඩුව ඒ කම්කරුවන්ටත් වඩා "කම්කරුවන්" බව පෙන්වන්නට ඒ අවස්ථාවේ උත්සාහ කළ බව මා මතක් කරන්න කැමැතියි. මේ විධියට රට රවටන්නේ ඇයිදැයි මා අහන්න කැමතියි. ඒ යෝජනාව, පොරොන්දුව ඉෂ්ට කරන්නට මේ ආණ්ඩුවට ශක්තියක් නැති බව තමුන්නාන්සේලා හොඳටම දන්නවා; අගමැතිතුමා පවා හොඳටම දන්නවා. සේව්‍ය පක්ෂයට, පාලක පක්ෂයට විරුද්ධව මේ ආණ්ඩුව ක්‍රියා කරන්නේ කොහොමද? පසුගිය මහා මැතිවරණයෙන් තමුන්නාන්සේලා ජය ලැබුවේ ඒ පාලක පක්ෂය නිසා නොවෙයිද? එහෙම නම් තමුන්නාන්සේලා කවදාවත්ම ඒ පාලක පක්ෂයට අහිතවත්, විරුද්ධ ක්‍රියා මාර්ගයක් ගන්නේ නැහැ. එම නිසා තමයි, ඒ ගැන වචනයක්වත් මේ රාජාසන කථාවේ සඳහන් වී නැත්තේ. එපමණක් නොව, ඒ ප්‍රශ්නය ගැන මෙතෙක් කිසිම පියවරක් නොගත්තේත් ඒ පාලක පක්ෂය අසතුටු කිරීමට තමුන්නාන්සේලා තුළ තිබෙන නොකැමැත්ත නිසා බව මා මතක් කරන්න කැමැතියි.

එපමණක් නොවෙයි. "අපි තමයි නියම විධියට ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරන්නේ, ඒ නිසා අපේ ආණ්ඩුවක් පිහිටෙව්වාට පස්සේ ඒ ඒ දේශපාලන මත දරන අයට එසේ විවිධ මත දරන්නට ඉඩ දෙනවා, ඔවුන්ට විරුද්ධව ක්‍රියා කරන්නේ නැහැ" කියා පසුගිය මහා මැතිවරණයේදී තමුන්නාන්සේලා නිකුත් කළ ප්‍රකාශනයේ සඳහන් වෙනවා. තමුන්නාන්සේලාගේ ඒ ප්‍රකාශනයත්, ඊට හාත්පසින් වෙනස් ක්‍රියා මාර්ගයත් ගැන මේ ගරු සභාවේ ඕනෑ තරම් කථා කර තිබෙන නිසා, මා ඒ ගැන දීර්ඝ විස්තරයක් කරන්නට යන්නේ නැහැ. එහෙත්, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පිහිටුවූ හැටියේම රජයේ සේවකයන්ගෙන් පළිගත් බව කියන්න ඕනෑ. ඒ වාගේම, ගුරුවරුන්ගෙන් පළි ගත්තා. එසේ පළිගන්නා අතරම 1965 රාජාසන කථාවෙන් තමුන්නාන්සේලා පොරොන්දුවක් දුන්නා, රජයේ සේවයේ යම් යම් කොටස්වලට දේශපාලන නිදහස දෙනවාය කියා. තමුන්නාන්සේලා එකක් හිතේ තබාගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මංගල මුණසිංහ මයා.]

තවෙකක් කියන බව මතක් කරන්න කැමැතියි. ගුරුවරුන්ටත්, රජයේ සේවකයන්ටත් දේශපාලන නිදහස දෙන්න තමුන්නාන්සේලා කවදාවත්ම ලැස්ති නැහැ. ඒ ගැන එක වචනයක්වත් මේ රාජාසන කථාවේ සඳහන් කර නැත්තේත්, ඒ වෙනුවෙන් මෙතෙක් එක ඇඟිල්ලක්වත් හොලවා නැත්තේත් ඒ නිසයි.

එපමණකුත් නොව, නැවත වරක් කුඹුරු පනත සංශෝධනය කරන බවත්, ගොවියාට තැන දෙන බවත්, 1965 රාජාසන කථාවෙන් කීවා. අද මේ ආණ්ඩුව ගොවීන්ට නියම තැන දෙනවාය කියමින් ගොවි රජවරුන් සොයාගෙන යනවා. එහෙත් අද තියෙන කුඹුරු පනත නිසා සාමාන්‍ය ගොවි ජනතාවට විශාල අමාරුවකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. අද කුඹුරු හිමියා තමයි, රජ කරන්නේ. අද අපේ පළාත්වල කුඹුරු හිමියන්, 20 දෙනකු පමණ එකතු කරගෙන ගොස් අද ගොවියාගෙන් ඒ ඉඩම් පැහැරගෙන අද ගොවියා දෙව්ට දමනවා. එවැනි අද ගොවීන්ට අවුරුදු ගණනාවකින් සහනයක් ලැබෙන්නෙ නැහැ. අද ගොවියා මේ ගැන නිලධාරීන්ට කියා විභාගයක් ඉවර වන විට අවුරුදු 3 ක් පමණ කල් යනවා. ඒ විභාගයෙන් ගොවියාට ජයක් ලැබුනොත් කුඹුරු හිමියා සමීක්ෂණ මණ්ඩලයට යනවා. සමීක්ෂණ මණ්ඩලය ඒ ගැන කටයුතු කරන විට තව අවුරුදු 3 ක් පමණ ගත වෙනවා. එයින් පසු කුඹුරු හිමියා උසාවියට ගියාම, කුඹුරු හිමියා ඉවත් කරන්න තවත් අවුරුදු තුන, හතරක් ගත වෙනවා. අපේ පළාත්වල අවුරුදු 5 කට පසුත්, අද ගොවීන්ට තවම ඔවුන්ගේ අයිතිවාසිකම ලැබී නැති බව මා මතක් කරන්නට ඕනෑ. මේ ආණ්ඩුව මේ රාජාසන කථාවේදිත් කියා තිබෙනවා, කුඹුරු පනත සංශෝධනය කරනවාය කියා. එහෙත් මේ ආණ්ඩුව කුඹුරු පනත සංශෝධනය කරන්නට ලැස්තිය කියා මා නම් විශ්වාස කරන්නේ නැහැ. කුඹුරු හිමියා අද රජ කරනවා. ඇත්ත වශයෙන්ම සංශෝධන කරනවා නම්, මේ විභාග ඉක්මනින් ඉවර කරන්නට පුළුවන් වන විධියට සංශෝධන කීපයක් ගෙනෙන්නට ඕනෑ. ඒ අවශ්‍ය සංශෝධන නොකරන නිසා තමයි, සාමාන්‍ය ගොවියාට අද තැනක් නැත්තේ. තමුන්නාන්සේලා කොපමණ ගොවි රජවරුන් තේරුවත්, සාමාන්‍ය ගොවියාට තැනක් ලැබෙන අන්දමට මේ කුඹුරු පනත සංශෝධනය කරන්නේ නැත්නම් සාමාන්‍ය ගොවියා තමුන්නාන්සේලාට දොස් කියන බව මතක් කරන්නට ඕනෑ.

සංශෝධන ඇති කළ යුත්තේ මේ සම්බන්ධයෙන් පමණක් නොවෙයි. ගොවි මණ්ඩලවලට දැනට වඩා පළල් බලතල දෙන්නට ඕනෑ. ඒ ගොවි මණ්ඩලවලට කාර්යාල දෙන්නට ඕනෑ. ඒ ගොවි මණ්ඩල මීට වඩා උනන්දු කරවන්නට ඕනෑ. එවැනි සංශෝධන ඇති කළොත් තමයි, මේ වැඩේ හරියන්නේ.

ගරු කථානායකතුමනි, කරන්නට වැඩ රාශියක් තිබෙද්දී, එක්සත් ජාතික පක්ෂය පසුගිය මැතිවරණයට ඉදිරිපත් වුණේ විශේෂයෙන්ම ප්‍රශ්න දෙකක් විසඳන්නටයි. පසුගිය මැතිවරණ කාලයේදී එක්සත් ජාතික පක්ෂයේ තරුණ සමිති හදා 18 න් ඉහළ තරුණයන්ට රක්ෂා දෙනවාය කියා ඒ තරුණ සමිතිවලට පොරොන්දු වුණා. එහෙත් රැකීරක්ෂා ප්‍රශ්නයත්, බඩු මිළ ඉහළ යාමේ ප්‍රශ්නයත් වැනි වැදගත් ප්‍රශ්න දෙකක් ගැන මේ රාජාසන කථාවේ වචනයක්වත් සඳහන් කර නැහැ. අවුරුදු 3 ක් ගත වූවාට පසු මේ රජය රැකීරක්ෂා ප්‍රශ්නය විසඳා තිබෙන සැටි මා තමුන්නාන්සේට පෙන්වා දෙන්නට කැමතියි.

1960 දී—ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආණ්ඩුව පිහිටුවන විට—රැකීරක්ෂා නැතිව ලියාපදිංචි වී සිටි අයගේ ගණන 1,51,095 යි. 1965 දී ඒ ආණ්ඩුව ඉවත් වන අවස්ථාවේ රැකීරක්ෂා නැතිව ලියාපදිංචි වී සිටි අයගේ ගණන 1,99,655 යි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අවුරුදු 5 ක පාලනයෙන් පසුව ඒ ගණන 48,560 කින් වැඩි වී තිබෙනවා. මේ ආණ්ඩුව බලයට පත් වුණේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්නටයි. එහෙත් ඒ ප්‍රශ්නය ගැන මෙම රාජාසන කථාවේ වචනයක්වත් සඳහන් කර නැහැ. මේ ආණ්ඩුවේ තුන් අවුරුදු පාලනයෙන් පසුව අද ඒ ප්‍රශ්නය පිළිබඳ තත්ත්වය මොකක්ද? සභාග රජය පාලන බලයෙන් ඉවත් වන විට රැකීරක්ෂා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැත්තවුන්ගේ සංඛ්‍යාව 1,99,655 යි. එහෙත් මේ ආණ්ඩුවේ තුන් අවුරුදු පාලනයකින් පසුව 1968 දී ඒ සංඛ්‍යාව 2,63,878 දක්වා ඉහළ ගොස් තිබෙනවා. එහෙම නම් ඉකුත් අවුරුදු තුන තුළදී 64,223 ක් රැකී රක්ෂා නැත්තවුන්ගේ ගොඩට අලුතෙන් එකතුවී සිටිනවා. මේ වැදගත් ප්‍රශ්නය ගැන රාජාසන කථාවේ සඳහන් කර නැතිවා පමණක් නොව බඩු මිල ප්‍රශ්නය ගැනද වචනයක්වත් සඳහන් කර නැහැ. අද බඩු මිල කොතරම් නම් ඉහළ ගොස් තිබෙනවාදැයි මා අමුතුවෙන් පෙන්වා දිය යුතු නැහැ. මට පෙර මෙම විවාදයේදී කථා කළ ගරු මන්ත්‍රීවරුන් කීප දෙනකුම ඒ ගැන මතක් කළා. ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් මොනවා කීවත් මහජනතාව දී තිබෙන පිළිතුරුවලින් ඇත්තෙන්ම බඩු මිල නැගලාද බැසලාදැයි කාටත් හොඳ හැටි පෙනී යනවා. පසුගිය කාලයේ පවත්වන ලද සෑම අතුරු මැතිවරණයකදීම ලැබුණු ප්‍රතිඵලවලින් කාටත් ඒක පැහැදිලි වෙනවා. එහෙත් ඔය බඩු මිල ප්‍රශ්නය ගැන වචනයක්වත් රාජාසන කථාවේ සඳහන් කරන්නට මේ ආණ්ඩුවට පුළුවන් වී නැහැ. නොයෙකුත් ඇණුම් බැණුම් සහ ඔපාදූප කියනවා මිස ඔය වැදගත් ප්‍රශ්න දෙක අමතක කර දමා තිබීම ගැන කණගාටු වෙනවා.

පසුගිය කාලයේදී නම් බඩු මිල ප්‍රශ්නය ගැන බොහොම හයියෙන් කෑකෝ ගසා පොලීසිය යොදවා ක්‍රියා කළා. පොලීසියත් කඩවලට පැන්නා. මුදලාලි කෙනකු ශත 5 ක් මිල වන ගිනිපෙට්ටිය ශත 6 ට විකිණීම නිසා ඔහු උසාවියට ගෙන ගොස් රුපියල් 1000 ක දඩයක් ගැස්සෙව්වා. ඔය විධියේ වැඩ කීපයක්ම කළා. එහෙත් ලොකු වෙළෙඳුන් ගැන ක්‍රියා කළේ නැහැ. ලොකු වෙළෙඳුන් නිසයි, බඩු මිල නැග තිබෙන්නේ. ලොකු වෙළෙඳුන්ට විරුද්ධව ක්‍රියා කිරීමට පොලීසිය ඉදිරිපත් වුණේ නැහැ.

බඩු මිල ප්‍රශ්නය ආදිය ගැන ක්‍රියා කිරීම පිණිස ජනතා කොමිටි පත් කරන්නට පසුගිය සහාග රජය බලාපොරොත්තු වුණා. ඒ සහාග රජයේ අදහස අනුව යමින් මේ ආණ්ඩුවත් ජනතා කොමිටි පත් කරන බව ප්‍රකාශ කළා. හැබැයි, මැතිවරණයෙන් පසුව මෙමආණ්ඩුව මුළු රටටම එකම එක ජනතා කොමිටියක් පත් කළා. කොළඹ කුරුඳුවත්තේ ධනවත් නෝනාවරුන්ද ඒ කොමිටියට පත් කළා. දැන් ඒ කොමිටියට මොනවා වෙලා දැයි දන්නේ නැහැ. එකක් නම් පැහැදිලියි. තවමත් බඩු මිල ප්‍රශ්නය නම් විසඳිලා නැහැ. බඩු මිල ඉහළ දැමීම සඳහා මෙම ආණ්ඩුව පත් වුණාට පසුව වැඩ රාශියක් කළ බව නම් කියන්නට පුළුවනි. දැනට මාස කීපයකට පෙර රුපියලේ අගය අඩු කිරීම නිසාද බඩු මිල වැඩි වුණා. වරායේ වැඩ වර්ජන නිසා බඩු මිල වැඩි වන බව ආණ්ඩු පක්ෂයේ සිටින උදවිය එක් කාලයකදී ප්‍රකාශ කළා. අද නම් වරායේ වැඩ වර්ජන නැහැ. සියයට සියයකින්ම වාගේම වැඩ වර්ජන අඩු වී ගොස් තිබෙනවා. එහෙත් බඩු මිල වැඩි වී ඇතිවා මිස අඩු වී නැහැ.

කෘෂිකර්මය නගා සිටුවා ඇතැයි කියමින් මේ ආණ්ඩුව ආඩම්බර වෙනවා. කෘෂිකර්මය වැඩි දියුණු කරන බවට මොරහඬ දෙමින් මුළු ආණ්ඩු යන්ත්‍රයම ඒ කටයුත්ත සඳහා යෙදුවා. මට මතකයි ට්‍රැක්ටර් සහ ජීප් රථ ගෙන්වීම සඳහා පසුගිය අය වැය ලේඛනයෙන් මුදල් ඇමතිතුමා විදේශ විනිමය ප්‍රමාණයක් වෙන් කළ බව. ඒ වාගේම මට මතකයි මුදල් ඇමතිතුමාගේ අය වැය කථාවෙදීත් කිව්වා, ඒ ඒ දිස්ත්‍රික්කවල කච්චේරිවල විශේෂ අංග පිහිටුවා විශේෂ දිසාපතිවරුන් යටතේ කෘෂිකර්මය දියුණු කිරීම පිණිස ලක්ෂ ගණනක් වෙන් කර තිබෙනවාය කියා. ඒ සඳහා මිනිමොක් රථ ආදිය ගෙන්වීමට මුදල් වෙන් කළා. එහෙත් අපේ රටේ කෘෂිකර්මය දියුණු කිරීමට, ආහාර වගාව දියුණු කිරීමට නොයෙකුත් විධියෙන් වැඩ කරනවාය කියා අක්කර 50,000, 70,000 ආදී වශයෙන් ධනපතීන්ටත් බෙදා දී නොයෙක් විධියෙන් කෑගසා ප්‍රචාරය කර අවසානයේදී ලබා ඇති ප්‍රතිඵලය කුමක්ද? මම එය කොටින්ම පෙන්වන්නම්. 1964 වර්ෂයේදී අක්කරයකට වී බුසල් 38.8 ක ප්‍රමාණයක් ලැබී තිබෙනවා. 1967 දී ලැබී තිබෙන ප්‍රමාණය අක්කරයකට වී බුසල් 41 යි. එම නිසා අපට ඉතාමත්ම පැහැදිලිවම පෙනී යනවා මේ තරම් කෑ ගසා ප්‍රචාරය කර වැඩි කර ගැනීමට හැකි වී තිබෙන්නේ වී බුසල් තුනකටත් අඩු ප්‍රමාණයක් බව. ධනපති පංක්තියට නොයෙක් විධියේ ආදායම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මංගල මූණසිංහ මයා.]

බදු සහන දීමාදී සියල්ලක්ම කිරීමෙන් පසුව තෙලා ඇති ඵලය එපමණයි. කොතෙක් කෑ ගසා වියදම් කළත් අපට කමක් නැහැ, සාමාන්‍ය ජනතාවට එයින් යහපතක් වුණා නම්. සාමාන්‍ය ජනතාවට එය ඇතිලාවත් නැහැ. අද බඩු මිල ඉහළ නැග තිබෙනවා. හාල් සේරුවක මිළ කිසිසේත් අඩු වී නැහැ.

මා අවසාන වශයෙන් කියන්නේ ගරු කථානායකතුමනි, මේ ක්‍රමය වෙනස් කරන තුරු අපේ රටේ දියුණුවක් ඇති නොවන බවයි. මා මගේ කථාව ආරම්භයේදී සඳහන් කළ කාරණය නැවත වරක් සිහිපත් කරන්න කැමතියි. අප මේ මන්ත්‍රී මණ්ඩලයට පැමිණ අවුරුද්දෙන් අවුරුද්ද රාජාසන කථාවලට ඇහුම්කන් දී තිබෙනවා. අපට නිදහස ලැබී දැන් අවුරුදු 20 ක් ගත වී තිබෙනවා. අපට නිදහස ලැබුණේ 1948 දී. දැන් 1968 යි. ඇත්ත වශයෙන්ම නිදහස ලැබී අවුරුදු 20 ක් ගත වී තිබෙන අද අප සිටින්නේ ලජ්ජා විය යුතු තත්ත්වයකයි. ඒ මොකද අවුරුදු 20 ක් ගත වෙලත් සාමාන්‍ය ජනතාවට ලැබී තිබෙන නිදහස මොකක්ද? අප මන්ත්‍රී මණ්ඩලයට පැමිණ නොයෙකුත් කරුණු ඉදිරිපත් කරනවා. අපට කණගාටුයි මේ ආණ්ඩු පක්ෂයේ එකම ඇමතිවරයෙක්වත් තමන්ගේ අසුන්වල මේ අවස්ථාවේ නොසිටීම ගැන. අද ආණ්ඩු පක්ෂයේ ඇමතිවරුන් පිට රට සංචාරයේ යෙදී සිටිනවා. බෙන්ස් ආදී සැප පහසු කාර්වලින් යනව එනවා; කුරුඳුවත්තේ ආණ්ඩුවේ ගෙවල්වල නැවත වරක් පදිංචි වී සිටිනවා. මේ උදවියම තමයි පසු ගිය ආණ්ඩුවට දොස් කිව්වෙ තමුසෙලා මෙහෙම කළාය අරෙහෙම කළාය කියා අද තමුන්නාන්සේලාගේ රාජාසන කථා විවාදය ඇසීමට එක්කෙනෙකුවත් මෙහි නැහැ.

**එස්. ද එස්. ජයසිංහ මයා. (කම්කරු, රැකිරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. எஸ். டி. எஸ். ஜயசிங்ஹ—தொழில், தொழில், வசதி, வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. S. de S. Jayasinghe—Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing)

එක්කෙනෙක් ආවා.

**මංගල මූණසිංහ මයා.**

*(திரு. மங்கள முனசிங்க)*

(Mr. Mangala Moonesinghe)

ඒ නිසා කථානායකතුමනි, මා කියන්නේ මේ ක්‍රමය වෙනස් කළ යුතු බවයි. මේ ක්‍රමය වෙනස් කරන තුරු රටට සහනයක් ලැබෙන්නේ නැහැ; රටේ දියුණුවක් ඇති වන්නේ නැහැ. එසේ නම් මේ ලැබී තිබෙන නිදහස මොකක්ද? අපට ලැබී තිබෙන ආර්ථික නිදහස මොකක්ද? මා කියනවා අපට කිසිසේත්ම නිදහසක් නැත කියා. අපේ ජනතාව අන්ත දුක් විඳිනවා. අපේ ළමයින්ට නියම පිළිවෙළක අධ්‍යාපනයක් නැත් නම්, අපේ ගම්බද පැල්පත්වල ළමයින්ට විද්‍යා අධ්‍යාපනයක් ලබාගෙන විද්‍යාඥයන් වීමට තවමත් අධ්‍යාපන ක්‍රමයක් සකස් වී නැත්නම් මොකක්ද කථානායකතුමනි, අපට ලැබී තිබෙන නිදහස? අපේ සාමාන්‍ය ජනතාවට සෞඛ්‍ය පහසුකම් ලැබී නැත් නම්, අපේ ආරෝග්‍ය ශාලා පිරිසිදු තත්ත්වයක නැත් නම් මොකක්ද අපට ලැබී තිබෙන නිදහස කියා මා තමුන්නාන්සේලාගෙන් අහනවා. අපේ සාමාන්‍ය ජනතාවට ණයක් නැතුව ජීවත් වීමේ නිදහසක් තිබෙනවාද? ඇත්ත වශයෙන්ම සාමාන්‍ය ජනතාවගේ ළමයින්ට දෙවේලක් හරිහැටි කන්නට තිබෙනවාය කියා ආඩම්බර වෙන්ට අපට පුළුවන්ද? ඒ අයට හරි හැටි දෙවේලක් කන්ට නොලැබෙනවා නම් අපේ නිදහස මොකක්ද? ඒ නිසා තමයි මම කියන්නෙ අපට ආර්ථික නිදහස ලැබී නැත්නම් අපට කිසිම නිදහසක් නැහැ කියා. මේ ක්‍රමය වෙනස් කරන තුරු අපේ රට දියුණු කරන්ට බැහැ. එම නිසා මා කියනව, මේ ක්‍රමය වෙනස් කර නියම සමාජවාදී ආණ්ඩුවක් පිහිටුවාගෙන සාමාන්‍ය ජනතාවත් ඒ ආණ්ඩුවේ කොටස්කරුවන් කරගෙන "මේක අපේ ආණ්ඩුවය, මේ ආණ්ඩුව දියුණු කර ගත්තොත් අපට ආර්ථික දියුණුව ලැබෙනවය, මේ ආණ්ඩුව දියුණු කර ගත්තොත් අපේ ළමයින්ට අනාගතයක් තිබෙනවාය" කියන හැඟීම ජනතාව තුළ ඇති කළ යුතුය කියා. එසේ නොකර කවදාවත් අපේ රට දියුණු කරන්ට බැහැ; අපේ රටට ඉදිරියට යන්ට බැහැ. තමුන්නාන්සේලාට මේ බව මතක් කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 4.17

**එස්. ද එස්. ජයසිංහ මයා.**

*(திரு. எஸ். டி. எஸ். ஜயசிங்ஹ)*

(Mr. S. de S. Jayasingha)

ගරු කථානායකතුමනි, රාජාසන කථා විවාදයට සහභාගිවන්නට ඉඩ ප්‍රස්තා ලැබීම ගැන මා සන්තෝෂ වෙනව. මට පෙර කථා කළ බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා (මංගල මුණසිංහ මයා.) රාජාසන කථාව සම්බන්ධයෙන් සෑහෙන විවේචනයක් මේ සභාව හමුවේ තැබුව. මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් හැටියට අපි රාජාසන කථා ගණනාවකට වරින් වර දැනුම් දී තිබෙනව. ඒ රාජාසන කථා ඉදිරිපත් කළ ආණ්ඩුවලින් රාජාසන කථාවල අඩංගු බොහෝ දේවල් ඒ ඒ අවුරුදුවලදී ඉටු කර නැහැ කියා මේ ගරු සභාවේ කිසිම මන්ත්‍රීවරයෙකුට ප්‍රකාශ කරන්ට බැහැ. එහෙත් අද අපේ මිත්‍ර බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා අළුත් තර්කයක් ඉදිරිපත් කළා. "මේ රාජාසන කථා පැවැත්වීම නිකම් බොරු වැඩක්. මේව අදිරාජ්‍යවාදි ප්‍රතිරූපය. මේවා අදිරාජ්‍යවාදි යුගවල සිදුවුණු දේවල්. යුනිෆෝම් ඇඳගත් කීප දෙනාකු ඉටි රූප වගේ පැයක් විතර හිටගෙන හිටිය". ආදි වශයෙන් නා නා ප්‍රකාර ප්‍රකාශ කීපයක් බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා රාජාසන කථාව සම්බන්ධයෙන් ඉදිරිපත් කළා. ගරු කථානායකතුමනි, රජයක් රාජාසන කථාවක් පැවැත්වීමෙන් බලාපොරොත්තු වෙන්නෙ ඒ රජය ලැබුවා වූ වර්ෂය තුළදී රට වෙනුවෙන් කරන්නට අදහස් කරන වැඩ පිළිබඳ විස්තරයක් මහජනයා ඉදිරියේ තැබීමයි. රාජාසන කථාව මගින් රට හමුවේ තබන පොරොන්දු ඉටු කිරීම රජයේ යුතුකමක්. සමහරවිට හදිසි ආපදා නිසා රට හමුවේ තබන යම් යම් කරුණු ඒ ආකාරයෙන් ඉටු කරන්ට බැරි වෙන්ට ඉඩ තිබෙනව. හදිසියේ ගංවතුරක් ඇවිත් නොයකුත් විපත් ඇතිවුණොත් බලාපොරොත්තු සුන් වෙනව. හදිසියේ නියගයක් ආවොත් බලාපොරොත්තු සුන් වෙනව. ස්වභාව ධර්මය අනුව එවැනි දේවල් සිදු වෙනවා. [බාධාකිරීමක්] බුලත්සිංහලට තරම් වතුර ගලන්නෙ නැහැ, දෙහිවල-ගල්කිස්සට.

බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, මේ රාජාසන කථා මෙසේ පැවැත්වීම වැඩක් නැති දෙයකිය කියා. එක අතකට එය එසේම වුවත්, ජාතික රජය බලයට පත්වන්නට පෙර විරුද්ධ පාර්ශ්වයෙන් මන්ත්‍රීවරුන්ගේ රජයක් තිබුණ; එහෙම නම් ඒ කාලයේදී මේ ක්‍රමය අහෝසි කර දමන්නට තිබුණ. අවුරුදු 9ක් තිස්සේ ඒ ආණ්ඩුවේ රාජසනා කථා 9කට සවන් දුන් මන්ත්‍රීවරුන් සිටින පක්ෂයක මන්ත්‍රීවරයෙකුගෙන් මෙවැනි කථාවක් අසන්නට ලැබීම පුදුම සහගත කරුණක්. මේවායින් යම් ප්‍රයෝජනයක් නැත් නම්, මේවායේ කිසිම හරයක් නැත්නම්, නිකම් කාලය අපතේ හැරීමක් පමණක් නම්, රජයේ මුදල් නාස්ති කිරීමක් නම්, ඒ කාලයේ මෙහි යම්කිසි වෙනසක් කළා නම් මේ රජය නැවත වරක් මේ විධියට රාජාසන කථා ඉදිරිපත් කරයි කියා මා හිතන්නෙ නැහැ. දැන් මේ ආණ්ඩුවෙ 4 වෙනි රාජාසන කථාව පිළිබඳ විවාදයටයි අප මුහුණ දෙන්නෙ. බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමාගෙන් ප්‍රකාශ වුණා රාජාසන කථාවල අඩංගු වන බොහෝ දේවල් ඉටු වෙන්නෙ නැහැ කියා. පසුගිය පාලන යුගයේදී එසේ වන්නට ඇති. මේ පාලන යුගයේදීත් එය සියේට සියයක්ම ඉෂ්ට කළායයි මා කියන්නේ නැහැ. එහෙත් හැකි තාක් දුරට එය ඉෂ්ට කර තිබෙන බව මතක් කරන්නට කැමතියි. කථාව අවසානයේදී ඒ ගරු මන්ත්‍රීතුමා නිදහස සම්බන්ධවත් කිව්වා. අපේ ආර්ථික නිදහස ඕනෑය, එය අපට ලැබී නැහැ යනුවෙන් එතුමා ප්‍රකාශ කළා. අපට සහයෝගය දෙනොත් සැම අතින්ම එය සම්පූර්ණ වෙනවා ඇති. නිදහසක් නැහැ කිය කියා ඉන්නෙ නැතිව, ප්‍රජාතන්ත්‍රවාදය අනුව රට පාලනය කරන යම් ආණ්ඩුවක් වෙතොත් ඊට සහයෝගය දී ජනතාව වෙනුවෙන් තමන්ගේ යුතුකම ඉටු කර තොත් ඕනෑම ආණ්ඩුවකට මීට වඩා වැඩ කටයුතු කරන්නට ඉඩ ප්‍රසථාව ලැබෙන බවට මා තුළ කිසිම සැකයක් නැහැ.

**බී. වයි. තුඩාවේ මයා.** (මාතර)

*(திரு. பி. வை துடாவ—மாத்தறை)*

(Mr. B. Y. Tudawe—Matara)

ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් මතු කරන්නට තිබෙනවා. මේ ගරු සභාවේ ගණපූරණයක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව :

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොතිබියෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**

පසුව ගණපූරණයක් තුබුයෙන්—

சபை எண்ணப்பட்டு நிறைவெண் இல்லாததால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப் பட்டது.

பிறகு நிறைவெண் இருந்ததனால்

*House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி. எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasingha)

ගරු කථානායකතුමනි, පෙරේදා රාජාසන කථා විවාදය ආරම්භ කරමින් කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) මේ ආණ්ඩුව වහා අස්විය යුතුයයි ප්‍රකාශ කළා. මේ ආණ්ඩුව බිහි වූයේ මහජන මතය උඩින් නොවේයයිද එතුමා කියා සිටියා. මේ ආණ්ඩුව පස්සා දොරින් බිහි වුණු එකකැයි කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා හිතනවාද? මේ ආණ්ඩුවට ජනතාව ඡන්දය දී නැතැයි එතුමා හිතනවාද? මේ රජය බිහි වුණේ මහජන මතය උඩින් නොවෙයි නම් කාගේ මතයක් උඩින්දැයි මම අහනවා. එය ප්‍රකාශ කරන්නට ආණ්ඩුවට බැහැ. ඒ නිසා විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්වත් එය ප්‍රකාශ කරනවා නම් එය ඉතාමත් ප්‍රඥාගෝචරය කියන එකයි මට කියන්නට තිබෙන්නේ. මේ ආණ්ඩුව බිහිවෙලා තියෙන්නේ මහජනයාගේ පරණ පවක් නිසාලු. මේ ආණ්ඩුව බිහි වුණේ මේ රටේ ජනතාවට ඉතාමත් වාසනාවන්ත යුගයක් උදා වන්නට යන්න මම මෙහිදී ප්‍රකාශ කරන්නට කැමතියි. පසුගිය ආණ්ඩුවේ අවසාන යුගයේදී ඇති වන්නට ගිය ඒකාධිපතිත්ත්වය ගැන තමුන්නාසේ දන්නවා. ඒ බව රටේ අස්සක් මුල්ලක් නැර රැව් පිළිරැව් දුන්නා. ඒ ආණ්ඩුවේ හිටපු සභානායකතුමා ඇතුළු ප්‍රබල මන්ත්‍රීන් කීප දෙනකුටම ඒ ආණ්ඩුවෙන් ඈස්වන්නට සිද්ධ වුණා. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඒ ආණ්ඩුව පරාජය වුණා. තත්ත්වය එසේ තිබියදී, දැන්, කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා මොකක්ද කියන්නේ? මේ ආණ්ඩුව පත් වුණේ ප්‍රජාතන්ත්‍රවාදය උඩ නොවෙයිලු. ජනතාවගේ පරණ පවකට මේ ආණ්ඩුව පත් වුණේ. මොන අදහසක් උඩ, මොන දර්ශනයක් උඩ, මොන ප්‍රතිපත්තියක් උඩ, මොන කල්පනාවක් උඩ එවැනි ප්‍රකාශයක් කෙළේදැයි කියන්නට මම නම් දන්නේ නැහැ. එහෙත් මම එකක් කියන්නට සතුටුයි. මේ රටේ එක්තරා ප්‍රමාණයකට තිබුණු අසමගි තත්ත්වය, මේ ආණ්ඩුව පත් වුණාට පස්සේ ඉතාමත් හොඳ සමගි තත්ත්වයකට පත් වී තිනෙවා. ඒ බව මෙහිදී සන්තෝෂයෙන් මතක් කරන්නට කැමතියි.

ඊළඟට, ගරු අගමැතිතුමා විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය අකුරටම ආරක්ෂා කරන්න පොරොන්දු වුණාය, දැන් ඒ විධියට කටයුතු කරනවද යන ප්‍රශ්නය ඉදිරිපත් කළා. අගමැතිතුමා හෝ, කැබිනට් මණ්ඩලය හෝ, අපේ රජය හෝ විසින් කරන ලද එකම ප්‍රජාතන්ත්‍ර විරෝධි දෙය කුමක්ද කියා මා මේ අවස්ථාවේදී අහන්න කැමතියි. මේ අවුරුදු 3 ඇතුළත එකම එක ප්‍රජාතන්ත්‍ර විරෝධි වැඩක් කර තිබෙනවාද? එකම එක ප්‍රජාතන්ත්‍ර විරෝධි වැඩක් ගැනවත් මේ සභාව ඉදිරියේදී කියැවුණේ නැහැ. ඊළඟට කිව්වා, මේ රජය පිහිටුවූවේ ප්‍රජාතන්ත්‍ර විරෝධිව මේ රජය පිහිටෙව්වා නම් ඒ සඳහා මිනිසුන් ඡන්දය දුන්නේ විජ්ජාවකින්ද? එහෙම නැත්නම් ප්‍රයෝගයකින්ද? විජ්ජාවකින් ඇවිත් මිනිසුන් ඡන්දය දුන්නා විය යුතුයි. විරුද්ධ පක්ෂයට පමණයි නිදහසේ ඇවිත් මිනිසුන් ඡන්දය දී තිබෙන්නෙ. තමුන්නාන්සේලා කියන විධියට විජ්ජාවකින් ලබා ගත් ඡන්දවලින් මේ රජය පිහිටුවූ බවයි අපට සිතා ගන්න තිබෙන්නෙ.

ඊළඟට ධවල පත්‍රිකාව සාකච්ඡා කරන ලද අවස්ථාව ගැන කරුණු කීපයක් කියා ගෙන ගිය අතර විශේෂයෙන්ම කයිට්ස්හි මන්ත්‍රීතුමා එහා පැත්තට ගොස් තම ප්‍රකාශය කරද්දී ෆේඩරල් පක්ෂයේ ලේකම් මහතා දෙස අගමැතිතුමා රවා ගෙන සිටියාය කියා කියන්න යෙදුනා. මා නම් දැක්කේ අගමැතිතුමා ඒ අය දෙස රවා ගෙන සිටිනවා නොවෙයි, සිනාවෙමින් බලා සිටි බවයි. ඒ ගැන කයිට්ස්හි මන්ත්‍රීතුමාත් ෆේඩරල් පක්ෂයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මන්ත්‍රීවරුනුත් හොඳට දන්නවා ඇති. ඒ සම්බන්ධයෙන් සිදු වුණ අනික් දේවල් ගැන මා කියන්න යන්නේ නැහැ. මා ඒ ගැන විවේචනය කරන්න යන්නෙත් නැහැ.

ගරු කථානායකතුමනි, කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා විවාදය අරම්භ කරමින්, දැන් ජීවන වියදම බොහෝ දුරට ඉහළ නැග තිබෙනවාය කියා කියන්න යෙදුනා. පාරිභෝගිකයාට එදිනෙදා වුවමනා කරන ද්‍රව්‍යවල මිල ගණන් රාශියක් එතුමා කියෙව්වා. 1964 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පරාජය වුණ අවස්ථාවේ මිල ගණන් තත්ත්වයත්, අද එක්සත් ජාතික පක්ෂයේ රජය—ජාතික රජය—බලයේ සිටින කාලයේ මිල ගණන් තත්ත්වයත් පරස්පර විරෝධි බවක් එතුමා කියන්න යෙදුනා ඒ වගේම මා තව කරුණක් ඒ මන්ත්‍රීතුමාට මතක් කර දෙන්න කැමතියි. එදා 1956 දී එක්සත් ජාතික පක්ෂයේ රජය පරාජයට පත් වන අවස්ථාවේ බඩු මිල තත්ත්වයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය 1964 දී පරාජය වන විට බඩු මිල තත්ත්වයත් සංසන්දනය කර බැලුවොත් නමුන්නාන්සේලාට පෙනේවි, ශත 8 ට තිබුණ බඩුව ශත 12ට නැග, ඊළඟට එය ශත 60 දක්වා නැග තිබුණ බව. ඒ සෑම බඩුවකම මිල 1956 එක්සත් ජාතික පක්ෂයේ රජය පරාජය වන අවසථාවේ තිබුණ මිල මෙන් හතර පස් ගුණයකින් වැඩි වී තිබුණා. එවැනි තත්ත්වයක් ඇති වීම විරුද්ධ පක්ෂයටවත්, අපේ පක්ෂයටවත් නවත්වන්න පුළුවන්කමක් නැහැ. මේ රටට වුවමනා කරන තරම් භාණ්ඩ නිෂ්පාදනය කරන තෙක් ඒ තත්ත්වය කිසිම කෙනෙකුට නවත්වන්න පුළුවන්කමක් නැහැ. ලෝකයේ ජනගහනය සීග්‍රයෙන් වැඩි වෙනවා. ඒ නිසා වැඩි වැඩියෙන් ආහාර ද්‍රව්‍ය වුවමනා කරනවා.

ගරු කථානායකතුමනි, අපේ රටට රතු ළූනු, කොත්තමල්ලි, වියළි මිරිස්, අඩු වශයෙන් කහ කෑල්ල පවා ගෙන්වන්න පුරුදුව සිටියේ පිටරටවලිනුයි. නමුත් මට පෙර කථා කළ ගරු සමාජ සේවා උප ඇමතිතුමා කී පරිදි ජාතික රජය විසින් පාරිභෝගිකයාට වුවමනා කරන ද්‍රව්‍ය ක්‍රමානුකූලව මේ රටේම නිෂ්පාදනය කිරීමෙන් මිල තත්ත්වය කෙසේ වෙතත් මේ රටේ ජනතාවට මේ රටේම නිපදවන ද්‍රව්‍ය කොටසක් ලබා ගැනීමට හැකි තත්ත්වයක් ඇති කිරීමට කටයුතු කර ගෙන යනවා. පසුගිය රජය අවුරුදු නවයක කාලයක් තිස්සෙ මේ සම්බන්ධයෙන් යම්කිසි පියවරක් ගත්තා නම්, අඩු වශයෙන් කහ පැලයක් වත් වවා ගැනීමට ජනතාව උනන්දු කෙරෙව්වා නම්, ප්‍රශ්නය මෙතරම් බරපතළ වන්නෙ නැහැ. නමුත් කහ කෑල්ලක් තරම්වත් නිපදවා ගැනීමට වුවමනාවක් එකල දැක්වූවේ නැහැ. අප දන්නවා ව්‍යාංජනයකට දැමීමට වුවමනා කරන්නෙ කහ ඉතාමත්ම ස්වල්පයක් බව. එම ප්‍රමාණයවත් මේ රටේ වවා ගැනීමට එවකට තිබුණු රජය කිසිම උනන්දුවක් ගත්තෙ නැහැ ; වැඩ පිළිවෙළක් යෙදුවෙ නැහැ.

ලෝකයේ මෙවැනි ද්‍රව්‍ය නිපදවන රටවල මිල ඉහළ යාම නිසාත්, ජනගහනය සීඝ්‍රයෙන් වැඩිවී යාම නිසාත් අපේ රටේ ද්‍රව්‍ය මිල ඉහල යාම නැවැත්වීමට බැරි බව අප කවුරුත් දන්නවා. මෙයට ඇති එකම ප්‍රතිකර්මය නම් අපේ රටේ ජනතාවට අවශ්‍ය ද්‍රව්‍යයන් මේ රටේම නිපදවා ගැනීමට හැකි සෑම ධෛර්යයක්ම දීමයි. එසේ අවශ්‍ය පමණට නිපදවා ගැනීමට හැකි උනොත් බඩු මිල පහත වැටෙනවාට කිසිම සැකයක් නැහැ.

ඉඩම් අක්කර දහස් ගණන්, විදේශීය කොම්පැනිවලට, දේශීය කොම්පැනිවලට, පුද්ගලයන්ට ගොවිතැන් කිරීම පිණිස, ද්‍රව්‍ය නිපදවීම පිණිස පැවරීම සම්බන්ධයෙන් මෙයට පෙර කථා කළ බුලත්සිංහල මන්ත්‍රීතුමාත්, බලපිටියෙ මන්ත්‍රීතුමාත් සඳහන් කළා. විරුද්ධ පාර්ශ්වයේ ඇතැම් මන්ත්‍රීතුමන්ලාට හැම තිස්සේම පෙනෙන්නෙ කැපූ දැව ප්‍රමාණය ගැන පමණයි. බලපිටියෙ මන්ත්‍රීතුමා කීවා, දැව විශාල ප්‍රමාණයක් කපා දමා තිබෙනවාය කියා. සමහර විට ඒ මන්ත්‍රීතුමා සෑහෙන අවබෝධයක් ඇතුව කියනවා විය හැකියි. දැව කැපීම සම්බන්ධයෙන් ඒ මන්ත්‍රීතුමා වාගේම විරුද්ධ පාර්ශ්වයේ ඇතැම් මන්ත්‍රීවරුනුත් විවේචනය කළා. දැව නොකපා කුඹුරු, හේන් ආදිය සකස් කරන්න බැරි බව අප කවුරුත් පිළිගන්න ඕනැ. යම් ප්‍රමාණයක් දැව කපා තිබෙනවා නම්, ඒ දැව මේ රටේ ප්‍රයෝජනය පිණිසම ඉවහල් කරගෙන ඇති බවත් ඒ මන්ත්‍රීතුමන්ලාට මතක් කරන්න කැමතියි. අපි හිතමු, මාස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ද එස්. ජයසිංහ මයා.]

යකට රුපියල් සියයක පමණ ආදායමක් ඇති පුද්ගලයකුට අක්කර සියයක් දුන්නාය කියා. රුපියල් සියයක් ලැබෙන ඒ පුද්ගලයා අක්කර සියයක් වගා කරන්නෙ කොහොමද? බොහොම ලෙහෙසියි කියන්න ධනපතීන්ට ඉඩම් දෙනවාය, කොම්පැනිවලට ඉඩම් දෙනවාය, දුප්පත් අයට ඉඩම් බෙදා දෙන්නෙ නැත කියා. රුපියල් සියයක් හෝ දෙසීයක් හෝ තුන් සියක් හෝ ආදායමක් මාසයකට ලබන කෙනෙක් අක්කර සිය ගණනක කැලෑ එළි කර වගා කරන්නෙ කොහොමද? කැලෑ කපන්න සල්ලි ඕනෑ; එළි කරන්න සල්ලි ඕනෑ; කුඹුරු සකස් කරන්න සල්ලි ඕනෑ. වුවමනා උපකරණ ගන්න කැත්ත උදැල්ල ගන්න, අඩු වශයෙන් ට්‍රැක්ටරයක්වත් මිලදී ගන්න සල්ලි ඕනෑ. වගා කරන්න බිම සකස් කරන්න විශාල වියදමක් දරන්න ඕනෑ. ඒ අයට මූලික ධනයක් නැහැ. මූලික ධනයක් නැතුව ඒ අන්දමේ වැඩක් කරන්න බැහැ. මූලික ධනය රජයෙන් නොයොදා, එය කරන්න පුළුවන් අයට, ශක්තිය ඇති අයට භාර දුන්නා.

දුප්පත් අය වෙනුවෙන් රජය කිසිවක් නොකර සිටියාද? නැහැ. මධ්‍යම පංක්තියේ අයට, අඩු ආදායමක් ලබන ගොවි ජනතාවට වගා කිරීම පිණිස ඉඩම් දුන්නා, අදත් දෙනවා. මෙබඳු පියවරක් රජය ගත්තේ පසුගිය කාලයේ මින්නේරිය වැනි ගොවිජනපදවල පදිංචියට ගිය අයට ගොඩින් මඩින් අක්කර දහයක් ලැබුණත් එම බිම් ප්‍රමාණය වගා කිරීමේදී මතු වුණු අපහසුකම් ගැන සලකා බලලයි. රජයට වැටහී ගියා ඒ අයට දෙන ආධාර මුදල ප්‍රමාණවත් නොවන බව. එම නිසා වගා කිරීමේදී එබඳු ප්‍රශ්න මතු නොවීමට කට යුතු යොදන්න ඕනෑ. කැලෑවක් එළි කර ගෙන, පුංචි පැල්පතක් තනාගෙන පදිංචි වුණත් වගාවෙන් පල ප්‍රයෝජන ලැබීමට සෑහෙන කාලයක් ගත වෙනවා; වගාවන්ගෙන් මුදල් උපයා ගන්න කලක් යනවා. එතෙක් කලක් ජීවිකාවෘත්තිය ගෙන යන්න මගක් නැහැ. එම නිසා විශාල ලෙස රජය මගින් මුදල් යොදවන්නෙ නැතුව, පෞද්ගලික ව්‍යාපාරිකයනට එම ඉඩම් බෙදා දී, ඒ අය ලවා කැලෑ එළිපෙහෙළි කරවා, වාරිමාර්ග ක්‍රම සකස් කරවා අවුරුදු විසිපහක් ගතවීමෙන් පසුව ආපසු ඒ ඉඩම් ලබාගෙන ගොවියන් අතර බෙදා දීමටයි රජය වැඩ පිළිවෙළ සකස් කර තිබෙන්නෙ. අවුරුදු විසි පහකට පසුව එම ඉඩම් දුප්පත් ගොවියන්ට ලැබුණාම ඔවුන්ට කරදරයක් නැතුව වගා කරගන්න පුළුවනි. කැලෑ එළිපෙහෙළි කොට සකස් කර තිබෙනවා. අවශ්‍ය වාරිමාර්ග පහසුකම් තිබෙනවා. කුඩා නිවාස තනා තිබෙනවා. අවශ්‍ය සෑම පහසුකමක්ම තිබෙන නිසා පදිංචියට ගිය හැටියේම වගා කර ගෙන යාමට ඒ අයට හැකි වෙනවා. එසේ නැතිව අක්කර සිය ගණන් නැත්නම් දහස් ගණන් මධ්‍යම පන්තියට හෝ උසස් මධ්‍යම පන්තියට හෝ කොම්පැනිකාරයන්ට දුන්නාය කියා අපට චෝදනා කරන එක වැරදියි. ඒ අතරම තමුන්නාන්සේලා කල්පනා කරන්නට ඕනෑ එසේ දී ඇති ඉඩම් අවුරුදු 25 කට පසුව ගොවි ජනතාව අතරේ බෙදා දීමට ආපසු රජයට පවරා ගැනීමේ පදනමක් උඩයි, එසේ දී තිබෙන්නේ කියන එක. තමුන්නාන්සේලා කොයි අවස්ථාවකදීවත් ඒ ගැන සඳහන් නොකිරීම කණගාටුවට කරුණක්. රජයෙන් ලබාගත් ඉඩම් හුඟ හරියක් යම් යම් අය වගා කළේ නැහැ. මේ රජයට කලින් තිබුණු රජය මගින් අක්කර දහස් ගණනින් යම් යම් අය අතර බෙදා දුන්නා. හුඟ දෙනෙක් ඒවා වවන්නට ගොස් ගස් ටික කපාගෙන නැත්නම් පුලුස්සා දමා එසේ නැත්නම් ලී ටික විකුණාගෙන ආපසු එනවා. ඒ ක්‍රමය මේ රජය මගින් වෙනස් කර ඉතා හොඳ ක්‍රමයකට ඒ වැඩ පිළිවෙළ සකස් කළාම වැරදියි කියනවා. මේ රජය ගත් ක්‍රියාමාර්ගය උඩ අපේ රටට වුවමනා කරන සහල්වලින් කොටසක් දැන් ලැබෙන බව තමුන්නාන්සේලා දන්නවා. එමෙන්ම මේ ක්‍රමය යටතේ තිරිඟු හා එළවලු ගොවිතැන් ඉතා සශ්‍රීකව කෙරෙනවා. එමෙන්ම ඒවා ජනතාවගේ ප්‍රයෝජනයට ලැබෙනවා. එම නිසා රජයේ මේ ඉඩම් ප්‍රතිපත්තිය උඩ වුව්මනා නැති විධියට දුප්පත් ගැමි ජනතාව මුළා කිරීමට තමුන්නාන්සේලා කරන ඔය චෝදනාවේ එක පැත්තක් පමණක්ම නොකියා අනික් පැත්තත් කියනවා නම් එයින් රටට ප්‍රයෝජනයක් වෙනවාට කිසිම සැකයක නැහැ.

ගරු කථානායකතුමනි, මේ රාජාසන කථාවේ 2 වැනි වගන්තියේ මෙන්න මෙහෙම තිබෙනවා :

"සිය ආර්ථික පිළිවෙත්වලින් ප්‍රතිඵල ලැබීමට පටන්ගෙන ඇති හෙයින් මාගේ ආණ්ඩුව ඒ ගැන ප්‍රීති වෙයි."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මොකක්ද මේ කොටසේ අදහස? ගරු අගමැතිතුමා හාල් සේරුව කැපූ විට මේ රටේ ජනතාවට විශාල කැක්කුමක් ඇති වේය කියා විරුද්ධ පක්ෂය බලාපොරොත්තු වුණා. එහෙත් හාල් සේරුව කැපීමෙන් බලාපොරොත්තු වන ඉලක්කය කුමක්ද කියා ගරු අගමැතිතුමා රටට ප්‍රකාශ කළා. එහි ප්‍රතිඵල දැන් ලැබීගෙන යනවා. නිෂ්පාදන තත්ත්වය උසස් වන්න වන්න, ජනතාවට වුවමනා කරන සහල් ආදිය අඩු මිලට ලැබෙනවාට කිසිම අනුමානයක් නැහැ.

ගරු කථානායකතුමනි, හාල් සේරු දෙක එක කළ දවස්වල හාල් ලබාගැනීමට සෑම කඩයකමත්, සමුපකාර කඩයකමත් අලෙවි දෙපාර්තමේන්තුවේ හැම වෙළඳ පොළකමත් ජනතාව පෝලිම් සෑදී සිටි බව තමුන්නාන්සේ දන්නවා. එදා හාල් ගැනීමට තිබුණු ඒ පෝලිම් අද කෝ? එදා හාල් සේරුව 1.50 බැගින් ගත්තා. ළමයින් වඩාගෙන පාන්දර සිටම පෝලිම්වල සිටියා. එහෙත් අද ඕනෑ තරම් හාල් නිදහසේ ලබාගන්නට පුළුවන්. ගබඩාවලත් සිල්ලර කඩවලත් පමණක් නොවෙයි, පදික වේදිකාවලත් හාල් වෙළඳාමෙන් පමණක් ජීවත් වන අය සිටිනවා. ශත 85 සිට ඉහළට දැන් ඕනෑ තරම් හාල් තිබෙනවා. තව දුරටත් නිෂ්පාදනය වැඩි වන විට හාල්වල මිල තවත් පහල බහිනවාට කිසිම අනුමානයක් නැහැ.

බලපිටියේ ගරු මන්ත්‍රීතුමා රතු ළූණු ගැන කිව්වා. මේ රටේ රතුළූණු වැවෙන්නේ සමහර ප්‍රදේශවල පමණයි. මෙවර රතුළූනු වගාව පසුගිය ජලගැල්මෙන් විනාශ වුණා. නැව් සමාගමක කලබලයක් නිසා ළූනු තොගයකුත් කලට වේලාවට ලැබුණේ නැහැ. එහෙත් දැන් හැම තැනකම පාහේ රතුළූනු බෙදීගෙන යනවා. ඒ නිසා එවැනි දේවල් අල්ලාගෙන රජයට දොස් පැවරීම ප්‍රඥාගෝචරයි කියා කල්පනා කරන්නට බැහැ.

ගරු කථානායකතුමනි, මේ රාජාසන කථාවේ මෙන්න මෙහෙම වාක්‍යයක් තිබෙනවා :

"සේවා සහ ජාතික සංවර්ධන ව්‍යාපාරවලට සහභාගිවීමෙහිලා මේ රටේ තරුණ තරුණියෝ දක්වා ඇති උනන්දුව බෙහෙවින් අගය කොට සලකන මාගේ ආණ්ඩුව......"

මේ ගැනත් අපේ බලපිටියේ මන්ත්‍රීතුමා විවේචනය කළා. පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් කුඹුරුවලට යැව්වාම ඔවුන් වල් පැළෑටි පමණක් නොව ගොයම් පැළත් උදුරනවාය කියා ගොවීන් දොස් කියනවායයි ඒ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. ගොවිනුත් වල් නෙළන විට ඉඳ හිට ගොයම් පැළයක් දෙකක් ඉදිරෙනවා ඇති. ඒ මන්ත්‍රීවරයාගෙන් හැරෙන්නට වෙනත් කිසිම මන්ත්‍රීවරයකුගෙන්වත්, රටේ ජනතාවගෙන්වත් මෙතෙක් ඒ චෝදනාව අසන්නට ලැබුනේ නැහැ. මේ රටේ හැදීගෙන එන බාල පරම්පරාව එවැනි ජාතික සේවයක් ඉටු කිරීමට ඉදිරිපත් වීම ගැන අප ඒ අයට ප්‍රශංසා කරන්නට ඕනෑ. ඒ අය අධෛර්‍යය කිරීමට හෝ ඒ අයගේ අදක්ෂතාවය පෙන්වීමට නොවෙයි, අප උත්සාහ කළ යුත්තේ. ඒ අය කුඩා කාලයේ සිටම මේ ව්‍යාපාරවල යෙදීම නිසා, මේ රට ස්වයම්පෝෂිත කිරීමේ ව්‍යාපාරයට ආධාරයක් ලැබෙන අතරම ඔවුන් තුළත් ගොවිතැන පිළිබඳව ආශාවක් සහ පළපුරුද්දක් ඇති වන බවට කිසිම සැකයක් නැහැ.

ගරු කථානායකතුමනි, පසුගිය කාලයේදී මේ රටේ විශාල කිරි පිටි හිඟයක් තිබුණු බව තමුන්නාන්සේ දන්නවා. වුවමනා කරන අයත්, වුවමනා නොකරන අයත් දෙපක්ෂයම කිරි පිටි ගන්නට පෝලිම්වල සිටියා. පසුගිය අවුරුදුවලදී ගෙන්වූවාට වඩා, පෝලිම් දිග්ගැස්සෙන යුගයේදී වියළි කිරි පිටි ප්‍රමාණයක් මේ රටට ගෙන්වා තිබෙන බව, මේ ගරු සභාවට ඉදිරිපත් කළ සංඛ්‍යා ලේඛනවලින් ඔප්පු කර දුන්නා. මේ හිඟය ඇති වීමට හේතුවක් තිබෙනවාය, මේ රටට ගෙන්වන පිටි කිරි වෙන මාර්ගවලින් පිට යනවාය කියා රාවයක් තිබුණා. එය සත්‍ය හෝ වේවා, අසත්‍ය හෝ වේවා නොයෙක් නොයෙක් දේ පිට යන බව, ඔය පැත්තේ අයත්, මේ පැත්තේ අයත් නොයෙක් අවස්ථාවලදී ප්‍රකාශ කර තිබෙනවා. ඒ පිළිබඳ සත්‍යතාවය කොයි හැටි වෙතත් ළදරු පොත් ප්‍රමාණයට කිරි පිටි බෙදීමේ ක්‍රමය අනුව කිරි පිටි සඳහා පෝලිම් ගැසීමේ ක්‍රමයත් නැති වුනා. එපමණක් නොවෙයි. පොලොන්නරුවේ උකු කිරි මධ්‍යස්ථානය විවෘත කළාට පසු උකු කිරි හිඟයක්—ටින් කිරි හිඟයක්—මේ රටේ ඇති වුණේ නැහැ. අපේ රජය මේ රටේ ජනතාවට ඇති වන්නාවූ දුෂ්කරතාවයන් එකින් එක ක්‍රම ක්‍රමානුකූලව මග හැරවීමට කටයුතු කරන බව එයින් තමුන්නාන්සේලාට අවබෝධ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ද එස්. ජයසිංහ මයා.]

වෙනවා ඇති. මහනුවරට නුදුරු ප්‍රදේශයකත්, වැලිසරත් කිරි පිටි කම්හල් දෙකක් විවෘත කිරීමටත්, පළමුවෙන් විශාල තොග වශයෙන් පිට රටින් කිරි පිටි ගෙන්වා මෙහිදී පැකට් කර හෝ ටින් කර බෙදා හැරීමටත් යෝජනා ක්‍රමයක් ආරම්භ කරන බව රාජාසන කථාවෙන් තමුන්නාන්සේලාට ප්‍රකාශ කර තිබෙනවා. යම් ක්‍රමයකින් මේ රටේ කිරි පිටි පිට යනවා නම්, මෙහිදී පැකට් කර හෝ ටින් කර ජනතාව අතර බෙදා හැරීමට සැලැස්වීමෙන් ඒ ඉඩ ප්‍රස්තාවත් නැති වේය කියා අපට විශ්වාස කරන්නට පුළුවන්. එම නිසා නුදුරු අනාගතයේදී මේ රටේ කිරි පිටි වුවමනා කරන සියළු දෙනාටම ඒ කිරි පිටි ලැබෙන්නට කටයුතු සලස්වන බව රාජාසනයේ කථාවේ සඳහන් වී තිබෙනවා.

නව කර්මාන්ත ව්‍යාපාර 116 ක් පිහිටුවීමට අප පොරොන්දු වී තිබෙනවා. නව කර්මාන්ත ගැන කථා කරන අතර දැනට තියෙන කර්මාන්ත ගැනත් වචනයක් දෙකක් කිය යුතුයි. සෑම දෙයක් ගැනම රජයට ආ වැඩිම නොව අපේ අදහස් ඉදිරිපත් කිරීමයි, කළ යුත්තේ.

ගරු කථානායකතුමනි, අපේ ජනතාවගේ සුභ සිද්ධියට ඇති කළ කර්මාන්ත බොහොමයක් ජනතාවගේ විනාශයට හේතුවී තිබෙනවා. ජනතාවගේ විනාශයට හේතුවී තිබෙනවාය කියන්නේ ජනතාවගේ ධන විනාශයට හේතු වී තිබීමයි. පසුගිය රජයෙන් ඇති කළ ඇඳුම් කර්මාන්තය ගැන, විශේෂයෙන් කමිස කර්මාන්තය ගැන බලමු. අවුරුදු ගණනක සිටම යාරයක් රුපියල් 2 කට වඩා වටිනා රෙදි ලංකාවට ගෙන්වන්නේ නැහැ. එහෙත් අද මේ රටේ ම හදන රුපියල් 50 හේ, 55 හේ කමිස තිබෙනවා. දැනට මේ ගරු සභාවේ නැති වුනත් ගරු කර්මාන්ත ඇමතිතුමා මේ ගැන කල්පනා කරන්නට ඕනෑ. ගරු කර්මාන්ත උප ඇමතිතුමාත් මේ ගැන කල්පනා කරන්නට ඕනෑ. මේ රටේ නිපදවන එවැනි දේ පාරිභෝගිකයන්ට අඩු මිළට ලබා ගැනීමට පුළුවන් වන අන්දමට මිළ පාලනයක් ඇති කරන්නට ඕනෑ. එසේ නැත්නම් බඩුවක් විකිණිය යුතු මිළ එම භාණ්ඩයේම නොමැකෙන තීන්තෙන් සඳහන් කර කර්මාන්ත ශාලාවෙන් එය පිට කිරීමට කටයුතු සලස්වන්නට ඕනෑ.

පසුගිය රජයෙන් ආරම්භ කළ කර්මාන්ත කීපයක් තිබෙන බව තමුන්නාන්සේලා දන්නවා. එයින් එකක්, "රේසර් බ්ලේඩ්" හෙවත් රැවුල බාන දැලි පිහි තල සෑදීමේ කර්මාන්තය ලංකාවේ නිපදවන දැලි පිහි තලයකින් එක දවසක් රැවුල බා අනෙක් දවසේ රැවුල බාන්න බලන විට, ඒ තලය මලකඩ කා ඇති; එහෙම නැත්නම් මොට්ට වී ඇති. එහෙත් ශත 5 ක් මිළ දී ගත්, පිටරටින් ගෙන්වූ "සෙවන් ඕ ක්ලොක්" තලයකින් සාමාන්‍යයෙන් සති 2 ක් පමණ රැවුල බාන්න පුළුවන්කම තිබුණා, වීදුරු කෑල්ලක අතුල්ලා පොඩ්ඩක් මැද ගත්තාම. එහෙත් ශත 15 ක් හෝ 20 ක් දී ගන්නා, අපේ රටේ නිපදවන දැලි පිහි තලයක් පාවිච්චි කරන්න පුළුවන්, දින 2 යි. එම නිසා, ඒ අතිනුත් ජීවන වියදම නඟිනවාට කිසිම සැකයක් නැහැ.

මේ වැනි කාලෙ. අපේ රටේ කුඩ කර්මාන්තයකුත් තිබෙනවා. අද මහතුන්ගේ කුඩයක් රුපියල් 40 යි නැත්නම් 45 යි. නෝනා මහතුන්ගේ කුඩයක් රුපියල් 25 යි. මොකක්ද, මේ සිදු වී තිබෙන අපරාධය? අපේ රටේ කර්මාන්ත ඇමතිතුමන්ලා—කලින් හිටපු ඇමතිතුමන්ලාත්, දැන් ඉන්න ඇමතිතුමාත්—කල්පනා කරන්නේ, මේ රටේ එක්තරා පිරිසක් පොහොසතුන් කරන්නද එහෙම නැත්නම් මේ රටේ ජනතාවට—කෑමට හෝ ඇඳීමට හෝ පාවිච්චි කිරීමට—වුවමනා කරන පාරිභෝගික ද්‍රව්‍ය හැකි තාක් අඩු මිළකට සපයා ජීවන වියදම පහත බැස්සීමටද යන ප්‍රශ්නය මා අහන්න කැමැතියි.

අද මේ රටට හොඳ තත්ත්වයේ ගිනි පෙට්ටි වුවමනා තරම් ලැබෙනවාද? කාක්කා ගිනි පෙට්ටියක තිබෙන කූරු 15 ක් ගැහුවාමයි, එකක් පත්තු වන්නේ. මේ රටේ ගිනි පෙට්ටි—විශේෂයෙන්, කාක්කා ගිනි පෙට්ටි—ඒ තරම් පහත් තත්ත්වයකට වැටී තිබෙනවා. එම නිසා, ටිකක් පරීක්ෂා කර බලන්න ඕනෑ, දුප්පත් පාරිභෝගිකයාගේ මුදලට සිදු වන්නේ කුමක්ද කියා. ඒ රජයෙන් කොපමණ කර්මාන්ත ආරම්භ කර මේ රටේ කොටසක් ධනපතියන් කළත්. මේ රජයෙන් නව නව කර්මාන්ත කොයි තරම් ආරම්භ කළත් කිසි වැඩක් නැහැ, පාරිභෝගිකයන්ට ලාබෙට ඒ බඩු ගන්නට බැරි නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

දැන් තමුන්නාන්සේලා අවුරුදු 3 ක්ම කළා නොවැ ?

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி. எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasingha)

තමුන්නාන්සේලා කළ පව් තමයි, අපි මේ කර ගහගෙන ගෙනියන්නේ. තමුන්නාන්සේලා ඒ කාලයේ හරියට කර තිබුණා නම් මේ පව් කර ගහන්න අපට සිදු වන්නේ නැහැ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

අවුරුදු 3 ක්ම හිටියෙ ; හදන්න එපායැ ?

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி. எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasingha)

තමුන්නාන්සේලා ඒ වැඩ හරියට කර තිබුණා නම් අද අපට නයිලොන් කමිස යක් රුපියල් 7.50 ට ගන්න තිබුණා. එහෙත් තමුන්නාන්සේලා ඒවා කළේ, වැරදි විධියටයි. ඒ වැරදි පාරෙයි, තව මත් ගමන් කරන්න සිදු වී තිබෙන්නේ. ඒ පාඩේ රේල් පිලි තදින්ම මලකඩ කා තිබෙනවා. අපේ ඇමතිවරු ඒ රේල් පිලි වල තිබෙන මුරිච්චිවලට භූමිතෙල් ගා කොපමණවත් කරකවනවා ; ඒත් ගල වන්න බැරිව දඟලනවා. තමුන්නාන්සේලා ඒ තරම් තදේට, ඒ මුරිච්චි කර කවා තිබෙනවා.

ඊළඟට රෙදි-පිළි කර්මාන්තය ගෙන බලමු. අද මේ රටේ අත් යන්ත්‍රවලින් විශාල රෙදි-පිළි ප්‍රමාණයක් නිපදවන බව තමුන්නාන්සේලා දන්නවා. ඒ අතරම, විදුලි බලයෙන් රෙදි-පිළි නිපදවන රජයේ හා පෞද්ගලික අංශයේ කර්මාන්ත ශාලා කීපයකුත් තිබෙනවා. මේ අවුරුද්ද තුළ රෙදි-පිළිත්, ඒ වාගේම අපට අවශ්‍ය මුද්‍රණ කඩදාසි ආදියත්, තව තවත් නිපද වීමට රජය බලාපොරොත්තු වෙනවා.

ඊළඟට ලුණු ගැන බලමු. මෙවර රාජාසන කථාවේ ඒ සම්බන්ධයෙන් මෙසේ කියා තිබෙනවා :

"දේශීය ලුණු නිෂ්පාදනය වැඩි කරනු ලැබේ. ලංකාවේ මෙතෙක් නොවූ විරූ තරම් විශාල ලේවා යක් සෑදීම සඳහා 1968-69 තුළදී ටෙන්ඩර් කැඳ වනු ඇත."

මොකක්ද, මේ ලුණු ප්‍රශ්නය ? පසුගිය රජය කාලයේ හොඳ්දට දමන ලුණු ටිකවත් නැතිව ගිය බව තමුන්නාන්සේලා දන්නවා.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. என். டென்சில் பெர்ணாண்டோ)*
(Mr. N. Denzil Fernando)

පකිස්ථානයෙනුත් ලුණු ගෙන්නුවා.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி. எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasingha)

පකිස්ථාන් ලුණුත් නැතිව ගිය කාල යක් තිබුණා. පකිස්ථානයෙන් ලුණු ගෙන්වන්න සිදු වුණේ, මේ රටේ ලුණු නැති වූ නිසායි. පසුගිය රජය යම් යම් පුද්ගලයන්ගේ යෝජනා ක්‍රම පිළිගෙන හම්බන්තොටින් එහා ලේවායක් හදන්න රුපියල් කෝටි ගණනක මුදලක් නාස්ති කළා. ඒ නාස්තිය නිසා, තිබුණු ලේවාවල වැඩ කළේත් නැහැ. අවසාන යේදී, අපේ රටට වුවමනා කරන ලුණු ප්‍රමාණයවත් මේ රටේ නිපදවන්න බැරි වී ගොස්, පිටරටිනුත් ලුණු ගෙන්වන්න සිදු වුණා. දැන් නම් අපේ රටට අවශ්‍ය වන ලුණු මෙහිම නිපදවනවා. අලුත් යෝජනා ක්‍රමයෙන් බලාපොරොත්තු වන්නේ මේ රටේ ජනතාවගෙන් කොට සතට රක්ෂා සැපයීමත් නිෂ්පාදනය කරන ලුණු පිටරට යැවීමත් යන කාරණා දෙකයි. මේ ආදී වශයෙන් මේ අවුරුද්දේ කරන්නට පුළුවන් වැඩ මහත් රාශියක් ගැන මේ වර රාජාසන කථාවේ සඳහන් කර තිබෙනවා. තවත් වැදගත් දෙයක් කියන්නට තිබෙනවා.

"රත්මලාන වැඩපොළෙහි ඩීසල් එංජින් ඇන් ජින් රථ සාදනු ඇත. මෙයින් පළමුවැන්න මේ වර්ෂයේදී නිම කරනු ඇත."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ද එස්. ජයසිංහ මයා.]

ඇත්තෙන්ම මෙවැනි දෙයක් ඇසීම මහත් සතුටට කාරණයක් බව ප්‍රවාහණ ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි. දිවා රෑ දෙක්හි පවා වැඩ කොට තමන්ගේ නළු පැවතීම සඳහා අපේ රටේ සෑදූ ඩීසල් එන්ජිමක් වැඩි කල් යන්නට මත්තෙන් ගාල්ලේ සිට කොළඹ කොටුවට ධාවනය කරවන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එසේ ධාවනය කොට "මෙන්න අප කළ හපන්කමක්" යනුවෙන් ජනතාවට කියන්න. එවැනි හපන්කම් කළ විට විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ද ඊට ප්‍රශංසා කරනවා පමණක් නොව මෙවැනි රාජාසන කථාවලට පක්ෂව ඡන්දය පාවිච්චි කරනවාටද සැකයක් නැහැ.

අපේ රටේ දක්ෂ තරුණ කලාකරුවන් සිටින බව ගරු කථානායකතුමා දන්නවා ඇති. සමහරුන් කලාව වැරදි විධියට පාවිච්චි කරන බවත් ඇත්තයි. එහෙත් ගම්බද තරුණ තරුණියන් දක්ෂ කලාකරුවන් වී සිටිනවා. උත්සවයක් පවතින දිනයක කොළඹ සිට ගාල්ල දක්වා ගියහොත් විසි පොළකදී තරම අපේ ගම්බද දක්ෂ තරුණ තරුණියන් නාට්‍ය ආදිය රඟ දක්වන බව පේනවා. ඒ දක්ෂ කලාකරුවන්ට ආධාර දීමට මෙම රාජාසන කථාවෙන් යෝජනා කර තිබීම ගැන අප සතුටු වෙනවා.

කුලියට සින්නවීමේ ක්‍රමය අනුව නිවාස යෝජනා ක්‍රම ඇති කරන බවද රාජාසන කථාවේ සඳහන් කර තිබෙනවා. ජනතාවට අවශ්‍ය කරන නිවාස සාදා දීමට බොහෝ කාලයක සිටම පරිශ්‍රම දරා තිබෙනවා. එහෙත් එකම රජයකටවත් ඒ ප්‍රශ්නය නියම අන්දමින් විසඳන්නට පුළුවන් වී නැහැ. ක්‍රමානුකූලව ඒ ප්‍රශ්නය විසඳීමට අප උත්සාහ කරන අතරම කුලියට සින්න වීමේ ක්‍රමයට ගෙවල් දීම රජයේ පරමාර්ථයයි. මේ සම්බන්ධයෙන් පසුගිය කාලයේදී නීති රීති සකස් කරගෙන ගිය බව මතක් කරන අතරම පළමු වරට දැනට රජය විසින් කුලියට දෙනු ලැබ ඇති නිවාස මාස්පතා ගෙවීමේ ක්‍රමයට පදිංචිකරුවන්ටම දීමට බලාපොරොත්තු වෙනවා පමණක් නොව මින් ඉදිරියට කුලියට සින්න වීමේ ක්‍රමය අනුව දෙන නිවාස සෑදීමටද ක්‍රියා කරනවා. තවද, නිවාස යෝජනා ක්‍රම සඳහා පෞද්ගලික අංශයේ ආධාර ලබාගැනීමටද අදහස් කරගෙන සිටිනවා. පෞද්ගලික ආයතනවල තිබෙන තැන්පත් මුදල් ඒ ආයතනවල කැමැත්ත ඇතිව එක්තරා පොලියක් ගෙවීමට ලබාගෙන නිවාස සෑදීමටත්, රජයේ මුදල් වලින් නිවාස සෑදීමටත් ක්‍රියා කරනවා. එතකොට නිවාස සෑදීම සඳහා රජය එක් පැත්තකිනුත්, පෞද්ගලික අංශය තවත් පැත්තකිනුත් මුදල් යොදවන විට දැනට වඩා ඉක්මනින් ඒ ප්‍රශ්නය විසඳන්නට පුළුවන් වෙනවා ඇති.

කාලවේලාව ඉක්ම යමින් පවතින නිසා මගේ කථාව සඳහා තව විනාඩිය කට දෙකකට වඩා ගන්නට මා අදහස් කරන්නේ නැහැ. රාජාසන කථාවේ අවසාන කොටසෙහි දිස්ත්‍රික් සභා ගැන සඳහන් කර තිබෙනවා. ඒ මෙසේයි :

> "මහ ආණ්ඩුවේ මෙහෙයවීම සහ පාලනය යටතේ ක්‍රියා කරන දිස්ත්‍රික් සභා පිහිටුවාලීම පිළිබඳ වූ ධවල පත්‍රයක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. ව්‍යවස්ථා ඉදිරිපත් කිරීමට පෙර එම ධවල පත්‍රිකාව පිළිබඳව ඇති වූ සාකච්ඡාවේදී ප්‍රකාශ කරන ලද අදහස් ගැන මාගේ ආණ්ඩුව සුපරීක්ෂාකාරීව සලකා බලනු ඇත."

මෙම ධවල පත්‍රිකාව සම්බන්ධව මේ රටේ නොයෙක් නොයෙක් විධියේ උද්ඝෝෂණ ඇති වුණ බව තමුන්නාන්සේලා දන්නවා. ඒ වාගේම මේ රට දෙකඩ කඩා කොටසක් ද්‍රවිඩ පක්ෂයට පාවා දීමට ඩඩ්ලි සේනානායක අගමැතිතුමා සහ ජාතික රජයේ එක්සත් ජාතික පාක්ෂිකයන් ලැහැස්ති වෙනවාය කියා දඹදෙණියේ ගරු මන්ත්‍රීතුමා මෙම මන්ත්‍රී මණ්ඩලයේ දීත් විරුද්ධ පාර්ශ්වයේ අනික් අය හයිඩ් පාක් පිට්ටනියේදීත් ප්‍රකාශ කර තිබෙනවා. එමෙන්ම වෙනත් වෙනත් ප්‍රසිද්ධ රැස්වීම්වලදීද ඔය කාරණයම ප්‍රකාශ කර තිබෙන බව මෙහිදී නොකියාම බැහැ.

ධවල පත්‍රිකාව ඉදිරිපත් කෙළේ ජනතාවගේ අදහස් උදහස් දැනගැනීමට බව ගරු අගමැතිතුමා මේ ගරු සභාවේදීත් ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාගේම මින් පිටතදීත් ප්‍රකාශ කර තිබෙනවා. ඒ නිසා ජනතාව විසින් දක්වන අදහස් අනුව එතුමා ඒ ගැන ක්‍රියා කරනවාට කිසිම සැකයක් නැහැ. මෙහි එක්තරා ප්‍රශ්නයක් තිබෙනවා. මෙම රට සහා ප්‍රශ්නය එක්සත් ජාතික පක්ෂයවත් ජාතික රජයවත් ඉදිරිපත් කළ ප්‍රශ්නයක් නොවෙයි. අවුරුදු 30ක් 35ක් තිස්සේම පැවත එන ප්‍රශ්නයක්. එම නිසා ඒ පිළිබඳව අවසානයක් කිරීමටයි ජාතික රජයේ අගමැතිතුමා බලාපොරොත්තු වුණේ. එවැනි අදහසක් ඇතිව, ඒ පිළිබඳව නීති රීති සකස් කරන්නට කලින් මහජනතාවගේ අදහස් දක්වන්නය කියා මේ රටේ ජනතාවට අවසථාවක් දුන්නා. මේ රටේ ජනතාව යම් යම් අදහස් ප්‍රකාශ කළා. සමිති සම්මේලන යම් යම් අදහස් ප්‍රකාශ කළා. බෞද්ධ සම්මේලන සවකීය අදහස් ප්‍රකාශ කළා. මහා සංඝ රත්නය අදහස් ප්‍රකාශ කළා. එසේ ප්‍රකාශ කරන ලද සියලුම අදහස්වලින් යම් යම් දේ වැටහී තිබෙනවා. එහෙත්, මෙහි තිබෙන ප්‍රධානම ප්‍රශ්නය නම් ඇත්ත නැත්ත හරි හැටි රටට ප්‍රකාශ නොකර, ජාතික රජය විසින් රට දෙකට කඩා භාගයක් ද්‍රවිඩයන්ට දෙන්නට සූදනම් වනවාය කියා විරුද්ධ පාර්ශ්වය විසින් කියා පෑමයි.

තමුන්නාන්සේ දන්නවා ඇති කථානායකතුමනි, "ඩී. සී. පැක්ට් එකට නොහොත් බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුමට මා එදත් විරුද්ධය අදත් විරුද්ධය" කියා ගරු අගමැතිතුමා මෙම ගරු සභාවේදී ප්‍රකාශ කර තිබෙන බව. එයින්ම තමුන්නාන්සේට පැහැදිලිව පෙනෙනවා ඇති, විරුද්ධ පාර්ශ්වයටත් පැහැදිලිව අවබෝධ වෙනවා ඇති, මෙය එවැනි පොරොන්දුවක් නොව සම්පූර්ණයෙන්ම ඊට වෙනස් එකක් බව. එවැනි ප්‍රකාශයක් ගැනවත් විශ්වාසය නොතබා විරුද්ධ පාර්ශ්වය මේ සම්බන්ධව ගමක් ගමක් පාසා රැස්වීම් පැවැත්වීම ආරම්භ කර තිබීම කණගාටුවට කාරණයක්. එහෙත් ඔය කරගෙන යන වැඩ පිළිවෙල ගැන ගැමි පිරුළකින් කියනවා නම්, "නටපු නැටුමකුත් නැත, බෙරේ පළුවකුත් නැත" යන තත්ත්වයට විරුද්ධ පාර්ශ්වයට මුහුණ පාන්නට සිද්ධ වේවිය කියා ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ටී. බී. එම්. හේරත් මයා. (වලපනේ)**
*(திரு. ரி. பி. எம். ஹேரத்—வலப்பனை)*
**(Mr. T. B. M. Herath—Walapane)**
ඒක ආණ්ඩුවටයි වෙන්නෙ.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*
**(Mr. S. de S. Jayasingha)**
ආණ්ඩුවටද කාටද වෙන්නෙ කියා අපි බලමු.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
**(Mr. T. B. M. Herath**
බලමු.

අ. භා. 4.59

**වී. නවරත්නම් මයා.**
*(திரு. வீ. நவரத்னம்)*
(Mr. V. Navaratnam)

*சபாநாயகரவர்களே, எனக்கு முன்பு பேசிய கௌரவ உடுவில் பிரதிநிதி திரு. வீ. தர்மலிங்கம் அவர்களைத் தொடர்ந்து நான் பேசக்கூடிய சந்தர்ப்பம் எனக்குக் கிடைக்குமென்று நினைத்திருந்தேன் ஆனால் பேசுகின்ற முறையிலே மாற்றம் ஏற்பட்டதனால் அவ்வாய்ப்புக் கிடைக்கவில்லை. நான் என் உடுவில் பிரதிநிதியவர்களைத் தொடர்ந்து பேச வேண்டுமென்று விரும்பினேனென்றால் எனது நண்பர் பேசுகின்ற பொழுது சில பொருட்களின் விலைகள், 1963 ஆம் ஆண்டிலே கௌரவ யட்டியாந்தோட்டைப் பிரதிநிதி சொன்ன விலைகளிலும் பார்க்க இப்பொழுது குறைவாக இருக்கின்றன; இந்த நிலைமை இந்தத் தேசிய அரசாங்கத்தினாலேயே கொண்டுவரப்பட்டது; ஆகவே பொருட்களின் விலை மிகவும் குறைவாக இருப்பது தேசிய அரசாங்கம் செய்த நன்மையினாலேதான் என்ற கருத்துப்படப் பேசினார். ஆனால் அதை நடுநிலைமையிலே இருந்து ஆராய்ந்து பார்த்தால் உண்மை எவருக்கும் விளங்கும்.*

*சவரம் செய்கின்ற பிளேட் என்று சொன்னாலும் சரி, பைசிக்கிள் ரயர் என்று சொன்னாலும் சரி, மற்றும் பொருட்களை எடுத்துப் பார்த்தாலும் சரி, இந்த அரசாங்கத்துக்கு முன்பு ஆட்சியிலே இருந்த ஸ்ரீலங்கா சுதந்திரக் கட்சி, கூட்டு அரசாங்கம்—இவர்களினாலே நடாத்தப்பட்ட அரசாங்கங்கள் எடுத்துக்கொண்ட நடவடிக்கைகளினாலேதான்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. නවරත්නම් මයා.]

இன்று குறைந்த விலையிலே பொருட்கள் வாங்கக் கூடிய நிலை ஏற்பட்டிருக்கிற தென்பதை நாங்கள் நன்ருக அறியக்கூடியதாக இருக்கிறது. ஆகையினுலே அந்தப் பெருமை ஒரு குறிப்பிட்ட அரசாங்கத்தையே சாரும் என்று நாங்கள் சொல்லிவிட முடியாது. ஒரு அரசாங்கம் எடுத்த நடவடிக்கைகளின் பலா பலன்களை நாங்கள் அனுபவிக்க வேண்டுமானுல் குறைந்தபட்சம் ஐந்து வருடங்களாவது போக வேண்டும். இப்பொழுது நாங்கள் குறைந்த விலைவாசியில் பொருட்களைப் பெறக்கூடியதாகவிருந்தால் அதற்குக் காரணம் என்ன? பிளேட்களை எடுத்துக் கொள்ளும்பொழுது வெளிநாட்டிலேயிருந்து இறக்குமதிசெய்யப்பட்ட பிளேட் நிறுத்தப்பட்டு உள்ளூரிலே உற்பத்தியாக்கப்படுகின்ற பிளேட்டுகளை நாங்கள் பாவிக்கின்ருேம்; அதைப் போல உள்ளூரிலே உற்பத்தியாக்கப்படுகின்ற பைசிக்கிள் ரயர்களை நாங்கள் பாவிக்கின்ருேம்; இவையெல்லாம் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியின் ஆட்சிக்காலத்திலே நிறுவப்பட்ட தொழிற்சாலைகளிலே உற்பத்தியாகப்படுபவை என்பதை நாம் மறுக்கக்கூடாது. அவர்கள் மேற்கொண்ட நடவடிக்கைகளாலே இன்றைக்கு மக்கள் ஏதோ ஒரு பலனை அனுபவித்துக்கொண்டு வருகிருர்களென்ருல் அதற்காக இந்த அரசாங்கம் பெருமைப்படுவதற்கு எக்காரணமும் கிடையாது. அதைப்போலத்தான் இப்பொழுது ஆட்சியிலே இருக்கின்ற அரசாங்கம் எடுத்துவருகின்ற நடவடிக்கைகளாலே—கட்டிப்பாலென்று எடுத்துக்கொண்டாலும் சரிதான் அல்லது இங்கே புதிதாகத் தொடங்கப்பட்டிருக்கின்ற தொழிற்சாலைகளிலே உண்டாக்கப்படப் போகின்ற பொருட்களாக இருந்தாலும் சரிதான்—இன்னும் 5 வருடங்களுக்குப் பின்பு அவற்றின் விலைகள் குறையத்தான் செய்யும். அப்பொழுது, ஐந்து வருடங்களுக்குப் பிறகு, இப்பொழுது அரசாங்கம் எடுத்துக் கொண்டுவருகின்ற நடவடிக்கைகளின் பலாபலன்களை மக்கள் அனுபவிப்பார்கள்.

நான் இதை ஏன் சொல்லுகின்றேனென்ருல், அந்தந்தக் காலத்திலே எந்தெந்த அரசாங்கம் பதவியில் இருக்கின்றதோ அந்த அந்த அரசாங்கங்கள் மக்களுடைய தேவைகளைப் பார்த்து நல்ல நடவடிக்கைகளையும் நல்ல திட்டங்களையும் வகுத்துச் செயல்படச் செய்யவேண்டியது தேவையான ஒன்ருகும். ஆகவே அது ஒரு அபூர்வமான செயலல்ல. ஆனுல் என்னுடைய மனதிலேபட்ட ஒரு சிறு விடயமென்னவென்ருல் இந்தப் பொருட்களை எடுத்துச் சொல்லி கௌரவ உடுவில் பிரதிநிதி தேசிய அரசாங்கத்துக்காக வக்காலத்து வாங்கிப் பேசினுரே என்பதுதான். தமிழ் மக்கள் மாத்திரம் இந்நாட்டிலே பாவிக்கின்ற பொருட்கள் சில உள. ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சி ஆட்சிக்காலத்திலே அல்லது கூட்டு அரசாங்கக் காலத்திலே எடுக்கப்படாத சில நடவடிக்கைகளை எடுத்து தமிழ் மக்கள் மாத்திரம் பாவிக்கின்ற சில பொருட்களின் இறக்குமதியை இந்த அரசாங்கம் கட்டுப்படுத்தியதனுல் இன்று தமிழ் பேசும் மக்களுக்கு அப்பொருட்கள் கிடைக்காமல் போய் விட்டன. இந்த அரசாங்கத்தைத் தமிழரசுக் கட்சி உறுப்பினர்கள் அங்கம் வகிக்கின்ருர்கள். இந்த அரசாங்கத்தைத் தமிழரசுக் கட்சி அரசாங்கம் என்று சொன்னுல் கூட அது மிகையல்ல. அப்படியிருந்தும் சீயாக்காய் இலங்கையிலே எந்த இடத்திலும் கிடையாது. சீயாக்காய் என்ற பொருளை, தமிழர்களை விட வேறு எவரும் பாவிப்பதில்லை என்பது கௌரவ அங்கத்தவர்கள் அனைவருக்கும் தெரியும். அப்படியிருந்தும் ஏன் அதனுடைய இறக்குமதியை நிறுத்தினுர்கள்? தமிழர்கள் பாவிக்கும் பொருள் என்பதாலா?

சபாநாயகரவர்களே, அடுத்ததாக உழுந்து என்ற பொருளை எடுத்துப் பார்ப்போம். ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியின் ஆட்சிக் காலத்திலே அவர்கள் எவ்வளவுதான் மசால வடை, தோசை என்று பரிகாசம் செய்தாலும் இறக்குமதி நிறுத்தப்படாத உழுந்தை இன்று வாங்க முடியாமல் இருக்கிறது. மருந்துக்கும் கிடையாது.

அடுத்ததாக, சமயக் கோவில்களை எடுத்துப் பாருங்கள். கோவில் பிரசாதங்களுக்கு சர்க்கரை பாவிக்கப்படுகிறது என்பது எல்லோருக்கும் தெரிந்ததே. திருவிழாக் காலம் வருகிறது; விரத காலம் வருகிறது. இப்பொழுது யாழ்ப்பாணப் பகுதியிலும் மற்றைய தமிழ்ப் பகுதிகளிலும் இருக்கும் ஒரே பிரச்னை சர்க்கரை எங்கே வாங்கப்போகிருேம், உழுந்தை எங்கே வாங்கப் போகிருேம், நிலக்கடலையை எங்கே வாங்கப் போகிருேம், துவரம் பருப்பை எங்கே வாங்கப் போகிருேம் என்பதுதான். இவற்றை சிங்கள மக்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கள் பாவிப்பதில்லை என்பது அனைவருக்கும் தெரியும். என்னுடைய நண்பர் கௌரவ உடுவில் பிரதிநிதி அவர்களைப் பார்த்துக் கேட்க விரும்புகிறேன்; உங்களுடைய அரசாங்கம் உம்பிளா மாசி என்றழைக்கப்படும் மாசி இறக்குமதியில் கைவைத்துப் பார்க்கட்டும். இந்த இறக்குமதியில் ஒரு அவுன்சைக்கூடக் குறைத்துப் பார்க்கட்டும். என்ன நடை பெறும் என்பது தெரியும். [இடையீடு]

நீங்கள் நடவடிக்கை எடுப்பீர்கள் என்று பார்த்துப் பார்த்து, பொறுத்துப் பொறுத்து மூன்றரை வருடங்கள் கழித்து, ஆற்ருமல் தான் நான் இந்த நடவடிக்கையை எடுத்தேன் என்பதை நினைவில் வைத்திருக்க வேண்டும். ஆனல் இதைப் பற்றி நான் அதிக தூரம் பேச விரும்பவில்லை. ஏனென்ருல், இதிலே ஒருவகையான ஆச்சரியமும் இல்லை. தமிழரசுக் கட்சித் தலைமைபீடம் போகும் போக்கைப் பார்த்தால், அவர்கள் தேர்தல் காலத்திலே என்ருலும் சரிதான், பிரச்சார சமயங்களில் என்ருலும் சரிதான் மக்களுக்குக் கொடுத்த வாக்குறுதிகளைக் காற்றில் பறக்கவிட்டு பதவி மோகத்தில் ஆழ்ந்து அமிழ்ந்து போயிருக்கும் நிலையைப் பார்த்தால் எனக்கு ஆச்சரியப்படக் காரணம் இல்லை.

அரசாங்க ஊழியர் விஷயத்தை எடுத்துப் பாருங்கள். அரசாங்க ஊழியர்களுக்குக் கடந்த பன்னிரண்டு வருடங்களாகக் கொடுத்த வாக்குறுதிகள் எல்லாம் என்ன? எனக்குக் கொடுக்கப்பட்டிருக்கும் நேரம் சுருக்கமானதால் அதுபற்றி விரிவாகப் பேச விரும்பவில்லை. ஆனல், இன்று தமிழரசுக் கட்சித் தலைமைப்பீடம் மக்களின் நலன்களையெல்லாம் காற்றிலே பறக்கவிட்டு, வாக்குறுதிகளையெல்லாம் காற்றிலே பறக்கவிட்டு இருக்கும் விதத்தைப் பார்த்தால் நிச்சயமாக அந்தப் பாராளுமன்ற அங்கத்தவர்கள் ஒவ்வொருவரும் தங்கள் பதவியை இராஜினமாச்செய்து விட்டு வெளியேற வேண்டும். அதுதான் கௌரவம். அதனை அவர்கள் செய்வார்கள் என்று நான் நம்பவில்லை. இருந்தாலும் கௌரவமாக நடந்துகொள்வார்களாயின் அவ்விதம் செய்ய வேண்டும். நேர்மையுள்ளவர்கள், சத்தியத்தைக் காக்கப் பிறந்தவர்கள் என்ருல் அவர்கள் இந்த நடவடிக்கையை எடுத்தால்தான் மக்கள் அவர்கள் மேல் ஏதோ நம்பிக்கையையாவது வைப்பார்கள் என்பது என்னுடைய கருத்து.

அரசாங்க ஊழியர்களைப் பொறுத்த வரையில் விட்டுக் கொடுப்பதை விட்டுக்கொடுத்திருக்கிறீர்கள். அரசாங்கத்தோடு இன்னும் ஒட்டிக்கொள்ளவேண்டும் என்று நினைத்திருந்தால் இந்த அற்ப விஷயத்தை உங்களால் செய்ய முடியும். அதாவது சிங்களம் படிக்காதவர்கள் என்று சம்பள உயர்வு பெருமல் இருப்பவர்கள் எல்லோரையும்—confirmation செய்யப்படாமல் இருப்பவர்கள் எல்லோரையும்—தமிழ்ப் பிரதேசங்களுக்கு அனுப்பி அவர்கள் அங்கு வேலைசெய்ய ஒழுங்கு செய்ய முடியும். அப்படிச் செய்தால் அவர்கள் சிங்கள மொழியில் தேர்ச்சி பெறவேண்டிய தேவை வராது. தாங்கள் எந்தப் பாஷை மூலம் சேவைக்குத் தெரிந்தெடுக்கப்பட்டார்களோ அந்தப் பாஷை மூலம் கடமையாற்ற முடியும். அதையாவது நீங்கள் அரசாங்கத்துடன் ஒட்டிக்கொண்டிருக்கும் நேரத்தில் செய்யவேண்டும். அது ஒரு பிராயச்சித்தமாக இருக்கும். அதே நேரத்தில் நீங்கள் அதை எங்கே செய்யப் போகின்றீர்கள் என்ற சந்தேகமும் எனக்கு இருக்கின்றது. ஏனென்ருல், இன்று தமிழ்ப் பிரதேசங்கள் எங்கு போய்ப் பார்த்தாலும், யாருடன் கதைத்தாலும் எல்லோரும் ஒரே அபிப்பிராயத்தைத்தான் தெரிவிப்பார்கள்: அதாவது, தமிழரசுக் கட்சி, ஐக்கிய தேசியக் கட்சியோடு இரண்டறக் கலந்து ஐக்கியப்பட்டு தனது தனித்தன்மையை இழந்துவிட்டது என்பதுதான் அந்த அபிப்பிராயம். இந்த அபிப்பிராயம் தமிழ்ப் பிரதேசங்கள் எங்கும் நிலவி வருகின்றது.

**ධර්මලිංගම් මයා.**
(திரு. தர்மலிங்கம்)
(Mr. Dharmalingam)

உங்கள் கற்பனை.

**වී. නවරත්නම් මයා.**
(திரு. வி. நவரத்னம்)
(Mr. V. Navaratnam)

நான் சொல்லவில்லை. தமிழ்ப் பிரதேசங்களில் மக்கள் சொல்கிருர்கள். அதுவுமல்லாமல் கௌரவ பிரதமர் அவர்கள் கூட அப்படிச் சொல்லியிருக்கிருர்கள். அதனை நீங்கள் மறுக்க முடியாது.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. නවරත්නම් මයා.]

'வொஷிங்டன் போஸ்ட்' என்ற ஆங்கிலப் பத்திரிகை நிருபருக்கு கௌரவ பிரதமர் அவர்கள் சில மாதங்களுக்கு முன்னர் பேட்டியளித்தார்கள். வொஷிங்டன் போஸ்ட் பத்திரிகைப் பிரதி ஒன்றைப் பெற முயன்று பார்த்தேன். அது எனது கைக்குக் கிடைக்கவில்லை. நண்பர் சண்முகதாசன் அவர்கள் அந்தப் பெட்டியில் இருந்து சில பகுதிகளை எடுத்துச் சொல்லி இருக்கிறார். 1968 ஆம் ஆண்டு மார்ச் மாதம் 4 ஆம் தேதி வொஷிங்டன் போஸ்ட் பத்திரிகையில் இந்தப் பேட்டி வெளி வந்ததாக இலங்கை டெயிலி நியூஸ் பத்திரிகை ஏப்றில் மாதம் 18 ஆம் தேதி இதழில் திரு. சண்முகதாசன் குறிப்பிட்டிருக்கிறார். அவர் கௌரவ கொலன்னாவை தொகுதிப் பாராளுமன்ற அங்கத்தவர் (திரு. ரி. பி. இலங்கரத்ன) அவர்களுக்கு மறுப்பாக எழுதிய ஒரு கட்டுரையில் இதை எடுத்துக் கூறி இருக்கிறார் எங்களுடைய கௌரவ பிரதமர் அவர்கள் சொன்னதாக. அதை நான் இங்கு வாசிக்கிறேன்.

"We are gradually building two strong democratic parties here. I am absorbing the communalists and Mrs. Bandaranaike is absorbing the left."

திட்டவட்டமாக எமது கௌரவ பிரதமர் அவர்களுடைய அபிப்பிராயம் இது. இதை நீங்கள் மறுக்க முடியாது.

**ධර්මලින්ගම් මයා.**
(திரு. தர்மலிங்கம்)
(Mr. Dharmalingam)

He did not mean the Federal Party.

**වී. නවරත්නම් මයා.**
(திரு. வி. நவரத்னம்)
(Mr. V. Navaratnam)

இலங்கை அரசியல் விடயங்களைத் தெரிந்த எவராவது இலங்கைக் கட்சிகளில் **யாரைக்** communalists என்று [இடையீடு]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
நீங்களும்தான்.

**වී. නවරත්නම් මයා.**
(திரு. வி. நவரத்னம்)
(Mr. V. Navaratnam)

இந்தச் சொல்லுக்கு நீங்கள் பயப்படாதீர்கள். இந்தச் சொல்லை நான் ஏற்றுக் கொள்ளத் தயாராக இருக்கிறேன். இந்தச் சொல்லில் இன்றைய அரசியலில் எதுவும் பிழையில்லை. ஆனால் இதில் கௌரவ பிரதமர் யாரைச் சுட்டிக் காட்டுகிறார் என்றால் தமிழரசுக் கட்சியினரை என்பதில் எந்தவிதமான சந்தேகமும் இல்லை. "I am absorbing the communalists and Mrs. Bandaranaike is absorbing the left." இதில் உள்ள இரண்டாவது விடயத்தைப்பற்றி நான் குறிப்பாகப் பேச விரும்பவில்லை. அந்த இரண்டாவது விடயத்தைப் பற்றிச் சொல்லத் தகுந்தவர்கள் இருக்கிறார்கள். காலமும் அதற்குப் பதிலளிக்கும். திருமதி சிறிமாவோ பண்டாரநாயக்க அவர்கள் இடதுசாரிகளைச் சுவீகரித்து அவர்களை விழுங்கிக் கொண்டார்களா என்பதைக் காலம் காட்டும். இன்றைய நிலையில் இலங்கைத் தமிழ் மக்கள் ஒவ்வொருவருக்கும் தெரியும், ஐக்கிய தேசியக் கட்சி தமிழ் அரசுக் கட்சியை உள்ளடக்கி விழுங்கி இரண்டறக் கலக்கவைத்து விட்டதென்பது. அது சமித்துக்கூடப்போய் விட்டது என்பதும் எல்லோருக்கும் தெரியும். ஆகவே கௌரவ பிரதமர் அவர்கள் கூறியதை நான் முழுக்க முழுக்க ஏற்றுக் கொள்ளுகிறேன். அதை ஒரு சரியான analysis என்று ஆங்கிலத்தில் கூறலாம். ஆனபடியால் தமிழ் அரசுக் கட்சி இன்று போகும் போக்கைத் தமிழ்ப் பிரதேசங்களிலே மக்கள் நன்றாக அவதானித்துக் கொண்டிருக்கிறார்கள். இன்று தமிழ்ப் பகுதிகளில் ஒருவகையான பரபரப்பான நிலை நிலவுகின்றது. தமிழ் மக்கள் தங்களுடைய எதிர்காலத்தைப் பற்றிச் சிந்தனை செய்கின்ற ஒரு நிலைமை இன்று ஏற்பட்டிருக்கின்றதென்பதை நான் பகிரங்கமாகக் கூறிவைக்க விரும்புகிறேன். தங்கள் எதிர்காலம் இந்த நாட்டில் எப்படி இருக்கப்போகின்றது; என்னவிதமான அரசியலமைப்பை இந்த நாட்டில் அமைத்தால் தாங்கள் சுதந்திர மக்களாக வாழ முடியும் என்பதைப் பற்றி மிகத் தீவிரமாகச் சிந்தித்துக் கொண்டிருக்கிறார்கள் இன்று தமிழ் மக்கள். அனேகமாக இன்றைய பத்திரிகைகளைப் பார்த்தவர்கள் அறிவார்கள், இன்று தமிழ் மக்களுடைய சிந்தனை எந்த வழியில் போய்க்கொண்டிருக்கின்றதென்பதை. இனி இலங்கையில் தமிழ் மக்களும் சிங்கள மக்களும் ஒரே அரசாங்கத்தின்கீழ் வாழ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

முடியாத நிலைமை ஏற்பட்டு விட்டது என்று தான் சிந்திக்கிறார்கள் இன்று தமிழ் மக்கள். நாங்கள் எல்லோரும் இதை அறிந்திருக்க வேண்டும்.

இன்று British Commonwealth of Nations என்று சொல்லப்படும் பொதுநல வுறவுக் கூட்டரசுத் தொகுப்பிலே மாட்சிமை தங்கிய மகாராணியாகிய எலிசபெத் மகா ராணியையே அரசியாகக் கொண்ட புறம்பான ஒரு டொமினியனை இலங்கையிலே உருவாக்க வேண்டுமென்ற வழியிலே தமிழ் மக்களின் சிந்தனைகள் போய்க்கொண்டிருக்கிறதென்ப தை நாங்கள் மறந்துவிடக்கூடாது. இது சாதா ரணமாக எழுந்த ஒரு எண்ணமல்ல. இருப தாண்டுகளுக்கு மேலாக தமிழ் மக்கள், சிங் கள மக்களோடு சகோதர பான்மையுடன் ஒற்றுமையாக—ஒரே மக்களாக—பிரிக்கப்பட முடியாத ஒரு சமூகமாக—இலங்கையிலே வாழவேண்டுமென்று தங்களுடைய ஒத் துழைப்பைக் கொடுக்க முயன்றார்கள். ஆனால், அரசாங்கங்களைப் பொறுத்தவரை யிலே, நட்புறவுகொண்டவர்களும் சரி, எதிர்ப்பைக் காட்டினவர்களும் சரி, தமிழ் மக்களுக்கு விரோதமாக நடவடிக்கைகளை எடுத்தவர்களும் சரி, நண்பர்களென்று சொல்லிக்கொண்டவர்களும் சரி, அவர்கள் எடுத்துக்கொண்ட நடவடிக்கைகள் ஒவ் வொன்றையும் கூர்ந்து கவனித்த தமிழ் மக்கள் இன்று மிகவும் கவலையான நிலையிலே இருப்பதால், இப்படியாகச் செய்யவேண்டு மென்ற சிந்தனையிலே அமிழ்ந்திருக்கிறார்க ளென்பதை நீங்கள் மனதில் வைத்திருக்க வேண்டும். இது வெறும் விளையாட்டான சிந் தனையென்று தட்டிக்கழித்துவிடக்கூடாது. அந்த இலட்சியத்தை உருவாக்கக்கூடிய ஒரு சூழ்நிலையை சமீபத்திலே தமிழ் மக்கள் ஆரம் பித்தாலுங்கூட நாங்கள் ஆச்சரியப்படக் கூடாது. அந்த நிலைமைதான் உருவாகிக் கொண்டு வருகிறது.

பௌத்த பிக்குகளைப் பற்றி எனக்கு நன்கு தெரியும். புத்தபெருமானின் அந்தப் புனித உடையை அணிந்த பௌத்த பிக்குகளை உண்மையிலேயே தமிழ் மக்கள் எப்பொழுதும் மிகவும் மரியாதையுடனும் கண்ணியத்துட னும் வணங்குபவர்கள். இன்றும் வணங்குகின் றார்கள். என்றும் வணங்கியவர்கள் அவர்கள். அந்த உடைக்கு—அந்தப் பெருமக்களுக்கு எப்பொழுதும் மரியாதை செலுத்தியவர்கள் தமிழ் மக்கள், என்னைப் பொறுத்த அளவிலே, நான் வித்தியோதய, வித்தியாலங்காரப் பிரி வென என்ற இரண்டு பிரிவெனாக்களிலும் பௌத்த பிக்குகளின் அடியிலே உட்கார்ந் திருந்து பாடம் படித்தவன். அவர்களுடைய அறிவுச் செல்வத்திற்காக அவர்களைத் தேடி நான் அறிவை வளர்த்தவன். பௌத்த பிக்கு களுக்கு மரியாதை செலுத்த நான் பின்நிற் பவனல்ல. ஆனால், இன்று மிகவும் மனவருத் தத்துடன் நான் சொல்ல விரும்புவது என்ன வென்றால் இன்று அவர்களுடைய வாயிலே யிருந்து வருகின்ற—அல்லது அவர்களுடைய பேனாவின் எழுத்துக்களிலேயிருந்து வருகின்ற சில சொற்களைப் பார்த்து தமிழ் மக்கள் கண் ணீர் விட வேண்டிய நிலைமைதான் ஏற்பட் டிருக்கின்றது. அதை இந்தச் சபையும் இந்த நாடும் அறிய வேண்டும். 5000 ஆண்டுகள்— சரித்திரத்தை எடுத்துப்பார்த்தாலுங்கூட 3000 ஆண்டுகளுக்கு முன் பேசப்பட்ட ஒரு மொழி தமிழ்மொழி. 3000 ஆண்டுகளுக்குப் பின் இன்றும் அதே நிலையில் பேசப்படுகிற தென்று சொன்னால் உலகத்திலே தமிழ் மொழி ஒன்றுதான் அப்படியிருக்கிறது. எத்த னையோ மொழிகள் இருந்து இறந்துபோய் விட்டன. 3000 ஆண்டுகளுக்கு முன் தமிழ் மொழி என்ன நிலையிலே பேசப்பட்டதோ அதேநிலையிலேதான் இன்றும் இருக்கிறது. தமிழ் மக்களுக்கு ஒரு தனிக் கலாசாரம் உண்டு. அவர்களுக்கு ஒரு தனிப்பண் பாடு உண்டு. அப்படியான பண்பாட்டை யும் அப்படியான கலாசாரத்தையும் அப் படியான மொழியையும் உடைமையாகக் கொண்ட தமிழர்களைப் பார்த்து, அந்தப் பரம்பரையிலே வந்த மறத்தமிழர்களைப் பார்த்து "தமிழர்களே, சிங்கக் குட்டிகள் உறங்குகின்றன; அந்தச் சிங்கக் குட்டிகளை எழுப்பாதீர்கள்" என்று பௌத்த பிக்குகள் சொல்லி மிரட்டுவார்களாகவிருந்தால் அவர் கள் நிச்சயமாகத் தமிழர்களுடைய பண் பாட்டை அறியாதவர்களென்றுதான் நாம் சொல்ல வேண்டும். தமிழரசு வாலிப முன்னணியினரைப் பார்த்து அவர்கள் யார் என்று நாங்கள் விளங்கிக்கொள்ள வேண்டும். பழங் காலத்திலே சிங்கத்தின் குருளைகளை யும் புலியின் குட்டிகளையும் தங்கள் சிறார் களுக்கு விளையாட்டுப் பந்துகளாகப் பிடித்துக் கொடுத்த மறத்தமிழர்களுடைய இனவழி வந்த தமிழரசு வாலிப முன்னணியினரைப் பார்த்துச் சொல்கிறார்கள் "சிங்கக்குட்டிகளை எழுப்பாதீர்கள்" என்று. மிரட்டலுக்கும் பய-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. නවරත්නම් මයා.]

முறுத்தலுக்கும் ஒரு காலமும் தமிழன் தலை தாழ்த்தியதில்லை. அன்பு, நட்பு, சகோரத்துவம் என்று அணுகினால்தான் அவர்களும் அதைக் காட்டுவார்கள். இன்று மிரட்டி, பயமுறுத்தி எங்களுடைய அம்மாவைப் புறக்கணித்து விட்டு தங்களுடைய அம்மாவை, அம்மா என்று கூப்பிடுங்கள் என்றால் அதற்குத் தமிழன் தலைவணங்க மாட்டான். என்னுடைய தாயாரைப் புறக்கணித்து விட்டு வேறு ஒருவருடைய தாயாரை அம்மா என்று கூப்பிடும்படி எனக்குச் சொன்னால் நான் அதற்கு ஒருபோதும் அடிபணிய மாட்டேன். அது தமிழனுடைய பண்பாடு. அவனுடைய இயற்கைக் குணம். இந்தப் பண்பாடு மற்றவர்களுக்கும் உண்டுதான். ஆகையால் "சிங்களம் மாத்திரத்தை ஏற்றுக்கொள்ளுகள். நீங்கள் உங்களுடைய உரிமைகள் ஒன்றையும் கேட்க வேண்டாம். அப்படிக் கேட்டால் எங்களுடைய சிங்கக் குட்டிகள் எழும்பி உங்களைத் தாக்கி தும்சமாக்கி விடும்" என்ற மிரட்டலுக்கு தமிழன் ஒருபோதும் அடிபணிய மாட்டான் என்று சொல்லி எனக்குப் பேசுவதற்கு நேரம் தந்தமைக்குத் தங்களுக்கு நன்றி கூறி, எனது உரையை முடித்துக் கொள்கிறேன்.

අ. භා. 5.24

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! The Deputy Speaker will now take the Chair.

**අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [එම්. සිවසිතම්පරම් මයා.] මූලාසනාරූඪ විය.**

அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, உபசபாநாயகர் அவர்கள் [திரு எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்கள்.

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [MR. M. SIVASITHAMPARAM] *took the Chair.*

අ. භා. 5.24

**සුගතදාස අරඹවල මයා.** (අක්මීමන)
*(திரு. சுகததாச அரம்பவல—அக்மீமன)*
(Mr. Sugathadasa Arambewala—Akmeemana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රාජාසන කථා විවාදයේදී, මා නියෝජනය කරන ජනතාව වෙනුවෙන් ඉතාමත් ලුහුඩින් මගේ අදහස් ප්‍රකාශ කරන්නට බලාපොරොත්තු වෙනවා.

රාජාසන කථාවල් ඉදිරිපත් කිරීම අපේ ආණ්ඩු ක්‍රමය අනුව වර්ෂයක් පාසා සිදුවන දෙයක්. බලයට පැමිණ සිටින ආණ්ඩුව ඒ වර්ෂය තුළදී කරන්නට බලාපොරොත්තු වන දේවල් මොනවාදැයි රාජාසන කථාවලින් දැනගන්නට ජනතාව බලාපොරොත්තු වෙනවා. ජනතාවට දෙන ලද පොරොන්දුවලින් ආණ්ඩුව ඉෂ්ට කරන්නට යන දේවල් ගැන අවබෝධයක් ලබා ගන්නට ජනතාව අදහස් කරනවා. මේ ගරු සභාවේ මන්ත්‍රීවරයකු හැටියට පැමිණෙන්නට කලිනුත් මේ ආණ්ඩු ක්‍රමය ඇති වුණාට පස්සේ ඇති වූ රාජාසන කථාවල් මා විසින් කියවා බලන්නට යෙදුණා. රාජාසන කථාවලින් දෙන ලද පොරොන්දු හරියාකාර ඉෂ්ට වෙනවාදැයි ඒ වාගේම කල්පනාවෙන් බලාගෙන ඉඳලාත් තිබෙනවා. එහෙත් මේ දක්වා මේ රටේ පැවති කිසිම ආණ්ඩුවකට රාජාසන කථාවලින් තමන් ජනතාවට දුන් පොරොන්දු සියයට සියයක් සාර්ථක ලෙස ඉෂ්ට කරන්නට බැරි වෙලා තියෙනවා. අපේ ආණ්ඩුවටත් බැරි වෙලා තිබෙනවා. මීට ඉස්සර වෙලා තිබුණු ආණ්ඩුවලටත් බැරි වෙලා තිබෙනවා. එහෙත් අපේ ආණ්ඩුව පිහිටුවනු ලැබීමෙන් පසු, අප දුන් පොරොන්දුවලින් වැඩි කොටසක් ඒ වර්ෂය ගෙවී යෑමට මත්තෙන් ඉෂ්ට කර තිබෙන බව කියන්නට කැමතියි.

අපේ ගරු අගමැතිතුමා ගැන මේ රටේ ලොකු ආන්දෝලනයක් ඇති කිරීමට කරුණු විරුද්ධ පාර්ශ්වය නිතරම ඉදිරිපත් කරන බව අමුතුවෙන් කියන්නට ඕනෑ නැහැ. හවුල් රජයක් පිහිටුවීම ගැන නොයෙක් දේ කියා තිබෙනවා. අපේ ගරු අගමැතිතුමා හවුල් ආණ්ඩුවක් පිහිටුවන්නට ඕනෑයයි එතුමාගේ දේශපාලන ජීවිතයේදී බලාපොරොත්තු වූ එකම අවස්ථාව මෙය බව තමුන්නාන්සේලා දන්නවා ඇති. එවැනි ප්‍රතිපත්තියක් පිළිගැනීමට එතුමාට හේතු වූ කාරණා ඒ කාලයේදී පුවත් පත් මගිනුත්, ජනතාවගේ කථාවල් මගිනුත් නොයෙක් තැන්වල ඇති වූ සාකච්ඡා මගිනුත් පැහැදිලි වී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ කාලයේ මේ රට පාලනය කළ ආණ්ඩුව ඒකාධිපති වාදයක් මේ රටේ ගෙන යන්නට උත්සාහ කරනවාය යන්න එවකට මේ රටේ තිබුණු හැඟීමක් බව කියන්නට ඕනෑ. රටක් සාමාන්‍ය තත්ත්වයක පවතින කාලයක හවුල් ආණ්ඩුවක් හදන්නට අකමැති වූ අපේ ගරු අගමැතිතුමා ඒකාධිපතිවාදයට බියෙන් හවුල් ආණ්ඩුවක් හැදූ බව මා විශ්වාස කරනවා. රටක් සම්පූර්ණ සාමයෙන් පවතින කාලයක පිහිටුවනු ලබන හවුල් ආණ්ඩුවක් වැඩි කල ගෙන යන්නට බැරි බව ප්‍රතිපත්තියක් හැටියට ඥානවන්ත හැමදෙන පිළිගන්නවා. එහෙත් එය ගරු අගමැතිතුමාගේ නිරවුල් සිතුවිල්ල අනුව පිරිසිදු චේතනාවෙන් පිළිගත් ප්‍රතිපත්තියක් නිසා මේ හැම කණ්ඩායමක්ම සන්තෝෂ කරගෙන මේතාක් කල් මේ ආණ්ඩුව ගෙන යන්නට එතුමාට පුළුවන් වී තිබෙනවා. මෙදා ඉදිරිපත් කර තිබෙන රාජාසන කථාවෙන්, ප්‍රජාතන්ත්‍රවාදී අන්දමට, ප්‍රජාතන්ත්‍රවාදය දිගටම තහවුරු වන අන්දමට, පසුගිය අවුරුදුවල කළ වැඩත්, ඉදිරි වර්ෂයේදී කරන්නට බලාපොරොත්තු වන වැඩත් සාරාංශ වශයෙන් ජනතාව වෙත ඉදිරිපත් කර තිබෙනවා.

මෙහිදී පසුගිය වර්ෂවල කරන ලද වැඩ ගැන මොහොතක් කල්පනා කර බලනවා නම්, පළමුවැනි රාජාසන කථා තුනෙන් දුන් පොරොන්දු, ජනතාව ඉදිරියේ කරන ලද ප්‍රකාශ, බොහොමයක් දුරට ඉෂ්ට කර තිබෙන බව අපට පෙනී යනවා. ඒවා හුඟක් දුරට සාර්ථක වෙලාත් තිබෙන බව පිළිගන්නට ඕනෑ. වගාකිරීම සහ කර්මාන්ත අතින් මේ රට ඉතාමත් සුළු කාලයක් තුළ ගරු අගමැතිතුමාගේ මාර්ගෝපදේශකත්වයෙන් ඉදිරියට ගමන් කර තිබෙන බව තමුන්නාන්සේලා හැම දෙනාම පිළිගන්නට ඕනෑ. තමන්ගේ හෘදය සාක්ෂියට අනුව කථා කරනවා නම්, මීට පෙර කවදාවත් නොවූ තරමේ දියුණුවක් වගාකිරීමේ ව්‍යාපාරයෙන් දැනටමත් ලැබී තිබෙන බව අවිවාදයෙන් පිළිගන්නට ඕනෑ. මේ රටේ ජනතාවගෙන් වැඩි දෙනෙක් ඒ බව පිළිගෙන අවසානයි. වගාව අතින් පමණක් නොව කර්මාන්ත අතිනුත් මේ රට දියුණු කර රටේ ආර්ථික තත්ත්වය නගා සිටුවීමට ක්‍රියා කිරීම ඥානවන්ත ආණ්ඩුවක ලක්ෂණයක්. රට කර්මාන්ත අතින් මේ කාලය තුළ ලොකු දියුණුවක් ලබා තිබෙන බව අපි හැම දෙනෙකුම පිළිගන්නට ඕනෑ. කර්මාන්ත ආයතනයක් හෝ සංයුක්ත මණ්ඩලයක් ඇති කළ වහාම ඒවායින් ලාභයක් ලබා ගැනීමට බැරි බව අපි කවුරුත් පිළිගන්න දෙයක්. කර්මාන්ත අතින් රට දියුණු කිරීමට මීට කලින් පැවති ආණ්ඩුවත් වැඩ කර තිබෙන බව අපි පිළිගන්නවා. මේ ආණ්ඩුව මගින් අළුත් කර්මාන්ත ව්‍යාපාරත් පටන් ගෙන දැන් ඒවා ලාභ ලැබීමේ ව්‍යාපාර හැටියට පවත්වාගෙන යන බව අසන්නට ලැබීම මේ රටේ සුභසිද්ධිය ප්‍රාර්ථනා කරන හැමදෙනාගේම සන්තෝෂයට හේතුවක් වන්නට ඕනෑ.

මේ රටේ අධ්‍යාපනයේ ආකූල තත්ත්වයක් තිබුණා. අධ්‍යාපන ක්‍රමය වෙනත් මාර්ගයක යොමු කර රටට ඔබින, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමයක් මේ රටේ ඇති කිරීමට නව මුහුණුවරක් ඇතිව දැන් අධ්‍යාපන අංශය සකස් කර තිබෙනවා. ඉදිරි වර්ෂය තුළ ඒ ක්‍රමය සාර්ථක වුණොත් එයින් රටට මහත් ප්‍රයෝජනයක් අත් වෙයි කියා මා විශ්වාස කරනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
උප ඇමති පුරප්පාඩු නැහැ.

**සුගතදාස අරඹවල මයා.**
*(திரு. சுகததாச அரம்பவல)*
(Mr. Sugathadasa Arambewala)
ඒක කාටත් කොයි කාලයේදීත් ලැබෙන දෙයක්. දේශපාලන සම්ප්‍රදායක්.

ඊළඟට ජාතික ස්වේච්ඡා තරුණ සේවා පනතක් ක්‍රියාත්මක කරන බව මේ රාජාසන කථාවෙන් හෙළි දරව් කර තිබෙනවා. ඒ ගැන මගේ ප්‍රසාදය පළ කරනවා. මන්ත්‍රීවරුන් හැටියට අපට මුහුණ දෙන්නට සිදුවී තිබෙන ලොකු ප්‍රශ්නය රැකී රක්ෂා ප්‍රශ්නයයි. දිනකට අප ඉදිරියට මිනිසුන් 100ක් එනව නම් එයින් 99 ක්ම එන්නෙ මොකක් හෝ රක්ෂාවක් සොයා දෙන්න කියාගෙනයි. මේක ඉතා භයානක ප්‍රශ්නයක්. කොයිම ආණ්ඩුවකටවත් පුළුවන් වෙලා නැහැ මේ ප්‍රශ්නය විසඳන්න. පළල් ඥානාන්විත වැඩ පිළිවෙලක් නොයෙදුවොත් මෙයින් ඇතිවන ආදීනවවලට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුගතදාස අරඹෙවල මයා.]

මුහුණපාන්නට ඉදිරියේදී අපට සිදු වෙනව. ජාතික ස්වේච්ඡා තරුණ සේවා ක්‍රමයක් ඇති කළොත් ගම්බද ප්‍රදේශවල දියුණුවට අදාළවන ව්‍යාපාරික කටයුතුත්, ඒ වගේම ප්‍රතිසංස්කරණ කටයුතු හා වාරිමාර්ග කට යුතු ආදියත් තරුණයන්ගේ උදව්වෙන්, ඔවුන්ගේ ශ්‍රමයෙන් දියුණු කර ගන්න අතර ඔවුන්ටත් සුළු මුදලක් ගෙවීමෙන් විශාල ප්‍රයෝජනයක් ලබා ගන්ට පුළුවන් යයි අපි විශ්වාස කරනව. මේ කාරණය රාජාසන කථාවෙන් ඉදිරිපත් කළාට මදි. මෙය මේ වර්ෂය ගත වනතුරු බලා නොසිට වහාම ක්‍රියාත්මක කරන්ට පියවර ගන්නා මෙන් ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

ඊළඟට ජලය බැස්වීමේ යෝජනා ක්‍රම ගැනත් වචන සවල්පයක් කියන්නට ඕනෑ. ජලය බැස්වීමේ යෝජනා ක්‍රම තව මත් රටේ අවශ්‍යතා අනුව සම්පූර්ණ වී නැහැ. ගරු අගමැතිතුමාත් කෘෂිකර්ම ඇමතිතුමාත් දිවා රෑ නොබලා වෙහෙස මහන්සි වී කෘෂිකර්ම දියුණුව සඳහා ක්‍රියා කරන බව ඇත්තයි. එහෙත් ජලය බැස්වීමේ ක්‍රමය සර්ව සම්පූර්ණ නැති නිසා අපේ ආසනවල ජනතාව අවුරුද්දකට දෙවතාවක් ජල ගැලීම්වලින් විපතට පත්ව දුක් විඳිනව. මගේ බලවත් ඉල්ලීම පිට මගේ ආසනයේ ලෝලුවාගොඩ නමැති ප්‍රදේශයේ ජලය බැස්වීමේ යෝජනා ක්‍රම යක් ආරම්භ කර ඒ සඳහා මුදල් වෙන් කළ බව කියන්ට ඕනෑ. එහෙත් ඒ වැඩ කටයුතු ගෙන යන්නෙ ගොළුබෙලි ගමණින්. දැන් අවුරුදු දෙකක් වැඩ කරගෙන ගිහිනුත් තවම ඒ යෝජනා ක්‍රමයෙන් 1/6 ක වැඩ කටයුතුවත් සම්පූර්ණ කර නැති බව මා ඉතා කනගාටුවෙන් සඳහන් කරන්ට ඕනෑ. ඊළඟට මා කියන්න ඕනෑ මේ ආණ්ඩුව විසින් ගොවියන්ට ණය දීම සඳහා ඇති කරන ලද ක්‍රමය ගැනත්. එය ඉතාමත්ම උසස් ක්‍රමයක් නමුත් ගොවියන්ට ණය දුන්නත් එම ගොවියන්ට ඒ ණය ගෙවා ගන්න බැරි තත්වයක් ඇති වී තිබෙනෙවා. හේතුව නම් අවුරුද්දකට දෙවරක් ගංවතුර නිසා අස්වැන්න පාලු වීමයි. මගේ ආසනයේ ගම් කිහිපයක ජනතාව අද සාගින්නෙන් පෙළෙනවා. එසේ වී තිබෙන්නේ ණය ගෙවා ගන්න බැරිකම නිසයි. ණය නොගෙවීම නිසා නීතිය අනුව ඔවුන්ගේ සහල් සලාකය නතර කර තිබෙනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

සාගින්නේ සිටියත් ඔටුන්න තිබෙනවා.

**සුගතදාස අරඹෙවල මයා.**
*(திரு. சுகததாச அரம்பவல)*
(Mr. Sugathadasa Arambewala)

ඒ නිසා මා ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ජලය රුස් කිරීමේ යෝජනා ක්‍රමය සාර්ථක කරන තෙක් ගොවියන්ට දෙන ණය මුදල් අය කරගැනීමේ කාල සීමාව දීර්ඝ කරන්නය කියා. ඒ වගේම ඔවුන්ගේ සහල් සලාකය නැති කිරීමත් ප්‍රඥාවන්ත දෙයක් නොවන නිසා එම නීතියත් වහාම අස් කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

ඊළඟට අකමැත්තෙන් වුවත් ආහාර හිඟය ගැනත් කිව යුතුව තිබෙනවා. අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට අපහසුකම් තිබෙනව. විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුනුත් මේ ගැන කියා සිටියා. නමුත් ඔවුන් කියන තරමටම නම් එහි ඇත්තක් නැහැ. පසුගිය කාලවල අපි දන්නවා සතියට දවස් 7 ක් තිබුණා නම් ඒ දවස් 7 ම පෝලීම්වල සිටීමට මහජනතාවට සිදු වුණා. නමුත් අද රෙදි පෝලිම් නැහැ. රෙදිවලින් හුඟක් දුරට රට ස්වයම්පෝෂිතයි. ඊළඟට සුදුරු මාදුරු පෝලිම් නැහැ. සහල් පෝලිම් නැහැ. නමුත් විටින් විට පිටරටින් ගෙන්වන භාණ්ඩවල හිඟයක් ඇති වෙනවා. එවැනි අවස්ථාවලදී පෝලිම් ඇති වෙනවා. ඒ වගේම අද රට ලූනු, රතු ලූනු පෝලිම්ද දක්නට තිබෙනවා. මේ පෝලිනුත් නැති කිරීමට වැයම් කරන මෙන් මා ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට උපාධිධාරීන්ගේ ප්‍රශ්නය පිළිබඳවත් කිව යුතුව තිබෙනවා. ඔවුන් සම්බන්ධයෙන් සාර්ථක පිළියමක් මේ රජාසන කථාවේ ඉදිරිපත් කර නැති බව මට පෙනී යනවා. ලංකාවේ උපාධිධාරීන් කොයි තරම් සංඛ්‍යාවක් සිටිනවාද කියා නමුන්නාන්සේලා තේරුම් ගත යුතුයි. මගේ ආසනයේම රුකිරක්ෂා නැති උපාධි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ධාරීන් 70 කටත් 80 කටත් අතර ගණනක් සිටිනවා. ඔවුන්ගෙන් මට තිබෙන හිරිහැර විස්තර කරන්න ගියොත් හුඟක් කාලය ගත වෙනවා. සමහරුන් මා සමග තරහ වී යනවා. සමහරුන් මට ආඩපලි කියනවා. ගුරුවරුන් බඳවා ගන්න විට ඔවුන්ටත් රක්ෂාවල් රැගෙන දෙන්නය කියා මට ඇවිත් කියනවා. ඒ අයගේ රැකිරක්ෂා ප්‍රශ්නය විසඳන්න කටයුතු කරන්න ඕනෑ. ඔවුන්ගේ ප්‍රශ්නය විසඳන්න කටයුතු කළේ නැත්නම් මේ ආණ්ඩුවට ඔවුන්ගෙන් ප්‍රසාදයක් ලැබෙන්නේ නැහැ. මේ ආණ්ඩුව පිහිටුවීමට ඒ අය හුඟක් උදව් කළා.

අවසාන වශයෙන් මතක් කළ යුතු තවත් කරුණක් තිබෙනවා. රටසහා පනත ගැනත් මා වචනයක් කිව යුතුයි. මේ පනත පිළිබඳව මේ රටේ ආන්දෝලනයක් ඇති වුණේ අද ඊයේ නොවෙයි. 1950 සිට විටින් විට මේ ගැන මත භේද මේ රට තුළ පැන නැඟුනා. ඒ සෑම අවස්ථාවකදීම රටේ විශාල ජනතාවගේ මතයට අනුව කටයුතු කිරීම නිසා එය යටපත් වුණා. ඒ නිසා මීට පෙර තිබුණ ආණ්ඩු දෙකක් විසින් එය අහෝසි කරන්න යෙදුනා. එය නැති කර දැම්මා. මහජන මතය උඩයි එසේ කළේ. මහජනතාවගේ මතය පිළි අරගෙන ඒ ගැන තරමක් බුරුල් තත්ත්වයක් ඇති කිරීම ගැන මේ අවස්ථාවේ ගරු අගමැතිතුමාටත් මා ප්‍රශංසා කරනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
**(Mr. T. B. M. Herath**
පනත අස් කළාද ?

**සුගතදාස අරඹවල මයා.**
*(திரு. சுகததாச அரம்பவல)*
**(Mr. Sugathadasa Arambewala)**
මෙම පනත ඉදිරිපත් කරන්නේ නැත කියා ප්‍රකාශයක් කරන ලෙස මගේ ආසනයේ ජනතාවගේ නාමයෙන් මා ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ඉදිරිපත් කළොත් මේ පැත්තට එන්න.

**සුගතදාස අරඹවල මයා.**
*(திரு. சுகததாச அரம்பவல)*
(Mr. Sugathadasa Arambewala)
මා පැති මාරු කරන්න යනවාය කියා තමුන්නාන්සේලා ඉදිරියේ කියන්න යන්නේ නැහැ. මගේ ප්‍රදේශවාසීන්ගේ අදහස් මා මේ අවස්ථාවේදී ඉදිරිපත් නොකළොත්, මේ ගරු සභාවේදී ඉදිරිපත් නොකළොත්, මට ප්‍රකාශ කරන්න තැනක් ලැබෙන්නෙ නැහැ. ඒ නිසා මේ කාරණා මේ ගරු සභාව ඉදිරියේ තබමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 5.39

**ඇස්. බී. යාලේගම මයා.** (රත්තොට)
*(திரு. எஸ். பி. யாலேகம—றத்தோட்டை)*
**(Mr. S. B. Yalegama—Rattota)**
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම රජය මගින් ඉදිරිපත් කර ඇති හතරවන රාජාසන කථාව මෙයයි. 1965 දී ඉදිරිපත් කළ පළමුවන රාජාසන කථාවේ එක් තැනෙක මේ අන්දමේ ප්‍රකාශයක් තිබෙනවා :

"මාගේ ආණ්ඩුව බඩු මිළ ඉහළ නැඟීමේ හේතුන් ඉවත් කිරීම සඳහා විහිදීයන මුදල් ප්‍රමාණය නිතර වෙනස් නොවී ස්ථිරව තබා ගැනීමට පියවර ගනු ඇත."

මේ ආණ්ඩුව බලයට පත් වුණු හැටියෙ ඉදිරිපත් කළ මුල්ම රාජාසන කථාවෙන් කී දෙයම නැවත වරක් මෙම රාජාසන කථාවෙනුත් කියා තිබෙනවා. මෙහිදී අප කල්පනාවට ගත යුතු කාරණයක් නම් මෙයයි. යම් කිසි දේශපාලන පක්ෂයක් මහජනතාව අතරට ගිහින් ආණ්ඩුවක් පිහිටුවීමට බලය ඉල්ලා සිටින්නෙ, බලයේ සිටි ආණ්ඩුවට කරන්න බැරි වුණු දේවල් කරනවාය කියන පොරොන්දු දීමෙනුයි. එපමණක් නොවෙයි, කලින් තිබුණු ආණ්ඩුව දී ඇති පොරොන්දු හරියාකාර ඉටු කරන්න බැරි වුණා නම් ඒවාත් ඉටුකරන බවට මහජනතාවට පොරොන්දු දී මහජනතාවගේ කැමැත්ත ලබාගැනීමෙනුයි පාර්ලිමේන්තුවට එන්නෙ. එමනිසා මෙම කාරණය තුළ—ආර්ථික ප්‍රශ්නය තුළ—අද රටේ පවතින සෑම ප්‍රශ්නයක්ම ගැබ් වන බව මෙහිදී මතක් කරන්න කැමතියි. එපමණක් නොවෙයි. ජනතාවගේ ආර්ථික

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[යාලෙගම මයා.]

ප්‍රශ්න, රැකී රක්ෂා ප්‍රශ්නය, ජීවන විය දම ඉහළ යාමේ ප්‍රශ්නය, ආහාර හිඟය පිළිබඳ ප්‍රශ්නය මේ ආදී සෑම දෙයක්ම අල්ලා තමයි මෙබඳු ප්‍රකාශයක් කරන්නෙ. එපමණක් නොවෙයි, 1965 දී මෙම ආණ්ඩුව බලයට පත්වන්නට පෙර, එක්සත් ජාතික පක්ෂයත්, එම පක්ෂයට ආධාර දුන් අනිකුත් පක්ෂත් ගමක් ගමක් ගානේ, ගෙයක් ගෙයක් ගානේ ගොස් මහජනතාවට දුන් පොරොන්දු මොනවා දැයි මතක ඇති. ඒ අන්දමට මහජනතාවට දුන් පොරොන්දුවලින් කීපයක් තමයි 1965 අප්‍රේල් 9 වනදා රාජාසන කථාව මගින් මහජනතාව හමුවේ තැබුවේ. මේ රජය පිහිටුවා ඇත් අවුරුදු තුනකට වැඩි කාලයක් ගත වී තිබෙනවා. සමහර විට මෙය අවසාන රාජාසන කථාව වෙන්නත් පුළුවනි, නෙවන්නත් පුළුවනි. ඒ කෙසේ වුණත් මේ ආණ්ඩුව බලයට පත් වූ අවධියට වඩා දැන් රට පරිහානියට පත් ව ඇති බව කියන්න සිදු වී තිබෙනවා. 1965ට වඩා මොන මොන අංශවලින් මේ රටේ දියුණුවක් ඇති වී තිබෙනවාද කියා මා අහනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ ආර්ථික තත්ත්වයෙහි වෙනසක් ඇති වීම නම් යම්කිසි සංවර්ධන සැලැස්මක් තිබෙන්න ඕනැ. අගමැතිතුමා කැමරාවක් අරගෙන රට වටා ගියත් ආහාර අතින් ස්වයංපෝෂිත වී තිබෙනවාය කියා මා නම් විශ්වාස කරන්නෙ නැහැ. අප දන්නවා ගම්බද තත්ත්වය ගැන. විශාල ධනයක් රජය වැය කරනවා මෙම ආහාර වගා කිරීමේ ව්‍යාපාරයට. කච්චේරිවලට අතිරේක දිසාපතිවරුන් පත් කර තිබෙනවා, අතිරේක ආදායම් පාලක නිලධාරීන් පත්කර තිබෙනවා, ආහාර වගා කිරීමේ ව්‍යාපාරය දියුණු කරන්නට. ඒ වාගේම සෑම කච්චේරියකටම පාහේ ජීප් රථ සහ වෙනත් වාහන ආදියත් සපයා තිබෙනවා. ඒ වාගේම ආහාර නිෂ්පාදන ඕවර්සියර්වරුන් සෑම ප්‍රදේශයකටම පත් කර තිබෙනවා. නමුත් ඒ අය කරන්නෙ මොනවාද ? මෙම නිලධාරීන් සපයන සංඛ්‍යාලේඛන අනුව මේ රට සංවර්ධනය වී තිබෙනවා යයි තමුන්නාන්සේලා කල්පනා කරනවා නම් එය මුලාවක් බව මතක් කරන්න සිද්ධ වී තිබෙනවා. ඔවුන් සපයන සංඛ්‍යාලේඛන අනුව අගමැතිතුමා කියන්නෙ 1970 වන කොට මේ රටින් සහල් පිටරට යවන්න පුළුවන් වේය කියායි. නමුත් සංඛ්‍යාලේඛන අනුව පමණයි ඒ අන්දමේ නිගමනයකට බහින්න පුළුවන් වී තිබෙන්නෙ. රටේ යථා තත්ත්වය ගැන කල්පනා කර මා මේ ආණ්ඩුවෙන් අහනවා ඔය කියන තරම් දුරට මේ රට ස්වයංපෝෂිත වී තිබෙනවා නම්, ආහාර නිෂ්පාදන ව්‍යාපාරය නිසා එවැන්නක් සිදු වී තිබෙනවා නම්— 1970ට තව ඒ තරම් කාලයක් නැහැ ; අවුරුදු 2 යි තිබෙන්නේ—මහජනතාවට හාල් සේරු දෙකක් නොදෙන්නෙ ඇයි කියා. තමුන්නාන්සේලා හාල් පිටරට යවන්නට හදන්නේ මේ රටේ ජනතාව බඩගින්නේ තබාද ? සංඛ්‍යා ලේඛන මගින් පෙන්නුවත්, පත්තරවලින් කිව්වත්, අගමැතිතුමා රට වටේ ගියත් මේ රට ස්වයංපෝෂිත වී නැති බව කියන්නට කැමතියි. පසුගිය කාලයේ පැවැති ගම්සභා මැතිවරණ, නාගරික මැතිවරණ හා සුළු නගරසභා මැතිවරණවලින් ජනතාව දුන් පිළිතුරු අනුව පෙනී යන්නේ තවදුරටත් මේ රජයට මේ රටේ ජනතාව මුලා කරන්නට බැරිය කියන එකයි. ඒකයි තත්ත්වය. යම්කිසි සැලැස්මක් අනුව වැඩ නොකර කවදාවත් ආර්ථික තත්ත්වය දියුණු කරන්නට බැහැ. තමන් බලයට පත්වුණාම කරගෙන යන වැඩ පිළිවෙළ මේකයි, කර්මාන්ත දියුණු කිරීමට කරන්නේ මේවායි, ආහාර නිෂ්පාදනය දියුණු කිරීමට කරන්නේ මේවායි, යනාදී වශයෙන් සැලැස්මක් නැතිව පත්තරකාරයින් අල්ලාගෙන කැමරාවක් අරගෙන අගමැතිතුමා රට වටේ ගියාට කවදාවත් මේ රටේ ආහාර නිෂ්පාදනය දියුණු වන්නේ නැති බව කියන්නට ඕනැ.

එමෙන්ම අද විශාල බඩු හිඟයක් තිබෙනවා. මේ රටේ ජනතාව කියන තරමේ ආහාර හිඟයක් නැති බවක් පෙන්වන්නට ආණ්ඩු පක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් මහන්සි ගත්තා. එදා මේ ආණ්ඩුව බලයට පත් කරන්නට සමහර භික්ෂූන් වහන්සෙලා ත්‍රෛනිකායික සංඝ සභා හදාගෙන රට වටේ ගියා. එහෙත් අද "ජනතා" පත්‍රයේ මුල් පිටුවේ මෙන්න මෙහෙම තිබෙනවා :

"දුප්පතා බේරාගන්න අගමැතිට කියති."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජීවන වියදම් බරින් මිරිකී සිටින දුප්පත් බේරා ගන්නය කියා ත්‍රෛනිකායික භික්ෂු බල මණ්ඩලයේ නියෝජිත පිරිසක් අගමැතිතුමා හමු වී කියා තිබෙනවා. කරවල, පරිප්පු, ඇනු, කොත්තමල්ලි ආදී ආහාර ද්‍රව්‍යවල හිඟයක් තිබෙනවාය කියා එම නියෝජිත පිරිස කියා තිබෙනවා. මේ හිඟය ආහාර ද්‍රව්‍ය එකකට දෙකකට සීමා වී නැහැ. පාරිභෝගිකයාට අවශ්‍ය මොනම ආහාර ද්‍රව්‍යයක්වත් අද ලබාගන්නට පුළුවන්කමක් නැහැ. තිබුණත් විශාල මුදලක් ගෙවලයි ඒවා ලබාගන්නට සිදු වී තිබෙන්නේ. අධික මිලක් ගෙවා ගන්නට නම් ආහාර ද්‍රව්‍ය තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව දුන් පොරොන්දු මොනවාද? අවුරුදුපතා පවත්වනු ලබන රාජාසන කථාවලට පසුව තමන්ට ඒ ප්‍රශ්න හරියාකාරව විසඳන්නට බැරි වී තිබියදීත් මෙවැනි වැල්වටාරම් ඇතුළත්—වච්චෝරු වෙදුන්ගේ කසාය සීට්ටු වගේ—රාජාසන කථා අවුරුදුපතාම මහජනතාව මුලා කිරීමට ඉදිරිපත් කිරීමෙන්ම රටේ බංකොළොත් භාවය ඔප්පු වෙනවා. ජනතාවගේ ප්‍රශ්න හරියට විසඳන්නට බැරි නම්, ජනසම්මත වාදයට ගරු කරන්නට බැරි නම්, තමන් කැමති ආණ්ඩුවක් පිහිටුවා ගැනීමට මහ ජනතාවට ඉඩ දී ඉල්ලා අස්වීම තමුන්නාන්සේලාගේ යුතුකමක්. ජනසම්මතවාදයට ගරු කරන රජයක යුතුකම ඒකයි. ආහාර ද්‍රව්‍ය ගෙන්වීමට අවශ්‍ය විදේශ විනිමය නැතෙයි කියනවා. එහෙත් මහ පාරේ යන වාහන අපට පෙනෙනවා. රටට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ගෙන්වීමට විදේශ විනිමය නැතැයි කියතත් කාර් වෑන් ආදිය ගෙන්වා තිබෙනවා. විදේශ විනිමය ඉතිරි කරගෙන ඒවායින් රටට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ගෙන්වා ගැනීම පිණිස පසුගිය රජය මගින් කාර්, වෑන් ආදිය ගෙන්වීම නතර කළා. එහෙත් මේ රජය විශාල වශයෙන් විදේශ විනිමය වියදම් කර කාර් ගෙන්වනවා; ලොරි ගෙන්වනවා; රට බීම, චීස්, බේකන් ආදිය ගෙන්වනවා. ඒ අන්දමට මේ රටේ සිටින ධනපති පන්තිය සන්තෝෂ කිරීම සඳහා, ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා, අවශ්‍ය වන සුඛෝපභෝගී ද්‍රව්‍ය ගෙන්වීමට නම් මේ රජයට විදේශ විනිමය තිබෙනවා. එහෙත් මේ රටේ සාමාන්‍ය ජනතාව ප්‍රයෝජනයට ගන්නා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ගෙන්වන්නට මේ ආණ්ඩුවට සල්ලි නැහැ. එවැනි තත්ත්වයක්, අද තිබෙන්නේ.

ඒ වාගේම, රැකීරක්ෂා ප්‍රශ්නය ගැනත් කියන්නට ඕනෑ. අවුරුදුපතා මේ රටේ විශ්ව විද්‍යාලවලින්, පාඨශාලාවලින් පිට වන උපාධිධරයන් හා ජ්‍යෙෂ්ඨ සමතුන් ලක්ෂ සංඛ්‍යාත ප්‍රමාණයක් රැකීරක්ෂා නැතිව සිටින බව, අද සෑම ගමකටම, නගරයකටම ගියොත් පෙනේවි. ඔවුන්ට රැකීරක්ෂා සපයන්නට නම් නියම සැලැස්මක් තිබෙන්නට ඕනෑ. තමුන්නාන්සේලා පසුගිය මහා මැතිවරණයේදී දුන් විශේෂ ප්‍රධාන පොරොන්දුවක් තමයි, බලයට පත් වූ වහාම මේ රටේ රැකීරක්ෂා නැති තරුණයන්ට රැකීරක්ෂා සැපයීම සඳහා කටයුතු කරනවාය යන්න. තමුන්නාන්සේලා ඒ පොරොන්දුව ඉෂ්ට කර තිබෙනවාදැයි මා අහන්න කැමැතියි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
උත්තර දෙන්න කවුරුත් නැහැ.

**යාලෙගම මයා.**
*(திரு. யாலேகம)*
(Mr. Yalegama)
මේ රාජාසන කථාවේ දිස්ත්‍රික් සභා ගැන මෙසේ සඳහන් වී තිබෙනවා:

"මහ ආණ්ඩුවේ මෙහෙයවීම සහ පාලනය යටතේ ක්‍රියා කරන දිස්ත්‍රික් සභා පිහිටුවාලීම පිළිබඳ වූ ධවල පත්‍රයක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. ව්‍යවස්ථා ඉදිරිපත් කිරීමට පෙර එම ධවල පත්‍රිකාව පිළිබඳව ඇති වූ සාකච්ඡාවේදී ප්‍රකාශ කරන ලද අදහස් ගැන මාගේ ආණ්ඩුව සුපරීක්ෂාකාරීව සලකා බලනු ඇත."

මේ රට සභා නැත්නම් දිස්ත්‍රික් සභා ප්‍රශ්නය සම්බන්ධයෙන් මේ රටේ විශාල ආන්දෝලනයක් ඇති වී තිබෙනවා. සිංහල ජනතාව පමණක් නොව උතුරු ප්‍රදේශයේ ඉන්නා ද්‍රවිඩ ජනතාවගෙන් වැඩි කොටසකුත්, නැගෙනහිර පළාත්වල ඉන්නා මුස්ලිම් ජනතාවත්, පොදුවේ ලංකාවේ ජනතාවගෙන් බහුතර කොටසක් මේ රට සභා නැත්නම් දිසා සභා ක්‍රමයට විරුද්ධත්වය පළ කර තිබෙනවා; ඒ පිළිබඳව උද්ඝෝෂණයක් ගෙන යනවා. ගරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[යාලෙගම මයා.]

අගමැතිතුමා මහජන මතයට ගරු කරනවා නම්, නැවත වරක් මෙවර රාජාසන කථාවේ අර විධියේ ප්‍රකාශයක් ඇතුළත් කොට මහජනයා මුළා කරන්නේ ඇයිදැයි මා අහනවා.

අද උතුරු ප්‍රදේශයේ, කුලහීන යයි සම්මත ජනතාව හා කුලීනය කියන කොට සත් අතර විශාල ඝට්ටන ඇති වේගෙන යනවා. ද්‍රවිඩ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරනවාය කියන පෙඩරල් පක්ෂයෙන් මා අහන්න කැමතියි—

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
කවුරුත් නැහැ. පැනල ගිහින්.

**යාලෙගම මයා.**
*(திரு. யாலேகம)*
(Mr. Yalegama)
—තමුන්ගේ මූලික මානුෂික අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා උතුරු ප්‍රදේශයේ පදිංචි, කුලහීනයන් යයි හැඳින්වෙන තුන් ලක්ෂ පණස් දහක් පමණ වූ ඒ ජනතාව ගෙන යන සටනේදී පෙඩරල් පක්ෂය නිශ්ශබ්දව ඉන්නේ ඇයිද කියා. දැනට මත් මූලික මානුෂික අයිතිවාසිකම් පවා ඔවුන්ට අහිමි වී තිබෙන නිසා තමයි, ඒ කුලහීන ජනතාව පවා මේ රට සභා නැත්නම් දිසා සභා පනතට විරුද්ධත්වය පළ කරන්නේ. යම් දවසක උතුරු හා නැගෙනහිර පළාත්වල මේ රට සභා නැත්නම් දිසා සභා පනත ක්‍රියාත්මක වුණොත් ඒ කුලහීන ජනතාවගේ අයිතිවාසිකම් තව තවත් ගිලිහෙන්නට, කුලීනයන්ගෙන් පෑගෙන්නට, විනාශ වන්නට ඉඩකඩ සැලසෙන නිසා තමයි, ඔවුන් මේ පනතට විරුද්ධව විශාල උද්ඝෝෂණයක්, සටනක් ගෙන යන්නේ. තමන්ගේ ආගම අදහන්නට නිදහසක් නැත්නම්, මනුෂ්‍යයන් හැටියට මහ පාරේ යන්නට නිදහසක් නැත්නම්, ශිෂ්ට මනුෂ්‍යයන් හැටියට ඇඳුම්-පැළැඳුම්වලින් සැරසෙන්නට නිදහසක් නැත්නම්, කෝවිලකට ගොඩවන්නට නිදහසක් නැත්නම්, ළිඳකින් වතුර ටිකක් බොන්නට නිදහසක් නැත්නම්, ඒ මානුෂික අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා ඔවුන් ගෙන යන සටන ඉතාමත් සාධාරණ බව, යුක්තිසහගත බව මා කියන්න කැමැතියි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
අපූරු ප්‍රජාතන්තරේ !

**යාලෙගම මයා.**
*(திரு. யாலேகம)*
(Mr. Yalegama)
තමන්ට මානුෂික අයිතිවාසිකම් පවා අහිමි වී තිබෙන නිසා තමයි, ඒ කුලහීන ජනතාව සිංහල භාෂාව ඉගෙන ගන්නට, බෞද්ධාගම වැළඳගන්නට මේ තරම් පෙළැඹී තිබෙන්නේ. මේ විධියට ලංකාවේ සෑම ජනතා කොට්ඨාශයක්ම පාහේ මේ රට සභා නැත්නම් දිසා සභා ක්‍රමයේ භයානකකම පෙන්නා දී තිබෙද්දීත්, එය ක්‍රියාත්මක කිරීම මේ රට දෙකඩ කිරීමට මුල් පියවර තැබීමක් බව පැහැදිලිව පෙන්වා දෙමින් දැඩි විරෝධය පළ කර තිබෙද්දීත්, එය ක්‍රියාත්මක කිරීම සඳහා නැවත වරක් මේ රාජාසන කථාවට ඇතුළත් කිරීම ගැන ඇත්ත වශයෙන් ම මා කම්පා වෙනවා.

එසේම වියට්නමයේ හටගෙන තිබෙන ඝට්ඨන ගැන රාජාසන කථාවේ මේ විධියට සඳහන් කර තිබෙනවා :

"වියට්නාමයේ හටගෙන ඇති සංවේගජනක ඝට්ඨනය ගැන නිරන්තරයෙන්ම ශෝකයට හා ඉමහත් සිත් තැවුලකට පත්ව සිටින මාගේ ආණ්ඩුව දැනට පැවැත්වෙන සාම සාකච්ඡා ගැන සතුට පළ කරයි. මෙම සාකච්ඡා මගින් වියට්නාම් ජනතාවගේ යහපතට තුඩු දෙන්නාවූද, ඔවුන්ගේ බලාපොරොත්තුවලට අනුකූල වූද, සාධාරණ වූත්, ස්ථිර වූත් විසඳුමක් කරා එළඹෙනු ඇතැයි යනු මාගේ ආණ්ඩුවේ අවංක ප්‍රාර්ථනයයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වියට්නාම් ප්‍රශ්නය ඒ රටේ අභ්‍යන්තර ප්‍රශ්නයක්. පසුගිය ලෝක මහා යුද්ධයෙන් පසු ලෝකයේ නොයෙක් රටවල ඇති වූ සිද්ධීන් ගැන කල්පනා කර බලන විට, නොයෙක් රටවල ජනතාව එකට එකතු වී ජාතියක් වශයෙන් නැගී සිටීමට කටයුතු කරන අවස්ථාවලදී ඒ රටවල ජනතාව භේද කිරීමේ ව්‍යාපාරය ගෙන ගියේ ඇමෙරිකන්වාදීන් බව අපට පෙනෙනවා. මහා යුද්ධයෙන් පසු තිබුණේ එක ජර්මනියක් පමණයි. එහෙත් ඇමෙරිකන්වාදීන්ගේ ඇඟිලි ගැසීම් නිසා අද බටහිර ජර්මනිය, නැගෙනහිර ජර්මනිය කියා රටවල් දෙකක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තියෙනවා අද ඒ රටවල් දෙක ඈණ කොටා ගන්නවා. මහා යුද්ධයෙන් පසු තිබුනේ එක කොරියාවක් පමණයි. එහෙත් ඇමෙරිකන්කාරයන් ඒ රටේ අභ්‍යන්තර ප්‍රශ්න වලට ඇඟිලි ගැසීම නිසා අද උතුරු කොරියාවය, දකුණු කොරියාවය කියා රටවල් දෙකක් තියෙනවා. එසේම මහා යුද්ධයෙන් පසු තිබුණේ එක වියට්නාමයක් පමණයි. ඒ රටේත් අභ්‍යන්තර ප්‍රශ්නවලට ඇමෙරිකන් කාරයන් ඇඟිලි ගැසීම නිසා අද උතුරු වියට්නාමය, දකුණු වියට්නාමය කියා කොටස් දෙකක් තියෙනවා. අද ඒ කොටස් දෙක ඈණ කොටා ගන්නවා. මහා යුද්ධයෙන් පසු තිබුණේ එක චීනයක් පමණයි. එහෙත් ඇමෙරිකන්කාරයන් ඇඟිලි ගැසීම නිසා ජාතික චීනය, මහජන චීනය කියා දෙකක් තිබෙනවා. මේ අන්දමට ඇමෙරිකන් කාරයන් හැම රටවලම අභ්‍යන්තර ප්‍රශ්න ඇඟිලි ගැසීම් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වියට්නාම් ප්‍රශ්නය ගැන අප රාජාසනයේ කථාවෙන් බලාපොරොත්තු වුණේ මීට වඩා වෙනස් දෙයක්. වියට්නාම් ප්‍රශ්නය ඒ රටේ අභ්‍යන්තර ප්‍රශ්නයක්ය, ඇමෙරිකාව ඒ ප්‍රශ්නයට ඇඟිලි ගැසීම අප සම්පූර්ණයෙන්ම හෙළාදකිනවාය කියා ප්‍රකාශ කළා නම් අපට සන්තෝෂ වන්නට ඉඩ තිබුනා. මේ විධියට සඳහන් කරන්නට ඇත්තේ ඇමෙරිකාවත්, උතුරු වියට්නාමයත් පැරීසියේ කරන සාකච්ඡා වලින් යම්කිසි ප්‍රයෝජනයක් අත්වේය යන හැඟීමක් ඇතිව වන්නට පුළුවන්. ඒ විධියේ සාකච්ඡාවලින් නියම ප්‍රතිඵල ලැබී තිබෙන බවක් කොයිම අවස්ථාවකවත් අප දැක නැහැ. අභ්‍යන්තර කටයුතුවලට ඇඟිලි ගැසීම් අද ලංකාවෙත් සිද්ධ වෙනවා. සාම දූත පිරිස් යනුවෙන් මේ රටේ සදාචාරය, සමගිය, ප්‍රජා සංවර්ධනය ඇති කිරීම සඳහාය කියා කොටසක් ඇවිත් සිටිනවා. ඒ අය කරන්නෙ මොකක්ද? රටේ අවුල් වියවුල් ඇති කර ජාතීන් අතර භේද ඇති කිරීමයි, ඔවුන් කරන්නේ. ඇමෙරිකන් මධ්‍යම ප්‍රවෘත්ති සංවිධානය ගැන අප දන්නවා. ඒ සංවිධානය සෑම රටකම ක්‍රියාකාරී වී තිබෙනවා. නොයෙක් රටවල් ඒ රටවල දියුණුව සඳහා කටයුතු කර ගෙන යන විට මේ ඇමෙරිකන් සංවිධාන නමයි, ඒ රටවල අභ්‍යන්තර භේද ඇති කර තිබෙන්නේ. තමන්ගේ රටේ රාජ්‍ය නායකයා ආරක්ෂා කර ගන්නට බැරි නම්, තමන්ගේ රටේ නායකයා මරා දමනවා නම් ඒ අයට පුළුවන්ද, මේ රටේ සදාචාරය ආරක්ෂා කරන්නට? සදාචාරය පුහුණු කිරීමක්, ප්‍රජා සංවර්ධනය ඇති කිරීමක් ඒ අයගෙන් අපට බලාපොරොත්තු වන්නට පුළුවන්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අනුව මේ රටටත් භයානක තත්ත්වයක් ඇති වේගෙන එනවා. මේ රට දෙකට කැඩුණොත්, මේ රට හරහා ඉරක් ගැහුවොත් ඒ සිද්ධිය පිටිපස ඇමෙරිකන් ඔත්තු සංවිධානය තියෙන්නට පුළුවන් බව අපට ප්‍රකාශ කරන්නට සිදු වී තිබෙනවා. අද රටේ තත්ත්වය මේකයි. අවුරුදු තුනක් ගත වුණාට පසුවවත් 1965 දී දෙන ලද පොරොන්දු ඉෂ්ට කරන්නට ආණ්ඩුව ක්‍රියා කරතැයි ජනතාව බලාපොරොත්තු වුණා. එහෙත් දැන් මේ රජය කොතරම් දුරට බංකොළොත් වී තිබෙනවාදැයි කිවහොත්, ජනතාව බලාපොරොත්තු වන වැදගත් කාරණා වෙනුවට අනවශ්‍ය වැල්වටාරම්, වැදගැම්මකට නැති දේවල්, රාජාසන කථාවෙන් ඉදිරිපත් කර තිබෙනවා. මේ වාගේ වැල්වටාරම්වලින් ජනතාව මුලා කිරීමට ලෑස්ති වුණත් එය ඉෂ්ට නොවන බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 6

**පී. බී. ඒ. වීරකෝන් මයා.** (වත්තේගම)
*(திரு. பீ. பி. ஏ. வீரக்கோன்—வத்தேகம)*
**(Mr. P. B. A. Weerakoon—Wattegama)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රත්තොට ගරු මන්ත්‍රීතුමාගේ (ඇස්. බී. යාලේගම මයා.) කථාවෙන් පසු මට කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. සැලැස්මක් නැතිව සංවර්ධන වැඩ කරන බව එතුමා ප්‍රකාශ කළා. 1965 දක්වා අවුරුදු හතරහමාරක් තිස්සේ බලයේ සිටි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව සැලැස්මක් ඇතිව කටයුතු කර ගෙන ගියාද නැද්දැයි මා එතුමාගේ ප්‍රශ්න කරනවා. ඇත්තෙන්ම ඒ කාලයේ නියම සැලැස්මක් ඇතිව කටයුතු කරගෙන ගියා නම් අද මේ තත්ත්වයට වැටෙන්නේ නැහැ.

අපට ආදායම ලැබෙන්නේ අප පිටරට යවන තේ රබර් පොල් යන ද්‍රව්‍ය තුනෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරකෝන් මයා.]

බව ඒ ගරු මන්ත්‍රීතුමා දන්නවා ඇති. 1965 වර්ෂය දක්වා මේ තුන් වර්ෂය සඳහා අපට පිටරටින් සැහෙන මුදලක් ලැබුණා. එහෙත් ලෝක වෙළඳපොළේ මේ ද්‍රව්‍ය බහුල වීම නිසා තරඟකාරී තත්ත්වය යටතේ 1966 සහ 1967 යන අවුරුදුවල ඒ ද්‍රව්‍යවලින් අපට ලැබුණු ආදායම අඩු වුණා. මේ අතර අවුරුදුපතා තුන් ලක්ෂය බැගින් ජනගහනය වැඩි වුණා. ඒ අනුව ඉකුත් අවුරුදු දහය දොළහ තුළ තිස් ලක්ෂයකින් පමණ මේ රටේ ජනගහනය වැඩි වී තිබෙනවා. ඉතින් මේ අයට කෑම ඇඳීම සැපයීමත්, රැකීරක්ෂා සැපයීමත් අවශ්‍යයි. පසු ගිය කාලය තුළ ඒ සඳහා කිසිවක් නොකර දැන් මෙතැන අවුත් සැලැස්මක් නැතැයි කෑකෝ ගසනවා. හොඳයි, අද මේ රජය ගෙන යන ආහාර නිෂ්පාදන වැඩ පිළිවෙළ හරි ද? වැරදි ද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
වැරදියි.

**වීරකෝන් මයා.**
*(திரு. வீரக்கோன்)*
(Mr. Weerakoon)
එහෙම නම් ඊට හේතු මෙම ගරු සභා වේදී ප්‍රකාශ කළ යුතුයි. ඒ වැඩ පිළිවෙළේ අඩුපාඩුවක් තිබෙනවා නම් එය සකස් කර ගැන්මට උදව් කළ යුතුයි. ඒ මිස එය කඩා කප්පල් කිරීම වැරදියි. It is easy to destroy everything. ආහාර අතින් මේ රට ස්වයම්පෝෂිත කිරීම ජාතික ප්‍රශ්නයක් බව කවුරුනුත් කල්පනා කොට ඒ සම්බන්ධයෙන් ගෙන යන වැඩ පිළිවෙළට ආධාර දිය යුතුයි. මේ රටේ සංවර්ධනය එක් පක්ෂයකට පමණක් නොව සියලුම පක්ෂවලට අයත් කටයුත්තක්. කොටින්ම එය මුළු ජනතාවටම අයත් කටයුත්තක්. දැනට අපේ ගරු අගමැතිතුමා ආහාර වගාව සම්බන්ධයෙන් ගෙන යන්නේ සැලැස්මක් ඇති වැඩ පිළිවෙළක්.

දැන් පර්යේෂණාගාර කීයක් පිහිටුවා තිබෙනවාදැයි කල්පනා කර බලන්න. නොයෙකුත් උසස් වී වර්ග ගැන හැමදාම පර්යේෂණ පවත්වනවා. අක්කරයෙන් බුසල් 150 සිට 200 දක්වා ගන්නට පුළුවන් වී වර්ග දැන් සොයාගෙන තිබෙනවා. අපේ ප්‍රදේශවල සාමාන්‍ය ගොවියන් නියමිත වාරිමාර්ග ක්‍රම නැති කුඹුරුවල අහස් වතුරෙන් ගොවිතැන් කිරීමෙන් පවා අක්කරයකින් වී බුසල් 140 ත් 200 ත් අතර ගණනක් ලබාගෙන තිබෙනවා. එහෙම නම් දැනට ගෙන යන වගා ව්‍යාපාරය අසාර්ථක නැහැ නේද? සැලැස්මක් ඇතිව වැඩ කර ගෙන යන නිසයි, අද මේ තත්ත්වය ඇති වී තිබෙන්නේ.

දැන් වලවේ ක්‍රමයේ වැඩ ඉවරයි. මහ වැලි ගඟ යෝජනා ක්‍රමයේ වැඩ මේ වර්ෂයේ පටන් ගන්න බවක් මේ වර රාජාසන කථාවේ සඳහන් කර තිබෙනවා. මහවැලි ගඟ යෝජනා ක්‍රමය යටතේ කුඹුරු අක්කර නව ලක්ෂයකට වතුර දෙන්නට පුළුවනි. අක්කර නව ලක්ෂයක් වගා කරන්නට පුළුවනි. අක්කර නව ලක්ෂයක ගොවීන් පදිංචි කරවන්නට පුළුවනි. ගරු ඉඩම් ඇමතිතුමා ක්‍රමානුකූල සැලැස්මක් අනුවයි, වැඩ කරගෙන යන්නේ. ඒවා කියවා බලා මෙහි කථා කළා නම් එතුමා ඔය විධියේ කරුණු ඉදිරිපත් කරන්නේ නැහැ. වියළි කලාපයේ වැව් 50ක් තැනීමට යෝජනා කර තිබෙන බව එතුමන්ලාට පෙනිය යුතුයි. මේ රටට අවශ්‍ය ගොවිතැන් කිරීම සඳහා වතුර රැස් කර ගැනීම ප්‍රධාන අවශ්‍යතාවයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව අයිති ඇමතිතුමා සැලැස්මක් ඇතුව ඒ ව්‍යාපාරය දක්ෂ ලෙස කරගෙන යනවා. පයෝෂණාගාර ඇති කර විද්‍යානුකූලව අස්වැන්න වැඩි කරන මාර්ග යොදා කටයුතු කිරීමෙන් දැනට සාමාන්‍ය වී අස්වැන්න අක්කරයකට වී බුසල් 50 ක් 60 ක් පමණ වී තිබෙනවා. එම නිසා රත්තොට මන්ත්‍රීතුමා (යාලේගම මයා.) කරන ලද කථාව සම්පූර්ණයෙන්ම අසත්‍ය අසාධාරණ කථාවක් බව මා ප්‍රකාශ කරනවා.

අනික් අතින්, නියෝජ්‍ය කථානායකතුමනි, නවීන ක්‍රම යොදා ගොවිතැන් කිරීම නිසා අස්වැන්න වැඩිවීමෙන් ගොවීන්ට ලැබෙන මුදල් ප්‍රමාණයත් වැඩි වී තිබෙනවා. එහෙත් අවුරුද්දක් දෙකක් ඇතුළතදීම අපේ රට ස්වයංපෝෂිත කර ගන්න පුළුවන් වේවිය කියා අපට බලාපොරොත්තු වෙන්න බැහැ. අපේ පරමාර්ථය වූ ඇත්තේ රට ස්වයංපෝෂිත කිරීමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් මතු කරන්න කැමතියි. සභාවේ ගණපූරණයක් නැහැ.

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොතිබියෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදි.**

**පසුව ගණපූරණයක් තුබූයෙන්—**

*சபை எண்ணப்பட்டு நிறைவெண் இல்லாததால் பிரிவுமணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப்பட்டது.*

*பிறகு, நிறைவெண் இருந்ததனால்—*

*House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present——*

**වීරකෝන් මයා.**
*(திரு. வீரக்கோன்)*
(Mr. Weerakoon)

1980 වන විට මේ ලෝකයේ ආහාර හිඟයක් ඇති වෙනවාය, විශාල ජන සංඛ්‍යාවක් මැරී යනවාය කියා විශේෂඥයන් විසින් අපට දැනුම් දී තිබෙනවා. එම නිසා ඇමෙරිකන් පිටි හෝ ඔස්ට්‍රේලියන් පිටි හෝ චීන හාල් හෝ අපට ඒ කාලය වන විට බලාපොරොත්තු වෙන්න බැහැ. එසේ නම් ඥාණවන්ත මනුෂ්‍යයන් වශයෙන් අප කළ යුත්තේ මොකක්ද ? සැලැස්මක් ඇති කරගෙන ඒ අනුව කටයුතු කිරීමයි. එවැනි සැලසුමක් සැලසුම් දෙපාර්තමේන්තුවෙන් සාදා තිබෙනවාය කියන එක ගැනවත් දැනීමක් නැතුවයි ඒ මන්ත්‍රීතුමා කථා කෙළේ. සැලසුම් දෙපාර්තමේන්තුවක් පිහිටුවා ඒ අනුව මේ ආණ්ඩුව විසින් වැඩ කරගෙන යන බව ඒ මන්ත්‍රීතුමා දැනගෙන නොසිටීම ගැන මා කනගාටු වෙනවා.

ඒ වාගේම මිනිපේ, ගල්ඔය, හඟුරන්කෙත, උඩ වලවේ ආදී ප්‍රදේශවල සංචාරය කළා නම් මෙවැනි කථාවක් ඒ මන්ත්‍රීතුමා විසින් නොකරන්න තිබුණු බව මා ගරු සභාවට මතක් කරන්න කැමයිනි. ඊට පෙර කථා කළ මන්ත්‍රීතුමෙකුත් ප්‍රකාශ කළා මේ ආණ්ඩුව ධනපතීන්ට ඉඩම් දී තිබෙනවාය කියා. මා කියන්න කැමතියි, නියෝජ්‍ය කථානායකතුමනි, මහජනතාව ආහාර හිඟයෙන් වැළැක්වීමට නොහොත් සාගින්නේ මරණයෙන් බේරන්නට අප දැන් ලොකු සටනක් ගෙන යන බව. එසේ නම් මේ රටේ සිටින අය ඊට සහභාගි වී පුළුවන් තරම් ඉක්මනින් රටට අවශ්‍ය ආහාර වර්ග සපයා දිය යුතුයි. අපි දන්නවා විදේශිකයන් මෙයින් යම්කිසි ලාබයක් ලබන බව. ඒ අතරම අපට වුවමනා කරන හාල් සහ ධාන්‍ය වර්ග, මස් වර්ග, පළතුරු වර්ග, එළවළු වර්ග පහසුවෙන් දීමට ඒ අයට පුළුවන්. ඊට හේතුව මොකක්ද ? පුද්ගලයින්ට ඉඩම් දෙන්ට එපා යයි අපි කියන්නෙ නැහැ. අපේ ගරු ඉඩම් ඇමතිතුමා පුළුවන් තරම් ඉඩම් බෙදා දෙනව. බලහත්කාරයෙන් ගිහින් ඉඩම්වල පදිංචි වන අයට පවා ඉඩම් පවරා දෙන ඇමතිවරයෙක් අපේ ඇමතිතුමා. මේක ආහාර නිෂ්පාදනය දියුණු කිරීමට කරන දෙයක්. මේ විශේෂ බදු ක්‍රමය යටතේ බෙදා දී තිබෙන ඉඩම්වල අයිතිය අවුරුදු 25 කින් අහෝසි වෙනව. ඒ ඉඩම් නැවතත් ජනතාවට ලැබෙනව. ඒ ධනපති උදවියට මුදල් තිබෙන බව අප අමතක කරන්ට හොඳ නැහැ. ගොවීන්ටත්, සාමාන්‍ය මධ්‍යම පන්තියේ අයටත් විශාල වශයෙන් ඉඩම් වගා කරන්ට මුදල් ඇත්තෙ නැහැ. මුදල් තිබෙන උදවියට නොයෙක් විධියේ පර්යේෂණ පවත්වන්න පුළුවන්. ඒ උදවියට පළපුරුදු නිලධාරි මහතුන් සිටිනව. ඒ වගේම යන්ත්‍රෝපකරණ, ආදිය පහසුවෙන් මිළ දී ගන්ටත් පුළුවනි. එහෙම නම් මේක ඥානාන්විත වැඩක්ද, නැද්ද, කියා කල්පනා කර බලන්න.

පෞද්ගලික සමාගම් හා ධනපති උදවිය මේ රටේ විශාල ලෙස තේ සහ රබර් වවනව. මේ රටේ ආදායමෙන් සියයට 60 ක් තරම ලැබෙන්නෙ තේවලින්. ඒ අන්දමට අපේ රටේ ගොවිතැන දියුණු කළොත් රට ස්වයම්පෝෂිත කරගෙන රටේ ප්‍රශ්න විසඳන්නට අපට පුළුවන්කම ලැබෙනව. ඒ නිසා මගේ විශ්වාසයේ හැටියට මේ චෝදනා ඥානවන්ත ඒවා නොවෙයි ; නිකම් නූගත් දුප්පත් මිනිසුන් රවටන්නට කරන කථායි. දුප්පතාගේ දේ ධනපතීන් ගත්තා කියා පෙන්වා දී දේශපාලන වාසියක් ලබා ගැනීම මෙහි පරමාර්ථයයි. රජය මේ සියල්ලම කරන්



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරකෝන් මයා.]

නෙ දුප්පතාට අවශ්‍ය කෑම ටික සපයා දීම සඳහා ආහාර වගාව දියුණු කරන්නයි; දුප්පතා බේරා ගන්නයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආහාර වගාව දියුණු කිරීමේ ව්‍යාපාරයට රැකී රක්ෂා ප්‍රශ්නයත් සම්බන්ධයි. රාජාසන කථාවේ රැකීරක්ෂා ප්‍රශ්නය සම්බන්ධව සඳහන් කරල නැතිලු. ආහාර හැරුණු කොට මේ රටේ ජනතාවට වුවමනා කරන වෙනත් භාණ්ඩ තිබෙනව. එයින් එක් දෙයක් තමයි, ඇඳුම් පැළඳුම්. අපේ ආණ්ඩුවේ එක ඉලක්කයක් තමයි, 1972 වන විට රට ඇඳුම් පැළඳුම්වලින් ස්වයම්පෝෂිත කිරීම. දැනටමත් මේ රටට අවශ්‍ය රෙදිවලින් සෑහෙන ප්‍රමාණයක් මේ රටේම නිපදවන බව තමුන්නාන්සේලා දන්නව. මේ රටේ වියන රෙදි පාවිච්චි කරන්ට අපේ මිනිසුන් පොළඹවන්න ඕනෑ. මේ රටේ නිපදවන ඇතැම් භාණ්ඩ පාවිච්චි කිරීමට කැමැත්තක් නොදැක්වීම අපේ ඇතැම් ධනපතීන්ගේ දුර්වලකමක්. ඒ ගැන කනගාටු වන අතර, ඒ අයට බල කරන්ට ඕනෑ, දේශීය භාණ්ඩ පාවිච්චි කරන්න කියා. 1972 වන විට මේ රටට පිටරටින් රෙදි පිළි නොගෙන්වන තැනට මේ රජය දැන් කටයුතු කරගෙන යන බව මතක් කරන්ට කැමතියි.

ඊළඟට කර්මාන්ත ගැනත් වචනයක් කියන්ට ඕනෑ. පසුගිය රජය කර්මාන්ත දියුණුවට කටයුතු කළේ නැහැ කියා මා කියන්නෙ නැහැ. එහෙත් ඊට වැඩිය ධෛර්යය දමා ඊට වැඩිය ආධාර දී මේ රජය කර්මාන්ත දියුණුවට ක්‍රියා කරගෙන යන බව කියන්ට ඕනෑ. කොයිම ආණ්ඩුව කින්වත් උඩරට ප්‍රදේශයේ කර්මාන්තයක් ඇරඹුවේ නැහැ. අගමැතිතුමාට ප්‍රශංසා කරන්ට ඕනෑ, මේ රජය මගින් පල්ලේකැලේ වතුයායෙන් අක්කර 4,500 ක් ලබාගෙන එහි කාර්මික නගරයක් පිහිටුවන්නට යාම ගැන. එහි කර්මාන්ත පුරයක් ඇති කරල අපේ තරුණ තරුණියන්ගේ රැකීරක්ෂා ප්‍රශ්නය විස දීම සඳහා සකස් වූ වැඩ පිළිවෙලක් කැබිනට් මණ්ඩලයේත් ආණ්ඩුවේත් සැළකිල්ලට භාජන වී තිබෙන බව මා කියන්ට කැමතියි. යාපනය, ගාල්ල, මහනුවර වලත් කාර්මික ජනපද "ඉන්ඩස්ට්‍රියල් එස්ටේට්ස්" පිහිටුවීමට රජය කටයුතු කරගෙන යන බව මතක් කරන්ට කැමතියි. අපේ පල්ලේකැලේ කාර්මික ජනපදයේ කටයුතුත් දැන් සිදු වීගෙන යන බව මතක් කරන්නේ ප්‍රීතියෙන්. මේ කරුණු නිසා ගරු මන්ත්‍රීවරුන්ට කියන්ට බැහැ, ආණ්ඩුව වැඩ කරන්නෙ නැහැ කියා. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදය අනුව වැඩ කිරීමේදී නොයෙක් බාධා ඇති වන බව මා පිළිගන්නව. රෙඩ් ටේප් ක්‍රමය නැති කර, නිලධාරීන්ගේ බලපෑම් නැති කිරීමටත් ආණ්ඩුව සකස් කිරීමටත් ආධාර වෙන්නට ඕනෑ. එතකොට ඉක්මනින් වැඩ කරන්නට පුළුවන් වේවි. විරුද්ධ පාර්ශ්වයේත් ආධාරය ඇතිව වර්තමාන ආණ්ඩු ක්‍රමය රටට අවශ්‍ය අන්දමට වෙනස් කළොත් අපේ ප්‍රශ්න විසඳන්නට පුළුවන් වන බව කියන්නට පුළුවනි. විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සේලා ඊට සහයෝගය දෙන්නේ නැහැ. ඒ නිසා ටිකින් ටික වැඩ පමා වෙනවා. අපේ වැඩ කටයුතු කරගෙන යෑමට අපට තිබෙන්නේ ඒ කාලයේදී අධිරාජ්‍යවාදීන් ගෙන ගිය නීති රීති ආදියයි. ඒ නිසා වැඩ කරගෙන යෑමේ යම් යම් ප්‍රමාදයන් ඇති වෙනවා. ගරු අගමැතිතුමා හෝ අපි හෝ ඊට පලි නැහැ. දෙගොල්ල එකතු වුණොත් අපේ ප්‍රශ්න විසඳන්නට පුළුවන් බව කරුණාවෙන් කියන්නට කැමතියි.

අධ්‍යාපනය ගැන තමුන්නාන්සේලා කිව්වා. අධ්‍යාපනය බොහොම අමාරු ප්‍රශ්නයක්. දුප්පතාට ඉගෙනීමට ඉඩක් නැතෙයි කියනවා. දුප්පතාට තැන ලැබී තිබෙනවා. මට මතක තිබෙන හැටියට 1920-30 කාලයේදී අපට අධ්‍යාපනය වෙනුවෙන් ගාස්තුවක් ගෙවන්නට සිදු වුණා. ස්කූල් fපීස් අය කරන ඉස්කෝල තමයි මේ රටේ වැඩිපුරම තිබුණේ. නිදහස් අධ්‍යාපනය ඇති වුණු දවසේ සිට—එය එක්සත් ජාතික පක්ෂයෙන් ඇති වූවකැයි මා කියන්නේ නැහැ—දුප්පතාට තැනක් ලැබුණා. නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි මේ රටේ මෙතරම් සංඛ්‍යාවක් උපාධිධාරීන් ඇති වන්නට පටන් ගත්තේ. ඒ කාලයේදී රට ආණ්ඩු කළ උදවිය වැරැද්දක් කළා. මොකක්ද ඒ වැරැද්ද? රටට ඔබින අධ්‍යාපනයක් ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෙළේ නැහැ. ඒ නිසා අපේ රටේ දියුණුවට බාධාවක් ඇති වුණා. රටේ වුවමනාවලට අවශ්‍ය තරුණ තරුණියන් පාසැල් වලින් බිහිවුනේ නැහැ. අපට නවීන ලෝකයේ අවශ්‍යතාවන් අනුව බොහොම වේග යෙන් ගමන් කරන්නට වුවමනා කරනවා. කර්මාන්ත දියුණු කරන්න ටත්, ගොවිතැන දියුණු කරන්න ටත්, පර්යේෂණ පවත්වන්නටත් දක්ෂ පුද්ගලයින් අපට වුවමනා කරනවා. වැඩි වැඩියෙන් ඉංජිනේරුවන් අපට වුවමනා කරනවා. ඒ අය අපට වුවමනා තරම් බිහි කරවා ගන්නට පුළුවන්කමක් ලැබුණේ නැහැ. කල්පනාවක් නැතිව වැඩ කිරීම ඊට හේතුවයි. අපේ තරුණ තරුණියන් අපේ රටට අවශ්‍ය දේවල් නිෂ්පාදනය කරන්නට පුළුවන්කමක් තිබෙන උදවිය හැටියට හැඩගස්වා ගැනීමට අපේ අධ්‍යාපනය සකස් වුණේ නැහැ. ගරු අධ්‍යාපන ඇමතිතුමා අපේ ළමයින් ගොවිතැන් දියුණු කිරීම සඳහා කුඹුරට බස්සවනවායයි මීට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා කීවා. ඒවාත් ළමයින්ට උගන්වන්නට ඕනෑ බව ඒ ගරු මන්ත්‍රීතුමාට කියන්නට කැමතියි. ලියන මහත්වරුන්ම කරන්නට නොවෙයි, ගුරුවරුන් කරන්නටම නොවෙයි අපේ අධ්‍යාපනය සකස් කළ යුත්තේ. බොහෝ දෙනෙක් දැන් බලාපොරොත්තු වන්නේ එවැනි වැඩ තමා. කාවල් වැඩ ඉල්ලා බොහොම දෙනෙක් එනවා. "වොචර් වැඩක් වුවමනාය" කියා ඒ අය කියනවා. වොචර් වැඩක් කියලයි කියන්නේ. එහෙමයි කියන්නට පුරුදු වෙලා ඉන්නේ. පියොන් වැඩක් වුණත් කමක් නැහැ කිය නවා. ඒ උදවියට පෙනෙන්නෙ නැහැ, නිෂ්පාදනය කිරීමට උත්සාහ කිරීම ඔය හැම එකකටම වඩා වැදගත් බව.

රටට කළ හැකි ලොකුම සේවය, යහපත, නිෂ්පාදන වැඩි කිරීමයි. තවමත් අපේ ළමයින්ට ඒවා පුරුදුවෙලා නැහැ. ඒ ගැන හැඟීමක් අපේ ළමයින්ට ලැබී නැහැ. ඒ ගැන අපි කනගාටු විය යුතුයි. මේ රටට අවුරුද්දකට ලැබෙන ආදායම සම්පූර්ණයෙන්ම වැය කළත් අපට වුව මනා කරන අධ්‍යාපනය, ඇමතිතුමාට දෙන් නට බැහැ. අපට වැඩි වැඩියෙන් විද්‍යාගාර වුවමනා කරනවා. තව තවත් "වර්ක් ෂොප්ස්" හෙවත් වැඩපොළවල් වුවමනා කරනවා. ඒවා ඇති කරන්නට අවශ්‍ය මුදල් නැහැ. ඊට ඔය විරුද්ධ පාර්ශ්වයේ ඉන්න නමුන්නාන්සේලාත් වැරදිකාර යන් නොවෙයි. ගරු අගමැතිතුමාත් වැරදි කාරයා නොවෙයි. මේ රටේ උපදින ධන යෙන් වැඩි කොටසක් කෑමට වැය වෙනවා. මහජනයාට කෑමට වුවමනා බඩු ගෙන් වීමට අපේ රටේ ධනයෙන් විශාල ප්‍රමාණ යක් වැය වෙනවා. අන්න ඒ නිසා තමයි මේ කනගාටුදායක තත්ත්වය ඇති වී තිබෙන්නේ. ඒ නිසා තමයි අපේ ගරු ඩඩ්ලි සේනානායක මැතිතුමාත්, අපේ ගරු ආහාර ඇමතිතුමාත්, කැබිනට් මණ්ඩලයත් මේ රට ස්වයංපෝෂිත කරන්නට වැඩ කරන්නේ. ඒ හැඟීම හැම දෙනාටම තිබෙන්නට ඕනෑ. වැඩ කිරීම ගෞරවයක් හැටියට කල්පනා කරන්නට ඕනෑ. "ඩිග්නිටි ඔෆ් ලේබර්" ගැන කල්පනාකාරී වන්නට ඕනෑ. ධනය නිෂ්පාදනය කිරීමට වුවමනා නම් හැම දෙනාම ඒ ගැන සැළකිලිමත් වන්නට ඕනෑ. ඒ නිසා රටට අවශ්‍ය දේවල් කිරීමට පුළුවන්කමක් ලැබෙන විධියේ අධ්‍යාපනයක් අපේ ළම යින්ට ලැබෙනවා නම් මීට වඩා විශාල සේවයක් ජනතාවට සිදු වන බවට කිසිම අනුමානයක් නැහැ. දැන් මගේ කාලයත් අවසාන වීගෙන යනවා; නමුත් කියන්න නම් හුඟක් දේවල් තිබෙනවා.

මා විශේෂයෙන් ගරු අධ්‍යාපන ඇමති තුමාට කෘතඥ වෙනවා, හොඳ ගුරුවරුන්, උසස් ශ්‍රේණියේ ගුරුවරුන්, ඒ වගේම විද්‍යා ගුරුවරුන්, ඌව, මිනිපේ, උතුරු-මැද පළාත, ආදී ප්‍රදේශවලට යැවීමට නියම කිරීම ගැන. එය මීට හුඟක් කලින් කළ යුතු වූ දෙයක්. නමුත් එය කල් ඇතිව කෙරුනේ නැහැ. කවදා හෝ කළ යුතුව තිබුන වැඩක්. නමුත් අපට කියන්න බැහැ, අවුරුදු දෙකෙන් තුනෙන් මේවාගේ ප්‍රති ඵල ලැබේවිය කියා. අපේ මුදල්වලින් සිය යට 20 ක්—අපේ ආදායමෙන් සියයට 20 ක්—වැය වන්නේ අධ්‍යාපනයටයි. මා හිතන්නේ නැහැ නමුන්නාන්සේලා කියන සමාජවාදී රටවලවත්—රුසියාවේවත්—අධ්‍යාපනය සඳහා මේ තරම් මුදලක් වියදම් කරනවා ඇත කියා. විශ්ව විද්‍යාලය තෙක් නිදහස් අධ්‍යාපනයක් ලබා දෙන්නේ කොයි රටේද?



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

තමුන්නාන්සෙ දන්නෙ නැහැ.

**වීරකෝන් මයා.**
*(திரு. வீரக்கோன்)*
(Mr. Weerakoon)

තමුන්නාන්සේට වඩා මම දන්නවා. මා දන්න නිසයි දන්නවාය කියන්නෙ. ඒ නිසා මට කියන්න එන්න වුවමනාවක් නැහැ.

ගරු කථානායකතුමනි, මට තවත් සුළු වේලාවක් දෙන්න එක් කරුණක් කියන්න. අපේ කොළොන්නාවේ මන්ත්‍රීතුමා කියන්න යෙදුනා, දැන් තිබෙන්නේ ද්‍රවිඩ ආණ්ඩුවක්ය කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ සිටින මහජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන අතරම සුළු ජාතියගේත් අයිතිවාසිකම් ආරක්ෂා වෙන්න ඕනෑ. මහ ජාතියෙන් සුළු ජාතියට අකටයුත්තක් සිදු වන්නේ නැත, ඒ අය දෙවැනි පංක්තියේ පුරවැසියන් හැටියට සැලකෙන්නේ නැත කියන හැඟීම සුළු ජාතියට ඇති වෙන විධියට කටයුතු කරන්න ඕනෑ. එහෙම කටයුතු කළොත් තමයි, එක්සත්ව වැඩ කරන්න පුළුවන් වන්නෙ. එක් ජාතියක් වශයෙන්, එක් රටක් වශයෙන්, අපේ ඉදිරි ගමන යන්න පුළුවන් වන්නේ එසේ කටයුතු කළොත් තමයි. එහෙම නැත්නම් අපේ මේ සංවර්ධන වැඩ එකක්වත් කරන්න පුළුවන් වන්නේ නැහැ. සුළු ජාතීන් සමග එක්සත්ව නොසිටියොත් මේ රටේ නොයෙක් අන්දමේ කැරලි කෝලහල ඇති වෙන්න පුළුවනි. එවිට අපේ වැඩ කටයුතු ගෙන යන්න පුළුවන් වන්නේ නැහැ. ඒ නිසා අපේ අගමැතිතුමා කල්පනා කළා, සුළු ජාතීන්ගේ සිත් දිනා ගැනීම මේ රටේ දියුණුවට වැදගත් දෙයක් වෙනවාය කියා. මට දී තිබෙන වෙලාව හමාර බැවින් මගේ කථාව අවසන් කරනවා. බාධා නොකර මගේ කථාවට සවන් දී සිටීම ගැන මා තමුන්නාන්සේලාට ස්තුති වන්ත වෙනවා.

අ. භා. 6.22

**ඩබ්ලිව්. ඒ. ධර්මදස මයා.** (පැල්මඩුල්ල)
*(திரு. டபிள்யு. ஏ. தர்மதாச—பெல்மதுல்ல)*
(Mr. W. A. Dharmadasa—Pelmadulla)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම බොහොම සන්තෝෂ වෙනවා අපේ අක්මීමන ගරු මන්ත්‍රීතුමා සියයට 5 ක පමණවත් රට ගැන යම්කිසි අවබෝධයක් ලබා තිබීම ගැන. එතුමාගේ කථාවෙන් අපට පෙනී ගියා එතුමාට යම්කිසි අවබෝධයක් ලැබී තිබෙන බව. අක්මීමන ගරු මන්ත්‍රීතුමාට අනතුරුව කථා කළ වත්තේගම ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී කියන්න යෙදුනා, දෙගොල්ලම එක් වී කටයුතු කරමුය කියා. ඇත්ත වශයෙන්ම මේ නගින දෙගින කාලේ කියන මේ කථාව 1965 මාර්තු හරියේදීම නොකීම ගැන මා මේ අවස්ථාවේදී කනගාටු වෙනවා.

ඊළඟට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ කථාවේදී කියවුණා, ළමයින් වගා ව්‍යාපාරයට යෙදීවීමෙන් ඔවුන්ට ගොවිතැන ගැන අවබෝධයක් ලැබෙනවාය කියා. ළමයින්ට ඒ ගැන පුහුණුවක් ඇති වෙනවාය කියා. එය එතුමාගේ වැරදි අවබෝධයක්. මේ ළමයින් එක් යල් කන්නයකට 4 වරක් කුඹුරුවල වැඩට යෙදෙව්වාට, කවදාවත් ඔවුන්ට ගොවිතැන ගැන අවබෝධයක් ලැබෙන්නේ නැහැ. එහෙම අවබෝධයක් ඇති වෙනවා නම් එය වැරදි අවබෝධයක් වෙන්න පුළුවනි.

**වීරකෝන් මයා.**
*(திரு. வீரக்கோன்)*
(Mr. Weerakoon)

ගොවිතැන ගැන පුහුණුවක් දෙන්න ඕනෑ.

**ධර්මදස මයා.**
*(திரு. தர்மதாச)*
(Mr. Dharmadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද කට යුතු කරන අන්දමට එක් යල් කන්නයකට 4 දවසක් පමණයි මළයින්ට ගොවිතැන් කටයුතුවල යෙදෙන්න පුළුවන් වෙන්නෙ. ඒ දවස් 4 රේ කාලය ඇතුළත වල් නෙලීම හෝ පැල සිටවීම කළාට ඒ ළමයින්ට ගොවිතැන ගැන අවබෝධයක් ඇති වේය කියා තමුන්නාන්සේලා සිතනවා නම් එය සම්පූර්ණ වැරදි අවබෝධයක්. ළමයෙකුට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගොවිතැන ගැන අධ්‍යාපනයක් දෙන්න ඕනෑ නම් ඒ ළමයින් ඉගෙන ගන්න පාසැල්වලට පොඩි කුඹුරක් දෙන්න ඕනෑ. එහෙම නැතිව මේ ක්‍රමයෙන් නම් කවදාවත් ළමයින්ට ගොවිතැන ගැන අධ්‍යාපනයක් දෙන්න පුළුවන් වන්නේ නැහැ. එම නිසා ඒ ක්‍රමය වැරදි බව කිව යුතුව තිබෙනවා.

ඊළඟට, මෙම රජයෙන් මේ රටේ වැඩ කරන ජනතාවට—ගොවි ජනතාවට හෝ වේවා කම්කරු ජනතාවට—බලාපොරොත්තු වුණු විධියෙ සේවයක්, ඉටු නොවනු බව පළමුවෙන්ම කිව යුතුව තිබෙනවා. මේ රට ආහාර අතින් ස්වයංපෝෂිත කිරීමට ලොකු වෙහෙසක් දරනවා, ක්‍රමවත් වැඩ පිළිවෙළක් අනුගමනය කරනවායයි කීවත් එයින් බලාපොරොත්තුවන තරමේ ප්‍රතිඵල ලබාගත හැකිද ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යම්කිසිවෙක් යම් වැඩක් කිරීමට පෙළඹෙන්නේ, ඒ වැඩෙන් ලැබෙන ආදායම අනුවයි. වැඩි ආදායමක් කුඹුරු කෙටීමෙන් ලබාගන්න පුළුවන් නම් මිනිසුන් කුඹුරු කොටන්න පෙළෙඹෙයි. එළවළු වගා කිරීමෙන් වැඩි ආදායමක් ලබන්න පුළුවන් නම් එළවළු වගා කරයි. කර්මාන්තවල නියැලීමෙන් වැඩි ආදායමක් ලබාගත හැකි නම් කර්මාන්ත කිරීමට පෙළඹෙයි. නමුත් මෙහිදී ඇති වන ප්‍රශ්නය මේකයි : රජය ආධාර කරන්නේ කාටද? මේ රජය ආධාර කරන්නේ ගොවියාට නොවෙයි, ගොවිතැන් කරවන්නන්ටයි. ඒකයි මා කිවේ වැරදි අවබෝධයකින් යුක්තව වැඩ කරනවාය කියා. ගොවිතැන් කරවන මිනිහාට අක්කර දහස් ගණන් දෙනවා, වාහන ගෙන්වන්ට ආධාර දෙනවා, ආදායම් බද්දෙන් නිදහස් කරනවා. ඒ සෑම පහසුවක්ම දෙනවා. මහන්සි වී ගොවිතැන් වැඩ කරන මිනිහාට එදාටත් වඩා පහත් තත්වයකිනුයි සලකන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය රජය කාලයේදී ගොවිතැන් කරන මිනිහාට වී බුසලකට රුපියල් 12 ක් දුන්නා. වර්තමාන රජයෙන් දෙනවා රුපියල් 14 ක්. මේ ගැන තමුන්නාන්සේ ටිකක් කල්පනා කළොත් පෙනී යාවී, පසුගිය රජයෙන් දුන්නෙ බාල්දු නොකළ රුපියල්වලින් 12 ක් බව. මේ රජය දෙන්නෙ බාල්දු කළ රුපියල්වලින් 14 ක් බාල්දු කළ රුපියල්වලින් රුපියල් 14ක් කියන්නේ බාල්දු නොකළ රුපියල්වලින් රුපියල් 11.20කටයි. ඒ කියන්නෙ කලින් දුන් ගණනට වඩා රුපියලක් පමණ අඩුවෙනුයි ගෙවන්නෙ. ගොවියාට උපකාර කරනවායයි කියන මේ ආණ්ඩුව ගෙවන්නෙ කලින් ආණ්ඩුවෙන් වී බුසලට ගෙව්වාටත් වඩා රුපියලක් අඩුවෙනුයි. පසුගිය රජය කාලයේදී රුපියල් දොළහකට වී බුසල විකුණා, ඒ අයට එදිනෙදා වුවමනා කරන පාරිභෝගික ද්‍රව්‍ය රාශියක් ගැනීමට පුළුවන්කම තිබුණා. ඒ ද්‍රව්‍යයන් මෙන්න මේ අන්දමින් ලබාගත හැකිව තිබුණා : රුපියල් 12 ට වී බුසලක් වික්කොත් හාල් මැස්සන් කරවල රාත්තල් 15 ක් පමණ ගන්න පුළුවනි. අද රුපියල් 14 ට වික්කොත් හාල් මැස්සන් කරවල ලබාගන්න පුළුවන් වන්නෙ රාත්තල් හයක් පමණයි. එදා කරවල රාත්තල් 10 ගත්තා නම් අද රුපියල් 14 ට විකිණීමෙන් ලබාගන්න පුළුවන් කරවල රාත්තල් 6 ක් පමණයි. එදා රෙදි යාර අට හමාරක් ලබාගත් ගොවියාට අද වී බුසල විකිණීමෙන් ලබාගන්න පුළුවන් වෙන්නෙ යාර පහමාරයි. අන්න ඒ නිසයි ගොවීන් වෙනුවෙන් වර්තමාන රජය අනුගමනය කරන ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම වැරදිය කියා මා කලින්ම කීවේ.

අප කවුරුත් කැමතියි අපේ දරුවන්ට හොඳහැටි කන්න දෙන්න, අඳින්නපළඳින්න දෙන්න, උගන්වන්න, වෙනත් සැපපහසුකම් දෙන්න පුළුවන්නම්. හැම දෙනාටම ඒ අන්දමේ කැමැත්තක් තිබුණත් ආදායම උපදවා දෙන මිනිහා හැමදාමත් පෙළෙනවා. ඒක ස්වභාවධර්මයක්. අදත් සිදු වී තිබෙන්නේ එයයි. ගොවියාට ගොවිතැනින් වැඩි ආදායමක් ලබන්නට බැරි නිසා ඔවුන් ආදායම් ලබන්නට පුළුවන් දේට පෙළඹෙනවා. ඒ නිසා ගොවිතැන දියුණු වන්නේ නැහැ. ගොවිතැන නගා සිටුවීමට නම් අඩු වශයෙන් ගොවියාට වී බුසලකට රුපියල් 18 ක් වත් ගෙවන්නට ඕනෑ. එසේ කළොත් මේ තරම් ලොකුවට ව්‍යාපාරයක් නොගෙනිච්චත් රටට අවශ්‍ය වී ටික

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ධර්මදාස මයා.]

ගොවියා විසින් නිපදවාවී. වත්තේගම ගරු මන්ත්‍රීතුමා වීරකෝන් මයා.) එතුමා ගේ කථාවේදී කිව්වා මේ රජය කරන ක්‍රමය වැරදි නම් හරි ක්‍රමය කියා දෙන්නය කියා. මා මේ අදහස මේ අවස්ථාවේදී ඉදිරිපත් කළේ ඒ නිසයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රට ආහාර අතින් ස්වයංපෝෂිත කිරීමට මේ ආණ්ඩුව ගන්නාවූ මේ ක්‍රියාමාර්ගය ගැන අපි වර්තමාන අගමැතිතුමාට ප්‍රශංසා කරනවා. එහෙත් මේ ආණ්ඩුව මේ ගෙන යන ක්‍රියාමාර්ගය වැරදි බව විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් වශයෙන් අපි කියන්නට ඕනෑ. ධනවත් අයට අක්කර දහස් ගණන් දුන්නා. එසේ කළ අතරම ඔවුන් ආදායම් බද්දෙනුත් නිදහස් කළා. ඒවායේ තිබෙන වටිනා ලී දඬු විකුණා ගන්නටත් වැඩ පිළිවෙළ යෙදුවා. ලොරි ජීප් ආදිය ගන්නටත් ආධාර දුන්නා. රටේ අද තිබෙන වටිනාකම අනුව ලොරි වැසියකින් හා ජීප් රථයකින් රුපියල් පනස් දාහටත් හැට දාහටත් අතර ගණනක ලාභයක් තිබෙනවා. එතනින් එන ලාභයෙන් ටිකකුත්, ලී දඬු විකිණීමෙන් ගන්නා ලාභයෙන් ටිකකුත් ආදායම් බදු නිදහසේ වාසියෙන් ටිකකුත් යොදා ඔහු යම් වැඩ කොටසක් කරනවා ඇති. ඒ සියල්ලම එයට යොදන්නේ නැහැ. ආත්මාර්ථයෙන් තොර පරාර්ථයක් නැතෙයි කියනවා. බුදුන්වහන්සේත් තමන් නිවන අවබෝධ කරගෙනයි අනුනට කිව්වේ. ඒ අයත් ලබන ලාභයෙන් කොටසක් ගොවිතැනේ දියුණුවට යොදනවා ඇති. එහෙත් ලාභය සම්පූර්ණයෙන්ම ඒ සඳහා යොද වන්නේ නැහැ. එය ආදායම් එන මාර්ගයක් නොවන නිසා යොදවන්නෙ නැහැ. දැන් ගෙන යන ක්‍රමය නම්, ලැබෙන ලාභයෙන් කොටසක් තමන්ගේ ප්‍රයෝජනයට යොදාගෙන ඉතිරියෙනුත් ටිකයි ඒ සඳහා යොදවන්නේ. ඒ නිසා අනාගතයේදී ආහාර අතින් මේ රට ස්වයංපෝෂිත කිරීමට එය රුකුලක් වන්නේ නැහැ. එය තාවකාලික පිළියමක් පමණයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කම්කරුවන් ආදි අය ගැන අපි සිතා බලමු. මේ රජය අද කම්කරුවාටත් සැහෙන පහරක් ගසා ඇති බව නොකියාම බැහැ. රුපියල බාල්දු කිරීම නිසා පිරිමි කම්කරුවකුගේ පඩිය සත 55 කින් කපා සත 28 කින් වැඩි කළා. රුපියල බාල්දු කිරීම නිසා ඒ කම්කරුවාගේ වැටුපෙන් කැපූ ප්‍රමාණයට සමාන මුදලක් වැඩි කළේ නැහැ. තේ, රබර් ආදී වතු කම්කරුවන් ගැන වුවත් එහෙමයි. මේ ආණ්ඩුව බලයට පත්වුණාට පසුව මේ රටේ ගොවියාත් කම්කරුවාත් යන දෙදෙනාම ඉතා අමාරුවෙනුයි ජීවත් වන්නේ. හෙට දරුවන්ට කන්න දෙන්නේ කොහොමද කියා ලොකු වේදනාවකින් හා බියකින් ඔවුන් ජීවත් වන්නේ. ඒ බව මේ අවස්ථාවේදී කිය යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගොවිතැන් දියුණු කිරීමටය කියා විශාල වශයෙන් ඉඩම් තිබෙන අයට ට්‍රැක්ටර් ගෙන්වා දී තිබෙනවා. පැල්මඩුල්ල ආසනය තුළ නම් වී ගොවිතැන දියුණු කිරීම සඳහා රජයේ දෙපාර්තමේන්තුවක් මගින් හෝ ට්‍රැක්ටර් කොම්පැනියක් මගින් හෝ පුද්ගලයන්ට ට්‍රැක්ටර් ලබා ගැනීමට වැඩ පිළිවෙළක් යොදා නැහැ. හම්බන්තොට පැත්තේ ගොවිතැන් දියුණු කිරීමට ගෙනැවිත් දී ඇති ට්‍රැක්ටර් යන්ත්‍ර පහක් ඒවායේ නගුල් එහේ දමා ඇවිත් ලී ඇදීම, පස් ඇදීම වැනි දේවල් කරනවා. අන්න ඒ විධියටයි ගොවිතැන දියුණු කරන්නේ.

නියෝජ්‍ය කථානායකතුමනි, අපේ දරුවනුයි, අපට තිබෙන ලොකුම වස්තුව. ඒ ළදරුවන්ට දෙන කිරි පිටිවල හිඟය දැන් ඩිංගක් මගහැරී ඇති බව ඇත්ත. එහෙත් කිරි පිටිවලින් පමණක් ළදරුවන් පෝෂ්‍ය කරන්නට පුළුවන්කමක් නැහැ. ළදරුවන්ට මාස 7-8 ක් ගත වන විට ඝන ආහාර දෙන්න ඕනෑ. පසුගිය ආණ්ඩු කාලයේ ඒ ඝන ආහාර ද්‍රව්‍ය සුලභව තිබුණ නමුත් දැන් ඒ ආහාර ද්‍රව්‍ය වෙළෙඳ පොළේ නැහැ. ඒවා කොළඹත් නැහැ; වෙන පළාත්වලත් නැහැ. එම නිසා ඒ ප්‍රශ්නය ගැන රජය සැලකිලිමත් විය යුතුයි. ළදරුවන්ට දෙන්න ආහාර නැතිව මවුවරුන් තැවෙනවා නම්, පාලක පක්ෂය ඊට වගකිව යුතුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගම් සභා මඟින් ළදරු කිරි ආහාර බෙදා දීමේ සිරිතක් තිබුණා; අදත් පවතිනවා. බෙදා දීම සඳහා දැන් ඒවාටත් කිරි ආහාර ද්‍රව්‍ය වුවමනා තරම් ලැබෙන්නේ නැහැ. ගම් සභා අවශ්‍ය කිරි ආහාර ද්‍රව්‍ය පසුගිය කාලයේදී ගත්තේ කොම්පැණිවලින්. එහෙත් පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් ලැබුණු නියෝගයක් අනුව, ගම් සභාවලට අවශ්‍ය කිරි ආහාර ද්‍රව්‍ය ජාතික කිරි මණ්ඩලයෙන් ගන්නට සිදු වුණා. අද ජාතික කිරි මණ්ඩලයෙන් පිටි රාත්තල් 1,000 ක් ඉල්ලුවාම ලැබෙන්නේ 150 යි. ඉතින් කොහොමද, නියම විධියට බෙදන්නේ? එම නිසා, මවුවරුන් ගම් සභා ළඟ පෝළිම්වල රස්තියාදු වී හිස් අතින් ගෙදර යනවා. ඒ තත්ත්වය හේතුකොටගෙන, පැල්මඩුල්ල ගම් සභාව මාස දෙකකින් කිරි ආහාර බෙදුවේ නැහැ. මා මේ ගැන ටැලිෆෝන් මඟිනුත්, ලිපි මඟිනුත්, ජාතික කිරි මණ්ඩලයට දැනුම් දුන්නා. අවශ්‍ය ප්‍රමාණයට ජාතික කිරි මණ්ඩලයෙන් කිරි ආහාර ද්‍රව්‍ය නොලැබෙන නිසා, තම ළදරුවන්ට ලුණු කැඳ දෙන්න අද ඒ පැත්තේ මවුවරුන්ට සිදු වී තිබෙනවා. ඇත්ත වශයෙන්, ගම් සභා මඟින් කිරි ආහාර බෙදා දීම දුප්පත් මවුවරුන්ට ලොකු සහනයක්. බොහොම අමාරුවෙන් ජීවත් වන ගමන් කිරි ආහාර මිල දී ගැනීමට ඒ දුප්පත් මවුවරුන්ට පුළුවන්කමක් නැහැ. ගම් සභා මඟින් බෙදන කිරි ආහාර වලින් ඒ මව්වරුන් තම දරුවන් නඩත්තු කරන්නෙත් බොහොම අමාරුවෙන්. තත්ත්වය එසේ තිබියදී, මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ, ගම් සභා මඟින් නොමිළයේ කිරි ආහාර බෙදා දීමේ ඒ වැඩ පිළිවෙළටත් බාධා පැමිණ තිබෙන බව කණගාටුවෙන් කිව යුතුව තිබෙනවා.

අපි සවස තේ බොන වෙලාවට මොනවා හෝ කැවිලි තුන හතරක් කා, කිරි තේ එකකුත් බොනවා. එහෙත් අපේ ගම්බද මිනිසුන්—ගොවියනුත්, කම්කරුවනුත්—අල්ලට සීනි ටිකක් ගෙන කහට ඩිංගක් බොනවා. එහෙත් අර දුප්පත් ළදරුවන්ට—අනාගත පුරවැසියන්ට—දෙන්නට කිරි ආහාර නැතිවාත් හැරෙන්නට, කොත්තමල්ලි ටිකක්වත් දෙන්න නැහැ. ඇත්ත වශයෙන්ම පාලක පක්ෂය මේවාට වගකිව යුතුයි. මේවා ගැන මේ ගරු සභාවේදී අප මතක් කළ යුතුයි. උපදින්න ඉන්න එකා වඳ පෙති දී නැති කළත්, උපන් එකාවත් හදා ගන්න ඕනෑය කියන හැඟීමක් දරුවන් ඇති දෙමාපියන් තුළ තිබෙනවා.

ඊළඟට, සමුපකාර ව්‍යාපාරය ගැනත් ඩිංගක් හිතා බලන්න ඕනෑ. අද සමුපකාර කඩවල තිබෙන්නේ මොනවාද? නිකම් දෙන හාල් ටිකත්, සීනි ටිකත්, බත්කිසි ටික හා තරාදි පඩි ටිකත් පමණයි. අද සමුපකාරයත් ඒ තත්ත්වයට පත් වී තිබෙනවා. මේ රජය සමුපකාරයටත් වඳ පෙති දී තිබෙනවා. අළුතින් එකක්වත් හැදෙන්නේ නැහැ. තිබෙන සමුපකාරයටත් මාන්දම. ස. තො. ස. ගබඩාවල බඩු නැහැ. පෝළිම් නැති කරන බවට දුන් පොරොන්දුව ඉෂ්ට කර තිබෙන බව ඇත්ත. මා කියන්නේ, පැල්මඩුල්ලේ ස. තො. ස. ගැනයි. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශවල ස. තො. ස. ගබඩාවල බඩු තිබෙනවා නම්, මේ රජය සාධාරණව ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු නොකරන බව මා කියනවා. පැල්මඩුල්ලේ ස. තො. ස. ගබඩාවල බඩුත් නැහැ; පෝලිමුත් නැහැ. අද හැම සමුපකාර කඩයක්ම ගෙන යන්නේ, පාඩුවටයි. නමුන්නාන්සේගේ ආසනය තුළත් සමුපකාර සමිති තියෙනවා නම් සෝදිසි කර බලන්න. අනික් ගරු මන්ත්‍රීවරුන්ගේ ආසන තුළත් සමුපකාර සමිති තිබෙනවා නම් ඒවා ගැනත් සෝදිසි කර බලන්න. ඒ සමුපකාර සමිති ගෙන යන්නට සිදු වී තිබෙන්නේ පාඩුවටයි. සේවකයන්ගේ පඩි ගෙවන්නට තරම්වත් වෙළඳාමක් ඒවායේ නැහැ. මේ රජය ගෙන යන වෙළඳ ප්‍රතිපත්තිය උඩ සමුපකාරය සඳහටම නැති වන තත්ත්වයක් ඇති වේගන එන බව මේ ගරු සභාවේදී කල් ඇතිව දැනුම් දීම අපේ යුතුකමක් වී තිබෙනවා.

මට ප්‍රථම කථා කළ ගරු මන්ත්‍රීවරුන්ගෙන් රට ලූනුවල, රතු ලූනුවල තත්ත්වය ගැන කියවුණා. මා ඒ ගැන කියන්නට අදහස් කරන්නෙ නැහැ. රජයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ධර්මදාස මයා.]
ආරෝග්‍යශාලාවල අද බොහොම ලොකු බෙහෙත් හිඟයක් තියෙනවා. හුඟක් ලෙඩුන්ට පිට කඩවලට ගිහින් බෙහෙත් ගෙනැවිත් දෙන්නට සිදු වී තිබෙනවා. රත්නපුරේ, කහවත්ත ආදි තැන්වල එසේ කරන්නට සිදු වී තිබෙනවා.

මේ රජය ආහාර අතින් රට ස්වයම් පෝෂිත කිරීමට කටයුතු කරනවාය කිය නවා. ආහාර වගා ව්‍යාපාරය ගැන ආණ්ඩු පක්ෂයේ අය බොහොම ලොකුවට වර් ණනා කරනවා. මා කියන්නේ ඒ අය ගේ දර්ශනය වැරදි බවයි. සෑම ගම්බද මනුෂ්‍යයකුම ආරෝග්‍යශාලාවට යන්නේ ලෙඩ සනීප කරගෙන එතැනින් පිට වී එන්නයි. ආරෝග්‍යශාලාවල ජීවිතයත් මරණයත් අතර සටන් කරන ලෙඩුන්ට අද බත් වේලක් දෙන්නට පුළුවන්කමක් නැහැ. මේ රජය 1970 වන විට ආහාර අතින් මේ රට ස්වයම්පෝෂිත කිරීමට ලැස්තිලු සංඛ්‍යා ලේඛන නම් ඕනෑ තරම් ඉදිරිපත් කරනවා. ඒ සංඛ්‍යා ලේඛන සියල්ලක්ම වැරදියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපත් සංඛ්‍යා ලේඛන එකතු කළ නිලධාරීන් කොටසක්. මේ රජයෙන් පලි ගන්නට ප්‍රථම අපත් සංඛ්‍යා ලේඛන එකතු කළා. සංඛ්‍යා ලේඛන එකතු කරන මණ්ඩල යක දිස්ත්‍රික් සභාපති වශයෙනුත් මා කටයුතු කළා. සංඛ්‍යා ලේඛන එකතු කරන හැටි අප දන්නවා. නොයෙකුත් නිලධාරීන් තමන්ගේ ලොකුකම පෙන්වී මට, තමන්ගේ කෙරුවාව පෙන්වීමට, හිතින් මවා ගත් සංඛ්‍යා ලේඛනයි, දෙන්නේ. ඒවායින් මැනගෙන, යම්කිසි රජයක්, මේ රට ස්වයම්පෝෂිත කරන වාය කියනවා නම්, එය වැරදි බව අප මතක් කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික සේවා ක්‍රමයක් ඇති කරන්නට යනවාය කියාත් රාජාසන කථාවේ කියවුණා. ගොවි හමුදාවට වූ දේ ගැන අප දන්නවා. අද ගොවි හමුදාවට 100 ක් බඳවාගෙන යනවා නම් ලබන මාසයේ මේ දවස වන විට 40 ක් ගිහින්. අනාගතයේදී ඇති කරන්නට යන ජාතික සේවා තරුණ හමුදාවටත් ඒ ඉරණමම අත් නොවන ලෙස රට ජාතිය ගැන කැක්කුමක් ඇති වන විධියේ අව බෝධයක් ඒ අයට දෙන්නට ඕනෑ. ඒ අයට ගරුසරුකමක් නොදක්වා, වහලුන් ගෙන් වැඩ ගන්න අන්දමට ඒ අයගෙන් වැඩ ගැනීමට ඉදිරිපත් නොවන ලෙස නිලධාරීන්ට උපදෙස් දෙන්නට ඕනෑ. ආණ්ඩු පක්ෂයේ අයට පමණක් නොව විරුද්ධ පාර්ශ්වයේ අපටත් මේ රට දියුණු කිරීම ගැන කැක්කුමක් තිබෙනවා. ජාතික සේවා ක්‍රමය හරියාකාර යෙදුවොත් එය සෑහෙන පිළියමක් වන්නට පුළුවන්. ඒ තරුණ තරුණියන් වහලුන් වශයෙන් සැලකෙන අන්දමට ඉහළ සිටින නිලධාරීන්ගෙන් කටයුතු නොකෙරෙන ආකාරයට වග බලා ගන්නවා ඇතැයි අප බලාපොරොත්තු වෙනවා.

වලවේ යෝජනා ක්‍රමය ගැන වත්තේගම ගරු මන්ත්‍රීතුමා (වීරකෝන් මයා.) සඳහන් කළා. වලවේ යෝජනා ක්‍රමය සම්පූර්ණ කරල ඉවරය කිව්වා. ඔව්, බැම්ම බැඳලා, වතුර පුරවලා ඉවරයි. දැන් වතුර ආපසු ගඟට යනවා. ඊට වඩා කෙරුවාවක් වලවේ යෝජනා ක්‍රමයේ නැහැ. ඒ වතුරෙන් ගොවීන්ට ප්‍රයෝජනයක් නැහැ. ඒ ව්‍යාපා රය හරියට ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒකයි, එතැන තිබෙන වැරැද්ද.

අවසාන වශයෙන් රටසභා ක්‍රමය ගැනත් වචනයක් කින්නට ඕනෑ. මේ සම්බන්ධ යෙන් අපට කියන්නට තිබෙන්නේ ජාති වාදය මතු කර යම් කිසි ප්‍රශ්නයක් විසඳන්නට එන අයට ඉඩ දෙන්නට අපට බැරි බවයි. මේ රටේ සිටින සිංහල, දෙමළ, මුස්ලිම් සහ බර්ගර් යන සෑම ජාතින්ටම සහෝදරයන් මෙන් ජීවත් වන්නට පුළුවන්කම තිබෙන්නට ඕනෑ. ජාතිවාදය මතු කරගනිමින් මේ රටෙන් කොටසක් වෙන් කර ගන්නට යම් කිසි කොටසක් උත්සාහ කරනවා නම් මේ රටේ මහ ජාතිය වන සිංහලයන්ට කවදාකවත් ඊට ඉඩ දෙන්නට පුළුවන්කමක් නැහැ. අප නම් ජාතිවාදය මතු කරන්නේ නැහැ. මේ රටේ සිංහල ප්‍රදේශයන්හි පොලීසිවල, ආරෝග්‍යශාලාවල වෙනත් නොයෙකුත් දෙපාර්තමේන්තුවල සේවය කරන ද්‍රවිඩ මහතුන් ඉන්නවා. පෙඩරල් පක්ෂය රටෙන් කොටසක් වෙන් කර දෙන ලෙස ඉල්ලා, ඊට පසුව ඒ ඉල්ලීම ඉෂ්ට කර ගෙන, සිංහලන්ට ඒ වෙන් කර ගත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොටසේ පදිංචි වන්නට බැරි යයි කීවොත් මතු වන තත්ත්වය මොකක්ද? ද්‍රවිඩ ජාතිකයන්ට සිංහල ප්‍රදේශවල රක්ෂා දෙන්නට බැරි යයි ඊට පසුව අපත් කීවොත් සිංහල ප්‍රදේශවල රක්ෂාව කරන ඒ ද්‍රවිඩ මහත්වරුන්ට උතුරු නැගෙනහිර ප්‍රදේශවලට ගොස් රක්ෂා සොයා ගන්නට පුළුවන්ද? බැහැ. ඒ නිසා මේ ජාති භේද වාදය අමතක කර දමා අප කවුරුනුත් සහෝදරයන් වශයෙන් ජීවත් වන්නට උත්සාහ කළයුතුයි. යම්කිසි පක්ෂයක් ජාතිවාදය මතු කර අර විධියේ ඉල්ලීම් ඉදිරිපත් කරනවා නම් කිසි සේත්ම ඊට ඉඩ දිය නොහැකි බවත්, ඊට විරුද්ධ බවත් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 6.46

**එම්. අබ්දුල් බකීර් මාකර් මයා.** (බේරුවල)

*(திரு. எம். அப்துல் பாக்கிர் மாக்கார்—வேருவலை)*

(Mr. M. Abdul Bakeer Markar—Beruwala)

Mr. Deputy Speaker, I was very happy, listening to the concluding portion of the speech of my hon. Friend, the Member for Pelmadulla, (Mr. Dharmadasa) that, consciously or otherwise, he was advising all of us to keep ourselves away from communalism because he felt that that hydra-headed monster, if permitted to start on its rampage, will cause endless destruction in this country. I like to ask him: If you are sincere in your remarks, if you are really anxious to see that all communities in this country live in amity and harmony, in the first instance, let your sermon be preached in your own quarters, and see to it that your own leaders are educated to give up this fight to make this country a country that belongs to one community, namely, the Sinhalese. I might also point out to the hon. Member that at no time has this National Government laid emphasis on safeguarding the interests of one particular community or doing any harm to another.

I might also ask the hon. Member for Pelmadulla: What has been your fight against the proposal to set up district councils? If you want the Sinhalese Buddhists, the Hindus, the Muslims, the Christians, and the rest of them, to live as members of one family, then why go about hawking communalism in areas where the Sinhalese Buddhists are in the majority? The National Government has always stood for communal amity. The National Government has always regarded every citizen of this country, regardless of the religious or racial group to which he belongs, as having equal rights.

Now, I might ask the hon. Member: Can you not trace back the history of your own party in this matter? Are you not aware that the Sri Lanka Freedom Party came into power by fanning communalism in this country, by raising communal issues. The only way by which you can win popularity in a country where the masses are not politically conscious and where the people regard themselves as belonging to a particular caste or community or group is by appealing to the majority community. Although multi-racial, in Ceylon the communities are not equally divided. The majority in this country are the Sinhalese Buddhists, and where counting of heads is regarded as a matter of democracy people who are anxious to get that democratic power emphasize that aspect and do their best to win over the community that commands the majority. If the hon. Member will trace back the history of the S. L. F. P. he will find that their coming into power has been due to their emphasizing the rights of the majority and trying to win them over

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අබ්දුල් බකීර් මාකර් මයා.]

at every turn. That has never been the policy of the United National Party.

ටී. බී. සුබසිංහ මයා. (කටුගම්පොළ)
(திரு. ரீ. பி. சுபசிங்க—கட்டுகம்பொள)
(Mr. T. B. Subasinghe—Katugampola)

What did your people do in 1958? Your papers said, "Kill and burn".

අබ්දුල් බකීර් මාකර් මයා.
(ஜனுப் அப்துல் பாக்கீர் மாக்கார்)
(Mr. Abdul Bakeer Markar)

I do not know whether the hon. Member remembers the history of this country. It is the party to which the hon. Member belongs that said, "Kill and Kill". And what was the result? Was it not his own bereaved leader who in 1958 went about the country preaching communalism?

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)

It was your people who did that.

අබ්දුල් බකීර් මාකර් මයා.
(ஜனுப் அப்துல் பாக்கீர் மாக்கார்)
(Mr. Abdul Bakeer Markar)

It was the late Mr. Bandaranaike who did that, broadcasting speeches, publishing certain information in the press, and adopting every means that disturbed communal amity in this country. The hon. Member's memory is short-lived. Does he remember the blood bath in Sri Lanka in 1958? I am afraid that the hon. Member, without knowing the true history of this country, is trying to pass the baby on to somebody else. Never has the United National Party preached communalism. It remains as the party which has united together all communities in this country, and for that credit must go to the late lamented Father of the Ceylonese Nation who was in fact anxious to see that he brought all communities together, and that in setting up a government all communities would have a hand in ruling this country. I think that the hon. Member, while going through the history of the period 1958, must have suffered from some kind of hallucination. Otherwise, I cannot understand that remark. Whatever that may be, let us now come back to the Throne Speech Debate.

If hon. Members of the Opposition will only bear with us and try to assess the situation in which this country was during the period 1963-64, they will not talk in the terms in which they are talking today. You may remember, Mr. Deputy Speaker, that in 1964 this country was heading for an economic disaster. The people were up in arms, as happened in France long years ago. In fact, they wanted to liberate themselves from the oncoming disaster, for they found that day by day things were becoming worse and worse and that the economic prospects were bleak. Because of these chaotic conditions they wanted a change of government in this country. We remember very well those days when the general public had to collect round the C. W. E. stores. When the Sinhalese New Year or any festive occasion was approaching, the people, in order to get their requirements, be it foodstuffs, textiles or anything else, had to queue up from 10 o'clock the previous night or from the early hours of the morning in front of the C. W. E. shops which opened at 9 A.M. That was the way the last Government treated the people. Scarcities were created by them, and queues were the order of the day.

Let hon. Members of the Opposition remember that once the National Government came into power they have made arrangements to see that the requirements of foodstuff and other essential goods are made available to the consumer at the point at which he is. The people do not experience the same difficulties now as in the past.

Hon. Members of the Opposition talked about the scarcity of certain food items. It is best to remember that we are living in a country that is

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

advancing, where the conditions of living are improving, where the population is growing. With the growth of population and with the improvement of the living conditions of the people there is a great demand for better things. As a result of improved facilities available for agricultural activities the villagers are getting more and more money into their hands. With what result? More money means improvement in the conditions of living of the people, and their demands will become greater and they will want more goods and services. Those people who were once satisfied with lower quality foodstuffs, or even lower quality milk foods, will want to buy something better. People want to buy more goods because they have more money in their hands. Naturally, in such a society the demand will tend to be greater, and that demand will cause scarcities. That is the reason why there are scarcities. Though it is so, credit must be given to the National Government for distributing well whatever goods they have. The hon. Member for Pelmadulla made a fair comment. He said that there was a scarcity of milk foods, that they were getting a small quantity of milk foods, and the people wanted more and more milk foods. Like Oliver Twist they keep on asking for more. What we must remember is that, however much goods may be available there will always be a demand for more as the conditions of living of the people improve.

I think if hon. Members of the Opposition would care to study the Throne Speech carefully they will find the answer in the very first paragraph to all the questions that they raised. This is what it says:

> " .... There was already a difficult situation on the economic front when it assumed office in 1965. This situation was aggravated by a marked deterioration in the world prices of our major exports, particularly during 1966 and 1967. Our foreign exchange earnings through exports in 1966 and 1967 were Rs. 240 million and Rs. 285 million respectively, below the level attained in 1965." [OFFICIAL REPORT, 7th July 1968; Vol. 79, c.35.]

So, the answer is that our exchange earnings had dropped by Rs. 240 million in 1966 and by Rs. 285 million in 1967. Naturally our imports had to be restricted. As a result of import restrictions there was a scarcity of goods.

In spite of those difficulties the National Government has met the wants of the people in respect of certain goods.

I do not know whether it is necessary for me to dwell upon the long-sighted policies followed by the Hon. Prime Minister. We remember last year and the year before that when the Hon. Prime Minister made known his intention to strengthen the food drive, when he said that he would take steps to see that the country would soon be self-supporting in its food requirements, Members of Opposition stood up in their numbers and attacked the Government and called the Hon. Prime Minister by all sorts of names. They charged the Government with wasting money on schemes that would never materialize. But now the food drive launched by the Hon. Prime Minister has produced results. We find that we are coming closer to the goal of self-sufficiency in rice. Those Members who criticized the Hon. Prime Minister then and who said that the schemes launched by him would never materialize, are now singing a different tune. Though they have not stated so within the four walls of this House, they have when facing the farmers in their numbers stated that they are supporting the Government in its food drive and in its attempt to improve the lot of the farmers.

It is clear that before long Ceylon is going to be self-supporting in the matter of food. The time is not far off when we will be the Granary of the East under the leadership of our Prime Minister. As in the days of Parakrama Bahu the Great, so under the regime of Dudley Senanayake, soon Ceylon will be not only the Granary of the East but even more than that.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Having focussed our attention on agriculture, greater attention is being paid to industrialization. In that direction too we have taken a sufficient number of steps. Certain schemes have been launched. If all these schemes are successfully implemented even in the matter of industry Ceylon will be self-supporting.

I shall quote only one example. Let us, for instance, take the textile industry. There was a time when we suffered due to the shortage of textiles. One hon. Member by his conduct proved to the country that there was a shortage of textiles. Now that was the situation in the country at the time the S. L. F. P. was in power. Does that situation exist now ? Are we not to a very large extent self-sufficient or self-spporting in the matter of textiles ? Are we not producing our requirements of textiles ? At one time it was not the usual handloom textiles that people went for. They were prepared to take any imported textiles that were available. There is always the anxiety of the people to wear something better and to have more and more imported varieties of textiles. It will not be long before we can see our factories producing quality goods. Judging from the quality of goods that our factories are manufacturing the people of this country will have luxurious clothing produced in Ceylon to adorn them.

I would say this to the Opposition Members. You ruled this country for nine years. In the course of those nine years you wasted all the foreign exchange available to the country. In the course of those long nine years what actually did you do in order to improve the conditions of the people of this country ?

I ask hon. Members of the Opposition : if you are really patriotic, if you are really national-minded, if you really feel that we have blundered, tell us where we have erred ; tell us where our mistakes lie ; tell us how we can improve and how we can mend. We only see hon. Members of the Opposition rising up and uttering some words that will catch the ears of the masses and will be flashed in the newspapers the following day. Besides that have you given us any constructive schemes ? Have you made any alternative suggestions ? If you are really patriotic, please tell us how we could improve the economic conditions in this country. You do not do that.

As it has happened in the past, they are good only as platform speakers. They are only good at creating a certain mentality in the people. As the Hon. Prime Minister has always stated, they are good at only creating enmity and hatred in the minds of the people ; they are clever at that. But where constructive work is concerned, where nation building is concerned, they have been found wanting and the people rejected them. The people by their votes have shown in abundant measure that the S. L. F. P. had no policy ; that the S. L. F. P. have not got the brains, nor the wherewithal to improve and develop this country.

I think the masses have confidence in the National Government, the masses have confidence in the leadership of the Hon. Dudley Senanayake, the Prime Minister of the National Government, and that confidence will continue.

By 1970 your district councils propaganda will have failed ; your propaganda on the economic conditions will have failed. The country is improving economically, the country is forging ahead. I would ask the Members of the Opposition to remember that in 1970 the masses will once again back the National Government and we will be here in larger numbers. Conditions in the country will improve.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 7.10

**කේ. වයි. එම්. විජේරත්න බණ්ඩා මයා.** (සොරනාතොට)

*(திரு. கே. வை. எம். விஜேரத்ன பண்டா—சொரணத்தோட்டை)*

(Mr. K. Y. M. Wijeratne Banda—Soranatota)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බේරුවල ගරු මන්ත්‍රීතුමාගේ (අබ්දුල් බකීර් මාකර් මයා.) කථාවට පසුව රාජාසන කථා විවාදයට සහභාගිවීමට ලැබීම ගැන මා සතුටු වෙනවා. පැල්මඩුල්ලේ ගරු මන්ත්‍රීතුමාට (ධර්මදාස මයා.) පිළිතුරු වශයෙන් බේරුවල ගරු මන්ත්‍රීතුමා කියා සිටියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පළමුවෙන් ජාති භේදවාදය පටන් ගත් බවයි. ඇත්තෙන්ම බේරුවල ගරු මන්ත්‍රීතුමාට ටිකක් මුල අමතක වෙලා යයි මා කල්පනා කරනවා. දැන් එතුමාට අලුත් කල්පනාවක් ඇවිත් වාගෙයි. එතුමා ඒ විධියට කථා කෙළේ ඒ නිසයි. 1956 දී මහජන එක්සත් පෙරමුණු රජය බලයට පත් වුණායින් පසු අද තිබෙන්නාක් මෙන් රටසභා පිළිබඳව මුළු රට පුරාම ආන්දෝලනයක් ඇති වුණා. එක්සත් ජාතික පක්ෂය කොළඹ සිට මහනුවර දක්වා පයින් ගමන් කරන්නට පටන් ගත්තේ ඒ කාලයේයි. "මරව්, මරව්; කොටව්, කොටව්" යනාදී වශයෙන් "සියරට" පත්‍රය මාර්ගයෙන් මහජනයා උසි ගැන්නුවේත් ඒ කාලයේයි. ඔය ප්‍රශ්නයේ ඉතිහාසය පටන් ගත්තේ ඔය විධියටයි. එහෙත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජාති භේදවාදය අවුස්සනවා යයි දැන් කියනවා. ජාති භේදය ඇවිස්සීමේ මූලාරම්භකයන් සිටින්නේ විරුද්ධ පාර්ශ්වයේ නොව ආණ්ඩු පාර්ශ්වයේ බව ඒ ගරු මන්ත්‍රීතුමා පිළිගත යුතුයි. අප ජාති භේදවාදයේ මූලාරම්භකයන් යයි හැඳින් වීම වැරදියි.

**අබ්දුල් බකීර් මාකර් මයා.**

*(ஜனாப் அப்துல் பாக்கீர் மாக்கார்)*

(Mr. Abdul Bakeer Markar)

එදත් අදත් එහෙමයි.

**විජේරත්න බණ්ඩා මයා.**

*(திரு. விஜேரத்ன பண்டா)*

(Mr. Wijeratne Banda)

නැහැ. ඒක වැරදි අදහසක්. අප අද කියන්නේ මේ රටේ ඒකීය ආණ්ඩුවක් තිබිය යුතු බවයි. අප විරුද්ධ වන්නේ ෆෙඩරල් වාදයට මිස ද්‍රවිඩ ජනතාවටවත් මුස්ලිම් ජනතාවටවත් නොවෙයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කිසි දවසක ඒ ජාතීන් දෙකට විරුද්ධ නැහැ. එදා නම් අපේ පක්ෂයේත් ජාතිවාදී කොටස් හිටියා. ද්‍රවිඩයන්ගේ හම්වලින් සපත්තු මැසීමට බලාපොරොත්තු වුණු ජාතික විමුක්ති පෙරමුණ ඒ කාලයේ අපත් සමග හිටියා. එහෙත් දැන් ඒ උදවිය සිටින්නේත් ආණ්ඩුව සමගයි. එතකොට මේ රටේ ඇති ජාතිවාදී පක්ෂ දෙකම දැන් තිබෙන්නේ මේ පැත්තේ නොව ඔය පැත්තේයි. ඒ නිසා මින් පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ජාතිවාදී චෝදනාව ඉදිරිපත් කරන්නට බැහැ.

ඊ ළඟට අපි මේ රාජාසන කථාව පිළිබඳව ටිකක් කල්පනා කර බලමු. රාජාසන කථාවකින් බලාපොරොත්තු වන්නේ අවුරුද්දක් ඇතුළත කරන වැඩ පිළිවෙළ පිළිබඳව කරන විස්තරයක් පමණයි. එහෙත් මෙහිදී අපට ඉතාමත් වැදගත් වන්නේ මේ ආණ්ඩුව බලයට පත් වින්නට කලින් මහජනයාට දුන්නා වූ පොරොන්දු රාශියක් ගැන ටිකක් විමසා බැලීමයි. ඒ පොරොන්දු රාශිය පිළිබඳව මෙම විවාදය ආරම්භ කරමින් විරුද්ධ පක්ෂය වෙනුවෙන් කථා කළ කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා මේ ගරු සභාව ඉදිරියේ දීර්ඝ විස්තරයක් තබන්න යෙදුණා.

අපේ සංශෝධනයෙනුත් ඉදිරිපත් කර තිබෙන පරිදි ජීවන වියදම අඩු කිරීමට යම් පියවරක් නොගැනීම විශෙෂ වැදගත්ම කාරණය හැටියට අප පෙන්වා දෙන්න කැමතියි. 1965 මැතිවරණ කාලයේදී එතුමන්ලා කිව්වා, ජීවන වියදම අහස උසට නැග තිබෙනවාය, එම නිසා ජීවන වියදම අඩු කිරීමට කටයුතු කරනවාය කියා. එසේ නම් ජීවන තත්ත්වයේ නැඟීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේරත්න බණ්ඩා මයා.]

පිළිබඳ දැන් තත්ත්වය කුමක්ද? දැන් අහසත් ඉක්මවා ඔබ්බට ගිහින් ඇති බවයි අපේ හැඟීම.

උඩුවිල්හි ගරු මන්ත්‍රීතුමා (වී. ධර්මලින්ගම් මයා.) විසින් කරන ලද කථාවට මා ටිකක් ඇහුම්කන් දීගෙන සිටියා. එතුමා ලැයිස්තුවක් ඉදිරිපත් කරමින් බඩු මිල පිළිබඳ තත්ත්වය මේ මේ විධිය යයි කියන්න යෙදුණා. උඩුවිල් හි ගරු මන්ත්‍රීතුමාගෙන් මා අහන්න කැමතියි, දැන් ගුවන් විදුලි බැටරියක මිල කොපමණද කියා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
දැන් ගන්න නැහැ.

විජේරත්න බණ්ඩා මයා.
(திரு. விஜேரத்ன பண்டா)
(Mr. Wijeratne Banda)
බැරි වෙලාවත් කළුකඩයකවත් තිබුණොත් කීයකටද අපට ගන්න පුළුවන් වන්නේ කියා මා එතුමාට පැහැදිලි කර දෙන්නම්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවේ සහ සභාග ආණ්ඩුවේ සමයේදී බැටරියක මිල වූයේ රු. 14යි. අර උප්පැන්න සහතික ආදී කිසිත් ඕනෑ කෙළේ නැහැ; රුපියල් 14ට ගන්න පුළුවන්කම තිබුණා. ඊට පසුව තමුන්නාන්සේලා බලයට පත් වුණාට පස්සෙ රුපියල් 23 යි. ඒත් ඒ සඳහා ගුවන් විදුලි බලපත්‍රය අරගෙන යැමෙනුයි ලබාගන්නට පුළුවන් වුණේ. ඒ තත්ත්වය අද කොතෙක් දුරට ගිහින් තිබෙනවාද කියතොත්, රුපියල් 40 දක්වා එය නැඟ තිබෙනවා. බොහොම ස්ථානවල එහෙමත් නැහැ.

ඒ වාගේම සාමාන්‍ය මහජනතාවට වුවමනා කරන විදුලි පන්දම් බැටරියක ඒ කාලයේ මිල තමුන්නාන්සේට මතක ඇති ශත 40ක් පමණක් බව. සාමාන්‍ය වෙළෙන්දාගෙන් ශත 40කට ගන්න පුළුවන්කම තිබුණා. මා බොහොම කනගාටුයි දන්වා සිටින්න, අද සාමාන්‍ය ගම්බද පළාත්වල රු. 1.50 දක්වා මිල නැඟ තිබෙන බව. ඒ ගණනටවත් ගන්න ඇත්තේ නැහැ.

ඒ කාලයේ පැවති රෙදි හිඟකම ගැන උදාහරණයක් වශයෙන් බේරුවල මන්ත්‍රීතුමා කිව්වා, එක්තරා මන්ත්‍රීවරයෙක් අමුඩයක් ගසාගෙන පාර්ලිමේන්තුවට ආවාය කියා. මා පාර්ලිමේන්තුවට ආධුනික මන්ත්‍රීවරයෙක් වුණත් මා දන්න හැටියට නම්, අමුඩයක් ගසාගෙන පාර්ලිමේන්තුවට එන්න පුළුවන්කමක් නැහැ. සාමාන්‍ය ශිෂ්ට මනුෂ්‍යයෙකුට නම් කවදාවත් එන්න පුළුවන්කමක් නැති බවයි මගේ හැඟීම. කොහේදෝ පාරක අයිනේ විලි ලජ්ජා නැතුව අමුඩයක් ගහගෙන ඉදලා පින්තූරයක් පත්තරේ දමූ පලියට බේරුවල මන්ත්‍රීතුමා මේ ගරු සභාවෙ මතක් කරනවා, අමුඩයක් ගසාගෙන පාර්ලිමේන්තුවට ආවාය කියා. අපි නම් අහලා නැහැ, අමුඩයක් ගහගෙන මහජන ගැලරියටවත් එන්න පුළුවන්කමක් තිබෙනවාය කියා. එදා රෙදි හිඟකම ගැන පෙන්වා රෙදිවලින් ස්වයම්පෝෂිත භාවය පෙන්වීමට එතුමා එසේ ප්‍රකාශ කළත්, රෙදි පිළි පිළිබඳව අද තත්ත්වය මොකක්ද? එතුමන්ලා යාර දෙකක් කූපන් එකකට දීගෙන ආවා. දැන් කඩවලට ගිය විට කූපන්වලට කොහෙත්ම රෙදි නැහැ. තිබෙන රෙදි ගැන කඩවලින් විමසූවිට කියන්නේ, මේවා කූපන් නැතිව විකුණන රෙදිය, යාරයක් රු. 3.50 යි කියායි. එදා අපි බොහොම අමාරුවෙන් රෙදි කළු කඩයට යන්න ඉඩ නොදී, සාමාන්‍ය දුප්පත් ජනතාව හිරිහැරයකට පත් වන්නට ඉඩ නොදී, තමන්ට ඇඳීමට අවශ්‍ය රෙදි ටික සතොස සහ සමූපකාර වෙළඳසැල්වලින් ගන්නට අවස්ථාව සලසා තිබුණා. මේ ආණ්ඩුව බලයට පත්වීමෙන් පසුව ඒ තත්ත්වය නැති කර රෙදි හිඟයක් මවා පා, තිබුණු රෙදි ටිකත් සාමාන්‍ය වෙළෙඳුන් අතට දී, සමූපකාරය සම්පූර්ණයෙන් නැත්තටම නැතිවන තැනට කට යුතු කරගෙන ගියා. අද සමූපකාරය වැටී තිබෙන තත්ත්වය මට මේ අවස්ථාවේදී මතක් වෙනව. අද සමූපකාරවලට විකුණන්ට බඩුවක් නැහැ. අර කොළ පොතට දෙන තුණපහ ටික, මාසයට ලැබෙන ප්‍රමාණය පළමුවෙනි සතියෙදීම අරගෙන ඉවර වෙනව. ඊට පසුව විකුණන්ට දෙයක් නැහැ. මා මේ තත්ත්වය හොඳින් දන්නෙ සමූපකාර සමිති දෙකකම කටයුතු කරන නිසයි. රතු ලූනු බොම්බයි ලූනු වගේ දේවල් ඇහැටවත් දකින්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැහැ. එහෙත් මේ රටේ රතු ලූනු රාත්තලක් වවල එයින් හොණ්ඩර දෙකක් ලබා ගත් බව පසුගිය දවස්වල ප්‍රචාරය කළ විට පුදුමයෙන් වගේ මම අසාගෙන සිටිය. දෙයියෝ සක්කි! මෙතරම් දුරට ලූනුවලින් ස්වයංපෝෂිත රටේ හදිසියේ දෙබරෙක් ගැසූ කෙනෙකුගේ විෂ මුදව ගන්නට රතු ලූනු බිකක් එහෙම හොයා ගන්න වුවමනා වුණොත් සාමාන්‍ය නගරයක කඩයක් පාසා ඇවිද බැලුවත් රතු ලූනු බිකක් සොයා ගන්නට අමාරුයි. ඒ වුණත් ගුවන් විදුලියෙන් ප්‍රචාරය කළා, රාත්තලක් හිටුවල හොණ්ඩර දෙකක අස්වැන්නක් ලබා ගත්ත කියා. මම දන්න හැටියට යාපනය අර්ධ ද්වීපය රතු ලූනු වගාවට හොඳ ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයේ මේ ව්‍යාපාරය දියුණු කරගෙන ගියා නම්, ඒ විධියට රාත්තලකින් හොණ්ඩර දෙකකුත් ලැබුණ නම්, මේ රටට වුවමනා රතුලූනු ප්‍රමාණයත් ලබාගෙන ලූනු පිටරට යවා අපට විශාල විදේශ විනිමය ප්‍රමාණයකුත් ලබා ගන්ට පුළුවන්කම තිබෙන්නට ඕනෑ. එහෙත් තත්ත්වය මොකක්ද? "අර නැව නරක් වෙලා, ලූනු කුණුවෙලා. ගංවතුර ගළලා" ආදි වශයෙන් නොයෙක් ප්‍රචාරයන් කරනව. පසුගිය අවුරුද්දෙ යාපනය ප්‍රදේශයට ගංවතුර ගැලූ බවක් මට දැනගන්නට ලැබුණේ නැහැ. රටේ වෙනත් නොයෙකුත් ප්‍රදේශවලට ගංවතුර ගලා තිබේන බව මා පත්‍ර මගින් කියෙව්ව. එහෙත් රතු ලූනු හොඳින් හැදෙන යාපනය ප්‍රදේශයට මෑතකදී ගංවතුර ගැලූ බවක් මා පමණක් නොව රටේ කවුරුවත් දන්නෙ නැහැ. [බාධා කිරීමක්] සමහරවිට කියනව, රතුලූනු හිඟයක් පවතින්නෙ කෝච්චියක් පෙරලීම නිසාය කියා. තමන්ගේ නිදහසට මොකක් හෝ කරුණක් ඉදිරිපත් කළාට ඉස්සර වගේ නොවෙයි; දැන් මහජනතාව රවටන එක අමාරුයි. ප්‍රශ්නවලට උත්තර දෙන්ට පුළුවන් කැපිල යන්න. "තමුන්නාන්සේලා නේද, රට සභා පටන් ගත්තෙ?" ආදි වශයෙන් ප්‍රශ්නවලට උත්තර දෙන්ට පුළුවන්. එහෙත් ඒවා ඒ අවස්ථාවට මේ සභාවට පමණයි සීමා වෙන්නෙ. රටේ ජනතාව ඒව පිළිගන්නෙ නැහැ.

මම තමුන්නාන්සේට කෘෂිකර්මය ගැන නිදර්ශනයක් දෙන්නම්. මම ගම්බද ගොවියෙක්. මට උදැල්ලෙන් කොටන්ට පුළුවන්. නගුල අරගෙන හී හාන්නට පුළුවන්. ගොයම් කපන්නට පුළුවන්. ක්‍රමානුකූලව වී ටික ඉහින්නට පුළුවන්. මම කථා කරන්නෙ අංග සම්පූර්ණ ගොවියකු වශයෙනුයි. මා නියෝජනය කරන කොට්ඨාශයේ සියයට අනූවකට වැඩි ගණනක් සිටින්නෙ ගොවියොයි. මා නිතර ජීවත් වෙන්නෙ ගොවීන් සමඟයි. ඇත්ත වශයෙන්ම ගොවීන්ට සලසා තිබෙන සහන ගැන අහන විට පුදුම හිතෙනව. කුරක්කන් කපන විට හෝ පැළ සිටුවන විට හෝ කියන සිංදුවක් එහෙම වාදනය කරල "අපේ සටන ජාතික සටනයි" ආදි වශයෙන් ගුවන් විදුලියෙන් පටන් ගන්නව. අපි බොහොම සන්තෝෂයි මේ ක්‍රම ක්‍රියාවට නැඟෙනව නම්. මේ ප්‍රයෝජන හරියාකාරව ගොවීන්ට ලැබෙනව නම් අපි සන්තෝෂයි. මේ කියන විධියේ සහන අද ගොවීන්ට ලැබෙන්නෙ නැති බවයි මා පෙන්වා දෙන්නෙ. පැල්මඩුල්ලේ ගරු මන්ත්‍රීතුමා (ධම්දස මයා.) විසින් ඒ ආධාර ලැබෙන්නෙ ගොවියාටද, ගොවි මුදලාලිලාටද යන්න හොඳහැටි පැහැදිලි කළ නිසා මා ඒ පිළිබඳව දීර්ඝ විස්තරයක් කරන්ට යන්නෙ නැහැ.

අද සාමාන්‍ය ගොවියකුට උදැල්ලක් ලබා ගන්න පුළුවන්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මාස 3 කට විතර උඩදී මහියංගන ආසනයේ වියළුව කෝරළයේ සිට මා අඳුනන පුද්ගලයන් දෙදෙනෙක් බදුල්ලට ආව. ඒ ප්‍රදේශයේ සිට බදුල්ලට හැතැප්ම 15 ක් විතර තිබෙනව. ඒ උදවිය බදුල්ලට ඇවිත් උදැල්ලක් ගන්නට සොයන විට එක්තරා ස්ථානයක උදළු තිබෙන බව ඔවුන්ට ආරංචි වී උදැල්ලක් මිළදී ගන්නට ගිය අවස්ථාවේ ඒ සඳහා ග්‍රාම සේවක නිලධාරියකුගෙන් ලිපියක් අවශ්‍ය බව කියා තිබෙනව. ග්‍රාම සේවකගෙන් ලියුමක් ගෙනෙන්ට හැතැප්ම 15ක් ආපසු යායුතු නිසා ඒ උදවිය මා සිටි කාර්යාලයට ඇවිත්—ඒ කාලයේ මගේ කාර්යාලය තිබුණේ බදුල්ලෙයි.—මට කිව්ව, "අපට උදළු දෙකක් ගන්ට වුවමනාව තිබෙනව; එහෙත් ඒකට නැවත වරක් බදුල්ලට එන්න සිද්ධ වෙනව" කියා. කරුණාකරලා ලියුම් කැල්ලක් දෙන්නට පුළුවන්දැයි ඇහැව්වා. මගෙන් දෙන ලියමනකින් ප්‍රයෝජනයක් ඇද්දැයි මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේරත්න බණ්ඩා මයා.]

නොදන්නා බව මම ඒ උදවියට කිව්වා. මේ කාරණය සම්බන්ධයෙන් බල පාන රෙගුලාසි මොනවාදැයි මා නොදන්නා බවත්, මෙවැනි ලියමනක් ග්‍රාමසේවක නිලධාරි මහත්මයාගෙන් මිස මගෙන් ගෙන යැමෙන් වැඩක් විය හැකිදැයි නොදන්නා බව කියා ඒ අයගේ ඉල්ලීම අනුව මම ලියමනක් දුන්නා. මේ එන දෙන්නා මා හොඳට හඳුනන බවත්, අසුවල් ගමේ පදිංචිකාරයින් බවත්, ඒ අය ගොවියන් නිසා පුළුවන්කමක් තිබෙනවා නම් උදලු දෙකක් දෙන්නැයි ලියා දුන්නා. ලියමන දෙන අතරම මම ඒ දෙදෙනාගෙන් එක් ඉල්ලීමක් කළා. උදලු දෙක ලැබුණොත් කරුණා කර ඒ බව ආපසු ගෙදර යන ගමන් මට දැනුම් දුන්නොත් හොඳයි කියා මම ඒ අයට කිව්වා. ටික වේලාවකින් ඒ දෙන්නා මා ළඟට ආවා. කිසිම ශබ්දයක්, බද්දයක් නැතිව උදලු දෙකක් දුන්නායයි කිව්වා. අද තියෙන තත්ත්වය ඔකයි. මේවා බෙදා දීම ක්‍රමානුකූල නැහැ. විධිමත් වැඩ පිළිවෙළක් මෙවැනි කරුණු සම්බන්ධයෙන් නැතිකම නිසා අසරණ ගොවියන්ට හිරිහැර සිදු වෙනවා. ගොවියන්ගේ අවශ්‍යතාවන් අනුව කලට වේලාවට කරදරයක් හිරිහැරයක් නැතිව උදැල්ලක්වත් ලබා ගන්නට පිළිවෙළක් ඇති කර නැහැ. කොහේවත් නැති වෙළෙඳ සමාගමකට උදලු යවනවා, බෙදා දෙන්නට. ඒ අය ඒවා බෙදා දීම සම්බන්ධයෙන් නියම වැඩ පිළිවෙළක් අනුගමනය කරන්නේ නැහැ. දවස් තුනක් හතරක් යන විට උදලු නැහැ. විකිණිලා හමාරයි කියනවා. ගම්බද ගොවියාට උදලු ලබා දීමට මීට වඩා හොඳ වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑ. ටිකක් කල්පනා කර බැලුවා නම් පහසුවෙන් එය කෙරෙන්නට කටයුතු කරන්නට තිබුණා. මම ඒ මොකක්දැයි පැහැදිලිකර දෙන්නම්. සෑම ගමේම වාගේ මිනිසුන්ට තමන්ගේ සලාක හාල් ටික ලබා ගන්නට සමුපකාර කඩයක් තිබෙනවා. සලාක පොතක් තිබෙන අයට හාල් මෙන්ම වෙනත් දේත් ඒ මගින් ලබා දෙන වැඩ පිළිවෙළක් දැනටමත් ඇති බව තමුන්නාන්සේ දන්නවා. ගම්බද සමුපකාර කඩයට මේ උදලු ටිකත් ගියා නම් කිසිම කරදරයක් නැතිව ගම්බද ගොවියාට ඒවා ලබා ගන්නට පුළුවන්කමක් ඇති කරන්නට තිබුණා. කෝ, එවැන්නක් ගැන සැලකිල්ලක් දක්වා තිබෙනවාද? කිසිම සැලැස්මක් නැහැ. හරියාකාර ක්‍රියා කරන්නේ නැහැ. ඒ නිසයි මේවා දිගින් දිගටම සිදු වන්නේ.

ඊළඟට ඉඩම් සම්බන්ධයෙන් පවතින තත්ත්වය දිහා ටිකක් කල්පනා කර බලමු. මා දන්නා හැටියට, අද ගම්බද ඉඩම් නැති ගොවියාට ඉතාමත් තදබල අන්දමට හිරිහැර-කරදරවලට මුහුණ පාන්නට සිද්ධ වෙලා තියෙනවා. නිදර්ශනයක් මගින් මේ කාරණය පැහැදිලි කර දෙන්නට මට පුළුවනි. මීගහවල නමින් ගමක් කොහුවල ග්‍රාමසේවක කොට්ඨාශයේ තිබෙනවා. එහි කිරිබණ්ඩා නමින් ගොවි මහත්මයෙක් ඉන්නවා. ඒ මහත්මයා ගොවිතැනට බොහොම දක්ෂයෙක්. එහෙත් ගොවිතැන් කරන්නට ඉඩම් සෑහෙන ප්‍රමාණයක් නැහැ. බලහත්කාරයෙන් ඉඩම් අක්කර තුනහමාරක් අල්ලාගෙන කුඹුරක් අස්වද්දලා වැඩ කළා. ඒ වාගේම එහි කොටසක මිරිස් සහ වෙනත් එළවලු වර්ගත් වගා කර තිබෙනවා. නිලධාරීන්ගෙන් මේ ගැන විරුද්ධත්වය ඇති වුණා. අන්තිමේදී මේ කාරණය සම්බන්ධයෙන් දිසාපති තුමාත්, ආදායම් නිලධාරිතුමාත් සමග හැකිතාක් සාකච්ඡා කළා. වරදකරු කිරීමෙන් පසු දඬයක් ගැහැව්වොත් මේ අහිංසක ගොවියා කරදරයට පත් වන බව පැහැදිලි කර දුන්නා. දඬයක් නොගහ, අහිංසක ගොවියකු බව කල්පනා කර, රජයේ වගා ප්‍රතිපත්තියට සහාය දුන් ගොවියා ගැන සානුකම්පිත ලෙස කල්පනා කර, රජයේ මහා බලාපොරොත්තුවක් ඉෂ්ට කිරීමට ගොවිතැන් කරන කෙනකුගෙන් ඉටු වූ සේවය කැයි තීරණය කර නිදහස් කරන්නැයි ඉල්ලා සිටියා. රජයේ ඉඩමක ගොවිතැන් කළ බව සැබෑවක් වුවත් ඔහු එසේ කළේ ඇත්ත වශයෙන්ම ගොවිතැන කෙරෙහි ඇති බලවත් ආශාව නිසා බව පෙන්වා දුන්නා. ඉඩම බලහත්කාරයෙන් අල්ලා ගත් නමුත් එහි ඔහු ගෙයක් දොරක් හදාගෙන නැහැ. දරුවන් පස්දෙනකු ඉන්න ගොවියකු නිසා දඬයක් නොගහ, වෙනත් අන්දමකින් හෝ හිරිහැර නොකර ඉන්නැයි කියා සිටියා. එතකොට දිසාපතිතුමා කිව්වේ මොකක්ද? ඒක නම් මට කරන්නට පුළුවන් දෙයක් නොවෙයි කියායි. එතුමා කිව්වේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉඩම් ආඥාපනත යටතේ මේ නැනැත්තා කළ වැරැද්දට රුපියල් 148.40 ක් දඩ නොගහ කරන්නට වෙනත් දෙයක් නැතැයි එතුමා කිව්වා. නියම කරන්නට පුළුවන් අඩුම දඩය එය බවයි එතුමා කිව්වේ. ඒ අහිංසක මනුෂ්‍යයා දඩය ගෙව්වා. රුපියල් 148.40ක දඩයක් ගෙවා ඒ අහිංසක ගොවි මහත්මයා මා ළඟට ඇවිත් මට කියනවා, දඩය ගෙව්වා කියලා. ඒකට මොකද නිත්‍යානුකූලව ඉඩම ලබා දී නැහැ කියලා ඒ නැනැත්තා මා එක්ක කියනවා. ඔන්න සාමාන්‍ය ගොවියාට ලැබී ඇති තත්ත්වය. ඉඩම් කෑල්ලත් නැහැ. අතේ තිබුණු මුදලත් නැහැ. බලහත්කාරයෙන් ඉඩම් කෑල්ලක් අල්ලාගෙන වගා කළොත් මොකක්ද වෙන්නේ ? ග්‍රාමසේවක මහත්මයා, ආදායම් නිලධාරිතුමා, ඒ පුද්ගලයා ගැන දිසාපතිතුමාට වාර්තා කරනවා. ඒ අනුව සිදුවන කරදරයට මුහුණ පාන්නට ඔහුට සිදු වෙනවා. ඔකයි සාමාන්‍ය දුප්පත් ගොවියාට අද සිද්ධවෙලා තියෙන්නේ.

තවත් එක් කාරණයක් සඳහන් කරන්නට ඕනෑ. රජයේ නිලධාරීන් වෙත යවන චක්‍රලේඛනවලින් නම් අඩුවක් නැහැ. වගා කිරීමට උනන්දු කරවන ලෙස ඒවායින් නිතර නිතර ඉල්ලා සිටිනවා. කාර්යාලවල ඒ සම්බන්ධයෙන් නොයෙක් නිලධාරීන් වැඩ කරනවා. ලියුම් ලියනවා. සම්මේලන පවත්වනවා. ඔය ඔක්කොම කෙරෙන්නේ කාර්යාලය ඇතුළේ. සතියකට වරක් වත් බදුල්ලේ කාර්යාලයට යෑම මගේ සිරිතක්. නිලධාරීන් කරන එකම වැඩේ කෘෂිකර්මාන්තය දියුණු කිරීමට සැලැස්ම හැදීමයි. පසුගිය දවසක මා යනවිට සම්මේලනයක් පැවැත්වෙමින් තිබුණා. හැම මැතිවරණ කොට්ඨාශයකින්ම—හැම ආසනයකින්ම—කිහිප දෙනකුගේ නම් ගම් තොරතුරු සකස් කරමින් සිටිනවා මට දකින්නට ලැබුණා. පසුගිය කන්නයේදී ලැබුණු අස්වණු ප්‍රමාණය කොයි තරම්දැයි සෝදිසි කර බැලුවා. ලබන අවුරුද්දේදී—එන කන්නයේදී—බලාපොරොත්තු වන අස්වනු ප්‍රමාණය කොතෙක්ද කියාත් සෝදිසි කරනවා මා දුටුවා. ගිය අවුරුද්දේ අක්කරයකින් වී බුසල් 80ක් ලත් ගොවියකු ලබන අවුරුද්දේ බලාපොරොත්තු වන අස්වනු ප්‍රමාණය වී බුසල් 150කැයි ලියනවා මට දකින්නට ලැබුණා. මේ ගැන ඊට සම්බන්ධ නිලධාරි මහත්මයා එක්ක මාත් සාකච්ඡා කළා. එක, දෙකක් කරන්නට පුළුවනි. දෙක, හතරක් කරන්ටත් පුළුවනි. සමහර විට හතර, අටක් කරන්නටත් ලෙහෙසියි. ඔය ක්‍රමයට ගිහිල්ලා අක්කරයකින් වී බුසල් 20ක් ලබා ගත් කුඹුරකින් අසූවක් ලබා ගැනීමත් පුළුවන් දෙයක් තමයි. ඒ තරම් ප්‍රමාණයකට ගොවියන්ගේ උත්සාහය ඇතිව අස්වැන්න වැඩි කර ගන්නට පුළුවන්වෙලා තියෙනවා. ඒ වුණාට එය 150 දක්වා වැඩි කරන්නට පුළුවන්ද කියලා මම ඇහුවා. ඔහු ටිකක් කල්පනා කර බලා කියනවා "ඔව් මට දැන් තේරෙනවා. මේ තරම් දුරට නම් ගෙනියන්න බැහැ, ටිකක් අඩු කරන්න ඕනෑ" කියා. ඔන්න ඔය විධියට තමයි සංඛ්‍යා ලේඛන හදන්නේ. මේ අපි ඇහින් දුටු දේවල්. අපි අත්දැක තිබෙන දේවල්. නිලධාරීන් කඩදාසිත් සමග බොහොම මහන්සි වෙනවා. නමුත් ක්‍රියාවට නැගෙනවා බොහෙම අඩුයි.

ඊළඟට බිත්තර වී පිළිබඳවත් කියන්න ඕනෑ. අපේ ප්‍රදේශයේ මෙතෙක් කල් වගා කළේ එච් 4 වී වර්ගයයි. මේ යල් කන්නයේ වතුර ටිකක් අඩු නිසා අපි හිතුවා ටිකක් බාල වී වර්ගයක් හිටවන්න ඕනෑය කියා. ඒ නිසා එච් 7 කියන වී වර්ගය මා සමුපකාර ආයතනයෙන් ඉල්ලා සිටියා. මට ඒ වර්ගයේ වී බුසල් 6 ක් ලැබුණා. බුසල රුපියල් 16.40 ගණනේ ඒ සඳහා රුපියල් 98 කුත් ගණනක් වියදම් වුණා. ඒ වී ටික ගෙදරට ගොස් ශුද්ධ කර බැලූ විට බුසලකට සේරු තුනක් හතරක් පමණ අඩු බවක් පෙනී ගියා. මෙයට හේතුව මොකක්ද කියා මා කල්පනා කර බැලුවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්මාන්ත අමාත්‍යාංශයේ කටයුතු සම්බන්ධයෙන් ලබන මාසය වන විට සාකච්ඡා කිරීමට අදහස් කර සිටින හෙයින් අපි මේ දුර්වලතාවයන් ගැන සොයා කියන්න ඕනෑ. අපට ලැබෙන බිත්තර වී වල හුඟක් තිබෙන්නේ බොල්. සියයට 25 ක් පමණ බොල් තිබෙනවා. ඒ බොල් සමග වී තමයි මහජනතාවට ලැබෙන්නේ. මගේ වී ටික දුටු සමහර අය කිව්වා බුසලකට ලැබෙන්නේ බුසලෙන් හතරෙන් තුනක් පමණ නම් රුපියල් 16.40 ක් ගෙවා ඔය බිත්තර වී ගැනීමෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද කියා. එහෙම සිතා වී ගන්න බලාපොරොත්තු වූ උදවියත් වී නොගෙන සිටියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේරත්න බණ්ඩා මයා.]

මා නම් අපේ ප්‍රදේශයට මේ වී පුරුදු කරන්න අවශ්‍ය නිසා බුසල් හතර හමාරක් පමණ වැපුරුවා. ඒවා වපුරා දැන් දින 15 ක් පමණත් ගත වී අවසානයි.

ඊළඟට පොහොර ගැනත් කිව යුතුව තිබෙනවා. පොහොර මිල දවසින් දවසම ඉහළ නගිනවා. සාමාන්‍ය ගොවියාට ගොවි තැන් කිරීමේදී වුවමන කරන, මා මුලින් කී අන්දමට උදැල්ලේත්, පොහොරවලත් මිළ අද හුඟක්ම ඉහළ ගොස් තිබෙනවා. පොහොර මිළ දවසින් දවසම ඉහළ නගින නිසා ගොවියාට අවශ්‍ය තරම් පොහොර යොදවා තමන්ගේ ගොවිතැන සාර්ථක කර ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ගරු අධ්‍යාපන ඇමතිතුමාත් මේ අවස්ථාවේ මෙහි සිටින බැවින් කිව යුතු වැදගත් කරුණක් තිබෙනවා. කෘෂිකර්මයත් උපයෝගි කර ගෙන ජාතිය ඉදිරියට ගෙන යාමට අපේ අධ්‍යාපන ඇමතිතුමා විශාල මහන්සියක් ගන්නවා. ඇත්ත වශයෙන්ම අපි ඒ ගැන එතුමාට ප්‍රශංසා කරන්න ඕනෑ. අපේ ජාතිය නිවහල් ජාතියක් බවට පත් කිරීමට එතුමා යම්කිසි උත්සාහයක් ගන්නව. නමුත් එයට එක් බාධකයක තිබෙනවා. බොහොම පාසැල් වලට වුවමනා කරන තරම් උපකරණ සපයා නැහැ. මා දන්නවා මුත්තෙට්ටුව ගම පාසැල ගැන. ඒ පාසැලට වුවමනා කරන තරම් ගොවි උපකරණ දී නැහැ. මා දන්නා තරමින් නම් ඒකට එක උදැල්ලයි තිබෙන්නෙ. ඒ උදැල්ලෙන් තමයි ඒ පාසැලේ ඉන්න හැම ළමයාටම වැඩ කරන්න සිදුවී තිබෙන්නෙ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගොවිතැන් කිරීම ක්‍රියාත්මක වන්නේ පැල සිටුවීමෙන් පමණක් නොවෙයි. පැල සිටුවීමට කලින් මූලිකව කළ යුත්තේ ඉඩම සකස් කිරීමයි. ඉඩම සකස් කිරීමේ තත්ත්වය උඩ තමයි, හිටවන පැල යෙන් ප්‍රයෝජනය ගන්න පුළුවන් වන්නෙ. ඒ නිසා බාලපරම්පරාවට ඒ ගැන පුහුණුවක් ලබා දෙන්න ඕනෑ. ඉඩම සකස් කර ගන්නේ මෙන්න මේ ආකාරය ටය කියා ඔවුන්ට පුහුණුවක් දෙන්න ඕනෑ.

**ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබ ඇමති)**

*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாசார விவகார அமைச்சர்)*

(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

මොන පාසැලේද?

**විජේරත්න බණ්ඩා මයා.**

*(திரு. விஜேரத்ன பண்டா)*

(Mr. Wijeratne Banda)

මුත්තෙට්ටුවගම පාසැලේ. ඒ පාසැලේ ඉඩම් අක්කර 2 ක් පමණ තිබෙනවා. එය මා විසින්ම පරිත්‍යාග කරන ලද ඉඩමක් නිසා මා හොඳට දන්නවා. ඒ පසැලට මා හිතන හැටියට තිබෙන්නෙ උදලු එකක් නැත්නම් දෙකක් පමණයි. ඒ නිසා ඒ ළමයින්ට වුවමනා ආකාරයට වැඩ හුරුවක් දෙන්න පුළුවන්කමක් නැහැ.

එකල්හි වේලාව අ. භා. 7.30 වූයෙන් කටයුතු අතහිටුවා විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 1968 ජූලි 19 වන සිකුරාදා පවත්වනු ලැබේ.

அப்போது பி. ப. 7.30 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்தி வைக்கப்பெற்றது.

விவாதம் 1968 ஜூலை 19, வெள்ளிக்கிழமை மீள ஆரம்பமாகும்.

*It being 7.30 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Friday, 19th July 1968.*

## කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

එවේලාවේදී නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, අ. භා. 7.30 ට, අද දින සභා සම්මතිය අනුව, 1968 ජූලි 19 වන සිකුරාදා අ. භා. 2 වන තෙක් කල් ගියේ ය.

அதன் பின்னர் உப சபாநாயகர் அவர்கள் வினு விடுக்காமலேயே சபையை ஒத்திவைத்தார்கள்.

அதன்படி, சபை அதனது இன்றைய தீர்மானத்துக் கிணங்க, 1968 ஜூலை 19, வெள்ளிக்கிழமை பி. ப. 2 மணி வரை ஒத்திவைக்கப்பெற்றது.

*Thereupon* MR. DEPUTY SPEAKER *adjourned the House without Question put.*

*Adjourned accordingly until 2 P.M., on Friday, 19th July 1968, pursuant to the Resolution of the House this Day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු.35.00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩක්. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியையடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00) 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி 30 சதம், தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org